
බුද්ධ ඇදහිල්ල

# බුද්ධ ඇදහිල්ල

පණ්ඩිත කිරිඇල්ලේ ඥාණවිමල
ස්ථවිර

ගුණසේන

සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම
නො. 217, ඔල්කොට් මාවත, කොළඹ 11.

© සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම

සතර වැනි මුද්‍රණය - 1983

කොළඹ සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම විසින්
මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී. 1 - 3024-9/82

# ප්‍රස්තාවනා

සංසාර විමුක්තිය සඳහා ගමන් කරන සැදැහැවත් බෞද්ධයන් හට නිර්වාණබෝධය පිණිස ඍජු මාර්ගයක් අවශ්‍ය මැයි. ඒ පිණිස පර්යාප්ති (ධර්මය ඉගැනීම), ප්‍රතිපත්ති (ධර්මය අනුව පිළිපැදීම) හා ප්‍රතිවේධ (සත්‍ය ධර්මාවබෝධය) යන ත්‍රිවිධ ශාසනානුගත වන පරිදි ක්‍රියා කළ යුතු ය.

සූත්‍ර - විනය - අභිධර්ම යන පිටකත්‍රයට අයත් 84000 ක් ධර්ම කොට්ඨාස දැන ඉගැනීමට තරම් ධාරණ ශක්තිය හා ඥාන ශක්තිය ඇති අය අප අතර විරලය. ඒ අඩු පාඩුව පිරිමසාලීම සඳහා ප්‍රමාණවත් ධර්ම කොට්ඨාස ඇතුළත් ධර්ම ග්‍රන්ථයක් බෞද්ධ වූ හැම දෙනා අත ම නිතර දෙවේලේ සිහි කිරීමට අත් පොතක් වශයෙන් තිබිය යුතු ම ය.

තුනුරුවන් විෂයයෙහි පූජා සත්කාර කිරීම සිල් රැකීම බණකීම-භාවනා කිරීම ආදි ආගමික පුණ්‍ය ක්‍රියාවන්හි යෙදෙන සැදැහැවත් බෞද්ධ පින්වතුන්-ගේ ප්‍රයෝජනය සඳහා ප්‍රමාණවත් පොතක් මේ තාක් නොතිබීමේ අඩුපාඩුව මෙයින් සම්පූර්ණ වන්නේ ය.

අතීතයේ ද ගිහි - පැවිදි දෙපක්ෂයේ ම ආගමික පිළිපැදීම සඳහා මෙබඳු පොත් තිබුණ බව පෙනේ. එයින් මේ දක්වා අප අතර ශේෂ වී තිබෙන පොත් දෙක ද තවම මුද්‍රණය වී නැත.

එයින් භික්ෂූන්වහන්සේලාගේ (ශික්ෂා) සංවරණය සඳහා අත් පොතක් වශයෙන් පාවිච්චි කරන ලද **සිකකරණිය** ඉතිරි වී තිබෙන එකම පොතයි. මෙය එකල ද ප්‍රධාන තැනක් ගෙන තිබුණ බව iv මිහිඳු (ක්‍රි. ව. 956 - 972) රජ තුමා විසින් අනුරපුර මිහින්තලේ පිහිටුවන ලද ශිලා ලිපියෙහි **''සිකකරණිහි කියු සෙයින් සිවුර් හැන්ඳ පෙරෙවැ''** (*Epigraphia Zeylānica Vol. I Page 85*) යන වාක්‍යයෙන් පෙනේ.

බෞද්ධ ප්‍රතිපත්ති පූරණය සඳහා ගිහි දින චරියාව අනුව ලියන ලද පැරණි පොත් අතුරින් මේතාක් ශේෂව තිබෙන්නේ ද එකකි.

එය කීර්ති ශ්‍රී රාජසිංහ (ක්‍රි. ව. 1747 - 1782) රජතුමාට ඕලන්ද ආණ්ඩුවෙන් පරිත්‍යාග කරනලද සම්පූර්ණ හමට බැඳි කඩදසි පොතක සිංහල චිත්‍ර

ශිල්පීන් විසින් සකස් කරන ලද කාලය අනුව වර්‍ණය වෙනස් නොවන දූලි සායමින් ලියන ලද **බෞද්ධ ඇදහිල්ලයි.**

අලඞ්කාර ලෙස කැටයම් කළ, පොතේ හැඩහුරුකමටම සෑදූ මඤ්ජුසාවක දමා තිබෙන මේ පොතේ ඇතුළත් කරුණු අද ඊයේ ලියන ලද ලේබල් මෙන් පැහැදිලි ය.

සිංහල රාජ්‍යයේ අවසාන භාගයෙහි අභ්‍යන්තර හා විදේශීය ආක්‍රමණ නිසා නොසන්සුන් ජීවිතයක් ගත කරමින් රාජ්‍යපාලනය කළ සිංහල රජවරු පවා එබඳු කරදර මධ්‍යයෙහි ම කොපමණ උනන්දුවකින් ස්වකීය ආගමික පිළිවෙත් පිරුවාහුද යන බව අවුරුදු 200 කට වඩා පැරණි ඒ බෞද්ධ ඇදහිල්ල පොතින් මනා ව හැඟෙන්නේ ය.

බුදු සසුන බැබලේවා!

මෙයට,

**පණ්ඩිත කිරිඇල්ලේ ඤාණවිමල ස්ථවිර**

$\frac{2498}{1955}$ ජනවාරි 25 දින,
මාරපණ ශාස්ත්‍රොදය පිරුවන්හි දී ය.

# පටුන

පිටුව

ප්‍රස්තාවනා ... ... ... iii

1. නමස්කාර පාඨය ... ... ... 1
2. සරණාගමනය ... ... ... 1
3. පඤ්ච ශීලය ... ... ... 3
4. පන්සිල් ඉල්ලීමෙහි වාක්‍යය ... 4
5. සරණ පිහිටන ක්‍රම ... ... 5
6. සරණ කෙලෙසන ක්‍රම ... ... 6
7. සරණ බිඳෙන ක්‍රම ... ... 7
8. සරණාගමන ප්‍රභේද ... ... 8
9. සරණාගමන ඵල ... ... 11
   i. ඡත්ත නම් බ්‍රාහ්මණයා සරණගත වූ පරිදි ... ... ... 12

10. අනුශාසනා
   i. පූර්වාහ්න ප්‍රතිපත්ති ... ... 15
   ii. සන්ධ්‍යාකාල ප්‍රතිපත්ති ... ... 16

iii. විහාරස්ථානාදියට පැමිණීම ... 17
iv. වන්දනා පිළිවෙළ හා ධාතු විභාගය 18
v. පෝය විභාග ... ... ... 20
vi. පටිජාගරණ උපොසථය ... 21
vii. ප්‍රාතිහාර්‍යපක්ෂ උපොසථය ... 21
11. ශීල විභාගය ... ... 22
i. උපෙසථ ශීලය හෙවත් අෂ්ටාංගශීලය 27
ii. තනිව සිල් සමාදන් වන ක්‍රමය ... 32
අටසිල් ගත් අය විසින් හැසිරිය යුතු අන්දම ... ... 33
තහනම් වූ දෙතිස් කථා ... ... 34
උපක්ලේශ ධර්ම හෙවත් සිල් හොරු 36
අටසිල් සමාදන්වූ අය විසින් ... 39
සිහිකටයුතු ධර්ම ... ... 42
දශ ශීලය ... ... ... 44
12. භාවනා විභාගය ... ... ...
බුද්ධානුස්මෘතිය හෙවත් බුදු ගුණ මෙනෙහි කිරීම ... ... 44

බුරුම දේශයෙහි පවතින බුද්ධානුස්-
මෘතිය හෙවත් නවගුණ මෙනෙහි
කොට වැඳීම ... ... 51
ධර්මානුස්මෘතිය හෙවත් ධර්මයේ ගුණ
මෙනෙහි කිරීම ... ... 55
සඞ්ඝානුස්මෘතිය හෙවත් සඞ්ඝයාගේ
ගුණ මෙනෙහි කිරීම ... ... 56
බුදු ගුණ සන්නය ... ... 57
දහම් ගුණ සන්නය ... ... 61
සඟ ගුණ සන්නය ... ... 62
තුණුරුවන් ගුණ මුදුන්පත් කිරීම ... 67
තුණුරුවන් සරණ යෑමේ ඵලය ... 69
කායගතා සතිය හෙවත් පිළිකුල්
භාවනාව ... ... ... 71
කායගතා සතිය අනුලෝම ප්‍රතිලෝම
වශයෙන් භාවනා කිරීම ... 77
අනුලෝමය ... ... ... 79
ප්‍රතිලෝමය ... ... ... 79

පිළිකුල් භාවනාව කිරීමට පහසු
ක්‍රමයක් ... ... ... 79
භාවනා ක්‍රමය ... ... ... 80
අනුලෝමනයෝ ... ... 80
පතිලෝමනයෝ ... ... 81
අනුලෝමනයයි ... ... 81
ප්‍රතිලෝමනයයි ... ... 82
බුද්ධානුස්මෘති භාවනාව ... ... 83
මෛත්‍රී භාවනාව ... ... 86
තවත් මෛත්‍රී භාවනාවක් ... 88
තවත් ක්‍රමයෙක මෛත්‍රී භාවනාවක් 93
මෛත්‍රී භාවනාව කිරීමෙහි ආනිසංස 99
අශුභ භාවනාව හෙවත් ශරීරය පිළිකුල්
කටයුතු කුණපයක් බව මෙනෙහි
කිරීම ... ... ... 101
මරණානුස්මෘතිය හෙවත් මරණය ගැන
සිහි කිරීම ... ... ... 104

සිහිකළ යුතු සංවේග වස්තු අට ... 108

මෙය සිහි කිරීමේ ආනිසංසය ... 108

නිත්‍ය ප්‍රත්‍යවෙක්ෂා ධර්ම ... ... 109

**13. වන්දනා කිරීමේ ක්‍රම ... ... 110**

බුදුන් වැඳීම ... ... ... 110

බුඩ වන්දනා ගාථා ... ... 112

අටවිසි සුගත වන්දනාව ... ... 117

ධර්මය වැඳීම ... ... ... 119

ධර්ම වන්දනා ගාථා ... ... 121

සඞ්ඝයා වැඳීම ... ... ... 123

සඞ්ඝයා වන්දනා ගාථා ... ... 125

සියම්රට ත්‍රිපිටකධාරි වජිරඤාණ මහරජාණන් විසින් විරචිත රත්නත්‍රයාභිවාදනය ... ... 127

තෙරුවන් සමාකිරීම ... ... 131

බුදුන් ක්ෂමාකරගැනීමේ ගාථාව ... 131

ධර්මය ක්ෂමාකරගැනීමේ ගාථාව ... 132

සඞ්ඝයා ක්‍ෂමා කරගැනීමේ ගාථාව... 132
ෂොඩශ විධ චෛත්‍ය වන්දනාව ... 133
මහියඞ්ගනය චෛත්‍ය වැඳීම ... 134
නාගද්වීප චෛත්‍යය වැඳීම ... 135
කැලණි වෙහෙර වැඳීම ... ... 136
ශ්‍රීපාදය වැඳීම ... ... ... 136
දිවාගුහාව හෙවත් භගවාලෙන වැඳීම 138
දීඝවාපී චෛත්‍යය වැඳීම ... 138
මුතියඞ්ගන චෛත්‍යය වැඳීම ... 139
තිස්සමහාරාම චෛත්‍යය වැඳීම ... 140
අනුරාධපුරයෙහි වූ ශ්‍රී මහාබෝධීන් වහන්සේ වැඳීම ... ... 140
මිරිසවැටිය චෛත්‍යය වැඳීම ... 141
රුවන්වැලි චෛත්‍යය වැඳීම ... 141
ථූපාරාම චෛත්‍ය වැඳීම ... ... 142
අභයගිරි චෛත්‍ය වැඳීම ... ... 143

ජේතවනාරාමය (මහසෙන්) චෛත්‍යය වැඳීම ... ... 144
සෙල චෛත්‍යය වැඳීම ... ... 144
කිරි වෙහෙර වැඳීම ... ... 145
දන්ත ධාතු හෙවත් දළදා වැඳීම ... 146
ශ්‍රීපාද ලාඤ්ඡන සතර වැඳීම ... 147
බෝධි වන්දනා ගාථා ... ... 148
අසූ මහා ශ්‍රාවකයන් වහන්සේලාට නමස්කාරය ... ... 151
සර්වඥයන්වහන්සේ සත් සතිය ගත කළ ස්ථානයන් වැඳීම ... ... 154
තෙරුවන් නමස්කාරය ... ... 155
මල් පූජා කිරීම ... ... 156
මල් පූජා කිරීමේ වාක්‍යයක් ... 157
ගසේ තිබියදී මල් පූජා කිරීම ... 159
සුවඳ පූජා කිරීම ... ... 160
සුවඳ දුම් පූජා කිරීම ... ... 160
පහන් පූජා කිරීම ... ... 161

පහන් පූජා කිරීමෙහි ආනිසංස ... 161
ආහාර පූජා කිරීම ... ... 162
පැන් පූජා කරන ගාථා ... ... 163
ගිලන් පස පූජා කිරීම ... ... 164
දූහැත් පූජා කිරීම ... ... 165
කැවිලි වර්ග පූජා කිරීම ... ... 165
ව්‍යඤ්ජන වර්ග පූජා කිරීම ... 166
යාගු (කැඳ) පූජා කිරීම ... ... 166
ප්‍රතිපත්ති පූජාවෙන් පූජා කරන ක්‍රමය 167

14. ධර්ම විභාගය ... ... ... 168

ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය ... 168
සප්තාර්‍ය්‍ය ධනය ... ... 172
දශ පුණ්‍ය ක්‍රියා ... ... 175
සසර කතර හෙවත් කාන්තාරය ... 176
සර්වඥයන් වහන්සේ සසර සයුරෙහි පරතෙරට ගිය අන්දම ... ... 177
දශ දාන වස්තු ... ... ... 180

අටපිරිකර පිළිගන්වන අන්දම ... 181

සාංඝික දානය ... ... ... 181

කඨින දානය ... ... ... 182

දන් දෙන්නවුන් ගේ ප්‍රභෙද ... 183

ශීලය පරිස්සම් කළ යුතු විධිය ... 183

ධර්ම දානය කිරීමේ යහපත... ... 184

පඤ්ච ශීලය ... ... ... 185

ප්‍රාණඝාතයෙහි අඞ්ග සහ ආදීනව ... 185

අදත්තාදානයෙහි අඞ්ග සහ ආදීනව ... 191

කාම මිථ්‍යාචාරයෙහි අඞ්ග සහ ආදීනව ... ... ... 196

මෘෂාවාදයෙහි අඞ්ග සහ ආදීනව ... 200

මද්‍යපානයෙහි අඞ්ග සහ ආදීනව ... 203

දශ අකුසල කර්ම ... ... ... 206

පෛශුන්‍යය හෙවත් කේළාම් කීම ... 208

පරුෂ වචන ... ... ... 209

සම්ඵප්‍රලාපය ... ... ... 212

අභිධ්‍යාව හෙවත් දළ ලෝභය ... 213

ව්‍යාපාදය ... ... ... 214

මිථ්‍යාදෘෂ්ටිය ... ... ... 216

ආනන්තර්‍ය්‍ය කර්‍ම පඤ්චකය ... 218

පඤ්ච දුශ්චරිතය ... ... 218

පඤ්ච කාමය ... ... ... 219

වැඩ කැමැත්තන් විසින් පහ කටයුතු
දෝෂ ... ... ... 219

කර්‍ම විභාගය ... ... ... 221

ජාති දුක ... ... ... 223

ගර්භාවක්‍රාන්ති මෞලික දුක්ඛය හෙවත්
මවු කුස පිළිසිඳ ගැනීම මුල් කොට
උපදනා දුක ... ... ... 224

ගර්භ පරිහරණ මෞලික දුක්ඛය හෙවත්
ගැබ ආරක්ෂා කරන කාලයෙහි
එය මුල් කොට උපදනා දුක ... 225

ගර්භ විපත්ති මෞලික දුක්ඛය හෙවත් ගැබට විපත් පැමිණීමෙන් හට ගන්නා වූ දුක ... ... 226
විජායන මෞලික දුක්ඛය හෙවත් වැදීම මුල් කොටඇති දුක ... 226
ගර්භයෙන් බහිර් නිෂ්ක්‍රමණ මෞලික දුක්ඛය හෙවත් ප්‍රසූත වූ කල උපදිනා දුක ... ... ... 227
ආත්මෝපක්‍රම මෞලික දුක්ඛය හෙවත් ස්වකීය උපක්‍රම මුල් කොට උපදනා දුක ... ... ... 228
පරෝපක්‍රම මෞලික දුක්ඛය හෙවත් අන්‍යයන්ගේ උපක්‍රම මුල් ව හට-ගන්නා දුක ... ... 228
ජරා දුක ... ... 229
මරණ දුක ... ... 231
කෙලෙස් ධූතාඞ්ගයෝ ... ... 232
ඒකාසනිකඞ්ගය රක්ෂා කිරීම ... 234

පත්ත පිණ්ඩිකඞ්ග සමාදනය ... 238
ධූතාඞ්ගධරයාගේ ඉරියවු ... 241
ධූතාඞ්ග ආනිසංස ... ... 242
හෙරණ සිඛ ... ... ... 243
චතුපාරිශුද්ධ ශීලය ... ... 246
සත්තිස් බෝධිපාක්ෂික ධර්‍ම ... 249
සමතිස් පැරුම් ... ... ... 256
පසුතැවිලි ධර්‍ම දශය ... ... 260
දුර්ලභ කාරණා චතුෂ්කය ... 266
අකුසල් මුල් ... ... ... 267
කුසල් මුල් ... ... ... 268
ගති නියත කුසල් ... ... 268
උපාසක ලක්ෂණ ... ... 269
නොඉවසීමෙහි ආදීනව .... ... 270
ඉවසීමෙහි ආනිසංස ... ... 270
මෛත්‍රෙය බුදුන් දක සසරින්
ගැලැවෙන්නෝ ... ... 271
මෛත්‍රෙය බුදුන් නොදක හෙන්නෝ 272

මවට වඳින ගාථාව ... ... 272

පියාට වඳින ගාථාව ... ... 273

මළගිය ඥාතීන් හට පින් දීම ... 274

මළ කුණක් දුටු විට සිහිකිරීම ... 275

බෞද්ධයන් විසින් සිහි කටයුතු ප්‍රාර්ථනා ... ... ... 276

දෙවියන්ට පින්දීම ... ... 277

තවත් පින්දීමක් ... ... 278

ප්‍රාර්ථනා ... ... 278

15. ගිහි විනය

වසල සූත්‍රය ... ... ... 279

පරාභව සූත්‍රය ... ... ... 297

ව්‍යග්ඝපජ්ජ සූත්‍ර භාවය ... ... 316

සිඟාලෝවාද සූත්‍රය ... ... 328

16. පරිත්‍රාණ දේශනා

මහාමඞ්ගල සූත්‍රය ... ... 379

රතන සූත්‍රය ... ... ... 382

කරණීය මෙත්ත සූත්‍රය ... ... 387
ධජග්ග සූත්‍රය ... ... ... 389
රත් දෙණේ ගාථා ... ... 394
ජින පඤ්ජරය ... ... ... 396
ජය පිරිත ... ... ... 401
අටවිසි පිරිත ... ... ... 404
ජයමඞ්ගල ගාථා ... ... 408
මහා ජයමඞ්ගල ගාථා ... ... 411
සර්වඥ ජන්ම පත්‍රය ... ... 427
බුඩාගමේ ප්‍රධාන දවස් ... 428
බුඩාගමේ මඞ්ගල්‍ය දවස් ... ... 433

## 1. නමස්කාර පාඨය

නමො තස්ස භගවතො අරහතො
සම්මා සම්බුද්ධස්ස

මෙහි භාවය:- භාග්‍යවත්වූ අර්හත්වූ ඒ (අපගේ) සම්‍යක් සම්බුඩයන් වහන්සේට නමස්කාර වේවා!

## 2. සරණාගමනය

1. බුද්ධං සරණං ගච්ඡාමි
   ධම්මං සරණං ගච්ඡාමි
   සඞ්ඝං සරණං ගච්ඡාමි

2. දුතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි
   දුතියම්පි ධම්මං සරණං ගච්ඡාමි
   දුතියම්පි සඞ්ඝං සරණං ගච්ඡාමි

3. තතියම්පි බුඩං සරණං ගච්ඡාමි
   තතියම්පි ධම්මං සරණං ගච්ඡාමි
   තතියම්පි සඞ්ඝං සරණං ගච්ඡාමි

## මෙහි භාවය

1. (මම) බුදුන් සරණ කොට යෙමි.
(මම) ධර්මය සරණ කොට යෙමි.
(මම) සඞ්ඝයා සරණ කොට යෙමි.

2. (මම) දෙවනුවද බුදුන් සරණකොට යෙමි.
(මම) දෙවනුවද ධර්මය සරණකොට යෙමි.
(මම) දෙවනුවද සඞ්ඝයා සරණකොට යෙමි.

3. (මම) තෙවනුවද බුදුන් සරණකොට යෙමි.
(මම) තෙවනුවද ධර්මය සරණකොට යෙමි.
(මම) තෙවනුවද සඞ්ඝයා සරණකොට යෙමි.

## 3. පඤ්ච ශීලය

1. පාණාතිපාතා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.
2. අදින්නාදනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.
3. කාමෙසුමිච්ඡාචාරා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.
4. මුසාවාද වෙරමණී සික්ඛාපදං සමාදියාමි.
5. සුරාමෙරය මජ්ජපමාදට්ඨානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.

## මෙහි භාවය

1. (මම) සතුන් මැරීමෙන් වැලැක්ම වූ ශික්ෂාපදය සමාදන් වෙමි.
2. (මම) සොරකම් කිරීමෙන් වැලැක්ම වූ ශික්ෂා පදය සමාදන් වෙමි.
3. (මම) කාමයෙහි වරදවා හැසිරීමෙන් වැලැක්මවූ ශික්ෂාපදය සමාදන් වෙමි.

4. (මම) බොරු කීමෙන් වැලැක්ම වූ ශික්ෂා පදය සමාදන් වෙමි.

5. (මම) මත්පැන් (රහමෙර) බීමෙන් වැලැක්ම වූ ශික්ෂාපදය සමාදන් වෙමි.

සුරා – රහමෙර නම්:– පිටි–කැවුම්–බත්–රාමණ්ඩි – නෙල්ලි – අබ – මේ ආදියෙන් තනන ලද්දේ සුරා නම් වේ. මල්–දෙල්–කොස්– මුද්දරප්පලම් – උක් – කටුක ඵල – යන මෙයින් තනන ලද්දේ මෙරය නම් වේ. සාමාන්‍යයෙන් මත්වීමට කාරණයවූ සියලුම පානවර්ග සුරා මෙරයට අයත් බැව් දතයුතුයි.

## 4. පන්සිල් ඉල්ලීමෙහි වාක්‍යය

"ඔකාස අහං භන්තෙ තිසරණෙන සහ පඤ්චසීලං ධම්මං යාචාමි අනුග්ගහං කත්වා සීලං දෙථ මෙ භන්තෙ – දුතියම්පි – පෙ – – ("මෙහි තේරුම:– අවසර ස්වාමීන් වහන්ස, මම තිසරණ සහිත පඤ්චශීල ධර්මය ඉල්ලමි. ස්වාමීන් වහන්ස, කරුණා

කොට මට ඒ ශීලය දෙන සේක්වා. දෙවනුවද-තෙවනුවද'' යනුයි) මේ වාක්‍ය තුන් වරක් කියූ පසු සිල්දෙන භික්ෂුව විසින් ''යමහං වදමි තං වදෙථ'' (මෙහි තේරුම මම යම් සිල් පදයක් කියම්ද, එය ඔබ කිය යුතුයි) යනු කී කල සිල් ලබන අය විසින් ''ආමභන්තෙ'' (එසේය ස්වාමීන් වහන්ස) කියා පිළිගෙන නමස්කාර පාඨය තුන් වරක් කියා නමස්කාර කටයුතුයි. මෙසේ සරණ ගමනයෙන් ඉක්බිතිව, සිල්දෙන භික්ෂුව විසින් ''තිසරණ ගමනං සම්පුණ්ණං'' (තුන්සරණය යාම සම්පූර්ණයි) කී කලද, ''ආම භන්තෙ'' (එසේය ස්වාමීන් වහන්ස) කියා පිළිගෙණ පඤ්චශීලය සමාදන් වෙනු. මින්පසු භික්ෂූන් වහන්සේ විසින් ''තිසරණෙන සද්ධිං පඤ්චසීලං ධම්මං සාධුකං සුරක්ඛිතං කත්වා අප්පමාදෙන සම්පාදෙතබ්බං'' (තිසරණ සහිත මේ සිල්පද පස යහපත්සේ කඩ නොකොට නිත්‍ය ශීල වශයෙන් අප්‍රමාදව (රක්ෂා කටයුතුයි) කී කලද ''ආම භන්තෙ'' (එසේය ස්වාමීන් වහන්ස) කියා පිළිගත යුතුයි.

ඇතැම්විට මේ වාක්‍ය නො කියවා නමස්කාර පාඨය පමණක් කියවා සිල් දෙනු ලැබේ. මේ දෙයාකාරයෙන් කොයි ප්‍රකාරයත් අභිප්‍රෙතාර්ථයට බාධක නොවේ.

## 5. සරණ පිහිටන ක්‍රම

සර්වඥයන් වහන්සේ නම් තුන්ලොවට අග්‍ර දක්ෂිණාහී ය; හෙවත් ඉතා උසස් වශයෙන් පුදපූජා ලැබීමට සුදුස්සාය. උන්වහන්සේට වඩා උතුම් දෙවියෙක්, බ්‍රහ්මයෙක් හෝ වෙන යම් කෙනෙක් නැත. උන්වහන්සේගේ බුදුගුණ සලකා යමෙක් වඳීද ඕහට සරණය පිහිටයි.

## 6. සරණ කෙලෙසෙන ක්‍රම

සර්වඥයන් වහන්සේ පිළිබඳව යමකු කෙරෙහි යම් විටක සැක සවභාවයක් ඇති වීද, එසේ නැතහොත් තුනුරුවන් පිළිබඳ ව යම් අගුණ සැලකීමක් ඇතිවීද, එකල හටගත් අනාදරය හේතු කොට ගෙන ඔහුගේ සරණය කිලුටු භාවයට පැමිණේ.

## 7. සරණ බිඳෙන ක්‍රම

සරණාගමනය ලෞකික ලෝකෝත්තර වශයෙන් දෙයාකාර වෙයි. සෝවාන්ඵල ප්‍රාප්තවූ පුද්ගලයාගේ සරණය ලෝකෝත්තර බැවින් එය නොබිඳෙයි. ලෞකික සරණ පරායණ වූ යම් ස්ත්‍රී පුරුෂයෙක්, සර්වඥයන් වහන්සේට වඩා උතුම් දෙවියෙක් බඹෙක් හෝ වෙන යම් කෙනෙක් ඇත කියා හෝ අසවල් දෙවියෝ බුදුන්ට වඩා ආනුභාවසම්පන්නය උතුම්ය කියා සිතුවේ හෝ විශ්වාස කෙළේ හෝ වේද එකෙනෙහිම ඔහුගේ සරණය බිඳේ.

යම් සේ බුද්ධාදී රත්නත්‍රයෙහි ගුණ නොදැනීමෙන් හා සැක කිරීමෙන් ද ගුණය අගුණය වශයෙන් වරදවා කල්පනා කිරීමෙන්ද සිත කිලුටුවීම සංක්ලේශ නමි.

## 8. සරණාගමන ප්‍රභේද

සරණ ශීලයෙහි යෙදෙන අය විසින් එහි විශේෂ විභාගාදිය දැන සමාදන් වීම යුතු බැවින් එහි විස්තර සැකෙවින් මෙසේ දත යුතුයි. සරණාගමනය වනාහි ලෞකිකය ලොකොත්තරයයි දෙවැදෑරුම් වේ.මෙයින් ලෞකික සරණා ගමනය වනාහී ආත්ම සංනියයාතනය, තත්පරායණය, ශිෂ්‍ය භාවොපගමනය, ප්‍රණිපාතයයි කියා භෙද සතරකි.

1. ආත්ම සංනියයාතන සරණාගමනය:– 'මෙවක් පටන් මාගේ ආත්මය ත්‍රිවිධ-රත්නයට පුදමියි' සිතා ආත්ම පරිත්‍යාග කිරීම් වශයෙන් ගන්නා ලද සරණය ආත්ම සංනියයාතන සරණා ගමනය නම් වේ.

2. තත්පරායණ සරණාගමනය:-'මෙවක් පටන් මම බුඩාදි ත්‍රිවිධරත්නයට ඇතුළත් වෙමි' සිතා නියුක්ත වීමෙන් ගන්නා ලද සරණයතත්පරායන සරණාගමනය නම් වේ.

3. ශිෂ්‍ය භාවොපගත සරණා ගමනය:– 'මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ පරිද්දෙන් අද පටන් මමත් බුඩාදී තුනුරුවන්ට ශිෂ්‍යයෙක් වෙමි' කියා ගන්නා සරණය ශිෂ්‍ය භාවෝපගත සරණාගමනය නම් වේ.

4. ප්‍රණිපාත සරණාගමනය:– 'බ්‍රහ්මායු බ්‍රාහ්මණයා මෙන් අද පටන් මම බුඩාදී රත්නත්‍රයට නමස්කාර ගෞරව කරමි'යි සිතා ගන්නා සරණය ප්‍රණිපාත සරණාගමනය නම් වේ.

බ්‍රහ්මායු බ්‍රාහ්මණ තෙම බුදුගුණ අසා වැඩසිටින දිශාභාගයට පසඟ පිහිටුවා වැඳ ''නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස'' කියා පළමුවෙන් නමස්කාර කෙළේය.

මේ දක්වන ලද ප්‍රණිපාතයද ඥාති, භය, ආචාර්‍ය්‍ය දක්ෂිණෙය්‍ය වශයෙන් සතර කොටසකට බෙදේ.

එනම්:—

'බුදුහු ශාක්‍ය කොලිය ආදි උසස් වංශික-යෙක මගේ නැයෙක යනාදි වංශයෙන් ඥාතිත්වයක් සළකා හෝ ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ රාජ පූජිතය, මහානු-භාව සම්පන්නය, නොවැන්ද කල මට අනර්ථ පමුණුවයි' යන භය හේතුකොට-ගෙන හෝ 'සර්‍වඥයන් වහන්සේ බොධි-සත්ව අවස්ථාවෙහි දී උන්වහන්සේගෙන් ශාස්ත්‍ර උගතිම්'යි යන සිතින් හෝ

එකෙන භොගෙ භුඤ්ජෙය්‍ය
ද්විහිකම්මං පයොජයෙ
චතුත්ථඤ්ච නිධාපෙය්‍ය
ආපදසු භවිස්සති.

'යමෙකු විසින් උපයන ලද වස්තුව සතර කොටසකට බෙද එක කොටසක් අනුභවයට (කෑම් ඇඳීම් ආදී කටයුතු පිණිස) ගන්නේය. දෙකොටසක් කෘෂි වණිග් ක්‍රමාදිකර්‍මාන්තයන්හි යොදන්නේය. ආපදවක් හෙවත් විපත්තියක් එළඹ සිටි

කල ප්‍රයෝජනය පිණිස සතරවෙනි කොටස නිධානගත කරන්නේ ය. හෙවත් සුරකිව තබන්නේ ය. යන මේ ආදි වශයෙන් මෙලොවට ප්‍රයෝජන වූ ගුරුකම් දෙන ආචාර්‍ය්‍යවරයෙක’ යන කල්පනා ඇතිව ආචාර්‍ය්‍ය ප්‍රණිපාතයෙහි නියුක්තවූවාහටද ප්‍රණිපාත සරණාගමනය සිද්ධ නොවේ.

## 9. සරණාගමන ඵල

බුද්ධ ධර්ම සංඝ යන රත්නත්‍රය සරණ නිත්‍ය වශයෙන් රක්ෂා කරන්නවුන් මෙලොවදී යක්ෂ ප්‍රෙතාදීන්ගෙන් වන භයක් හෝ වෛරී ජනයන්ගෙන් වන යම්කිසි උවදුරක් හෝ නො පැමිණ මරණින් මත්තෙහිදු සුගති සඩ්ඛ්‍යාවට පැමිණෙන බව පහත දක්වෙන ගාථාද්වයෙන් ප්‍රකාශ වේ.

1. යො ච බුද්ධඤ්ච ධම්මඤ්ච
සඞ්ඝඤ්ච සරණං ගතො
රක්ඛන්ති තං සදා දෙවා
සමුද්දෙවා ඵලෙපි වා.

2. යෙ කෙචි බුඬං සරණං ගතා සෙ
න තෙ ගමිස්සන්ති අපායං
පහාය මානුසං දෙහං
දෙව කායං පරිපූරෙස්සන්ති.

මේ ගාථා දෙකේ භාවය

1. බුදුන් දහම් සඟුන් යන ත්‍රිවිධ රත්නය සරණ ගියාවූ යම් පුද්ගලයෙක් වේ ද; හෙතෙම දෙවියන් විසින් ගොඩ දිය දෙතැන්හි දීම රක්ෂා කරණු ලැබේ.

2. බුඩ ධම් සඞ්ඝ යන ත්‍රිවිධ රත්නය සරණ ගතවූ පුද්ගල තෙම සතර අපායගත නොව මරණින් මතු දිව්‍ය ලෝකයෙහි උපදී.

**i. ඡත්ත නම් බ්‍රාහ්මණයා සරණ ගත වූ පරිදි**

අප සර්වඥයන් වහන්සේ දෙව්රම් වෙහෙරෙහි වැඩ වසන සමයෙහි සේතව්‍ය නුවර වාසි එක්තරා බමුණෙකුගේ ඡත්ත නම් එකම පුත්‍රයෙක් විය. පිය තෙම

සවකීය පුත්‍රයාට ශාස්ත්‍ර පුහුණු කරවනු පිණිස උක්කට්ඨ නුවර පොක්ඛරසාති නම් බ්‍රාහ්මණයා වෙත යැවුයේය. ප්‍රඥා සම්පන්නවූ ඒ බමුණු මානවකයා නොබෝ කලකින් ශාස්ත්‍රය මනාව දැන ඉගෙන සියලු බ්‍රාහ්මණ ශිල්පයෙහි පාරප්‍රාප්ත වූයේ පෙරළා සිය පුරයට අවුත් දෙගුරුන් පාදභිවාදනය කිරීමෙන් ශිල්ප දුන් ඇදුරු පිදීම පිණිස කහවණු දහසක් ඉල්වා ගත. ඉක්බිති ඒ මානවක තෙම ආචාර්‍ය්‍යයන්ට ගුරු පඬුරු දීම පිණිස නැවත උක්කට්ඨා නුවරට යනුයේ වෙයි. අන්තර මාර්ගයේදී 'සොරහු මානවකයා මරා වස්ත්‍ර පැහැර ගන්නාහ'යි කලින් දැන වදළා වූ සර්වඥයන් වහන්සේ ඔහු යන මාවත ඊට අභිමුඛවූ එක් රුකක් මුල වැඩහිඳ ඕහට ධර්ම දේශනා කිරීමෙන් සරණ ශීලයෙහි පිහිටෙව්වේය. ඒ සරණ ගතවූ පරිදි මේ දක්වන ගාථා තුනෙන් ප්‍රකාශ වේ.

1. යො වදතං පවරො මනුජෙසු
සක්‍ය මුනී භගවා කත කිච්චො
පාරගතොබල විරිය සමඞ්ගී
තං සුගතං සරණත්ථමුපෙමි.

2. රාග විරාග මනෙජ මසොකං
ධම්ම මසඞ්ඛත මප්පටිකූලං
මධුරමිමං පගුණං සුවිභත්ථං
ධම්ම මිමං සරණත්ථමුපෙමි.

3. යත්ථච දින්න මහප්ඵල මාහු
චතුසු සුචිසු පුරිස යුගෙසු
අට්ඨච පුග්ගල ධම්ම දසා තෙ
සඞ්ඝමිමං සරණත්ථමුපෙමි.

**ii. මේ ගථාතුනේ භාවය**

1. මනුෂ්‍යයන් අතුරෙහි ධර්ම කථනය කරන්නවුන්ට ශ්‍රේෂ්ඨවූ ශාක්‍ය මුනි වූ භාග්‍යවත් වූ සියලු බුද්ධ කෘත්‍යයන්ම අවසාන කළාවූ දශවිධ කාය බලයෙන් හා සිව් වැදෑරුම් වීර්‍ය්‍යයෙන්ද යුක්තවූ යම්

සර්වඥවරයෙක් තෙම සංසාර සාගරය තරණයකොට නිර්වාණපුර ප්‍රවේශ වූයේද ඒ මහෝත්තමයන් වහන්සේ (මම) සරණකොට යමි.

2. රාගයෙන් ඇලීම නොකරන්නාවූ මාර්ගයද තෘෂ්ණාවෙන් වෙන්වූ ඵලයද නිර්මිත නොකරණ ලද නිර්වාණයද මනාකොට බෙදන ලද පර්ය්‍යාප්තියද යන මේ ලොව් ලොවුතුරා ධර්මය (මම) සරණකොට යමි.

3. 'යම් සඞ්ඝ රත්නයක් කෙරෙහි දනය කරන ලද්ද මහත් ඵලය'යි වදළාහුද, පිරිසිදු වූ පුරුෂ යුග වශයෙන් සතරක් වූ චතුස්සත්‍යය අවබොධ කළාවූ ඒ අෂ්ටාර්ය්‍ය පුද්ගල මහා සඞ්ඝරත්නය (මම) සරණ කොට යමි.

### 10. අනුශාසනා

**i. පූර්වාහ්න ප්‍රතිපත්ති**

උදය හිරු උද වීමට පළමු නැඟිට මුව දෝවනාදිය කිරීමෙන් පවිත්‍රව පූජනීය ස්ථානයකට ගොස් මල් පහන් පුද එසේ

නැතහොත් කාය වාග් මනඃ යන ත්‍රිවිධ ද්වාරයෙන් බුඩාදි රත්නත්‍රයට නමස්කාර කොට තුනුරුවන් සරණ සහිත පඤ්ච සීලය ගෙන නැවත ''ඉතිපි සො භගවා'' යනාදි නව ගුණ පාඨය අර්ථ සහිතව මෙනෙහි කිරීමෙන් හැකි පමණ වේලාවක් බුඩානුස්මෘති භාවනා කොට ඉක්බිතිව තමන් කටයුතු කර්මාන්තාදියෙහි නියුක්ත විය යුතුයි.

## ii. සන්ධ්‍යා කාල ප්‍රතිපත්ති

සවස බුදුන් වැඳ මල් පහන් පුද ආහාර අනුභව කොට නිමවා නිද්‍රාව පිණිස පැමිණි කල උදය මෙන් සරණ ශීලයෙහි පිහිටා ඉක්බිති බුඩානුස්මෘති භාවනාව හෝ මෙහි භාවනා කාණ්ඩයෙහි ප්‍රකාශිත වෙන යම් භාවනාවක් හෝ සිහි කොට නිඳ ගත යුතුයි. මෙය හේතු කොටගෙන සිත එකඟ වීමෙන් රෑ නිදි වැළකීම සහ දුඃස්වප්න දර්ශනාදියෙන් වන උපද්‍රව ද දුරිභූත වෙයි.

**iii. විහාරස්ථානාදියට පැමිණීම**

විහාරස්ථානවලට යන්නන් විසින් එහි පැමිණෙන ස්ත්‍රී පුරුෂාදීන්ගේ ලීලා ආදිය බැලීම පිණිස හෝ ක්‍රීඩා දර්ශනාදිය පිණිස හෝ එහි නො යා යුතුයි. මෙබඳු කල්පනා මුල් කොට යන අයට පව් සිදුවනු නිසැක බැවින් හුදෙක් කුසල් කරණයෙහි නියැලිව එහි පැමිණිය යුතු වේ. සෙරෙප්පු සපත්තු ආදි වහන් ලාද, තොප්පි ආදි හිස්වැසුම් ලාගෙන ද, කුඩ ඉසලා ගෙනද, උභයාංශ පාරුපනයෙන් හෙවත් දෙවුර වසා පොරවා ගෙනද විහාරස්ථානවලට එළඹීමෙන් බුඬ ගෞරවයට බාධා වන බැවින් එසේ නො කට යුතුයි.

**iv. වන්දනා පිළිවෙළ හා ධාතු විභාගය**

විහාරස්ථානයකට පැමිණි කල එහි භික්ෂූන් වහන්සේලා ඇත් නම් තිසරණ සහිත පඤ්චශීලය සමාදන්වී, නැතහොත් තනිවම හෝ සරණ ශීලයෙහි යෙදී ඉන් පසු වැඳීම් පිදීම් ආදිය කිරීම යහපති.

වන්‍දනා කිරිමේදී පළමුකොට ශාරීරික ධාතූන්ට, එනම්:- සර්‍වඥයන් වහන්සේගේ ශ්‍රී ශරීරයට අයත් උණ්හිසශීෂ ධාතුව ද, දඨා ධාතු සතරනම ද, දකුණු වම් අකුධාතු දෙනම ද යන සර්‍වඥ ධාතු සත්නම සහ මුං පියලි කඩසාල් අබ යන තුන් ප්‍රමාණයට ඇති නැලි දහසයක් පමණ වූ අවශේෂ ධාතු පිහිටුවා තිබෙන චෛත්‍යාදීන්ට නමස්කාර කට යුතුයි.

දෙවනුව පාරිභෝගික චෛත්‍යයන්ට, එනම්:- දඹදිව ජය මහා බොධීන් වහන්සේද ඒ බොධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාව වූ, අනුරාධපුර පිහිටි ශ්‍රී මහා බෝධීන් වහන්සේද, ඒ බොධීන් වහන්සේගෙන් පැවතෙන අෂ්ට මහා ඵල දෙතිස් මහාඵල යන ඵලරුහ බෝධීන් වහන්සේලාද, (අෂ්ට මහා ඵලයන්ට අයත් බෝධීන් වහන්සේලා පිහිටි සථාන නම්:- ජම්බුකෝල හෙවත් දඹකොළ පටුනෙහිද, චක්ක නම් බමුණු ගමෙහිද, ථූපාරාම චෛත්‍යසථානයෙහිද, අනුරාධපුර පිහිටි ඉසුරුමුනි විහාරයෙහිද,

මහියඞ්ගන චෛත්‍ය ස්ථානයෙහි ද, මිහින්තලේ ද, රුහුණු රට කතරගමෙහි සහ එහිම වඩුන ග්‍රාමයෙහිත් ය. අනිකුදු දෙතිස් මහ ඵලයන්ට අයත් බෝධීන් වහන්සේලා දෙතිස සතර ගවුවෙන් සතර ගවුව විහාරවල රෝපනය කරන ලද බව ප්‍රකාශිතයි.) සර්වඥයන් වහන්සේ පරිභෝග කළ පාත්‍රය සිවුර ආදි ෂෝඩශ විධ පරිෂ්කාර ද, සර්වඥයන් වහන්සේගේ සිරිපතුල් ලකුණු පිහිටි ශ්‍රී පාදස්ථානය ද, යන පාරිභෝගික චෛත්‍යයන්ට නමස්කාර කළ යුතුයි.

තුන්වැනි ව:– සර්වඥයන් වහන්සේගේ රූපාකාරය දක්වන සිතියම් සහ බැඳීම් වශයෙන් කරනලද උද්දේසික චෛත්‍යවන ප්‍රතිමා වහන්සේලාට නමස්කාර කටයුතුයි.

වැඳීමේ ක්‍රම සතර ප්‍රකාර වේ. දණින් ඉඳ හිස නමා දෙහොත් මුදුන් දී වැඳීම ''උක්කුටුක'' නම් වේ. හිටගන හිස නමා වැඳීම ''අංජලි නමස්කාරය''නම් වේ. බිම මුණින් හෙව දිගාවී වැඳීම දණ්ඩ නමස්කාර

නම් වේ. අඞ්ග පස හෙවත් අත් දෙක දණ දෙක හිස යන අවයව පස බිම පිහිටුවා කරන නමස්කාරය පසඟ පිහිටුවා වැඳීම නම් වේ.

## v. පෝය විභාග

ව්‍යවහාර වශයෙන් මාසයකට පෝය හතරක් වේ. එනම්:– අව අටවක පෝය, පුර අටවක පෝය, අමාවක හෙවත් මාසෙ පෝය, පුර පසළොස්වක පෝය යන මේ සතර ය. මේ දක්වන ලද පොහෝ දිනවලදී පමණක් අටසිල් සමාදන් වීම පුරුද්දක් වශයෙන් පැවැති නුමුත් පෙර පසු ගමන් වශයෙන් උපොසථ දින අටක් ජාතක අටුවාහි ප්‍රකාශිතයි. එනම් ඉහත දැක්වූ පොහො දවස් හා අවපුර දෙපක්ෂ සම්බන්ධවූ විසේනිය පෝය දෙදවස සහ තුදුස්වක පෝය දෙදිනත් ය.

එහි පිළිවෙළ මෙසේයි:–

1. අව අටවක පෝය
2. අව විසේනිය පෝය
3. අමාවක (මාසෙ) පෝය

4. පුර අටවක පෝය
5. පුර විසේනිය පෝය
6. පුර තුදුස්වක ”
7. පසළොස්වක ”
8. අව තුදුස්වක ”

මෙකී දිනවලදී අෂ්ටාංග ශීලය සමාදන් වීම යෙහෙකි.

## vi. පටිජාගරණ උපොසථය

තුදුස්වක හා අමාවක ද සිල්රැකිය යුතු පොහො දෙකක් සෙයින් එයට පෙර පසු ගමන් වශයෙන් අව තෙළෙස්වක දින පටන් පුර පැලවිය දක්වා උපොසථශීල සංරක්ෂණයෙහි නියුක්තවීම “පටිජාගරණ උපොසථය” නම් වේ. පුර පක්ෂයට ද මෙ නයින් දතයුතුයි.

## vii. ප්‍රාතිහාර්‍ය්‍යපක්ෂ උපොසථය

වස් එළඹෙන දින අටසිල් සමාදන්ව ඒ තුන් මාසය තුළ අඛණ්ඩව ශීලයෙහි පිහිටා වස් පවාරණ දින සිල් මිදීම ද, එසේ නොහැකි නම් වප්මස පසළොස්වක

පටන් ඉල්මස පුර පසළොස්වක දක්වා නොකඩව ශීලයෙහි පිහිටීම ද, එසේත් නොහැකි නම් පෝවස විසුවන්ගේ පවාරණ දින පටන් පසළොස් දවසක් අටසිල් සමාදන්ව විසීම ද,' ප්‍රාතිහාර්‍ය්‍යපක්ෂ උපොසථය' නම්වේ. තවද යමෙක් යම් දවසක අටසිල් රකිනු කැමැත්තේ නම් එ දින ඔහට පොහොය දින වන බව දත යුතු ය.

## 11. ශීල විභාගය

ශීලය යනු හික්මීම යනාර්ථයි. ඒ ශීලය පඤ්චශීලය, අෂ්ටාඞ්ගශීලය, දශශීලය යයි තුන් ප්‍රකාරයක් වේ. මින් පඤ්චශීලය සහ දශශීලයත් නිත්‍ය ශීලයෝ යි. අෂ්ටාඞ්ග ශීලය වනාහි මෙහි මුලින් පෝය විභාග දක්වන ලද පරිදි පොහෝ දවස්වලදී රක්ක යුත්තේ යි.

පුරාණයෙහි කොසඹෑ නගරයෙහි විසූ කොසඹෑ රජහුගේ වෙස්සමිත්තා නම් ඇමෙණි කෙනෙක් වූවා ය. ඕ තොමෝ බුදුහු සරණ ගියා ය. නිත්‍ය පඤ්චශීලය

රකින්නීය. එක් දිනක් රජහට යුඬයක් පැමිණ චතුරඞ්ගණී සේනාව පිරිවරා යුඬය පිණිස යැමට සූදනම් වූ කල වෙස්ස-මිත්තාව ද ඒ හා යන්ට නික්මුණා ය. දූරි ඇති වූ ඇගේ යැම වැලැක්විමට රජතෙමේ අනේක වෑයම් කරත් කරත් නොහැකි-වූයෙන් ඈ හා කැටිව යනුයේ සංග්‍රාම භූමිය සමීප වූ කල මින් ඔබ්බට නොයා යුතුයයි සම්මත කොට දේවිය එහි නවතා ඉදින් මට මේ යුඬයෙන් පරාජයක් වී නම් රත් පතාකයක් ඔසවමැයි ඒ සලකුණින් තී පලා යවයි කියා රජ තෙම රණ භූමියට පැමිණි-යේය. යුඬයෙන් පරාජයට පත් රජතෙමේ තම දේවිය සිහි වී රත් පතාකයක් නංවා ඒ රණ දෙරණෙහි හොත්තේ ය.

මේ බව දැනගත් දේවී තොමෝ අඬමින් විලාප බෙණෙමින් යනාතර සතුරු රජහුගේ දූත පුරුෂයන් විසින් අල්වන ලදුව සවකීය රජහට ගොස් භාර කෙළේ ය. රජ තෙමේ ඇගේ රූප ශ්‍රී දැක දර්ශන සංසර්ගයෙන් බැඳී ඔවුන් කෙරේ පිළිබඳ සිත් ඇති ව සරණ

පාවා ගැනීමට කථා කළ නුමුත් ඒ ගැන නොසතුට ප්‍රකාශ කළ දේවිය ගින්නෙහි ලා මැරීමට වධකයන්ට විධාන කෙළේය. ඔව්හු කිහිරිදර ගොඩක් ගසා ගිනි අවුලා එහි ලා මැරීමට දේවිය කැඳවා යාමට ආරම්භ කළ විට ඕතොමෝ මෙසේ යාඥා කරන්නට වන්නී ය.

පුරාතනයෙහි භූපාල
සමණෙ බ්‍රාහ්මණෙ පි ච
මාතාපිතුසු බාලෙ ච
රොගෙනාතුර ඉත්ථීසු
නප්පසත්තොවධො දෙව
තස්මාහං නවධාරහා—

භූපාලයන් වහන්ස, පුරාතනයෙහි රජ දරුවන් විසින් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ය, මව්පිය දෙදෙනා ය, ළදරුවෝ ය, රෝග ව්‍යසනයෙන් පීඩිතයෝ ය, ස්ත්‍රී ජාතීහු ය යන මොවුන් කෙරෙහි වධක චේතනාව පසස්නා ලද්දේ නො වෙයි. එබැවින් වධයට මා නො පමුණුවන්නැ යි රජුගෙන් ක්ෂමාව අයැද සිටියා ය. මේ ගැන වඩවඩා

උදහස් වූ රජ තෙමේ 'දෙ ගිනි හා වෙන කල දේවිය ඔසවා ගෙන ගොස් එහි ලව'යි සේවකයන්ට නිල කරන ලදින් ඔව්හු ද එසේ කළෝ ය. මේ ගැන කිසි පිහිටක් නැති ඕ තොමෝ 'තිසරණ ම සරණ කෙරෙමියි බුත් සරණ දම් සරණ සහ සරණ යෙමි'යි සිතමින් ගින්නෙහි වැටී හුනුවා ය.

එකල ගුගුරමින් පැතිර පවතින ඒ රෞද්‍ර වූ ගින්න දේවියට සීතල ජලාසයක් මෙන් වන. මෙය බලා සිටි රජ දේවියට කිසි උවදුරක් නුවූ බව දැක මහත්සේ චිත්ත වික්ෂේපයට පැමිණ වහා දිවගොස් දේවිය ගින්නෙන් මුදගෙන ගොස් ඇය හට වැඳ තිගේ කවර ගුණයක් නිසා ගින්නෙන් නො දැයෙහි දැයි විචාළේ ය. එකල ඕ තොමෝ තෙරුවන් ගුණ මෙසේ වර්ණනා කරන්නට වන්නී ය.

අගාහං බුඩං සරණං
බුඩො මෙ සරණං ඉති;
තෙන තෙජෙන මං රාජ
ජලන්තො අග්ගි නො දහී.

මහ රජාණන් වහන්ස 'මට බුදුන් සරණ යැ'යි මම සර්වඥයන් වහන්සේගේ සරණ ගියෙමි. ඒ හේතුවෙන් අග්නි තෙම උදක-යක් මෙන් සිහිල් විය. යනුවෙන් රත්නත්-ත්‍රයේ හා පඤ්ච ශීලයේත් ගුණානුස්මරණ-යෙන් නො දැ බව ප්‍රකාශ කළ විට රජ තෙමේ ද සතුටට පැමිණ මෙබඳු යහපත් ගුණ ඇති එම පඤ්ච ශීලය මටත් දෙවයි කියා තිසරණ සහිත පන්සිල් ඉල්ලාගෙන අල්ලාගත් ඒ රාජ්‍යය දේවියට පුද සිය පුරයට ම ගියේ ය.

එ බැවින් සාධු ජනයෙනි, ශීලයාගේ ආනිශංසය මෙසේ අනුභාව සම්පන්නයයි දැන එය අඛණ්ඩ කොට රක්ෂා කිරීමෙන් මෙලොවින් වන්නා වූ සියලු උපද්‍රවයෙන් මිදී මරණින් මතු ජාති ජරා මරණාදියෙන් තොර වූ නිර්වාණ පුර ප්‍රවෙශ වීමට උත්සාහ කරත්වා!

## i. උපොසථ ශීලය හෙවත් අෂ්ටාඞ්ග ශීලය

'පොහොය දවස්හි ගන්නා ශීලය' යනාර්ථයෙන් මීට උපොසථ ශීලය කියා ද, 'අඞ්ග අටකින් යුත් ශීලය' යනාර්ථයෙන් අෂ්ටාඞ්ග ශීලය කියා ද කියනු ලැබේ. ශීලය සමාදන් වනු කැමති අය විසින් පළමු කොට ඊට අයත් සිල්පද සහ ඒ දිනයෙහි භාවනා කටයුතුවූ ද, සිහිකටයුතු වූ ද, ධර්‍මයන් අර්ථ සහිත ව (කටපාඩමින්) දැන ඉගෙන ගතයුතුය. ඉන්පසු පොහෝ දිනට ප්‍රථම දවස තම තමන්ගේ කටයුතු කර්‍මාන්තාදිය නිමවා තැබීමෙන් සිත එකඟකොට ගෙන පසු දින අරුණට පළමු (හිරු උදවීමට පළමු අහසේ ඇතිවන රක්තවර්‍ණ ආලෝකයහි එළිවීමට සතර පැයක් තබා අරුණෝදය වන බව දත යුතුයි.) නැඟිට මුව දෝවන ස්නානය කිරීමාදියෙන් ශරීරය ශුඩකොට ගෙන සුදු වස්ත්‍ර හැඳ පොරවා උදයම සිල් ගැනීම පිණිස සඞ්ඝයා වහන්සේ නමක් කරා පැමිණ

''අජ්ජ ඉමඤ්ච දිවසං උපොසථං උපවසාමි, තං භගවන්තං පටිපත්තියා පූජෙස්සාමි'' යන මෙය සිහි කොට සිල් දෙන භික්ෂුවට පසඟ පිහිටුවා වැඳ ''බුඬ පඤ්ඤත්තං අට්ඨාඞ්ග සීලං සමාදියාමි''යි තුන් වරක් කියා හෝ ඊට පසු ''ඔකාස අහං භන්තෙ තිසරණෙන සහ අට්ඨඞ්ග සීලං ධම්මං යාචාමි අනුග්ගහං කත්වා සීලං දෙථ මෙ භන්තෙ - දුතියම්පි - තතියම්පි'' යනාදීන් පඤ්ච ශීලයෙහි ආ නියායෙන් තුන්වරක් කියා සිල් යාඥා කළ කල සිල් දෙන භික්ෂුව විසින් තිසරණය සහිත සිල්පද අට කියා දෙන නියායෙන් එකින් එක කියා සිල් සමාදන් විය යුතුයි.

සමහර විට ඉහත දක්වූ වාක්‍යය නො කියවා නමස්කාර පාඨය තුන් වරක් කීව පසු තිසරණ දී, සිල් ගැනීම උදය වරුවට පමණක් නම් ''අහං භන්තෙ අජ්ජ ඉමඤ්ච දිවසං'' කියා ද සවස්වරුවට පමණක් නම් ''අහංභන්තෙ අජ්ජ ඉමඤ්ච රත්තිං'' කියාද උදය සවස දෙකටම නම් ''අජ්ජ ඉමඤ්ච

දිවසං ඉමඤ්ච රත්තිං උපොසථං උපවසාමි අට්ඨාඞ්ග සමන්නාගතං සීලං සමාදියාමි'' යන පාලි පාඨ කියවා ද පහත දක්වන ශික්ෂා පද අට කියවනු ලැබේ. හේ මෙසේ යි:—

1. පාණාතිපාතා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.
2. අදින්නාදනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.
3. අබ්‍රහ්මචරියා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.
4. මුසාවාද වෙරමණී සික්ඛාපදං සමාදියාමි.
5. සුරාමේරය මජ්ජපමාදට්ඨානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.
6. විකාල භොජනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.
7. නච්ච ගීත වාදිත විසූක දස්සන මාලා ගන්ධ විලෙපන ධාරණ මණ්ඩන විභූසනට්ඨානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.
8. උච්චාසයන මහාසයනා වෙරමණී සික්ඛා පදං සමාදියාමි.

## මෙහි භාවය

1. (මම) සතුන් මැරීමෙන් වැළැක්ම වූ ශික්ෂාපදය සමාදන් වෙමි.

2. (මම) සොරකම් කිරීමෙන් වැළැක්-ම වූ ශික්ෂාපදය සමාදන් වෙමි.

3. (මම) අබ්‍රහ්මචරියයි (ක්ලේශයන් ප්‍රහීණ කළ උත්තමයන්ගේ හැසි-රීමක් නොවන බැවින් මීට අබ්‍රහ්ම-චරිය යයි කියනු ලැබේ.) කියනු ලබන මෛථුන්දමෙහි හැසිරීමෙන් හෙවත් ස්ත්‍රී සංසර්ගයෙහි යෙදීමෙන් වැළැක්ම වූ ශික්ෂාපදය සමාදන් වෙමි.

4. මම බොරු කීමෙන් වැළැක්ම වූ ශික්ෂාපදය සමාදන් වෙමි.

5. (මම) මත්පැන් (රහමෙර) පීමෙන් වැළැක්ම වූ ශික්ෂාපදය සමාදන් වෙමි.

6. (මම) විකාලභොජනයෙන් හෙවත් ඉර අවර වූවායින් පසු ආහාර අනුභව කිරීමෙන් වැලැක්ම වූ ශික්ෂාපදය සමාදන් වෙමි.
(සිල්ගත් අයට හා භික්ෂූන් වහන්සේලාට ත් සූයෙ‍ඖාදයෙහි පටන් හිරු මුදුන්වන තුරු ආහර අනුභවයට කැප වූ කාලයයි. එවක් පටන් පසුදින උදය වනතුරු ආහාර අනුභවයට යොග්‍ය නොවූ විකාල-යයි.

7. (මම) නැටීම, නැටවීම හෝ නැටුම් බැලීම, ගී කීම, කියවීම, හෝ ඇසීම (බෙර, දවුල් ආදිය) වැයීම, වැයවීම හෝ ඇසීම ද විසුළු දක්වීම හෝ බැලීම ද, මල් ගඳ විලෙවුන් දැරීම හෙවත් මල් පැළඳීම හා සුවඳ ගැල්වීම ද, (පළඳනාවන්හි) අඩු තැන් පිරීම් වශයෙන් කරන සැරසීම් හා ඡවි රාග කරන වශයෙන් සැරසීම යන මේ ආදියෙන් වැලැක්මවූ ශික්ෂාපදය සමාදන් වෙමි.

8. උස් ආසන මහ සයන යන දෙක පරිභොග කිරීමෙන් වැලැක්මවූ ශික්ෂාපදය සමාදන් වෙමි. (උස් ආසන නම් වඩු රියනකට වඩා උස ඒවා වෙයි. මහ සයන නම් සාමාන්‍ය-යෙන් ශරීරයට අධික සුව පහසු දෙන ඉතා අගනා අනර්ඝ පලස් ඇතිරිලි අතුළ යහන් ආදියයි.)

අෂ්ටාඞ්ග ශීලයෙහි යෙදී සැට පැයක් ගතවූ කල පවාරණය කරනු ලැබේ. එහෙත් අතරකදී සිල් පවාරණය කරනු කැමැත්තන් විසින් පඤ්චශීලය සමාදන්වූ කල අෂ්ටාඞ්ග සීලයෙන් මිදුණා නම් වේ.

## ii. තනිව සිල් සමාදන් වන ක්‍රමය

සිල්දෙන්නට සුදුසු භික්ෂු නමක් නො ලැබිණි නම් තමා ම විවේක ස්ථානයකට එළඹ තිසරණ ගුණ මෙනෙහි කොට වඳනා කටයුතු ධාතු ප්‍රතිමාදියක් ඉදිරිපිට හෝ චෛත්‍යාදියක් පිහිටි දිසාවකට හෝ පසඟ පිහිටුවා වැඳ පළමුකොට නමස්කාරය කියා

තිසරණ ගෙන නැවත සිල්පද අට කීමෙන් සමාදන් වෙනු. මෙහි දී වාක්‍ය කීම අභිමත නො වේ. සිල්පද කට පාඩම් වශයෙන් නොදත් අය ''මම අද සර්වඥයන් වහන්සේ විසින් නියම කරන ලද අෂ්ටාඞ්ග ශීලයෙහි නියුක්ත වෙමි''යි කියා අධිෂ්ඨාන කිරීම් වශයෙන් ද සමාදන් විය හැකි වේ.

## අටසිල් ගත් අය විසින් හැසිරිය යුතු අන්දම

අන්‍යයන්හට හිංසා පීඩා වන යමක් කිරීමෙන් හෝ කරවීමෙන් හෝ දුරුවිය යුතුයි. සර්වඥයන් වහන්සේ විසින් උපාසක වරුනට හා භික්ෂූන් වහන්සේලාටත් කිරීමට එපා කැර වදළ දෙතිස් කථාවෙන් හා විපරීත මිථ්‍යා කල්පනාවලින් ද දුරුවිය යුතු යි. මෛථුන චේතනාවෙන් ද, ඊර්ෂ්‍යා ක්‍රෝධ මායා සාඨෙය්‍ය ස්තම්භ මාන ඡන්දකාම විතර්කාදි සිත් කිලුටු කරන පාප චේතනාවලින් ද දුරුවිය යුතු යි. තම තමන්ගේ රැකී රක්ෂාදිය ගැන හෝ ගෙවල

වියදම් ගණන් හිලවු ආදිය බැලීම පිණිස හෝ ව්‍යපෘත නොවිය යුතුයි. ඉඳුරන් දමනය කළ ශීල සම්පන්න භික්ෂුවක් මෙන් ආහාර ගෙන නිමවා විවේක ඇත්නම් තමන්ගේ ගෘහයෙහි හෝ විහාරස්ථාන-යකට එළඹ හෝ භාවනා කිරීමෙන් හා ධර්‍ම ශ්‍රවණය කිරීමෙන් ද දවස ගත කළ යුතුයි.

## තහනම් වූ දෙතිස් කථා

1 රජුන් සම්බන්ධ කථා, 2 හොරුන් සම්බන්ධ කථා, 3 මහාමාත්‍යාදීන් පිළිබඳ කථා,4 සමූහයා පිළිබඳ කථා,5 අනෙක භය පිළිබඳ කථා, 6 සංග්‍රාම හෙවත් යුද්ධ පිළිබඳ කථා, 7 ආහාර වශයෙන් ගනු ලබන ද්‍රව්‍ය සම්බන්ධ කථා, 8 පාන වර්‍ග සම්බන්ධ කථා, 9 රෙදිපිළි සම්බන්ධ කථා, 10 මල් මාලාදිය පිළිබඳ කථා, 11 සුගන්ධාදිය ගැන කරන කථා, 12 නෑයන් සම්බන්ධ කථා, 13 දෝළා පල්ලැක්කි ආදී යානාවන් සම්බන්ධ කථා, 14 ග්‍රාමයන් පිළිබඳ කථා, 15 විශාල ගම් පිළිබඳ කථා, 16 නගරවල් සම්බන්ධ කථා,

17 දනවු හෙවත් ප්‍රදේශ පිළිබඳ කථා, 18 ස්ත්‍රීන් සම්බන්ධ කථා, 19 සූරකථා හෙවත් යොධයන් පිළිබඳ කථා, 20 මත්-පැන් සම්බන්ධ කථා, 21 වීදි සම්බන්ධ කථා, 22 කුම්භට්ඨාන කථා, එනම් දිය ගෙන යාමට පැමිණෙන ස්ත්‍රීන් සම්බන්ධ පැන්තොට උපදින කථා, 23 පුබ්බ පෙත හෙවත් මළ නෑයන් පිළිබඳ කථා, 24 නානාත්ථ කථා, එනම් දෙතිස් කථාවෙන් පිට නානා ප්‍රකාර නිරර්ථක කථා, 25 ලොකක්ඛායි කථා, එනම් අසවලා විසින් ලෝකය මවන ලදැයි යනාදි වශයෙන් ලෝකයෙහි ව්‍යවහාර විතණ්ඩවාද මිථ්‍යා කථා, 26 සමුක්ඛායි කථා, එනම් සමුද්‍රය පිළිබඳ නිෂ්ප්‍රයෝජන කථා, 27 ශාස්වත දෘෂ්ටි කථා හෙවත් ආත්මය හා ලෝකයත් නිත්‍ය ය සදකාලික ය පෙරළෙන සුලු නොවන්නේ ය යනාදි වශයෙන් කරන කථා, (මේ මතය මිථ්‍යා දෘෂ්ටිය බැවින් නොපිළිගත යුතුයයි යනාදි වශයෙන් කීම නෛයර්‍යාණිකයි.) 28 උච්ඡෙද කථා, එනම් මරණින් පසු නැවත ඉපැදීමක්

නොමැති යයි කරන කථා, 29 වෘර්ධිකථා එනම් අසවලා රූප ශොභාවෙන් හා ධන-යෙන් ද වැඩෙන්නේ යයි කරන කථා, 30 හානි කථා එනම්, අසවලාගේ ධනය හීන භාවයට පැමිණියේ ය යනාදි වශයෙන් කරන කථා (මෙය අනිත්‍යයයි ප්‍රකාශ කිරීම් වශයෙන් නම් කීම යුතුයි.) 31 පඤ්චකාම සම්පත්තියෙහි ලොල් බව අභවා කරන කථා (පඤ්චකාම සම්පත්තිය නම් රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන මේ පසයි.) 32 ශරීරයට තද දුක් පැමිණ වීමෙන් නිවන ලැබිය හැක්කේ යයි කරන කථා යන මොවුහු දෙතිස් කථාවෝ වෙත්.

## උපක්ලෙශ ධර්ම හෙවත් සිල්හොරු

1. සීලස්ස ථෙය්‍යා චතුත්තිංස යොධා
   කොධා පලාසො අතිමාන-මායා
   සාඨෙය්‍ය ඉස්සා උපනාහ-ථම්භො
   සාරම්භ-මානො ච අසම්පජඤ්ඤං

2. මච්ඡෙර-කොසජ්ජ-මදෙ පමාදෙ
මුට්ඨස්සති දුබ්බචතා දුපඤ්ඤා
දුම්මිත්තවා අහිරි කුදිට්ඨී
අස්සද්ධතා නින්ද්‍රියසංවරො ච

3. අසන්තුට්ඨිතා සඳරතා මහිච්ඡො
අනොත්තප්තා ඉත්ථිමහිණ්හදස්සනං
සංසට්ඨචාරොසික්ඛා-අගරුං අමත්තං
මොක්ඛක්ඛමො ජාගරියානා යොගො

### මෙහි භාවය

1. ක්‍රොධය, 2. බඩ වෛරය හෙවත් ක්‍රොධයෙන් පෙළෙන බව ය, 3. අභිමානය ය, 4. මායාව ය, 5. කෛරාටික බව ය, 6. ඊර්ෂ්‍යාව ය, 7. එකකට එකක් වැඩියෙන් කිරීමය, 8. චිත්තයාගේ දැඩි බවය, 9. අවවාදයට නොනැමෙන තද ගතිය ය, 10. මාන සහගත බව ය, 11. සිහිමුළා බව ය, 12. මසුරු බව ය, 13. කොතුහල බව ය, 14. සත්විසි මදය ය, 15. පමාදය ය, 16. මුඛ බව ය, 17. දුච්ච බව ය,

හෙවත් අකීකරු බව ය, 18. දුර්බුද්ධිය හෙවත් නපුර කල්පනා ඇති බව ය, 19. පාප මිත්‍ර සෙවනය ය, 20. නිර්ලජ්ජා බව ය, 21. මිථ්‍යා දෘෂ්ටි බව ය, 22. ශ්‍රද්ධා රහිත බව ය, 23. ඉන්ද්‍රිය සංවරය නැති බව ය, හෙවත් ඇස්, කන්, නාසා, ජිව්හා, කාය, මනස් යන ඉන්ද්‍රිය සය රූප, ශබ්දදි ඒ ඒ අරමුණුවලට ගැටී ලොභ, ද්වේෂාදිය ඉපැදීමට අවකාශ දෙන බව ය, 24. නොසතුටු බව ය, 25. දුක් සහිත බව ය, 26. බලවත් ආසා ඇති බව ය, 27. පාපයට භය නැති බව ය, 28. පව් කිරීමට ලජ්ජා නැති බව ය, 29. නිතර ස්ත්‍රීන් දකිනු කැමති බව ය, 30. නානාප්‍රකාර දේ කරන්නවුන් හා ඇවිදිනු කැමති බව ය, 31. ශික්ෂා-වන්හි සැලකිලි නැති බව ය, 32. යමක ප්‍රමාණය නොදත් බව ය, 33. නිර්වාණය ලැබීමට නොකැමැති බව ය, 34. නිදිවර්ජිත නොකිරීම ය, යන මේ යෝධයෝ (බලවත්හු) සුතිස් දෙන සිල්හොරු හෙවත් උපක්ලේශ ධර්මයෝ ය.

සිල්සමාදන් වූ අය විසින් මෙහි ඉහත සඳහන් වූ උපක්ලේශ ධර්මයන්ගෙන් වෙන්ව ධර්ම ශ්‍රවණය කිරීම වැඳීම පිදීම ආදිවූ පුණ්‍ය ක්‍රියාවෙන් කාලාතික්‍රමණය කළ යුතුයි.

## අටසිල් සමාදන් වූ අය විසින් සිහි කටයුතු ධර්ම

1. රහතුන් වහන්සේලා ජීවිතාවසානය දක්වා ප්‍රාණඝාත යයි කියනු ලබන පරපණ වැනසීමෙන් විශෙෂයෙන්ම වැළකුණාහ. සත්ත්ව හිංසාව පිණිස තනනු ලැබූ දඬු මුගුරු ආදි ආයුධ කිසිවක් කිසි ලෙසකින් කවර කලකෙවත් නොගැනීමෙන් බහා තබන ලද දණ්ඩ ශාස්ත්‍රයන් ඇත්තාහුය; සකල ප්‍රාණීන් කෙරෙහි දයානුකම්පා සහිතව වසන්නෝය. එබැවින් මමද අද මේ රය සහ දවාලත් යථෝක්ත උත්තමයන් වහන්සේලාට අනුව ප්‍රාණඝාතයෙන් වැළකී සිටිමි.

2. රහතුන් වහන්සේලා ජීවිතාවසානය දක්වා සොර සිතින් ගැන්ම වූ අදත්තාදන-යෙන් විශෙෂයෙන්ම වැළැක්කාහුය. දුන්

දෙයට පමණක් කැමතිව පිළිගන්නා සවභාව ඇත්තාහුය. මමද අද මේ රැය සහ දවාලත් යථොක්ත උතුමාණන් වහන්සේලාට අනුව අදත්තාදනයෙන් වැළකී සිටිමි.

3. රහතුන් වහන්සේලා ජීවිතාවසානය දක්වා ග්‍රාම්‍යධර්මය හෙවත් මෛථුනසෙවනයයි කියනු ලබන නින්දිත හැසිරීමෙන් වියුක්තව බ්‍රහ්මචාරිව වාසය කරන්නාහුය. මම ද අද මේ රැය සහ දවාලත් යථොක්ත මහොත්තමයන් වහන්සේලාට අනුව මෛථුන්දම් සෙවීමෙන් වැළකී සිටිමි.

4. රහතුන් වහන්සේලා ජීවිතාවසානය දක්වා මුසාවාදයයි කියනු ලබන බොරුබස් බිණීමෙන් වියුක්තව සත්‍ය භාෂිතයෙන් යුක්ත වූවාහුය. මමද අද මේ රැය සහ දවාලත් ඒ උත්තමයාණන් වහන්සේලාට අනුව මුසාවාදයෙන් වැළකී සිටිමි.

5. රහතන් වහන්සේලා ජීවිතාන්තය දක්වා මද්‍යපානයයි කියනු ලබන මත්වීමට හා ප්‍රමාදයටත් හේතු වූ රහමෙර පානයෙන්

විශෙෂයෙන්ම වැළැක්කාහුය. මමද අද මේ රැය සහ දවාලත් ඒ උත්තමයන් වහන්සේලාට අනුව මත්පැන් බීමෙන් වැළකී සිටිමි.

6. රහතුන් වහන්සේලා ජීවිතාවසානය දක්වා විකාල භොජනයයි කියනු ලබන නොකල්හි ආහාර ගැනීමෙන් විශෙෂයෙන්ම වැළැක්කාහුය. මමද අද මේ රැය සහ දවාලත් ඒ උත්තමයාණන් වහන්සේලාට අනුව ඉර අවර වූවායින් පසු ආහාර ගැන්මෙන් වැළකී සිටින්නෙමි; හෙවත් එක්වේලේ වළඳින්නෙක් වෙමි.

7. රහතුන් වහන්සේලා ජීවිතාවසානය දක්වා නැටීම් ගී කීම් වාද්‍ය වාදනාදියෙන් හා විසුළු දැකීම් මල් ගඳවිලෙවුන් දැරීම් ආදියෙනුත් විශෙෂයෙන්ම වැළකුනෝය. මමද අද මෙ රැය සහ දවාලත් යථොක්ත උත්තමයාණන් වහන්සේලාට අනුව විපරීත ක්‍රියා දර්ශන සංඛ්‍යාත ඒ කාරණා වලින් හා ශරීරාලඞ්කාර වශයෙන් කරුණු ලබන සැරසීම් ආදියෙනුත් වැළකී සිටිමි.

8. රහතුන් වහන්සේලා ජීවිතාවසානය දක්වා උච්චාසයන මහාසයන පරිභොග කිරීමෙන් විශේෂයෙන්ම වැළැක්කාහුය. මම ද අද මේ රැය සහ දවාලත් (මිටි රියනකින් උස් නොවන) මිටි ඇඳෙක හෝ තණ ඇතිරිලි අතුට තනන ලද සයනාසනයෙක හෝ නීච සෙයයාව කිරීමෙන් යථොක්ත රහත් මහෝත්තමයාණන් වහන්සේලාට අනුව යමින් පෙහෙවස් රක්ෂා කරමි.

## දශ ශීලය

දශ ශීලය වනාහි සාමණෙර ස්වාමීන් වහන්සේලා විසින්ම රක්ෂා කටයුත්තකි. හැකිනම් වියඹී සම්පන්න ගිහියන් විසින්ද මෙය පිළිපැදීම යෙහෙකි.

දසසිල් සමාදන් වන්නවුන් විසින් ''ඔකාස අහංභන්තෙ තිසරණෙන සහ දස සීලං ධම්මං යාචාමි'' යන වාක්‍යය කියා සිල් යාඥ කොට නැවත නමස්කාර පාඨය තුන්වරක් කියා මෙහි දක්වන සිල්පද දශය සමදන් විය යුත්තේය. හේ මෙසේයි:–

1. පාණාතිපාතා වෙරමණී සික්ඛාපදං
සමාදියාමි.

2. අදින්නාදනා වෙරමණී සික්ඛාපදං
සමාදියාමි.

3. අබ්‍රහ්මචරියා වෙරමණී සික්ඛාපදං
සමාදියාමි.

4. මුසාවාද වෙරමණී සික්ඛාපදං
සමාදියාමි.

5. සුරාමෙරය මජ්ජපමා දට්ඨානා
වෙරමණී සික්ඛාපදං සමාදියාමි.

6. විකාල භොජනා වෙරමණී සික්ඛාපදං
සමාදියාමි.

7. නච්ච ගීත වාදිත විසූක දස්සනා
වෙරමණී සික්ඛාපදං සමාදියාමි.

8. මාලා ගන්ධ විලෙපන ධාරණ මණ්-
ඩණ විභූසනට්ඨානා වෙරමණී සික්ඛා
පදං සමාදියාමි.

9. උච්චාසයන මහාසයනා වෙරමණී
සික්ඛාපදං සමාදියාමි.

10. ජාත රූප රජත පටිග්ගහණා වෙරමණී
සික්ඛාපදං සමාදියාමි.

## මෙහි භාවය

අෂ්ටාඞ්ග ශීලයෙහි සිල්පදවලට කී අර්ථ අනුව ක්‍රමයෙන් දතයුතුයි. දසවෙනි ශික්ෂාපදය වූ ''ජාත රූප රජත පටිග්ගහණා වෙරමණී සික්ඛාපදං සමාදියාමි'' යන ''(මම) රන් රිදී පිළිගැනීමෙන් වැළැක්මවූ ශික්ෂාපදය සමාදන් වෙමි'' යනුයි.

## 12. භාවනා විභාගය

### බුද්ධානුස්මෘතිය හෙවත් බුදු ගුණ මෙනෙහි කිරීම

(මීට නවගුණ පාඨය යිද කියනු ලැබේ)

ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති.

1. අරහං අරහො'ති නාමෙන
අරහං පාපං න කාරයෙ
අරහත්ත ඵලං පත්තො
අරහං නාම තෙ නමො.

2. සම්මාසම්බුද්ධ ඤාණෙන
සම්මාසම්බුද්ධ දෙසනා
සම්මාසම්බුද්ධ ලොකස්මිං
සම්මාසම්බුද්ධ තෙ නමො.

3. විජ්ජාචරණසම්පන්නො
තස්ස විජ්ජා පකාසිතා
අතීතානාගතුප්පන්නො
විජ්ජාචරණ තෙ නමො.

4. සුගතො සුගතත්තානං
සුගතො සුන්දරං පි, ච
නිබ්බාණං සුගතිං යන්ති
සුගතො නාම තෙ නමො.

5. ලොකවිදූති නාමෙන
අතීතානාගතෙ විදූ
සංසාරසත්තමොකාසො
ලොකවිදූ නාම තෙ නමො.

6. අනුත්තරො ඤාණසීලෙන
යො ලොකස්ස අනුත්තරො
අනුත්තරො පූජලොකස්මිං
තං නමස්සාමි අනුත්තරො.

7. සාරථී සාරථී දෙවො
යො ලොකස්ස සුසාරථී
සාරථී පූජ ලොකස්මිං
තං නමස්සාමි සාරථී.

8. දෙවයක්ඛමනුස්සානං
ලොකෙ අග්ගඵලං දදං
දදංතං දමයන්තානං
පුරිසාජඤ්ඤ තෙ නමො.

9. භගවා භගවා යුත්තො
භග්ගං කිලෙසවාගතො
භග්ගං සංසාරමුත්තාරො
භගවා නාම තෙ නමො.

### මෙහි භාවය

1. අරහං:– ඒ භාග්‍යවත්වූ බුදුරජ තෙමේ සියලු කෙලෙසුන් කෙරෙන් දුරුවූ බැවින් ද, රාගාදී ක්ලේශ ශත්‍රුන් නැසූ හෙයින් ද, අක්මුල් නොමැති සංසාර චක්‍රයාගේ දැවි නැසූ බැවින් ද, දිව්‍ය මනුෂ්‍යාදීන් විසින් කරණු ලබන සියලු පූජා ලැබීමට සුදුසු හෙයින්ද, රහසිනුදු පව් නොකරණ බැවින් ද අර්හත් නම් වනසේක.

2. සම්මාසම්බුද්ධො:– දුක්ඛ සත්‍යය, සමුදය සත්‍යය, නිරොධ සත්‍යය, මාර්ග-සත්‍යය යන චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්‍මය අන්‍යොපදෙශ රහිත ව ස්වයම්භූඥානයෙන් (තමාම උපදවා ගත් නුවණින්) මනා කොට දත් හෙයින් සම්මාසම්බුද්ධ නම් වන සේක.

3. විජ්ජාචරණසම්පන්නො:– විදර්ශනා ඥනය, මනොමය ඍද්ධිය, ඍද්ධිවිධ-ඥනය පූර්වේනිවෙසානුස්මෘතිඥනය, දිව්‍ය චක්ෂුරභිඃ ඥනය, ආශ්‍රවක්ෂයකර ඥනය, යන මෙ අෂ්ටවිද්‍යා ඇති හෙයින් ද, සතර සංවරශීලයෙන් යුක්ත බැවින් ද, පමණ දැන වැළදීමය, නිදි වැළකීමය, ලොකොත්-තර ශ්‍රද්ධාව ය, පාපයට පිළිකුල් වීම ය, පාපයට භය වීම ය, සකල ශාස්ත්‍රයන් හා සියලු ධර්‍මයන් ද දැකීම ය, මහත් වීර්‍යය සම්පන්න වීම ය, සිහිය සහ ප්‍රඥ ඇති වීමය, චතුර්විධ ධ්‍යාන ලාභය ය යන පස-ළොස් චරණ ධර්‍මයෙන් සමන්විත හෙයින් විජ්ජාචරණසම්පන්න නම් වන සේක.

4. සුගතො:– යහපත් ගමන් ඇති බැවින් ද, අන්‍යයන්ට හිතවැඩ කළ බැවින් ද, යහපත් වැඩ ඇති ප්‍රිය වචනයන් කල් දැන වදරන බැවින් ද, ආර්‍යමාර්ග ඥනයෙන් යහපත් නිර්වාණයට වැඩි බැවින් ද, සුගත නම් වන සේක.

5. ලොකවිදූ:— සත්ත්වව සංස්කාර අවකාශ යන ලොකයෙහි ඇති ස්වභාව පරිද්දෙන් පිරිසිඳ දත් බැවින් ලොකවිදූ නම් වන සේක.

6. අනුත්තරො:— දිව්‍ය මනුෂ්‍යාදිවූ ලෝකවල ශීල සමාධි ප්‍රඥාදියෙන් සම-කෙනකු නොමැති හෙයින් අනුත්තර නම් වන සේක.

7. පුරිසදම්මසාරථි:— අපලාල, චලොදර, මහොදර, අග්ගිසිඛ, ධූමසිඛාදි අනුභාව සම්පන්න තද රෞද්‍ර දිව්‍ය නාගයන්ද, නාලාගිරි, ධනපාලාදි හස්තීන් ද, සච්චක අම්බට්ඨ මාණවක, පොක්ඛරසාති, සොණදණ්ඩ, කූටදන්තාදි තද මිථ්‍යාදෘෂ්ටි ගත් මනුෂ්‍යයන් ද, ආලවක, සුචිලොම, ඛරරොමාදි චණ්ඩපරුෂ යක්ෂයන් ද, තමන් වහන්සේගේ ධර්මයෙන් හික්මවා සරණ ශීලයෙහි යෙදවූ බැවින් පුරිසදම්ම සාරථි නම් වන සේක.

8. සත්ථාදෙව මනුස්සානං:- දිව්‍ය මනුෂ්‍යාදීන් හික්මවිය යුතු ලෙස අනුශාසනා කරන හෙයින් ද, ගැල් නායක තෙමේ තමා කැටුව යන මනුෂ්‍යයන් චෞර කාන්තාදියෙන් එතර කොට නිරුපද්‍රව, භූමියකට පමුණුවාද, එමෙන්ම දහම් නමැති ගැලින් දෙව් මිනිස් සමූහයා ජාති ජරා මරණ නමැති මහා කාන්තාරයෙන් එතර කොට නිර්වාණ ක්ෂේම නගරයට පමුණුවන හෙයින්ද, ශාස්තෘනම් වන සේක.

බුද්ධො:- අතීතානාගත වර්තමාන යන තුන්කාලයෙහි ම දැනගත යුත්තන් ජානනය කළ බැවින්ද, අන්‍ය ගුරුපදෙශයක් නොමැතිව සියල්ල අවබෝධ කළ බැවින් ද, බුද්ධ නම් වන සේක.

9. භගවා:- රාග ද්වේෂ මොහාදි ක්ලේශ ශත්‍රූන් භග්න කරන ලද බැවින් ද, සත් තිස් බොධිපාක්ෂික ධර්‍මයන් සෙවනය භජනය පර්යුපාසනය කර වදළ බැවින් ද භගවත් නම් වන සේක.

## බුරුම දේශයෙහි පවතින බුද්ධානුස්මෘතිය හෙවත් නවගුණ මෙනෙහි කොට වැඳීම

ඉතිපිසො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණ සම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙව මනුස්සානං බුද්ධො භගවාති.

1. ඉතිපිසො භගවා අරහං, අරහං වත සො භගවා, අරහන්තං සරණං ගච්ඡාමි, අරහන්තං සිරසා නමාමි.

අරහං අරහොති නාමෙන
අරහං පාපං න කාරයෙ
අරහත්තඵලං පත්තො
අරහං නාම තෙ නමො.

2. ඉතිපි සො භගවා සම්මාසම්බුද්ධො, සම්මාසම්බුද්ධො වත සො භගවා, සම්මාසම්බුද්ධං සරණං ගච්ඡාමි, සම්මා සම්බුද්ධං සිරසා නමාමි.

සම්මාසම්බුද්ධඤාණෙන
සම්මාසම්බුද්ධදෙසනා
සම්මාසම්බුද්ධ ලොකස්මිං
සම්මා සම්බුඩ තෙ නමො.

3. ඉතිපි සො භගවා විජ්ජාචරණසම්පන්නො, විජ්ජාචරණසම්පන්නො වත සො භගවා, විජ්ජාචරණසම්පන්නං සරණං ගච්ඡාමි, විජ්ජාචරණසම්පන්නං සිරසා නමාමි.

විජ්ජාචරණසම්පන්නො
අට්ඨවිජ්ජා පකාසිතා
අතීතානාගතුප්පන්නො
විජ්ජාචරණ තෙ නමො

4. ඉතිපි සො භගවා සුගතො, සුගතො වත සො භගවා, සුගතං සරණං ගච්ඡාමි, සුගතං සිරසා නමාමි.

සුගතො සුගතත්තානං
සුගතො සුන්දරංපි ච
නිබ්බාණං සුගතිං යන්ති
සුගතො නාම තෙ නමො.

5. ඉතිපි සො භගවා ලෝකවිදූ, ලොකවිදූවත සො භගවා, ලොකවිදූ සරණං ගච්ඡාමි, ලොකවිදූං සිරසා නමාමි.

ලොකවිදූති නාමෙන
අතීතානාගතෙ විදූ
සංසාරසත්තමොකාසෙ
ලොකවිදූ නාම තෙ නමො.

6. ඉතිපි සො භගවා අනුත්තරො, අනුත්තරො වත සො භගවා, අනුත්තරං සරණං ගච්ඡාමි, අනුත්තරං සිරසා නමාමි.

අනුත්තරො ඤාණසීලෙන
යො ලොකස්ස අනුත්තරො
අනුත්තරො පූජලොකස්මිං
තං නමස්සාමි අනුත්තරො.

7. ඉතිපි සො භගවා පුරිසදම්මසාරථී, පුරිසදම්මසාරථී වත සො භගවා, පුරිසදම්ම-සාරථිං සරණං ගච්ඡාමි, පුරිසදම්මසාරථිං සිරසා නමාමි.

සාරථී සාරථී දෙවො
යො ලොකස්ස සුසාරථී
සාරථී පූජලොකස්මිං
තං නමස්සාමි සාරථිං.

8. ඉතිපි සො භගවා සත්ථා දෙවමනුස්සානං, සත්ථා දෙවමනුස්සානං වත සො භගවා, සත්ථාරං දෙවමනුස්සානං සරණං ගච්ඡාමි, සත්ථාරං දෙව මනුස්සානං සිරසා නමාමි.

දෙවයක්ඛමනුස්සානං
ලොකෙ අග්ගඵලං දදං
දදන්තං දමයන්තානං
පුරිසාජඤ්ඤ තෙ නමො.

9. ඉතිපි සො භගවා, භගවා වත සො භගවා, භගවන්තං සරණං ගච්ඡාමි, භගවන්තං සිරසා නමාමි.

භගවා භගවා යුත්තො
භග්ගං කිලෙසවාගතො
භග්ගං සංසාරමුත්තාරො
භගවා නාම තෙ නමො.

මෙහි භාවය බුද්ධානුස්මෘතියෙහි කී පරිදි බව දත යුතු යි.

## ධර්මානුස්මෘතිය හෙවත් ධර්මයේ ගුණ මෙනෙහි කිරීම

ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨි-කො අකාලිකො එහිපස්සිකො ඔප-නයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූ-හී ති.

### මෙහි භාවය

භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය මනා කොට වදාරන ලද්දේ ය. එය තමා විසින්ම දක්ක යුතු විපාක ඇත්තේ ය. කල් නො යවා තමාගේ පැවැත්මට අනතුරු ව දෙන විපාක ඇත්තේ ය. මේ බලවයි කියා ප්‍රකාශ කිරීමට ද සුදුසු වන්නේ ය. සියලු අධික ප්‍රඥා සම්පන්නයන් විසින් මාර්ගය භාවිත ය, ඵලය අධිගම ය, නිරොධය සාක්-ෂාත් කෘත යයි තම තමා කෙරෙහි දැනගත යුතු ය.

## සඞ්ඝානුස්මෘතිය හෙවත් සඞ්ඝයාගේ ගුණ මෙනෙහි කිරීම

සුපටිපන්නො භගවතො සාවක-සඞ්ඝො, උජුපටිපන්නො භගවතො සාවක-සඞ්ඝො, ඤායපටිපන්නො භගවතො-සාවකසඞ්ඝො, සාමීචිපටිපන්නො භග-වතො සාවකසඞ්ඝො, යදිදං චත්තාරි පුරිසයුගානි, අට්ඨ පුරිසපුග්ගලා එස භගවතො සාවකසඞ්ඝො, ආහුණෙය්‍යො පාහුණෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකර-ණීයො, අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.

### මෙහි භාවය

භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සඞ්ඝ තෙම පුරුෂ යුග වශයෙන් සතර දෙනෙක්ද, පුද්ගල වශයෙන් අට දෙනෙක් ද වෙති. ඒ ශ්‍රාවක සඞ්ඝයා මනා ව පිළිපැදුම් ඇත්-තේ ය. ඥනාන්විත ඍජු පිළිපැදුම් ඇත්තේ ය. සාමීචි ධර්ම සම්පන්න ය.

එබැවින් සිවු පසය (සිවුරු, ගිලන්පස, පිණ්ඩපාත, සෙනසුන්, යන සතර සිවු පසයයි) අමුතු මහදන් පුද පඬුරු ආදිය සහ දෙහොත් මුදුන් දී කරන නමස්කාරයට නිස්සහ. ලෝකවාසීන්ගේ පින් නමැති බීජ වාපනයට යොග්‍ය වූ උත්තම පුණ්‍ය ක්ෂේත්‍රයක් ය.

## බුදුගුණ සත්නය

ඉතිපි සො භගවා අරහං සම්මා සම්බුද්ධො විජ්ජාචරණ සම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිස දම්ම සාරථී සත්ථා දෙව මනුස්සානං බුද්ධො භගවා.

සො භගවා; ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ, ඉතිපි; (මෙසේ මනුෂ්‍ය දිව්‍ය බ්‍රහ්ම යන ත්‍රිවිධ ලොකවාසීන්ගේ පූජා විශෙෂ පිළිගැන්මට සුදුසු වූ ශීල සමාධි ප්‍රඥා විමුක්ති ඥාන දර්ශන සංඛ්‍යාත අචින්තනීය අප්‍රමෙය්‍ය ගුණස්කන්ධයන් ගෙන් සමන්වාගත වූ හෙයින් ද) අරහං; අර්හත් නම් වන සේක.

සො භගවා, ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ, ඉතිපි; මෙසේ (පඤ්චවිධඥෙය මණ්ඩලය හා චතුස්සත්‍ය ධර්මයන් ඇතුළු සකල ධර්ම සමූහය පරොපදෙශ රහිත ව තෙමේ ම අනාවරණ ස්වයම්භූඥානයෙන් මනා ව අවබොධ කොට ගෙන වදළ හෙයින් ද), සම්මාසම්බුද්ධො; සම්‍යක් සම්බුද්ධ වන සේක.

සො භගවා; ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ; ඉතිපි, මෙසේ (අෂ්ටවිද්‍යාවෙන් හා පසළොස්චරණ ධර්මයන්ගෙන් ද සමන්වාගතවූ හෙයිනුත්); විජ්ජාචරණසම්පන්නො, විද්‍යාචරණසම්පන්න නම් වන සේක.

සො භගවා, ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ; ඉතිපි, මෙසේ (ශාස්වතොච්ඡෙද දෘෂ්ටි සංඛ්‍යාත ලාමක අන්තද්වයයට නොබැස මධ්‍යම ප්‍රතිපද අෂ්ටාඞ්ගික මාර්ගයෙන් පරම සුන්දර අමෘත මහා නිර්වාණ අභයපුරයට පැමිණ වදළ හෙයින් ද); සුගතො, සුගත නම් වන සේක.

සො භගවා, ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ; ඉතිපි, මෙසේ (කාමරූපාරූප යන ලොකත්‍රය පරමාණු ප්‍රමාණ සංස්කාරයකුදු නො හැර නිරවශෙෂයෙන් දන වදළ හෙයින් ද); ලොකවිදූ, ලොකවිදූ නම් වන සේක.

සො භගවා, ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ, ඉතිපි; මෙසේ (ජාතිමාන, පුණ්‍ය මාන, බලමාන, ප්‍රඥමාන, ගුණමාන, සමෘද්ධි මානාදී අනෙක විධ මානයෙන් උඩඟු වූ නන්දෙපනන්‍ද, අඞ්ගුලිමාල, සච්චක, බකබ්‍රහ්මාදි එඩිතර පුරුෂයන් දමනය කොට හික්මවාලීමෙහි තමන් වහන්සේට වඩා වැඩි කෙනකු නැති හෙයින් ද); අනුත්තරො පුරිස දම්ම සාරථී, අනුත්ර වූ පුරිසදම්මසාරථී නම් වන සේක.

සො භගවා, ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ; ඉතිපි, මෙසේ (දෙව් මිනිස් සහිත අනේවාදහස් ලෝකවාසීන්හට තිවග සම්පත් පිණිස අනුශාසනා කරන හෙයින්ද) සත්ථා දෙවමනුස්සානං, දිව්‍ය මනුෂ්‍යයන්ට ශාස්තෘ නම් වන සේක.

සො භගවා, ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ; ඉතිපි; මෙසේ (චතුවසත්‍ය ධර්ම-යන් වෛනෙය ජනයන්හට අනුබොධ ප්‍රතිවෙධ වශයෙන් අවබොධ කරවා වදාළ හෙයින් ද); බුද්ධො, බුද්ධ නම් වන සේක.

සො භගවා, ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ; ඉතිපි; මෙසේ (අනන්ත පුණ්‍ය, අනන්ත ඍද්ධි, අනන්ත ඥාන, අනන්ත තෙජො බල පරාක්‍රමයන්ගෙන් සමන්වා-ගතව සකල ලොක වාසීන් විසින් පාෂාණච්ඡත්‍රයක් මෙන් ගරු කටයුතු වූ හෙයින් ද); භගවා, භාග්‍යවත් නම් වන සේක.

තං භගවන්තං, ඒ (අරහං ආදි නව පදයෙන් සඞ්ගෘහිතව භවාග්‍රහය දක්වා පැන නැඟි නවවිධ අසාධාරණ ගුණස්කන්ධයන් ගෙන් සමන්වාගතවූ භාග්‍යවතුන්වහන්සේ අහං, මම; වන්දමි, (දෙහොත් මුදුන්හි තබා ස්තුති වාක්‍ය පතුරුවමින්, ගුණ මෙනෙහි කොට කායාදි ත්‍රිවිධද්වාරයෙන් සකසා) වැඳ ප්‍රණාමය කෙරෙමි.

## දම් ගුණ සන්නය

ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්-ඨිකො අකාලිකො එහිපස්සිකො ඔප නයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහීති

භගවතා, භාග්‍යවතුන් වහන්සේ විසින්; ධම්මො, සපර්‍ය්‍යාප්තික නවලොකොත්තර ශ්‍රී සද්ධර්මයතෙම; ස්වාක්ඛාතො, (මුල, මැද, අග යන තුන් තැන) මොනවට වදාරණ ලද්දේය.

සන්දිට්ඨිකො, පිළිපන්නවුන් විසින් ප්‍රත්‍යක්ෂව දැකිය හැක්කාවූ ගුණ විශෙෂ-යෙන් සමන්විත වූයේය.

අකාලිකො, පිළිපන්නවුන් විසින් කල් නො යවා (එදා එද ම) ලබාගත හැකි ගුණ විශෙෂයෙන් සමන්විත වූයේ ය. අතීතා-නාගතාදී එක්තරා කාලයකට පමණක් නොවූයේ ය.

එහිපස්සිකො, පිළිපන්නවුන් විසින් 'එව බලව' යයි පෙන්විය හැක්කාවූ ගුණ විශෙෂ-යෙන් සමන්විත වූයේ ය.

ඔපනයිකො, තම තමන්ගේ සිත්සතන්හි නිතර එළවා වැඩිය යුතු ගුණ විශෙෂයෙන් සමන්විත වූයේය.

විඤ්ඤූහි, පැනවත් සත්පුරුෂයන් විසින්; පච්චත්තං, වෙන වෙන ම සිය සතන්හි එළවා; වෙදිතබ්බො, 'අහෝ සැපය අහෝ යහපත ය'යි නිතර විඳිය යුතු දත යුතු ගුණ විශෙෂයෙන් සමන්විත වූයේ ය.

තං ධම්මං, (ස්වාක්ඛාතො ආදිකොට ඇති සවැදෑරුම් පදයෙන් සඞ්ගෘහීත ව භවාග්‍රය දක්වා පැනනැඟි ෂට්විධ අසාධාරණ ගුණ-ස්කන්ධයන් ගෙන් සමන්වාගත වූ ධර්‍ම රත්නය); අහං, මම; වන්දමි, (දෙහොත් මුදුන්හි තබා ස්තුති වාක්‍ය පතුරමින් ගුණ මෙනෙහි කොට කායාදි ත්‍රිවිධද්වාරයෙන් සකසා) වන්දන ප්‍රණාමය කෙරෙමි.

### සඟ ගුණ සන්නය

සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො,
උජුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො,
ඤායපටිපන්නො භගවතො සාවකසඞ්ඝො,

සාමීචිපටිපන්නො භගවතො සාවක-සඞ්ඝො, යදිදං චත්තාරි පුරිසයුගානි, අට්ඨපුරිස පුග්ගලා, එස භගවතො සාවක සඞ්ඝො ආහුණෙය්‍යො පාහුණෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්-තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස.

තං සංඝං අහං වන්දමි.

භගවතො, භාග්‍යවතුන් වහන්සේගේ; සාවකසඞ්ඝො, (ශීලවන්ත ඥාණවන්ත කල්‍යාණ පෘථග්ජනයා සහිත අෂ්ටායර්‍ය පුද්ගල) ශ්‍රාවක සඞ්ඝතෙම; සුපටිපන්නො, (ශීල සමාධි ප්‍රඥා සඞ්ඛ්‍යාත ත්‍රිශික්ෂා ශාසන ප්‍රතිපත්තියෙහි) මනා ව පිළිපන්සේක.

භගවතො, භාග්‍යවතුන් වහන්සේගේ; සාවකසඞ්ඝො, (ශීලවන්ත ඥානවන්ත කල්‍යාණ පෘථග්ජනයා සහිත අෂ්ටාර්‍ය පුද්ගල) ශ්‍රාවක සඞ්ඝතෙමේ; උජුපටි-පන්නො, (ශීල සමාධි ප්‍රඥා සඞ්ඛ්‍යාත ත්‍රිශික්ෂා ශාසන ප්‍රතිපත්තියෙහි) ඍජු ව පිළිපන් සේක.

භගවතො, භාග්‍යවතුන් වහන්සේගේ; සාවකසඞ්ඝො, (ශීලවන්ත ඥණවන්ත කල්‍යාණ පෘථග්ජනයා සහිත අෂ්ටාර්‍ය්‍ය පුද්ගල) ශ්‍රාවක සඞ්ඝතෙම; ඤායපටිපන්නො; (ශීල සමාධි ප්‍රඥ සඞ්ඛ්‍යාත ත්‍රිශික්ෂා ශාසන ප්‍රතිපත්තියෙහි) නිවනට යොග්‍යව පිළිපන් සේක.

භගවතො, භාග්‍යවතුන් වහන්සේගේ; සාවකසඞ්ඝො, (ශීලවන්ත ඥණවන්ත කල්‍යාණ පෘථග්ජනයා සහිත අෂ්ටාර්‍ය්‍ය පුද්ගල) ශ්‍රාවක සඞ්ඝතෙම; සාමීචිපටිපන්නො, (ශීල සමාධි ප්‍රඥ සඞ්ඛ්‍යාත ත්‍රිශික්ෂා ශාසන ප්‍රතිපත්තියෙහි) නොයෙක් ගරු බුහුමනට යොග්‍ය ව පිළිපන් සේක.

යදිදං යානි ඉමානි චත්තාරි පුරිස යුගානි; යම් මේ පුරුෂ යුග්මයෝ සතරදෙනෙක්, අත්ථි, ඇත්තාහු ද; යදිදං යෙ ඉමෙ අට්ඨ පුරිස පුග්ගලා, යම් මේ පුරුෂ පුද්ගලයෝ අටදෙනෙක්; අත්ථි, ඇත්තාහු ද; භගවතො, භාග්‍යවතුන් වහන්සේගේ; එසො සාවක,

සඞ්ඝො, පුරුෂ යුග්ම වශයෙන් සතරක් වූ පුද්ගල වශයෙන් අට දෙනෙකු වූ මේ ශ්‍රාවක සඞ්ඝ තෙම; ආහුණෙය්‍යො, (ශීල සමාධි ප්‍රඥා සඞ්ඛ්‍යාත සුවිසද මනරම් ගුණයෙන් ගුණවත්ව ආගන්තුකයන් උදෙසා පිළියෙල කරණ ලද) ප්‍රත්‍යය පිළිගැන්මට සුදුසු වූ යේ ය.

පාහුණෙය්‍යො, ශීල සමාධි ප්‍රඥා සඞ්ඛ්‍යාත සුවිසද මනරම් ගුණයෙන් ගුණවත්ව පූජා පිණිස ගෙන එන ලද ප්‍රත්‍යය පිළිගැන්මට සුදුසු වූ යේ ය.

දක්ඛිණෙය්‍යො, (ශීල සමාධි ප්‍රඥා සඞ්ඛ්‍යාත සුවිසද මනරම් ගුණයෙන් ගුණවත් ව පරලොව කම්පල අදහා දෙන ලද) ප්‍රත්‍යය පිළිගැන්මට සුදුසු වූ යේ ය.

අඤ්ජලිකරණීයො, (ශීල සමාධි ප්‍රඥා සඞ්ඛ්‍යාත සුවිසද මනරම් ගුණයෙන් ගුණවත් ව සියලු ලෝවැස්සන් විසින් දෙහොත් මුදුන්හි තබා කරන ලද) අඤ්ජලි කර්‍ම නමස්කාරයට සුදුසු වූ යේ ය.

ලොකස්ස, ලෝකයාගේ; අනුත්තරං තමහට වඩා වැඩි කෙනෙකු නැති හෙයින් අනුත්තරවූ; පුඤ්ඤක්ඛෙත්තං, පින් නමැති බිජු වපුරා ගැන්මට සාරවත් ක්ෂෙත්‍රයක් හා සදෘශ වූ යේ ය.

තං සඞ්ඝං, ඒ (සුපටිපන්න ආදි කොට ඇති වන පදයෙන් සඞ්ගෘහිත ව භවාග්‍රය දක්වා පැන නැගි නව විධ අසාධාරණ ගුණස්කන්ධයන්ගෙන් සමන්වාගත වූ; සඞ්ඝරත්නය; අහං, මම; වන්දමි, (දෙහොත් මුදුනෙහි තබා ස්තුති වාක්‍ය පතුරුවමින් ගුණ මෙනෙහි කොට කායාදි ත්‍රිවිධ ද්වාරයෙන් සකසා, ප්‍රණාමය කෙරෙමි.

යථොක්ත බුඬරත්නයෙහි ගුණනවය හා ධම් රත්නයෙහි ගුණ හය හා සඞ්ඝ රත්නයෙහි ගුණ නවයත් අරුත් අදහස් සමග සොඳින් නුගත් පුද්ගලයා රත්නත්‍රයෙහි ඥණයෙන් පහදින්නෙක් නො වේ. ඔහු තුළ ඥණය නොයෙදුනු ද්විහේතුක කුසල් මුත් ඥණය යෙදුනා වූ ත්‍රිහෙතුක කුසල්

නූපදීම ය: එහෙත් තෙරුවන් සරණ පරායණවූ සකල බෞඩ පින්වතුන් විසින්ම තුනුරුවනෙහි සූවිසි මහා ගුණයන් ප්‍රකාශ වන්නා වූ මේ ගාථා සන්න තුන හොඳින් කට පාඩම් කොටගෙන තුනුරුවන් වැඳීම කළ යුතුයි.

## තුනුරුවන් ගුණ මුදුන් පත් කිරීම

1. බුඩ ධම්මා ච පච්චෙක
   බුඩ සඞ්ඝා ච සාමිකා
   දසො වාහස්මි මෙ තෙසං
   අණං ධාතු සිරෙ සද!

2. තිසරණං තිලක්ඛණුපෙක්ඛං
   නිබ්බාණමන්තිමං සුඛං
   සුවණ්ණ සිරසා නිච්චං
   ලභාමි තිවිධා මහං,

3. තිසරණංච සිරෙ ධාතු
   සිරෙ ධාතු තිලක්ඛණං
   උපෙක්ඛා ච සිරෙ ධාතු
   නිබ්බාණං ධාතු මෙ සිරෙ!

4. බුද්ධෙ සකරුණෙ වන්‍දෙ
ධම්මෙ පච්චෙක සම්බුද්ධෙ
සඞ්ඝෙ ච සිරසා යෙව
නිධා නිච්චං නමාමහං

5. නමාමි සත්ථුනොවාද
අප්පමාද වචනන්තිමං
සබ්බෙ'පි චෙතියෙ වන්‍දෙ
උපජ්ඣාචරියෙ මමං
මය්හං පණාම තෙජෙන
චිත්තං පාපහි මුඤ්චිතං ති.

## මෛත්‍රී භාවය

1. බුද්ධ ධර්ම සඞ්ඝ යන රත්නයෝ මාගේ ස්වාමීහු වෙති. මම දාස වෙමි. උන්වහන්සේලාගේ ගුණය සඳ කල්හිම මාගේ සිරසෙහි පිහිටාවා!

2. බුද්ධ, ධර්ම, සඞ්ඝ, යන සරණ තුන ද අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ලක්ෂණත්‍රයය ද, අන්තිම සැපය වූ නිර්වාණය ද, නිත්‍යයෙන් ම වඳිමි. මාගීඵල නිර්වාණය ලබම්වා!

3. තිසරණයද, ත්‍රි ලක්ෂණයද, උපේක්ෂාව ද, නිර්වාණය ද මාගේ ම කයෙහි පිහිටා වා! හෙවත් මා හිස ඊට යටත් වේවා!

4. මහා කරුණාන්විත වූ බුදුවරයන් ද, උන්වහන්සේලා විසින් දේශිත ශ්‍රී සද්ධර්මය ද, පසේ බුදුවරයන් හා ශ්‍රාවක සමූහයා ද ත්‍රිවිධාකාරයෙන් නමස්කාර කරමි.

5. ''සියලු සංස්කාර ධර්මයෝ විනාශ වන සවභාව ඇත්තාහු ය. එහෙයින් සිහියෙන් යුක්ත ව අප්‍රමාද ව විසීමෙන් සර්ව කෘත්‍යයන්ම සම්පාදනය කරවු'' යන අප්‍රමාද පදය අන්තිම කොට ඇති ශාස්තෘන්වහන්සේගේ වචනයද සියලු චෛත්‍යයන්ද, උපාධ්‍යාය ආචාර්‍ය්‍යවරයන්ද, නමස්කාර කරමි. මේ හේතුවෙන් මා සිත පාපයන් කෙරෙන් මිදේවා!

## තුනුරුවන් සරණ යෑමේ ඵලය

1. ඒවං බුද්ධං සරන්තානං
ධම්මං සඞ්ඝංච භික්ඛවො
භයං වා ඡම්භිතත්තං වා
ලොමහංසො වා න හෙස්සති!

2. බුද්ධෙ චිත්තප්පසාදෙන
ධම්මෙ සඞ්ඝෙ ච යො නරො
කප්පානි සත සහස්සානි
දුග්ගතිං සො න ගච්ඡති.

## මෙහි භාවය

1. මහණෙනි, මෙසේ බුදුන් දහම් සඟුන් යන ත්‍රිරත්නය නිරතුරුව සිහි කරන්නා හට භයක් තැති ගැනීමක් හෝ රෝමාද්-ගමනයෙක් හෝ නොවේ.

(යක්ෂ ප්‍රෙත සිංහ ව්‍යාඝ්‍ර සොර සතුරු ආදීන්ගෙන් යම්කිසි භයක් තැති ගැනීමක් රොමොද්ගමනයෙක් වූ විට ඉහත දක්වූ ''ඉතිපි සො භගවා'' යනාදි බුඩානුස්මෘති භාවනාව සිහි කිරීමෙන් සියලු උපද්‍රව ම දුරුවේ.)

2. යම් මනුෂ්‍යයෙක් බුදු දම් සඟ යන තුනුරුවනෙහි සිත පහදද ඒ හේතුවෙන් හෙතෙම කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි දුගතියකට නොයෙයි.

## කායගතා සතිය
## හෙවත්
## පිළිකුල් භාවනාව

අත්ථි ඉමස්මිං කායෙ, 1. කෙසා, 2. ලොමා, 3. නඛා, 4. දන්තා, 5. තචො, 6. මංසං, 7. නහාරූ, 8. අට්ඨී, 9. අට්ඨිමිඤ්ජා, 10. වක්කං, 11. හදයං, 12. යකනං, 13. කිලොමකං, 14. පිහකං, 15. පප්ඵාසං, 16. අන්තං, 17. අන්තගුණං, 18. උදරියං, 19. කරීසං, 20. පිත්තං, 21. සෙම්හං, 22. පුබ්බො, 23. ලොහිත, 24. සෙදෙ, 25. මෙදෙ, 26. අස්සු, 27. වසා, 28. ඛෙළො, 29. සිඞ්ඝාණිකා, 30. ලසිකා, 31. මුත්තං, 32. මත්ථකෙ මත්ථලුඞ්ගන්ති.

## මෙහි භාවය

දෙතිස් කුණප කොට්ඨාසය නම් කවරේද යත්:– මෙ ශරීරයෙහි 1. කෙසා:– ගලවළයෙහි පටන් නළල හිම් කොට දෙකන් සිළුවෙන් උඩ හිස්කබල මත්තෙහි පිහිටියා වූ

කළු ලිහිණිය පඳුරක් බඳු පැහැ වූ සම පිට වැඩුණා වූ දෙකෙළ පනස් ලක්ෂයක් හිස-කේද, 2. ලොමා:– අතුල් පතුල් හැර සකල ශරීරයෙහි පැතිර සිටියාවූ නවානූ දහසක් රෝමයෝ ද, 3. නඛා:– ඇඟිලි අග පිහිටි කුණුමස්හි පිළිපොතු බඳුවූ විසි නිය පොත්-තෝද, 4. දන්තා:– මැටි සකෙක හිඳැවූ ලබු බිජු පෙළක් මෙන් දෙනිකටෙහි හෙවත් මුඛය තුළ දෙඇන්දෙහි පිහිටියා වූ දෙතිසක් දත් ඇටද, 5. තචො:– සකල ශරීරයෙහි මාංසය වසා සිටියාවූ සම ද, 6. මංසං:– ඇට නහර වැළඳ සිටින්නා වූ නවසීයක් මස් පිඩු ද, 7. නහාරූ:– ඇට මස් වෙළා සිටින්නා වූ නවසියයක් නහර ද, 8. අට්ඨී:– එක්සිය අසූතක් සන්ධිවලින් ගැවසුණු තුන් සියයක් ඇට ද, 9. අට්ඨි මිඤ්ජා:– ඉදීගිය වේබඩ මෙන් ඒ ඇට තුළ පුරා තිබෙන ඇට මිදුලු ද, 10. වක්කං:– එක නටුවේ හටගත් විළිකුන් අඹගෙඩි දෙකක් බඳු වූ දෙතන අතරෙහි පුරා සිටින වකුගඩුවද, 11. හදයං:– පිටිපොත්ත හළුවා වූ නෙලුම් කැකුළක් මෙන් හදවත වැතිර සිටිනා වූ

අඩ පතක් පමණ ලෙහෙයෙන් පිරුණු හෘදය මාංසය ද, 12. යකනං:– රත් කොබෝලීල පතෙක ආකාර වූ නිවුඩු පිටියෙන් තැනූ කැවුමක් සමාන කොට කැඩුවාක් මෙන් හෘදය මාංසයට දකුණු පසින් පිහිටි අක්මාව ද, 13. කිලොමකං:– හෘදය මාංසය වසා තිබෙන්නා වූ දුහුල් කඩක් වන් දළබුව ද, 14. පිහකං:– හෘදය මාංසයට වාම පාර්ශ්වයෙන් කළු වස්සකුගේ දිව මෙන් හදවත වැතිර සිටින්නා වූ බඩදිව ද 15. පප්ඵාසං:– එල්බෙන්නා වූ පිළිකුල් කටයුතු පපු කැනැත්ත ද, 16. අන්තං:– රත් දෙණෙක හොත්තා වූ ඉස වල්පත නැති හැළි ගැරඬියකු මෙන් අධොමාගීය හිමි-කොට පිහිටි එක් විසි තැනකින් නැමී පිහිටියා වූ, ස්ත්‍රීට අටවිසි රියනක් හා පුරුෂයාට දෙතිස් රියනක් හාවූ බඩවැල ද, 17. අන්තගුණං:– එම බඩවැල පා පිස්නා බිස්සක් වෙළු ලනුවක් මෙන් ඔබ මොබ යා නොදී බැඳී පවතින අතුනු බහන ද, 18, උදරියං:– පෙරහන්කඩේක

ලූ සහලක් මෙන් අනුභව කරනු ලබන සියලු ආහාරයන්ම වැද සිටිනාවූ උදර පටල- යද, 19. කරීසං:- අධොමාගීයෙන් උඩ පිටකටුව දක්වා අටඟුලක් පමණවූ පඩුමැටි පැහැය බඳු ආහාර මල හෙවත් අසූචිද, 20. පිත්තං:- අක්මා පපුව අතරෙහි මිදීගිය ගිතෙල් වැත්තක් වැටකොලූ එලයක පිරුනාක් මෙන් පිත් කොෂය පුරා සිටිනා පිතද, 21. සෙම්හං:- (උගුර දක්වා පිරිසිටි බෙලෙසුල්වූ ශ්ලේෂ්මයද, 22. පුබ්බො:- කටු කණු ආදියෙහි ගැටී කල්හි ද ගඬපොල ආදි තැන්හිද කුණු බොර මඩ වන් ලේ පැසුණු සැරවද, 23. ලොහිතං:- කෙස් ලොම් නිය දත් ආදිය හැර සකල ශරීරාභ්‍යන්තරයෙහි ඇසිරී සිටිනාවූ ඉසිරී සිටිනාවූ පැතිරී සිටිනාවූ කැටිව සිටිනාවූ ලෙහෙයද, 24. සෙදෙ:- නැවුම් වළඳෙක වක්කළ දිය පිටින් වසින්නාක් මෙන් නවානු දහසක් කේස ලෝමයන්ගේ කූප පිහිටි ස්ථානවලින් වැහෙන ඩහදියද, 25. මෙදෙ:- කසා රැදි රෙද්දක් දෙතුන් වැනි කළාක් මෙන් සම් මස් දෙකට අතුරෙහි

සිටිනාවූ මේද නම් තෙල්ද, 26. අස්සු:- ඇස්ස කපා බීපු තල් කස පැනක් වැනි පැනක් පුරා ගත්තාක් මෙන් දෙඇස් පුරා තිබෙන කඳුලුද, 27. වසා:- බතින් පෙරූ කැඳිත්තක් පිට ඉසි තෙලක් මෙන් ගිනි අවු ආදියෙන් ශරීරය උණුසුම් වූ කල්හි අතුල් පතුල් කන් නාසා දසරු ආදි තැනින් වහනය වන වුරුණු නම් තෙල්ද, 28. ඛෙළො:- ආහාරයක් ගැන අසන කල්හිද ආහාර සුගන්ධාඝ්‍රාණයෙන්ද, සනව බැඳී බිලයෙක මැඩි පෙණ මෙන් දෙකපොළයෙන් පෙණ සේ නික්මෙන්නා වූ කෙළද, 29. සිඞ්ඝාණිකා:- දෙම්නස් කල්හිද, බලවත් සේ කට දවන උෂ්ණාධික ආහාරයක් අනුභව කළ කල්හිද නැහැ සිදුරුවලින් වැගිරෙන්නාවූ ලා තල්, කසපැන් ලොඳ බඳු සොටුද, 30. ලසිකා:- සකල සන්ධිස්ථානයන්හි පිහිටියාවූ කිණිහිරි ගසෙක පහළ තැනෙකින් වැගිරෙන ලහවු බඳු බෙලසුල් සඳ මිදුලුද, 31. මුත්තං:- නමා තිබූ කුම්භයෙන් වත්කළ කරදිය මෙන් ඇතිවූ මූත්‍රද,

32. මත්ථකෙමත්ථලුඞ්ගං'ති:- හිස් මතුයෙහි කබල පුරා සිටි හිස් මුල්ද, යන මේ දෙතිස් කුණප කොට්ඨාසයක් ඇත්තේයි.

මෙ ශරීරය වනාහි මුතු, මැණික්, රන්, රිදී ආදි උතුම් වස්තුවෙකින් නිමියේ නොවෙයි. ඇට-සම්-මස්-නහර-ලෙහෙ-සෙම-සොටු-සැරව ආදි දෙතිස් කුණපයන්ගෙන් ගැවසිගත් බැවින් අසූචි පුරා පිටින් සිතියම් කරන ලද මැටි කළයකට බඳු උපමා ඇත්තේය. එබැවින් සාධුජනයෙනි. රොග භයොපද්‍රවාදි ආකරයක් බඳු මේ සිරුර අද හෙට නසීය යන ඉමක් නොමැතිව පිළිකුලට භාජනව පවතියි. මෙ ශරීරය නිසා පවත්නා සිත මුත් ආත්මයක් නොමැතියි. මේ ශරීරය හා සිතත් ඇතිව නැති වන සුළු බැවින් අනිත්‍යය. අනේක දුක්වලට හේතු බැවින් දුක්ඛය, තමා කැමති පරිද්දෙන් නොපවත්නා බැවින් අනාත්ම යයි යන මේ අනිත්‍යාදි ලක්ෂණ මෙනෙහි කිරීමෙන් සංසාර දුක් නසා මොක් පුර පැමිණීමට කල්පනා කටයුතුයි.

## කායගතා සතිය අනුලෝම ප්‍රතිලෝම වශයෙන් භාවනා කිරීම

මේ කායගතා සති භාවනාව කටවචනයෙන් හෙවත් පාඩම් කළ දෙයක් පාඩම් කියන්නාක් මෙන් කීමෙන් ද, සිතින් හෙවත් පාඩම් ඇති දෙයක් කල්පනා කරන්නාක් මෙන් ද, වර්‍ණ වශයෙන් හෙවත් ඒ ඒ කුණප කොට්ඨාශවල පාට සැලකීමෙන් ද, සටහන්වශයෙන් හෙවත් ඒ ඒ කුණපවල හැඩහුරුකම සැලකීමෙන්ද,දිශා වශයෙන් හෙවත් ඒ ඒ කුණප පිහිටි ප්‍රදේශ සැලකීමෙන් ද, (මෙම සිරුරෙහි නාභියෙන් හෙවත් පෙකනියෙන් ඉහළ කොටස ඌර්ධව භාගය, නාභියෙන් පහළ කොටස අධො භාගයයි කියා දිශා දෙකට බෙද තිබේ.) අවකාශ වශයෙන් හෙවත් ඒ ඒ කුණු කොටස් පිහිටි ඉඩම සැලකීමෙන් ද, පරිච්ඡෙද වශයෙන් හෙවත් ඒ ඒ කුණපවල ම මායිම් මේ මේවා යයි සැලකීමෙන් ද යන සප්ත ප්‍රකාරයෙන් ඉගෙන දැරිය යුතු යි.

තව ද මෙය ''තචපඤ්චකාදී'' පිළිවෙළින් අනුලොම ප්‍රතිලොම වශයෙන් ද සලකා බැලිය යුතු යි. අනුලොම නම් මුල පටන් අග දක්වා බැලීමයි. ප්‍රතිලොම නම් අග පටන් මුල දක්වා සලකා බැලීමයි. තච පඤ්චකාදි කොටස් මින් අනතුරුව දක්වමු. 1. සම යන අර්ථ ඇති ''තචො'' යන පදය පස් වැනි වූ කුණප කොටස් පස ''තච පඤ්චක'' යයි. 2. වකුගඩුව ප්‍රකාශ වන ''වක්කං'' යන පදය පස්වැනි කොට ඇති කුණප කොට්ඨාශ පස ''වක්ක පඤ්චක'' යයි. 3. පපු මස ප්‍රකාශ වන ''පප්ඵාසං'' යන පදය පස්වැනි වූ කුණප පස ''පප්ඵාස පඤ්චක'' යයි. 4. පිත ප්‍රකාශ වූ ''පිත්තං'' යන පදය පස් වැනි වූ කුණප පස ''පිත්ත පඤ්චක'' යයි. 5. කඳුළු ප්‍රකාශ වූ ''අස්සු'' යන්න සවැනි කොට ඇති කුණප සය ''අස්සුඡක්කය''යි. 6. හිස්මොළ ප්‍රකාශවූ ''මත්ථලුඞ්ග'' යන්න සවැනි කොට ඇති කුණප සය ''මත්ථලුඞ්ගඡක්කය''යි. මෙසේ මේ කොටස් සය වේ.

### අනුලෝමය

1. කෙසා ලොමා නඛා දන්තා තචො-තච පඤ්චකයයි.
2. මංසං නහාරූ අට්ඨී අට්ඨිමිඤ්ජා වක්කං-වක්ක පඤ්චකයයි.

### ප්‍රතිලෝමය

1. තචො දන්තා නඛා ලොමා කෙසා.
2. වක්කං අට්ඨිමිඤ්ජා අට්ඨී නහාරූ මංසං

තචො දන්තා නඛා ලොමා කෙසා-ඉතිරි වාත් මෙම ක්‍රමයෙන් දත යුතුයි.

### පිළිකුල් භාවනාව කිරීමට

### පහසු ක්‍රමයක්

අමතං තෙසං අපරිභුත්තං
යෙසං කායගතාසති අපරිභුත්තං
අමතං තෙසං පරිභුත්තං
යෙසං කායගතාසති පරිභුත්තං.

යමකු විසින් මතු දක්වන කෙස් ලොම් ආදි කාය කොටස් අනුව පැවති සිහිය නිතර වැඩීමෙන් පරිභොග නොකරන ලද්දේ නම් ඔහු විසින් අමෘත මහා නිර්වාණ සුඛය පරිභොග නොකරන ලද්දේ ය. යමකු විසින් ඒ කෙස් ලොම් ආදි කාය කොටස් අනුව පැවති සිහිය නිතර වැඩීමෙන් පරිභොග කරන ලද්දේ නම් ඔහු විසින් අමෘත මහා නිර්වාණ සුඛය පරිභොග කරන ලද්දේ ය.

## භාවනා ක්‍රමය

කෙසා, ලොමා, නඛා, දන්තා, තචො, මංසං, නහාරූ, අට්ඨී, අට්ඨිමිඤ්ජා, වක්කං, හදයං, යකනං, කිලොමකං, පිහකං, පප්ඵාසං, අන්තං, අන්තගුණං, උදරියං, කරීසං, පිත්තං, සෙම්හං, පුබ්බො, ලොහිතං, සෙදො, මෙදො, අස්සු, වසා, ඛෙළො, සිඞ්ඝාණිකා, ලසිකා, මුත්තං, මත්ථලුඞ්ගං.

## අනුලෝම නයෝ

මත්ථලුඞ්ගං, මුත්තං, ලසිකා, සිඞ්ඝාණිකා, ඛෙළො, වසා, අස්සු, මෙදෙ, සෙදෙ, ලොහිතං, පුබ්බො, සෙමහං, පිත්තං, කරිසං, උදරියං, අන්ත ගුණං, අන්තං, පප්ඵාසං, පිහකං, කිලොමකං, යකනං, හදයං, වක්කං, අට්ඨිමිඤ්ජා, අට්ඨි, නහාරූ, මංසං, තචො, දන්තා, නඛා, ලොමා, කෙසා.

## පතිලෝම නයයෝ

කෙස්, ලොම්, නිය, දත්, සම්, මස්, නහර, ඇට, ඇටමිදුලු, වකුගඩුව, හෘදය මාංසය, අක්මාව, දලබුව, බඩදිව, පපුමස, බඩවැල, අතුනුබහන, නොපැසුණු ආහාරය, ආහාර මල, පිතය, සෙම, සැරව, ලෙහෙ, ඩහදිය, මේද තෙල, කඳුලු, වුරුණු තෙල, කෙළ, සොටු, සඳමිදුලු, මුත්‍ර, හිස්මොළ.

## අනුලෝම නයයි

හිස්මොළ, මුත්‍ර, සඳමිදුළු, සොටු, කෙළ, වුරුණුතෙල, කඳුළු, මේද තෙල, ඩහදිය, ලෙහෙ, සැරව, සෙම, පිත, ආහාර මල,

නොපැසුණු ආහාරය, අතුනුබහන, බඩවැල, පපු මස, බඩදිව, දළබුව, අක්මාව, හෘදය මාංසය, වකුගඩුව, ඇට මිදුළු, ඇට නහර, මස්, සම්, දත්, නිය, ලොම්, කෙස්—

## ප්‍රතිලෝම නයයි

අඩා ඉමාය පටිපත්තියා නිබ්බාණ සුඛං ලභිස්සාමි - මේ කර්මස්ථාන භාවනා ප්‍රතිපත්තිය හේතුකොටගෙන ඒකාන්තයෙන් නිර්වාණ සුඛය ම (මතු) ලබම්වා!

## බුද්ධානුස්මෘති භාවනාව

1. සවාසනෙ කිලෙසෙ සො
   එකො සබ්බෙ නිඝාතිය,
   අහු සුසුද්ධ සන්තානො
   පූජානඤ්ච සද’රහො.

2. සබ්බකාල ගතෙ ධම්මෙ
   සබ්බෙ සම්මාසයං මුනි,
   සබ්බාකාරෙණ බුජ්ඣිත්වා
   එකො සබ්බඤ්ඤුතං ගතො.

3. විපස්සනාදි විජ්ජාහි
සීලාදි චරණෙහි ච,
සුසමිද්ධෙහි සම්පන්නො
ගගනාභෙහි නායකො.

4. සම්මා ගතො සුභං ඨානං
අමොඝවචනො ච සො,
තිවිධස්සාපි ලොකස්ස
ඤාතා නිරවසෙසතො.

5. අනෙකෙහි ගුණොඝෙහි
සබ්බ සත්තුත්තමො අහු,
අනෙකෙහි උපායෙහි
නරදම්මෙ දමෙසි ච.

6. එකො සබ්බස්ස ලොකස්ස
සබ්බ අත්ථානුසාසකො,
භාගා ඉස්සරියාදීනං
ගුණානං පරමො නිධි.

7. පඤ්ඤා'ස්ස සබ්බ ධම්මෙසු
කරුණා සබ්බ ජන්තුසු,
අත්තත්ථානං පරත්ථානං
සාධිකා ගුණ ජෙට්ඨිකා.

8. දයාය පාරමී චින්වා
පඤ්ඤාය'ත්තානමුඩරී.
උඩරී සබ්බ ධම්මෙ ච
දයාය'ඤ්ඤ ච උඩරී
9. දිස්සමානො'පි තාව'ස්ස
රූපකායො අචින්තියො:
අසාධාරණඤාණඩ්ඩෙ
ධම්මකායෙ කථා'වකා ?

මෙහි භාවය

1. ඒ (බුදු රජ) තෙමේ ම වාසනා සහිත සකල ක්ලෙශ නසා ඉතා පිරිසිදු සිත් ඇත්තේ (ආමිස ප්‍රතිපත්ති) පූජාවට සියලු කල්හි සුදුස්සෙක් විය.

2. මුනිතෙමේ සියලු කාලයන් පිළිබඳ සියලු ධර්‍මයන් අන් උපදෙස් නොමැති ව තෙමේම ජානනය කොට සියලු ආකාරයෙන් අවබොධ කොටගෙන තනි ව සර්‍වඥ බවට පැමිණියේ ය.

3. තුන්ලොවට නායක වූ (බුදුරජ) තෙම අෂ්ට විද්‍යායෙන් හා ශීලාදි පසළොස්චරණ ධර්‍මයෙන් ද සර්ව සම්පූර්ණත්වයෙන් ම සම්පන්න ය.

4. ඒ (සර්වඥ) තෙමේ (දන ශීලාදිය හේතු කොටගෙන) යහපත් ස්ථානයට (–එනම් නිර්වාණයට) වැඩම කළේ ය. සිස් නොවන්නා වූ තෙපුල් ඇත්තේ ය. තුන් ලොකය ම සම්පූර්ණයෙන් දත්තේ ය.

5. (ඒ සර්වඥතෙමේ) අනෙක ගුණාංගයන් හේතුකොටගෙන සියලු සත්වයන් හට උතුම් වූයේය. දමනය කටහැකි සත්ත්වයන් අනෙකොපායයෙන් මැඩ පැවැත්වූයේ ය.

6. (ඒ සර්වඥ තෙමේ) තනි ව සකල ලොකයාට හිත වැඩ සඳහා අනුශාසනා කරයි. භාග්‍ය ඓශ්වර්‍ය්‍යා වූ ගුණයන්ට උසස් ම නිධානයකි.

7. (ඒ බුදු රජුගේ) ප්‍රඥතොමෝ සියලු ධර්‍මයන් කෙරෙහිද, කරුණා තොමෝ සියලු සත්වයන් කෙරෙහිද , පවත්නාහුය, ආත්මාර්ථ පරාර්ථ යන දෙක්හි අත්‍යධික වූ (බුදු) ගුණ වඩාලාත් ම වන්නේ ය.

8. (සියලුසතුන් කෙරෙහි) දයාවෙන් පාරමී ධර්‍මයන් පුරා ප්‍රඥවෙන් තම (සසරින්) නැංවීය. සියලු ධර්මයන් ගොඩනැංවී ය; දයාවෙන් අන්‍යයන් ද ගොඩලූසේක.

9. ඒ බුදු රජුගේ දෘශ්‍යමාන වූ රූපකාය පවා සිතිය නොහැක්කේ ය. (එසේ කල) ෂට් අසාධාරණ ඥානයෙන් යුක්ත වූ ධර්ම කායෙහි අචින්ත්‍යතාවය කියනු කිම.

## මෛත්‍රී භාවනාව

1. අත්තුපමාය සබ්බෙසං
සත්තානං සුඛ කාමතං
පස්සිත්වා කමතො මෙත්තං
සබ්බ සත්තෙසු භාවයෙ.

2. සුඛී භවෙයයං නිද්දුක්ඛො
අහං නිච්චං අහං විය;
හිතාව මෙ සුඛී හොන්තු
මජ්ඣත්තා'ථ ච වෙරිනො.

3. ඉමම්හි ගාමක්ඛෙත්තම්හි
සත්තා හොන්තු සුඛී සදා;
තතො පරඤ්ච රජ්ජෙසු
චක්කවාළෙසු ජන්තුනො.

4. සමන්තා චක්ක වාළෙසු
සත්තානන්තෙසු පාණිනො;
සුඛිනො පුග්ගලා භූතා
අත්තභාව ගතාසියුං.

5. තථා ඉත්ථී පුමාචෙව
අරියා අනරියා' පිච;
දෙවා නරා අපායට්ඨා
තථා දස දිසා සුඛාති.

## මෛත්‍රී භාවනාව

1. සියලු සතුන් ම සැප කැමති බව තමා උපමාකොට බලා පිළිවෙළින් සියලු සත්ත්වයන් කෙරෙහි මෛත්‍රිය කටයුතුයි.

2. සතතයෙන් මම නිදුක් සුවපත් වෙම් වා, එමෙන් ම මට හිත වූවෝ ද මධ්‍යස්ථයෝ ද, යළිඳු වෛරී සත්ත්වයෝ ද, සුවපත් වෙත්වා.

3. මේ ග්‍රාම ක්ෂෙත්‍රයෙහි සත්ත්වයෝ හැම කල්හිම සුවපත් වෙත්වා. එයින් ඔබ්බෙහි ගම්හි ද, ක්ෂෙත්‍රයෙහි ද,

රාජ්‍යයන්හි ද, (මේ අපගේ) සක්වළවල්හි සත්‍වයෝ ද හැම (කල්හි කායික චෛතසික දුකක් නොවිඳ සුවපත් වෙත්වා.)

4. හාත්පස අනන්තසක්වළවල්හි සත්ත්‍වයෝද, (ප්‍රාණීහුද පුද්ගලයෝද, භූතයෝ ද, ආත්ම භාවයට ගියාහුද,) සුවපත් වෙත්වා.

5. ස්ත්‍රීහු ද, පුරුෂයෝ ද, ආය්‍යීයෝ ද, (පෘථග්ජන) අනාර්යයෝ ද, (ශක්‍රබ්‍රහ්මාදී,) දෙවියෝ ද, (ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදී,) මනුෂ්‍යයෝ ද, (සතර) අපායෙහි සිටින සත්වයෝ ද, එසේ ම දස දිශාවන්හි (සත්වයෝ) ද, සුවපත් වෙත්වා.

## තවත් මෛත්‍රී භාවනාවක්

අහං අවෙරො හොමි, අබ්‍යාපජ්ඣො-හොමි, අනීඝො හොමි, සුඛී අත්තානං පරිහරාමි, අහං විය මය්හං ආචරි-යුපජ්ඣායා මාතා, පිතරො, හිත සත්තා, මජ්ඣත්තික සත්තා, වෙරී සත්තා, අවෙරා හොන්තු, අබ්‍යාපජ්ඣා හොන්තු, අනීඝා

හොන්තු සුඛී අත්තානං පරිහරන්තු, දුක්ඛා මුඤ්චන්තු, යථා ලද්ධ සම්පත්තිතො මා විගච්ඡන්තු කම්මස්සකා, ඉමස්මිං, විහාරෙ ඉමස්මිං ගොචර ගාමෙ, ඉමස්මිං නගරෙ, ඉමස්මිං ලඞ්කාද්වීපෙ, ඉමස්මිං ජම්බුදීපෙ, ඉමස්මිං චක්කවාළෙ, ඉස්සරජනා සීමට්ඨක දෙවතා, සබ්බෙ සත්තා අවෙරා හොන්තු, අබ්‍යාපජ්ක්ධා හොන්තු, අනීඝා හොන්තු, සුඛී අත්තානං පරිහරන්තු, දුක්ඛා මුඤ්චන්තු, යථා ලඩ සම්පත්තිතො මා වී-ගච්ඡන්තු, කම්මස්සකා, පුරත්ථිමාය දිසාය, දක්ඛිණාය දිසාය, පච්ඡිමාය දිසාය, උත්තරාය දිසාය, පුරත්ථිමාය අනුදිසාය, දක්ඛිණාය අනුදිසාය, පච්ඡිමාය අනුදිසාය, උත්තරාය අනුදිසාය, හෙට්ඨිමාය දිසාය, උපරිමාය දිසාය, සබ්බෙ සත්තා, සබ්බෙ පාණා, සබ්බෙ භූතා, සබ්බෙ පුග්ගලා, සබ්බෙ අත්තභාව පරියාපන්නා, සබ්බා ඉත්ථියො, සබ්බෙ පුරිසා, සබ්බෙ අරියා, සබ්බෙ අනරියා, සබ්බෙ දෙවා, සබ්බෙ මනුස්සා, සබ්බෙ අමනුස්සා, සබ්බෙ

විනිපාතිකා අවෙරා හොන්තු, අබ්‍යා-
පජ්ක්ධා අනීඝා හොන්තු, සුඛී අත්තානං
පරිහරන්තු, දුක්ඛා මුඤ්චන්තු, යථා ලද්ධ
සම්පත්තිතො මා විගච්ඡන්තු කම්මස්සකා.

පුරත්ථිමස්මිං දිසාභාගෙ, සන්ති දෙවා
මහිද්ධිකා
තෙ'පි මං අනුරක්ඛන්තු, ආරොගෙයන
සුඛෙන ච.
දක්ඛිණස්මිං දිසාභාගෙ, සන්ති
දෙවා මහිද්ධිකා
තෙ'පි මං අනුරක්ඛන්තු, ආරොගෙයන
සුඛෙන ච.
පච්ඡිමස්මිං දිසාභාගෙ, සන්ති
දෙවා මහිද්ධිකා
තෙ'පි මං අනුරක්ඛන්තු, ආරොගෙයන
සුඛෙන ච.
උත්තරස්මිං දිසාභාගෙ, සන්ති
දෙවා මහිද්ධිකා
තෙ'පි මං අනුරක්ඛන්තු, ආරොගයන
සුඛෙනච.

පුරත්ථිමස්මිං ධතරට්ඨො, දක්ඛිණෙන
විරූළ්හකො
පච්ඡිමෙන විරූපක්ඛො, කුවෙරො
උත්තරං දිසං
තෙ'පි මං අනුරක්ඛන්තු, ආරොග්‍යෙන
සුඛෙන ච.

## මෛත්‍රී භාවය

"මම වෛර නැත්තෙක් වෙමි. ව්‍යාපාද නැත්තෙක් වෙමි. පීඩා නැත්තෙක් වෙමි. සැප සේ ශරීරය පරිහරණය කරමි. මා වාගේ ම මාගේ ආචාර්‍ය්‍ය උපාධ්‍යායෝ ද, මව් පියෝද, හිත සත්ත්වයෝ ද, මැදහත් සත්ත්වයෝ ද, වෛරී සත්ත්වයෝ ද, වෛර නැත්තාහු වෙත්වා. ව්‍යාපාද නැත්තාහු වෙත්වා. පීඩානැත්තාහු වෙත්වා. සැපසේ ශරීරය පරිහරණය කරත්වා. දුකින් මිදෙත්වා. ලබන ලද කර්මය සවකීය කොට ඇත්තාහු වෙත්වා. මේ විහාරයෙහි, මේ ලඩ්කාද්වීපයෙහි, මේ

ජම්බුද්වීපයෙහි, මේ චක්‍රවාටයෙහි, අධිපති ජනයෝද, සීමව්‍යක දේවතාවෝද, සියලු සත්ත්වයෝද, එසේම වෙත්වා. නැගෙණ-හිර–දකුණු දිග–බස්නාහිර–උතුරුදිග යන සතර දිසාවෙහිද, සතර අනුදිසාවෙහිද, උඩ පාත දෙදිසාවෙහිද, සියලු සත්ත්වයෝද, සියලු ප්‍රාණීහුද, සියලු භූතයෝද, සියලු පුද්ගලයෝද, ආත්මභාවයට පැමිණි හැම දෙනා ද, සියලු ස්ත්‍රීහුද, සියලු පුරුෂයෝද, ආර්‍ය්‍ය අනාර්‍ය්‍ය සියල්ලෝ ද, සියලු දෙවියෝ ද, සියලු මනුෂ්‍යයෝ ද, සියලු විනිපාතිකයෝද එසේම වෙත්වා.

පූර්වදිශා භාගයෙහි ඇත්තා වූ මහා ඍද්ධි ඇති දෙවියෝ, නිරෝගි භාවයෙන් ද, සැප සේ ද මා රකිත්වා. දක්ෂිණ - පශ්චිම - උත්තර දිශාවන්හි දෙවියෝ ද නිරෝගි භාවයෙන් ද සැපසේ මා රකිත්වා. පූර්ව දිශාවෙහි ධෘතරාෂ්ට්‍ර නම් මහරජ ද, දකුණු දිශාවෙහි විරූඪ නම් රජ ද, පශ්චිම දිශාවෙහි විරූපාක්ෂ නම් මහරජ ද, උතුරු දිශාවෙහි වෛශ්‍රවණ නම්

මහරජ ද යන මේ සතර වරම් මහරජ දරුවෝ, නිරෝගී භාවයෙන් ද සැප සේ මා රකිත්වා'' යනු භාවයයි.

## තවත් ක්‍රමයෙක මෛත්‍රී භාවනාවක්

1. පුඤ්ඤෙනානෙන මෙයා ච
ජීවං සබ්බත්ථ සබ්බදා
සුඛී භවෙය්‍යං නිද්දුක්ඛො
අබ්‍යාපජ්ඣො භවෙය්‍ය'හං

2. මය්හං හිතා ච වෙරා ච
මජ්ඣත්තා සබ්බ පාණිනො
මඛී අවේරා නිද්දුක්ඛා
අබ්‍යාපජ්ඣා ච හොන්තු තෙ.

3. තථා අස්මිං සරාරාමෙ
ගාම පබ්බත පාදපෙ
රජ්ජෙ'පි මස්ස දීපස්ස
ගාමක්ඛෙත්ත වනාදිසු.

4. චක්කවාළස්සිමස්සාපි
මහාදීප චතුසවපි
ද්විසහස්ස බුද්ද දීපෙසු
තෙසු ගාමාදිකෙසු'පි;

5. තථා සමන්තානන්තෙසු
චක්කවාළෙසු තෙසු'පි
හෙට්ඨා අවීචිතො යාව
භවග්ගා දස දිසාසු'පි;

6. ඛත්තියා බ්‍රාහ්මණා වෙස්සා
සුද්ද චණ්ඩාල පුක්කුසා
මනුස්සා අමනුස්සා ච
සුපණ්ණා ච අසෙසකා;

7. සබ්බෙ අපාද දිපාද ච
චතුප්පාද යහුප්පාද
තෙසු භූතෙසු බබ්බෙසු
පුමා සබ්බාපි ඉත්ථියො;

8. සබ්බෙ ජෙට්ඨා ච අජෙට්ඨා
සබ්බ දීඝා ච රස්සකා
සන්තෙ සුහුම ථූලා ච
හීන මජ්ක්ඛිම උත්තමා;

9. දූරට්ඨ’පි න දූරට්ඨා
සන්තිකට්ඨා ච කෙවලං
යෙ පඤ්චගතිකා සත්තා
සබ්බෙ තෙ චතුයොනිකා;

10. යෙ සබ්බෙ පාණිනො ජවා
භූතා සත්තා ච සබ්බද
සුඛී අවෙරා නිද්දුක්ඛා
අබ්‍යාපජ්ඣා ච හොන්තු තෙ!

11. නාගා ච සබ්බෙ පාතාලෙ
අසුරාවාසුරෙ පුරෙ
නරකෙ යමරාජානො
නෙරයිකා ච විසාතිනො;

12. තිරච්ඡාන ගතා සබ්බෙ
පෙතාපෙත භවෙසු ච
අසුරකායා සත්තා ච
සබ්බෙ භූ නිස්සිතා’පි ච;

13. සුඛිතා හොන්තු නිද්දුක්ඛා
අවෙරා ච අනාමයා
දීඝායුකා අඤ්ඤමඤ්ඤං
පියා පප්පොන්තු නිබ්බුතිං.

14. අස්මිං විහාර සර පබ්බත රුක්ඛ
ගාමෙ
සබ්බෙසු දීප නගරෙසු'පි
චක්කවාළෙ
දෙවා සුරා ගරුඬ රක්ඛස
නාගයක්ඛා
රක්ඛන්තු මං සතනුභාව
බලෙන නිච්චං!

## මෛත්‍රී භාවය

1. මාගේ මේ පින කරණකොටගෙන ජීවිතාන්තය දක්වා සැම තන්හි සියලු දුක නැත්තේ සැප ඇති වන්නෙමි. පීඩා රහිත වන්නෙමි.

2. මාගේ වැඩ කැමැත්තෝ ද වෛරී–ජනයෝ ද මධ්‍යස්ථ වූවෝ දැයි යන ඒ සියලු සත්ත්වයෝ සුවපත් වූවෝ වෛර රහිත වූවෝ ව්‍යාපාද රහිතයෝ වෙත්වා!

3. එසේම මේ ගෘහ ආරාමයෙහි ද, ග්‍රාම පර්වත වෘක්ෂවල ද, මේ දිවයින සම්බන්ධි වූ රාජ්‍යයෙහි ද, ග්‍රාමක්ෂෙත්‍රයෙහිද ආරණ්‍යාදි ස්ථානයන්හි ද,

4. මේ චක්‍රවාටයාගේ ද, සතර මහා දිවයිනේ ද, දෙදහසක් කොදිව්වල ද, ඒ දිවයින්හි ගම් ආදි ස්ථානයන්හි ද,

5. එසේ ම හාත්පස කෙළවරක් නැත්තාවූ ඒ චක්‍රවාටයන්හි ද, යට අවීචි මහා නරකය පටන් භවාග්‍රය දක්වා දශ දිසාවන්හි ද,

6. සියලු ක්ෂත්‍රියයෝ ද, බමුණෝද, වෛශ්‍යයෝ ද, ශුද්‍රයෝ ද, සැඬොල්ලු ද, පුස්සඬු සැඬොල්ලුද, මිනිස්සු ද, අමනුෂ්‍ය වූ යක්ෂ භූතාදීහු ද, අනවශෙෂ වූ ගුරුළෝ ද,

7. සියලු පාද නැති සත්ත්වයෝ ද, දෙපා ඇති සත්ත්වයෝ ද, සිවුපාවෝ ද, බොහෝ පා ද ඇති සත්ත්වයෝ ද, ඒ සියලු සත්ත්වයන් අතර පුරුෂයෝ ද සියලු ම ස්ත්‍රීහු ද,

8. සියලු වැඩි තැන් පැමිණියෝ ද, බාල තැන් පැමිණියෝ ද, සියලු දීර්ඝ සත්ත්වයෝ ද, හ්‍රස්ව සත්ත්වයෝ ද, සියුම් මහත් සත්ත්වයෝ ද, හීන මධ්‍යම උත්තම සත්ත්වයෝ ද;

9. දුර සිටියෝ ද, නුදුරු ව සිටියෝ ද, හුදෙක් ළඟ සිටියෝ ද, නිරය ගති-තිරිසන් යෝනි ගති-ප්‍රෙත ගති-මනුෂ්‍ය ගති-දේව-ගති-යන පඤ්ච ගති ඇත්තා වූ සත්ත්ව-යෝ ද, අණ්ඩජ – ජලාබුජ – සංසෙදජ – ඕපපාතික යන සතර යෝනි ඇත්තා වූ ඒ සියලු සත්ත්වයෝ ද;

10. යම්බඳු වූ ප්‍රාණි කෙනෙක් වෙද්ද, ජීවිකෙනෙක් වෙද්ද, භූත කෙනෙක් වෙද්ද ඒ සියලු සත්ත්වයෝ සෑම කල්හි සුව ඇත්තාහු වෛර රහිත වූවාහු නිදුක් වූවාහු ව්‍යාබාධ රහිත වූවාහු ද වෙත්වා.

11. පාතාල ලොකයෙහි සියලු නාග-යෝ ද, අසුර පුරයෙහි අසුරයෝ ද, නිරයෙහි යම රජහු ද, පීඩා ඇත්තා වූ නිරිසත්හු ද;

12. තිරිසන්, යෝනිගත සියල්ලෝ ද; ප්‍රෙත භාවයෙහි ප්‍රෙතයෝ ද, අසුරකායගත සත්ත්වයෝ ද, පෘථිවි ආශ්‍රය කොට ඇත්තාවූ සියලු සත්ත්වයෝ ද,

13. දුක් නැත්තාහුද, වෛර රහිත වූවාහුද, නිරෝග වූවාහු ද, සැප ඇත්තෝ ද වෙත් වා. දීර්සායුෂ ඇත්තාහු ඔවුනොවුන්හට ප්‍රිය වූවාහු නිවනට පැමිණෙත් වා.

14. මේ විහාරය – ගෙය – පර්‍වතය – වෘක්ෂය – ගම – යන මෙහි ද, සියලු ද්වීප පුරයන්හි ද, සක්වළෙහි ද, දෙවියෝත්, අසුරයෝත්, ගරුඬ රාක්ෂය නාග යක්ෂයෝත්, ස්වකීයානුභාවය බලය කරණකොට ගෙන සතතයෙන් මා රක්ෂා කෙරෙත් වා.

## මෛත්‍රී භාවනාව කිරීමෙහි ආනිසංස

1. ඉමං හි මෙත්තං පටිවාසරඤ්ඤෙද
භාවෙති පාතො ච දිවා ච රත්තිං
පියො ච සො හොති නරාමරානං
රක්ඛන්ති තං දෙවගණාපි නිච්චං.

2. සුඛං සුපෙතෙ ච සුඛං පබුජ්ඣති
සුපිතෙසු පාපං සුපිනං න පස්සති
වණ්ණො මුඛෙවස්සච විප්පසීදති
චිත්තං සමාධිං තුවටඤ්ච ගච්ඡති.

3. පරප්පයුත්තාව විසග්ගි සත්ථා
නකම්පි බාධෙන්ති මලං සදපි
අමූළ්හකො යෙව කරොති කාලං
ආයුක්ඛයෙ බ්‍රහ්මනිවාස ගාමී.

**මෙහි භාවය**

1. මේ මෛත්‍රිය වනාහි යමෙක් තෙමෙ දිනපතා උදය දිවා රෑ යන තෙකල්හි වඩා ද හෙතෙමෙ මනුෂ්‍යයන් හා දෙවියන්ටද ප්‍රිය වේ. දේව සමූහයෝ ද ඔහු සතතයෙන් රකිත්.

2. සුවසේ සයනය කෙරේ. සුවසේ පිබිදේ, සයනය කෙළේ ද පවිටු සිහිනයක් නොදකී. ඔහුගේ මුහුණේ වර්‍ණයද විශෙෂයෙන් පහදී. සිත වහා එකඟ වීමට ද පැමිණේ.

3. අනුන් විසින් සොයන ලද්ද වූ විෂ ගිනි ශස්ත්‍ර යන මොහු ද, මල ද, ඔහුට පීඩා නො කෙරෙයි. මුළා නුවූයේ ම කාලක්‍රියා කෙරේ. ආයුෂ ගෙවීමෙහි බ්‍රහ්මලෝකයට යන සවභාව ඇත්තේ ද වේ.

### අශුභ භාවනාව හෙවත් ශරීරය පිළිකුල් කටයුතු කුණපයක් බව මෙනෙහි කිරීම

1. අවිඤ්ඤාණ සුභනිභං
සවිඤ්ඤාණ සුභං ඉමං
කායං අසුභතො පස්සං
අසුභං භාවයෙ යති.

2. වණ්ණ සණ්ඨාන ගන්ධෙහි
ආසයොකාසතො තථා
පටික්කූලානි කායෙ මෙ
කුණපානි ද්විසොළස.

3. පතිතම්හාපි කුණපා
ජෙගුච්ඡං කාය නිස්සිතං
ආධාරොහි සුචිතස්ස
කායොතු කුණපෙ ඨිතං

4. මිළ්හෙ කිමිව කායො යං
අසුචිම්හි සමුට්ඨිතො
අන්තො අසුචි සම්පුණ්ණො
පුණ්ණවච්චකුටි විය.

5. අසුචි සන්දතෙ නිච්චං
යථාමෙදක ථාලිකා
නා නා කිමි කුලා වාසො
පක්ක චන්දනිකා විය.

6. ගණ්ඩ භූතෝ වණභූතෝ
රොග භූතෝ සමුස්සයො
අතෙ කිච්ඡොති ජෙගුච්ඡො
පභින්න කුණපූපමො.

### මෙහි භාවය

1. නවද්වාරයකින් වැගිරෙන කුණු ඇති හෙයින් සිත් නැති අශුභයක් බඳු වූ සිත් ඇති ව ම අශුභ වූ මේ ශරීරය අශුභ වශයෙන් මෙනෙහි කරමින් භාවනා කට යුතුයි.

2. මාගේ ශරීරයෙහි දෙතිසක් කුණපයෝ වර්‍ණය සටහන, ගඳ, ආශ්‍රය හෙවත් ආධාරය, අවකාශය, යන පඤ්ච ප්‍රකාරයෙන් පිළිකුල් වන්නාහු ය.

3. ශරීරයෙහි වූ කුණපය ශරීරයෙන් වැටුණු කුණපයට වඩා පිළිකුල් වේ. කුමක් නිසාද යතහොත්; ශරීරයෙන් වැටුණු කුණපයාගේ ආශ්‍රය පිරිසුදු ය. ශරීරස්ථ වූ කුණපය කුණපයෙහි ම පිහිටි බැවිනි.

4. අසුචියෙහි වූ පණුවෙකු මෙන් මේ සිරුර මවු කුස අසුචියෙහි ම උපන්නේ ය. පිරුණා වූ වැසිකිළියක් මෙන් ඇතුළත අසුචියෙන් පිරුණේ ය.

5. මේද තෙල් පිරූ භාජනයක් මෙන් නිතර අසුචි වැහෙන්නේ ය. ගිම්හානයෙහි පැසුණු මඩ වලක් මෙන් අනේක කෘමි කුලයන් හට (පණු ජාතීන්ට) ගෙයක් වූයේ ය.

6. මේ ශරීරය වනාහි පැසවාපූ ගෙඩියක් වැන්න. පිළියම් කිරීමෙන් සුවකට නොහැකි රෝගයක් වැන්න. වණයක්ද වැන්න.

නොයෙක් අතින් සිදුරුව ගිය මිනී කුණප-
යක් බඳු බැවින් නුවණැත්තවුන් විසින්
ඉතා පිළිකුල් කටයුත්තේ ය.

### මරණානුස්මෘතිය
### හෙවත්
### මරණය ගැන සිහි කිරීම

1. පවාත දීප තුල්‍යාය
සායුසන්තති යාක්ඛයං
පරූපමාය සම්පස්සං
භාවයෙ මරණස්සතිං

2. මහා සම්පත්ති සම්පත්තා
යථා සත්තා මතා ඉධ
තථා අහං මරිස්සාමි
මරණං මම හෙස්සති

3. උප්පත්තියා සහෙවෙදං
මරණං ආගතං සදා
මරණත්ථාය ඔකාසං
වධකො විය එසති

4. ඊසකං අනිවත්තන්තං
සතතං ගමනුස්සුකං
ජීවිතං උදයාඅත්ථං
සුරියො විය ධාවති

5. විජ්ජුබුබ්බුල උස්සාව
ජලරාජි පරික්ඛයං
ඝාතකොව රිපූතස්ස
සබ්බත්ථාපි අවාරියො

6. සුයසත්ථාම පුඤ්ඤිද්ධි
බුද්ධිවුඩ්ඪ ජිනද්වයං
ඝාතෙසි මරණං ඛිප්පං
කාතු මාදිසකෙ කථා

7. පච්චයානඤ්ච වෙකල්‍යා
බාහිරජ්ඣත්තුපද්දවා
මරාමොරං නිමෙසාපි
මරමනො අනුක්ඛණන්ති

## මෛත්‍රී භාවය

1. මහ සුළඟ හමන තැන දල්වන ලද පහනක් මෙන් හීන භාවයට යන ආයුෂය අනාථයන්ට උපමා කොට බලමින් මරණානුස්මෘතිය භාවනා කට යුතුය.

2. යම් සේ මේ මනුෂ්‍ය ලොකයෙහි මහා සම්පත්තියෙන් ආඪ්‍යවූ (මහා සම්මත රාජාදීවූ) සත්වයෝ මළාහු ද, එමෙන් මම ද මියෙමි. මරණය මට වන්නේය.

3. මේ මරණය උත්පත්තිය කැටුව ආයේය. එබැවින් සියලු කල්හිම මරණය පිණිස වන්නේය. වධකයකු මෙන් මරණය පිණිස ම ඉඩක් සොයන්නේය.

4. ජීවිතය ඇසිල්ලකුදු නොනවත්නේ නිරන්තරයෙන් ගමන උත්සාහ ඇත්තේ උදවීමෙන් අස්තඞ්ගත වන්නා වූ හිරුමෙන් දිව යන්නේය.

5. විදුලියක් මෙන් දිය බුබුලක් මෙන් තණ අග පිනි බිඳක් මෙන් දියෙහි ඇඳි ඉරක් මෙන් මේ ජීවිතය නැති වීමට

යන්නේය. මරණ සතුරකු මෙන් ඒ මරණය සියලු තන්හි ම වැළකිය නොහැක්කේය.

6. මහත් යසසින්, ශක්තියෙන්, පිනින්, ඍද්ධියෙන්, බුද්ධියෙන්, වැඩිසිටි බුදු පසේ බුදු දෙදෙනා ද වහා මරණය තෙම නැසූයේය. කීර්ති රහිත වැඩි සිටි බවක් නොමැති මා වැන්නකු ගැන කියනු මැ කවරේද?

7. ක්‍ෂණක්ෂණයෙහි ක්‍ෂණික මරණයෙන් මියෙන්නා වූ මම ආහාරාදි ප්‍රත්‍යයන්ගේ වෙනස් වීමෙන්ද, සිංහ ව්‍යාඝ්‍රාදීන්ගෙන් වන බාහිර උපද්‍රවයෙන් ද, ධාතු කැළඹීම් ආදි වූ ශරීරගත උපද්‍රවයන්ගෙන් ද, ඇසිපිය හෙළීමෙන් මොබ ද මියෙමි.

චතුර්විධ ආරක්ෂායයි කියන ලද මේ ඉහත දක්වූ භාවනා කොට ඉන් අනතුරුව මහා සංවේග වස්තු අට මෙනෙහි කට යුතුයි.

## සිහි කළ යුතු සංවේග වස්තු අට

ජාති ජරා ව්‍යාධි චුති අපායා
අතීත අප්පත්තක වට්ට දුක්ඛං
ඉදනි ආහාර ගවෙට්ඨි දුක්ඛං
සංවෙග වත්ථූනි ඉමානි අට්ඨ.

### මෙහි භාවය

උත්පත්ති – ජරා – ව්‍යාධි – මරණ යන මේ සතර මුල් කොට ඇති දුක් ද, අපා දුක ඉක්ම ගිය සංසාරවෘත්ත දුක, නොපැමිණි-යාවූ සංසාරවෘත්ත දුක, වර්තමානයෙහි ආහාර සොයන දුක යන මෙය ආවර්ජනීය සංවෙග වස්තුව අට වේ.

### මෙය සිහිකිරීමේ ආනිසංසය

උභය ලොකාභිවෘද්ධිකාමිවූ යමෙක් තෙම උදය සවස දෙවේලෙහි මේ භාවනා ක්‍රමය පුරුදු කරන්නේ ද; හෙතෙම සර්වඥයන් වහන්සේ විසින් විශිෂ්ට යයි වදරන ලද උත්කෘෂ්ටවූ නිර්වාණ සැපතට පැමිණෙන්නේ ය.

## නිත්‍ය ප්‍රත්‍යවෙක්ෂා ධර්ම

ශද්ධාවන්ත ස්ත්‍රී පුරුෂාදීන් සියලු ඊර්යාපථවල (යාම – ඉඳීම – සිටීම – නිදීම යන සතර) දීම භාවනානු ක්‍රමයෙන් සිහි කටයුතු ධර්ම කොට්ඨාසය මෙසේ දතයුතුයි. එනම් :–

ජරා ධම්මොම්හි ජරං අනතීතො, ව්‍යාධි ධම්මොම්හි ව්‍යාධිං අනතීතො, මරණ-ධම්මොම්හි මරණං අනතීතො, සබ්බෙහි මෙ පියෙහි මනාපෙහි නානා භාවො විනා භාවො කම්මස්සකොම්හි කම්ම දායාදෙ කම්මය යොනි කම්ම බන්ධූ කම්ම පටිසරණො යං කම්මං කරිස්සාමි කල්‍යාණං වා පාපකං වා තස්ස දායාදෙ භවිස්සාමි.

## මෙහි භාවය

'මම වනාහි ජරා ව්‍යාධි මරණ යන තුන සවභාව කොට ඇත්තෙක් වෙමි. එය නොඉක්මවූයේ වෙමි. ප්‍රිය විප්‍රයෝග (මනාප අය ගෙන් වෙන් වීම) සවභාව

කොට ඇත්තෙමි. යම් කුශලාකුශල කර්මයක් මම කරන්නෙම් ද; ඊට දයාදයක් වන්නෙමි. කර්මය සවකීය කොට ඇත්තේ වෙමි. කර්මය දයාද කොට ඇත්තේ වෙමි. කර්මය කරණයකොට ඇත්තේ වෙමි. කර්මය නෑයා කොට ඇත්තේ වෙමි. කර්මය පිහිට කොට ඇත්තේ වෙමි.' යනුයි.

## 13. වන්දනා කිරීමේ ක්‍රම
### බුදුන් වැඳීම

1. ඉතිපි සො භගවා අරහං සම්මා සම්බුද්ධො විජ්ජාචරණ සම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්ම සාරථී සත්ථා දෙව මනුස්සානං බුද්ධො භගවාති.

2. බුද්ධං ජීවිත පරියන්තං සරණං ගච්ඡාමි.

3. යෙ ච බුද්ධා අතීතා ච
යෙ ච බුද්ධා අනාගතා
පච්චුප්පන්නා ච යේ බුද්ධා
අහං වන්දමි සබ්බද.

4. නත්ථි මෙ සරණං අඤ්ඤං
බුද්ධෝ මෙ සරණං වරං
ඒතේන සච්ච වජ්ජේන
හෝතු මේ ජයමංගලං.

5. උත්තමංගේන වන්දේහං
පාදපංසුවරුත්තමං
බුද්ධේ යෝ ඛලිතෝ දෙසෝ
බුද්ධෝ ඛමතු තං මමං–

## මෛත්‍රී භාවය

1. මෛත්‍රී භාවය බුද්ධානුස්මෘතියෙහි දක්වා ඇත. එයින් බලා ගත යුතුයි.

2. මාගේ ජිවිතාන්තය දක්වා බුදුන් සරණ කොට යෙමි.

3. අතීතානාගත වර්තමාන යන කාලත්‍රයෙහි වූ සියලු බුදුවරයන් සියලු කල්හි මම නමස්කාර කරමි.

4. මට අන් පිහිටක් නොමැතියි. උතුම් වූ සර්වඥයන් වහන්සේ මට පිහිට ය. ඒ සත්‍යය හේතුවෙන් මට ජය මඟුලක් වේවා! හෙවත් නිර්වාණය ලබම්වා!

5. දෙෂ රහිත වූ හෙවත් නික්ලේශීවූ ඒ සර්වඥයන් වහන්සේගේ උතුම් වූ පා රජස් මස්තකයෙන් නමස්කාර කරමි. බුදුහු කෙරෙහි සිදු වූ යම් වරදක් ඇද්ද සර්වඥයන් වහන්සේ මා ගේ ඒ වරදට කමා කරන සේක්වා.

## බුද්ධ වන්දනාගථා

1. නමො නමො බුද්ධ දිවාකරාය
නමො නමො ගොතම චන්දිමාය
නමො නමොනන්ත ගුණණ්ණවාය
නමො නමො සාකිය නන්දනාය.

2. බ්‍රහ්මිඥ දෙවිඥ නරිඥ රාජං
බොධිං සුබොධිං කරුණා ගුණග්ගං
පඤ්ඤා පදීපජ්ජලිතං ජලන්තං
වන්දමි බුද්ධං භව පාර තිණ්ණං.

3. නමො නමො සාක්‍ය කුලද්ධජාය
නමො නමො සජ්ජන මාදධාය
නමො නමො නිබ්බුති නිජ්ජරාය
නමො නමො ලොක පභඞ්කරාය.

4. නමො තෙ කරුණා භාර
නමො තෙ මති සාගර
නමො තෙ අමතාකර
නමො තෙ නර භාකර.

5. නමො තෙ භත සංසාර
නමො තෙ නර කුඤ්ජර
නමො තෙ ජගතාධාර
නමො තෙ අමතණ්ණව.

6. රංසිමාල නමො තුය්හං
නරබ්බුරුහ මණ්ඩන
ජලමාල නමො තුය්හං
භවාරඤ්ඤ දවානල

7. ඉධානන්ත ගුණාධාර
සද්ධම්ම රතනාකර
පාදෙ වන්දමි තෙ නාථ
සද්ධායතන මුද්ධනා.

8. සතත විතත කිත්තිං
ධස්ත කන්‍දප්පදප්පං
තිභවහිත විධානං
සබ්බ ලොකෙක කෙතුං
අමිතමතිමනග්ඝං
සන්තිදං මෙරු සාරං
සුගත මහ මුද්‍රං
රූප සාරං නමාමි.

## මෙහි භාවය

1. සර්වඥ නමැති සූර්‍ය්‍යයාවූ ද, ගෞතම නමැති චන්ද්‍රයා වූ ද, කෙළවරක් නොමැති ගුණයට සාගරය වූ ද, ශාක්‍ය වංශයට උතුම් වූ ද, මුනීන්ද්‍රයන් වහන්සේට නමස්කාර වේ වා.

2. බ්‍රහ්මාධිපති වූ ද, දේවාධිපති වූ ද, මනුෂ්‍යාධිපති වූ ද, සම්‍යක් සම්බොධිය මනා කොට ජානනය කළා වූ ද, කරුණා ගුණයෙන් උතුම් වූ දල්වන ලද ප්‍රඥ නමැති

පහනින් ජ්වලිත වන්නා වූ සංසාර සාගරය තරණය කළා වූ සර්වඥයන් වහන්සේට නමස්කාර කරමි.

3. ශාක්‍ය කුලයට ධ්වජයක් වූ සර්වඥයන්හට නමස්කාර වේවා, නමස්කාර වේවා. සත්පුරුෂයන්ට ප්‍රතිෂ්ඨා වූ බුදුන්හට නමස්කාර වේවා, නමස්කාර වේවා. විශුද්ධි දේවවූ බුදුන්හට නමස්කාර වේවා. නමස්කාර වේවා. ලොවට සූර්‍ය්‍යයා වැනි වූ බුදුන්හට නමස්කාර වේවා, නමස්කාර වේවා.

4. දයාවෙන් බර වූ ඔබට නමස්කාර වේවා. ප්‍රඥා සාගර වූ ඔබට නමස්කාර වේවා, අමෘතයට උත්පත්ති ස්ථාන වූ ඔබට නමස්කාර වේවා. මිනිසුන්හට සූර්‍ය්‍යයා බඳු වූ ඔබට නමස්කාර වේවා.

5. සසර නැසුවා වූ ඔබට නමස්කාර වේවා. නරශ්‍රෙෂ්ඨ වූ ඔබට නමස්කාර වේවා. ලොවට පිහිට වූ ඔබට නමස්කාර වේවා. අමා සයුරු වූ ඔබට නමස්කාර වේවා.

6. සත්ත්ව නමැති පද්මාකරය සරසන්නා වූ සූර්‍ය්‍යයාණෙනි, ඔබට නමස්කාර වේවා. සංසාර නමැති වනයට ලැව් ගින්නක් වැනි වූ මහාග්නිස්කන්ධයක් වූ සර්‍වඥයන් වහන්ස, ඔබට නමස්කාර වේවා.

7. ලෝකයෙහි කෙළවරක් නැති ගුණ සමූහයකට පිහිටවූ රත්නාකර වූ සර්‍වඥයන් වහන්ස, ඔබගේ පාදපද්මයන් සැදූ හැයෙන් අවනත වූ හිස කරණකොටගෙන වදිමි.

8. අනවරතයෙන් පතළා වූ කීර්ති ඇති, නසන ලද රාගය ඇති, තුන් ලොවට වැඩ සිද්ධකරන්නාවූ මුළු ලොවට එක ම ධ්වජයක් බඳු වූ අප්‍රමාණවූ ප්‍රඥ ඇති, කාම ක්‍රොධාදී ක්ලෙශයන් ජය ගැනීම යයි කියන ලද නිර්‍වාණයට පමුණු වන්නා වූ දෙතිස් මහා පුරුෂ ලක්ෂණයෙන් යුක්තවූ රූපකාය ඇති සර්‍වඥයන් වහන්සේට නමස්කාර කරමි.

## අටවිසි සුගත වන්දනාව

1. වන්දෙ තණ්හඞ්කරං බුද්ධං
වන්දෙ මෙධඞ්කරං මුනිං
සරණඞ්කරං මුනිං වන්දෙ
දීපඞ්කරං ජිනං නමෙ

2. වන්දෙ කොණ්ඩඤ්ඤ සත්ථාරං
වන්දෙ මඞ්ගල නායකං
වන්දෙ සුමන සම්බුද්ධං
වන්දෙ රෙවත නායකං

3. වන්දෙ සොභිත සම්බුද්ධං
අනොම දස්සිං මුනිං නමෙ
වන්දෙ පදුම සම්බුද්ධං
වන්දෙ නාරද නායකං

4. පදුමුත්තරං මුනිං වන්දෙ
වන්දෙ සුමෙධ නායකං
වන්දෙ සුජාත සම්බුද්ධං
පියදස්සී මුනිං නමෙ

5. අත්ථදස්සී මුනිං වන්‍දෙ
ධම්මදස්සී ජිනං නමෙ
වන්‍දෙ සිද්ධත්ථ සත්ථාරං
වන්‍දෙ තිස්ස මහා මුනිං

6. වන්‍දෙ ඵුස්ස මහාවීරං
වන්‍දෙ විපස්සි නායකං
සිඛී මහා මුනිං වන්‍දෙ
වන්‍දෙ වෙස්සභූ නායකං

7. කකුසන්ධං මුනිං වන්‍දෙ
වන්‍දෙ කොනාගමන නායකං
කස්සපං සුගතං වන්‍දෙ
වන්‍දෙ ගොතම නායකං

8. අට්ඨ වීසති මෙ බුද්ධා
නිබ්බාණ මත දායකා
නමාමි සිරසා නිච්චං
තෙ මෙ රක්ඛන්තු සබ්බදා!

## මෙහි භාවය

තණ්හඞ්කර ය, මෙධඞ්කර ය, සරණඞ්කර ය, දීපඞ්කර ය, කොණ්ඩඤ්ඤ ය, මඞ්ගල ය, සුමන ය, රෙවත ය, සොභිත ය, අනොමදස්සිය පදුම ය, නාරද ය, පදුමුත්තර ය, සුමෙධ ය, සුජාත ය, පියදස්සි ය, අත්ථදස්සි ය, ධම්මදස්සි ය, සිඬත්ථ ය, තිස්ස ය, ඵුස්ස ය, විපස්සි ය, සිඛි ය, වෙස්සභූ ය, කකුසන්ධ ය, කොනාගම ය, කස්සප ය, ගෞතම ය යන මේ අටවිසි බුදුවරයන් වහන්සේලාට (මම) නමස්කාර කරමි.

## ධම්ය වැඳිම

1. ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො එහි පස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහීති.

2. ධම්මං ජීවිත පරියන්තං සරණං ගච්ඡාමි

3. යෙච ධම්මා අතීතා ච
යෙච ධම්මා අනාගතා
පච්චුප්පන්නාච යෙ ධම්මා
අහං වන්දාමි සබ්බදා.

4. නත්ථි මෙ සරණං අඤ්ඤං
ධම්මො මෙ සරණං වරං
එතෙන සච්ච වජ්ජෙන
හොතු මෙ ජයමංගලං!

5. උත්තමඞ්ගෙන වන්දෙහං
ධම්මඤ්ච තිවිධං වරං
ධම්මෙ යො කලිතො දොසො
ධම්මො ඛමතු තං මමං

## මෙහි භාවය

1. මෙහි විස්තර ධර්මානුස්මෘතියෙහි දක්වා ඇත. එය එයින් බලා දත යුතුයි.

2. මාගේ ජීවිතාන්තය දක්වා ධර්මය සරණ ගනිමි.

3. අතීතානාගත වර්තමාන යන කාලත්‍රයෙහිවූ සියලු ධර්‍මයන් සියලු කල්හි මම නමස්කාර කරමි.

4. මට අන් පිහිටක් නොමැතියි. උතුම් වූ ධර්‍මය මට පිහිට ය. ඒ සත්‍යය හේතුවෙන් මට ජයමඟුලක් වේවා, හෙවත් නිර්‍වාණය ලබම්වා!

5. දෙෂ රහිත වූ හෙවත් නික්ලෙශී වූ ඒ ශ්‍රීසද්ධර්‍මය මස්තකයෙන් නමස්කාර කරමි. ධර්‍මය කෙරෙහි සිදු වූ යම් වරදක් ඇද්ද ධර්‍මය මාගේ ඒ වරදට කමා කරණ සේක්වා!

## ධර්‍ම වන්දනා ගාථා

1. යං රාගහාරී රුචිදයි ඛෙමං
පාපෙති සත්තෙ මණිමෙව භාති
යං භාවකානංපි පදලි මොහං
වන්‍දාමි ධම්මං නිපුණං සුභත්තං.

2. පාපාරි ජාල පහතං පවරං මහග්ඝං
සංසාර සාගර සමුත්තරණාය සජ්ජං
නාවා යමං ජිනවරෙනහි දෙසිතං යං
සම්මා නමාමි සුඛදං වර ධම්ම සාරං

3. හත දුරිත තුසාරං
මොහ පඞ්කොප තාපං
මන කමල විකාසං
ජන්තුනං සෙසකානං
කුමති කුමුද නාසං
බුඩ පුබ්බා ච ලග්ගා
උදිත මහ මුදරං
ධම්ම භානුං නමාමි.

## මෙහි භාවය

1. යම් ධර්‍මයක් හේතු කොටගෙන රාගය නැති කෙරේ ද, කැමති දෙයක් ගෙනදේ ද, සත්වයන් නිර්‍වාණයට පමුණුවා ද, මාණික්‍යයක් බඳුව දීප්තිමත්ව බබළා ද, වඩන්නවුන් ගේ මෝඩ බව දුරු කෙරේ ද, මනා කොට බෙදන ලද ඒ උත්කෘෂ්ට වූ ධර්‍මය (මම) නමස්කාර කරමි.

2. පාප නමැති ශත්‍රු සමූහයා දුරු-කරන්නාවූ, සංසාර සාගරය තරණය පිණිස සරහන ලද උතුම් වූ නෞකාවක් බඳු වූ,

සැප ගෙනදෙන යම් සාර වූ ධර්මයක් සර්වඥයන් වහන්සේ විසින් දේශනා කරන ලද්දේ ද; ඒ ධර්මය මම සකසා වඳිමි.

3. නසන ලද පව් නමැති තුසාර ඇති අවිද්‍යා නමැති මඩ වියළන්නා වූ, යහපත් නිර්වාණ මාර්ගය දක්වන්නා වූ, සත්ත්වයන්ගේ සිත් නමැති නෙලුම් මල් පුබුදුවන්නා වූ, මිත්‍යා දෘෂ්ටිය විනාශ කරන්නා වූ සර්වඥ නමැති උදය පර්වත මස්තකයෙන් පහළ වූ සද්ධර්ම නමැති සූර්යයා මම මනාකොට වඳිමි.

## සංඝයා වැඳීම

1. සුපටිපන්නො භගවතො සාවක සඞ්ඝො, උජුපටිපන්නො භගවතො සාවක සඞ්ඝො, ඤායපටිපන්නො භගවතො සාවක සඞ්ඝො, සාමීචිපටිපන්නො භගවතො සාවක සඞ්ඝො, යදිදං චත්තාරි පුරිස යුගානි අට්ඨ පුරිස පුග්ගලා එස භගවතො

සාවක සඞ්ඝො, ආහුණෙය්‍යො පාහුණෙ-
ය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො
අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.

2. සඞ්ඝං ජීවිත පරියන්තං සරණංගච්ඡාමි.

3. යෙ ච සඞ්ඝා අතීතාච
යෙ ච සඞ්ඝා අනාගතා
පච්චුප්පන්නා ච යෙ සඞ්ඝා
අහං වන්දාමි සබ්බදා.

4. නත්ථි මෙ සරණං අඤ්ඤං
සඞ්ඝො මෙ සරණං වරං
එතෙන සච්චවජ්ජෙන
හොතු මෙ ජයමඞ්ගලං!

5. උත්තමඞ්ගෙන වන්දෙහං
සඞ්ඝඤ්ච තිවිධොත්තමං
සඞ්ඝෙ යො ඛලිතො දොසො
සඞ්ඝො ඛමතු තං මමං!

මෙහි භාවය

1. මෙ වාක්‍යයෙහි භාවය සඞ්ඝානු-
ස්මෘතියෙහි සඳහන් කොට ඇති බැවින්
එයින් වටහා දත යුතුයි.

2. මාගේ ජීවිතාන්තය දක්වා සඞ්ඝයා සරණ ගනිමි.

3. අතීතානාගත වර්තමාන යන කාලත්‍රයෙහි වූ සියලු සඞ්ඝයා සියලු කල්හි මම නමස්කාර කරමි.

4. මට අන් පිහිටක් නොමැතියි. උතුම්වූ සඞ්ඝයා මට පිහිටය. ඒ සත්‍යය හේතුවෙන් මට ජයමඟුලක් වේවා, හෙවත් නිර්වාණය ලබම්වා!

5. දෝෂ රහිත වූ හෙවත් නික්ලේශිවූ ඒ සඞ්ඝයා වහන්සේලාගේ උතුම් වූ පා රජස් මස්තකයෙන් නමස්කාර කරමි. සඞ්ඝයා කෙරෙහි සිදු වූ යම් වරදක් ඇද්ද; සඞ්ඝයා වහන්සේ මා ගේ වරදට කමා කරන සේක්වා!

## සඞ්ඝ වන්දනා ගාථා

1. අඞ්ගීරසස්සොරස පුඤ්ඤඛෙත්තං
   ලොකප්පසිද්ධං සරණං ජනානං
   දුක්ඛප්පහානං විමලං ගුණග්ගං
   වන්දමි සඞ්ඝං සමිතින්ද්‍රියං යං.

2. සන්තින්ද්‍රියං සුගතසූනුවරං විසුද්ධං
යං දක්ඛිණෙය්‍ය මතදං සුචි පුඤ්ඤ
ඛෙත්තං
තානෙසිනං සරණ මුජ්ක්ධිත සබ්බ
දුක්ඛං
වන්දමි සඞ්ඝ මනසං සිරසා මහග්ඝං

3. සකල විමල සීලං ධූතපාපාරිජාලං
සුර නර මහනීයං පාහුණෙය්‍යාහු-
ණෙය්‍යං
උජුපථ පටිපන්නං පුඤ්ඤ ඛෙත්තං
ජනානං
ගණමහමහි වන්දෙ සාරදං සාදරෙන.

## මෛත්‍රී භාවය

1. සර්වඥ පුත්‍ර වූ, පින් කෙතක් බඳු වූ මනුෂ්‍යයන්ට පිහිට වූ දුක් නැති කරන්නා වූ, නිර්මල වූ, ගුණාන්විත වූ, දමනය කරන ලද ඉඳුරන් ඇති යම් සඟුරුවනක් වේ ද; ඒ සඞ්ඝරත්නය (මම) නමස්කාර කරමි.

2. සත්භූත් ඉඳුරන් ඇති සර්වඥ පුත්‍ර වූ, දක්ෂිණාර්හ පින්කෙතක් බඳු වූ, නිවන් සැප සොයන්නා වූ, මුලින් උපුටාදමන ලද සියලු දුක් ඇති නිෂ්පාපි වූ, යම් සඟුරුවනක් වේ ද, ඒ සඞ්ඝ රත්නය මම නමස්කාර කරමි.

3. නසන ලද පාප නමැති සතුරු සමූහයා ඇති දිව්‍ය මනුෂ්‍යයන් විසින් පූජා කිරීමට සුදුසු ආර්ය අෂ්ටාඞ්ගික මාර්ගය යි කියන ලද ඇද නැති මාර්ගයට පැමිණියා වූ උත්තම ඵලදායක ආර්ය සඞ්ඝයා වහන්සේ මම ආදරාන්විත සිතින් නමස්කාර කරමි.

### සියම් රට ත්‍රිපිටකධාරී වජිරඤාණ මහ රජාණන් විසින් විරචිත රත්නයාභිවාදනය

1. යො සන්නිසින්නො වරබොධි මූලෙ
මාරං සසෙනං මහතිං විජෙත්වා
සම්බොමාධිගච්ඡි අනන්ත ඤාණො
ලොකුත්තමො තං පණමාමි බුද්ධං.

2. අට්ඨඞ්ගිකො අරියපථො ජනානං
මොක්ඛප්පවෙසා යුජුකොව මග්ගො
ධම්මො අයං සන්තිකරො පණීතො
නියානිකො තං පණමාමි ධම්මං.

3. සඞ්ඝො විසුද්ධො වර දක්ඛිණෙය්‍යා
සන්තින්ද්‍රියො සබ්බ මලප්පහීණො
ගුණෙහිනෙකෙහි සමිද්ධිපත්තො
පුනාසවො තං පණමාමි සඞ්ඝං.

4. යො බුද්ධ සුරියො අමිතන්ධකාරං
හන්ත්වාන ධම්මෙහි ජුතීහි ලොකෙ
බොධෙසි වෙනෙය්‍ය ජනං සරොජං
වන්දෙ මුනින්දං හගවන්තරාගං.

5. යෙ ධම්ම මාලං සිරසා වහන්ති
මුඤ්චන්ති තෙ වට්ටභයා දුගන්ධා
තස්මාපදං යන්ති ජනා අසඞ්ඛ්‍යා
තං ධම්ම සෙට්ඨං පණමාමි සාධුං.

6. යෙ සඞ්ඝ ඛෙත්තම්හි සුපුඤ්ඤ බීජං
රොපෙන්ති තෙ නන්ද බලානි සද්ධා
වුසන්ති මොක්ඛං භවජෙද හෙතුං
තං සඞ්ඝ සෙට්ඨං සිරසා නමාමි.

## මෙහි භාවය

1. සමයක් සම්බුදු කෙනෙක් උතුම් බෝමුල වැඩ හුන්නේ මහත් වූ සේනා සහිත වූ මාරයා ජය ගෙන සමයක් සම්බෝධියට පැමිණියේ ද; කෙළවරක් නැත්තා වූ නුවණ ඇත්තේ ද, ලෝකයට උතුමෙක් වූයේ ද ඒ බුදුන් වඳිමි.

2. සත්ත්වයන්ගේ නිවන් පුර වැදීම පිණිස ඇද නැත්තා වූ අඞ්ග අටකින් යුක්ත වූ ආයර්‍යයන්ගේ මාර්ගය වූ යම් මාර්ග සත්‍ය ධර්මයක් වේ ද, ඒ මාර්ග සත්‍යය ශාන්තිකර වේ ද; ප්‍රණීත වේ ද, සංසාරයෙන් නික්ම යාම කෙරේ ද, ඒ ධර්මය වඳිමි.

3. විශේෂයෙන් පිරිසුදුවූ උතුම දක්ෂි-ණාවට සුදුසු වූ යම් සඞ්ඝ රත්නයෙක් වේ ද, ඒ සඞ්ඝ තෙමේ සන්හුන් ඉඳුරන් ඇත්තේ වේ ද, සියලු කෙලෙස් මල ප්‍රහීන කෙරේ ද, නොයෙක් ගුණයෙන් සමෘද්ධබවට පැමිණි-යේ වේ ද, කාමාදී ආශ්‍රව නැත්තේ වේ ද, ඒ සඞ්ඝ රත්නය වඳිමි.

4. යම් සර්වඥ සූර්‍ය්‍යයෙක් තෙමේ අප්‍ර-මාණ වූ අවිද්‍යා අන්ධකාරය නසා ධර්ම නමැති රශ්මියෙන් ලොකයෙහි විනෙය ජන නමැති පද්ම සමූහය පුබුදු කෙළේ වේ ද, ඒ නසන ලද රාගය ඇත්තා වූ මුනීන්ද්‍රයන් වහන්සේ වඳිමි.

5. යම් සත්ත්ව කෙනෙක් ධර්ම නමැති මුදුන් මල්කඩ මස්තකයෙන් උසුලත් ද, ඒ සත්ත්වයෝ දුර්ගන්ධ වූ සංසාර භයෙන් මිදෙන්නාහු වෙත් ද, ඒ හෙයින් ම සඞ්ඛ්‍යා පථාතික්‍රාන්ත සත්ත්වයෝ නිර්වාණ පදයට යෙත් ද, යහපත් වූ ඒ ශ්‍රෙෂ්ඨ ධර්මය වඳිමි.

6. යම් සත්ත්ව කෙනෙක් සඞ්ඝ නමැති ක්ෂේත්‍රයෙහි යහපත් පින් නමැති බිජුවට රෝපණය කෙරෙත් ද, සැදැහැති ඒ සත්ත්වයෝ සන්තෝෂය හා බලය ලබද්ද (එසේ) භවය සිඳීමට කාරණ වූ මොක්ෂය ස්පර්ශ කෙරෙත්. ඒ ශ්‍රේෂ්ඨ වූ සංඝරත්නය වඳිමි.

## තෙරුවන් සමා කිරීම
## බුදුන් ක්ෂමා කරගැනීමේ ගාථාව

කායෙන වාචාය වා චෙතසා වා
බුද්ධෙ කුකම්මං ච කතං මයායං
බුද්ධො පටිග්ගණ්හාතු අච්චයන්තං
කාලන්තරෙ සංවරිතුංන බුද්ධෙ.

## මෙහි භාවය

කයින් වචනින් මනසින් යන මේ ත්‍රිවිධ ද්වාරයෙන් මා විසින් සර්වඥයන් වහන්සේ කෙරෙහි යම් වැරදි ක්‍රියාවක් කරන ලද්දේ ද; ඒ වරදට ඔබ වහන්සේගේ කමාව ලැබේ වා. මින් මතු කිසි වරද ක්‍රියාවක් බුදුන් වහන්සේ කෙරෙහි නො කරමි.

## ධර්මය ක්ෂමා කරගැනීමේ ගාථාව

කායෙන වාචාය වා චෙතසා වා
ධම්මෙ කුකම්මං ච කතං මයායං
ධම්මො පටිග්ගණ්හතු අච්චයන්තං
කාලන්තරෙ සංවරිතුං න ධම්මෙ.

## මෙහි භාවය

කයින් වචනින් මනසින් මා විසින් ධර්ම රත්නය කෙරෙහි යම් වැරදි ක්‍රියාවක් කරන ලද්දේ ද; ඒ වරදට ධර්මරත්නය තෙමේ ක්ෂමා කෙරේ වා. මින් මතු ධර්මරත්නය කෙරෙහි කිසි වරදක් නො කරමි.

## සඞ්ඝයා ක්‍ෂමා කරගැනීමේ ගාථාව

කායෙන වාචාය වා චෙතසා වා
සඞ්ඝෙ කුකම්මං ච කතං මයායං
සඞ්ඝො පටිග්ගණ්හතු අච්චයන්තං
කාලන්තරෙ සංවරිතුං න සඞ්ඝෙ.

## මෛත්‍රී භාවය

කයින්, වචනින්, මනසින් යන තිදෙරින් මා විසින් සඞ්ඝරත්නය කෙරෙහි යම් වරද ක්‍රියාවක් කරන ලද්දේ ද; ඒ වරදට සඞ්ඝ රත්නය තෙමේ මට ක්ෂමා කෙරේවා. මින්මතු සඞ්ඝරත්නය කෙරෙහි කිසි වරද ක්‍රියාවක් නො කරමි.

## ෂොඩශ විධ චෛත්‍ය වන්දනාව

මහියඞ්ගනං නාගදීපං කල්‍යාණං
පදලාඤ්ඡනං
දිවාගුහං දීඝවාපි චෙතියං මුතියඞ්ගනං
තිස්සමහා විහාරඤ්ච බොධිං
මරිචවට්ටියං
සොණ්ණමාලි මහාචෙතිං ථූපාරාම
භයාගිරිං
ජෙතවනං සෙලචෙත්‍යං තථා
කාචරගාමකං
සොළසෙතානි ඨානානි අහං වන්දාමි
මුද්ධනා

### මෛත්‍රී භාවය

මහියඞ්ගනය, නාගදීපය, කැලණිය, ශ්‍රීපාද ලාඤ්ඡනය, දිවාගුහාව හෙවත් භගවා ලෙන, දිඝා වැව, මුතියඞ්ගනය, තිස්සමහාරාමය, අනුරාධ පුරයෙහි මහා බොධිස්ථානය, මිරිසවැටිය, රුවන්වැලි සෑය, ථූපාරාමය, අභයගිරිය, ජේතවනය, සෙලචෛත්‍යය, කතරගම කිරිවෙහෙර, යන මේ සොළසමහාස්ථාන මම මස්තකයෙන් නමස්කාර කරමි.

### මහියඞ්ගන චෛත්‍යය වැඳීම

ලඞ්කාය යත්ථ පඨමං සුගතො නිසජ්ජ
යක්ඛෙ දමෙසි හිත සාසන සාධනාය
ඨානෙ තහිං නිහිත කුන්තල ගීව ධාතුං
වන්දමි සාධු මහියඞ්ගන ථූපරාජං.

### මෛත්‍රී භාවය

සර්වඥයන් වහන්සේ සවකීය ශාසනය රක්ෂා කරනු පිණිස පළමු කොට ලක්දිව යම් තැනක යකුන් දමනය කළ සේක් ද;

ඒ ස්ථානයෙහි ලලාටධාතූන් හා ග්‍රීවාධාතූන් නිධානය කොට ස්ථාපිත කරණලද මහියඞ්ගන චෛත්‍ය රාජයා මනා කොට වඳිමි.

## නාගද්වීප චෛත්‍යය වැඳීම

හගිනිසුතමාතුලෙහි දින්නෙ
මණිපල්ලඞ්කවරෙ යහිං නිසින්නො
මුනි ධම්ම ම දෙසයි මුනිනං
සිරසා තං පණමාමි නාගදීපං

## මෙහි භාවය

යම් තැනෙක්හි මාතුල භාගිණෙය්‍ය දෙදෙනා විසින් දෙනලද උතුම්වූ මිණි-පළඟෙහි වැඩහිඳ සර්වඥයන් වහන්සේ භික්ෂූන්හට ධර්ම දේශනා කළ සේක් ද; පාරිභෝගික ධාතුවක්වූ ඒ උත්කෘෂ්ට මාණික්‍යපර්‍ය්‍යඞ්කය පිහිටුවා ස්ථාපිත කරනලද නාගද්වීප චෛත්‍යය මස්තක යෙන් නමස්කාර කරමි.

## කැලණි වෙහෙර වැඳීම

ආයාචනාය මණිඅක්ඛි මහොරගස්ස
යස්මිං නිසීදි භගවා මණිමණ්ඩපස්මිං;
තස්සො පතිට්ඨිත මුපට්ඨිත වීතරාග
කලයාණි චෙතියමහං සිරසා නමාමි.

### මෙහි භාවය

මණි අක්ඛික නම් නාගරාජයාගේ ආරාධනාවෙන් සර්වඥයන් වහන්සේ යම් තැනක මැණික් මණ්ඩපයෙහි වැඩ හුන් සේක්ද; ඒ මත්තෙහි කරන ලද කලයාණි චෛත්‍ය රාජයා මම මස්තකයෙන් අභිවාදනය කරමි.

## ශ්‍රී පාදය වැඳීම

1. කලයාණිතො ගගනතො මුනි යත්ථ
ගන්ත්වා
දස්සෙසි චක්ක වරලක්ඛණ පාදලඤ්ඡං
ලඞ්කාමහී වරවධූ මකුටොපමානං
වන්දමහෙ සුමනකූට සිළුච්චයන්තං.

2. යන්නම්මදය නදියා පුලිනෙව තීරෙ
යං සච්චබද්ධ ගිරිකෙ සුමනාච ලග්ගෙ
යං තත්ථ යොනකපුරෙ මුනිනොච පාදං
තං පාද ලාඤ්ඡන වරං සිරසා නමාමි.

## මෙහි භාවය

1. සර්වඥයන් වහන්සේ කැලණියේ සිට අහසින් වැඩ චක්‍ර ලක්ෂණ සම්පන්න වූ ශ්‍රී-පාද ලාඤ්ඡනය යම් තැනෙක දක්වූ සේක්ද, ලඞ්කා නමැති කාන්තාවට කිරීටයක් බඳුවූ ඒ සමන්තකූට පර්වත රාජයා නමස්කාර කරමි.

2. නර්මදනම් නදියෙහි වාලුකා තීරයෙහි වූ යම් ශ්‍රීපාද ලාඤ්ඡනයක් වේද; සච්චබඩ පර්වතයෙහි යම් ශ්‍රීපාදයක් වේද; සමන්තකූට පර්වතයෙහි යම් ශ්‍රීපාදයක් වේද, යෝනකද පුරයෙහි සර්වඥයන් වහන්සේගේ ශ්‍රීපාද ලාඤ්ඡනයක් වේ ද; ඒ උතුම් ශ්‍රීපාද ලාඤ්ඡන මස්තකයෙන් නමස්කාර කරමි.

## දිවාගුහාව හෙවත් භගවාලෙන වැඳීම

ඛීණාසවෙහි සහ පඤ්ච සතෙහි ගන්ත්වා
යස්මිං අකාසි භගවා සදිවා විහාරං
සංඵුල්ලසාල සුමනාවල පාද දෙසෙ
වන්‍දෙ සුසීතල මහං භගවා ගුහන්තං.

## මෙහි භාවය

සර්වඥයන් වහන්සේ යම් තැනෙක්හි පන්සියයක් රහතුන් වහන්සේ සමග දිවා විහාරය කළ සේක් ද; පිපිගිය සල්ගස් ඇති සමන්තකූට පර්වත ප්‍රාන්තයෙහි වූ ඒ භගවාලෙන වඳිමි.

## දීඝවාපි චෛත්‍යය වැඳීම

යත්ථ නිසීදිය භගවා
සසාවකො සාධු සමාපයි
සමාධිං තං දීඝවාපි ථූපං
රොහණපුර මණ්ඩනං වන්‍දෙ.

## මෙහි භාවය

යම් තැනෙක්හි වැඩහිඳ ශ්‍රාවකයන් සහිත සර්වඥයන් වහන්සේ සමාධි සමවන් සේක් ද; රුහුණු රටට ආභරණය වූ ඒ දීඝවාපි නම් චෛත්‍යය මම වඳිමි.

## මුතියඞ්ගන චෛත්‍යය වැඳීම

විමල සුසීතල භූරිජලාසයජ්
පභවකරං රජොහපි පිඤ්ජරං
ගිරි නදීවන දෙවෙන පූජිතං
නමාමි තුඞ්ග මුතියඞ්ගන චෙතියං.

## මෙහි භාවය

නිර්මල වූ ශීතල වූ බොහෝ ජලාසයන් ගෙන් යුක්ත (බදුලු නගරයෙහි) පිහිටි වන දෙවියන් විසින් පුදන ලද උස්වූ මුතියඞ්ගන චෛත්‍යය වඳිමි.

## තිස්සමහාරාම චෛත්‍යය වැඳීම

නික්ඛිත්ත සම්පුණ්ණ සසඞ්ක බිම්බ
සංකාස භාසන්ත ලලාට ධාතුං
අකාරයී තිස්ස නරිස්සරො යං
ථූපං නමෙ තිස්ස මහාවිහාරෙ.

## මෙහි භාවය

සම්පූර්ණ චන්ද්‍රමණ්ඩලය බඳුවූ ලලාට ධාතුව නිදන් කොට කාවන්තිස්ස රජ්ජුරුවන් විසින් කරවූ තිස්ස මහා විහාරයෙහි චෛත්‍යය නමස්කාර කරමි.

## අනුරාධ පුරයෙහි වූ ශ්‍රී මහාබෝධීන් වහන්සේ වැඳීම

සුපතිට්ඨිත රට්ඨනුරාධ පුරෙ
සමදිට්ඨිත දක්ඛිණ සාඛ භවං
සුභ මෙඝ වනම්බර මෙඝනිභං
ජය බොධිමහං පණමාමි වරං,

## මෙහි භාවය

අනුරාධ පුරයෙහි මහා මේඝ වනෝද්‍යාන-යෙහි පිහිටුවන ලද ශ්‍රී මහා බෝධි ශාඛාව මම නමස්කාර කරමි.

## මිරිසවැටි චෛත්‍යය වැඳීම

අභයරාජ සධාතුක කේතුවරං
සුනිධාය කතං බහුමානිතං
සකලහිතං පනමෙ සද
මරිච වට්ටික චෙතියමුත්තමං.

## මෙහි භාවය

අභයරජ (දුටු ගැමුණු) විසින් සර්වඥ ධාතු සහිත වූ උතුම් වූ ජයධ්වජය නිධාන කොට, කරවන ලද මිරිසවැටි චෛත්‍යය නමස්කාර කරමි.

## රුවන්වැලි චෛත්‍යය වැඳීම

සයිංසු යස්මිං සුගතස්ස ධාතු
නිම්මාය රංසුජ්ජල බුඩ රූපං
සුවණ්ණ මාලිති පතිත නාමං
වන්දමහං ථූපවරං මහග්ඝං.

## මෙහි භාවය

යම් සර්වඥ ධාතු කෙනෙක් කාන්තියෙන් බබලන බුඩරූපය මවා ප්‍රාතිහාර්‍ය්‍ය කොට යම් චෛත්‍ය රාජයක් කෙරෙහි සැතපුණු හෙයින් රුවන්වැලි නම් වී ද දුටුගැමුණු මහ රජහු විසින් කරන ලද ඒ චෛත්‍ය රාජයා නමස්කාර කරමි.

## ථූපාරාම චෛත්‍යය වැඳීම

යස්මිං දක්ඛිණ මක්ඛකංච–
මුනිනො පත්තප්පමානො තනු
ධාතුංචාපි නිධාය ලොක මහිතො–
ජබ්බන්න සොභාකුලෙ
දෙවානම්පියතිස්ස භූපති වරො–
කාරෙසි සඩා ධනො
ථූපාරාම වරං නමාමි තමහං–
අජ්ඣායිතං සත්ථුනා,

දෙවෙනි පැතිස්ස මහරජහු විසින් බුදුන්ගේ දකුණු අකු ධාතුව නිධානකොට කරවූ සියලු ලොකයා විසින් පුදනු ලැබුවා වූ ථූපාරාම චෛත්‍ය රාජයා මම නමස්කාර කරමි.

## අභයගිරි චෛත්‍යය වැඳීම

කත නවමණිකම්මෙ
ධාතුගබ්භෙ සුරම්මෙ
කනකවසභ කුච්ඡිං
ධාතුනා පූරයිත්වා
විහිතමභයරඤ්ඤො
ධඤ්ඤ පුඤ්ඤාධිවාසො
අභයගිරි විහාරෙ
චාරු ථූපං නමාමි.

## මෙහි භාවය

කරන ලද නව විධ මාණික්‍ය කම් ඇති ධාතු ගර්භයෙහි සවණ් වෘෂභ රාජයකුගේ කුක්ෂියෙහි ධාතු පුරවා වළගම්බා මහ රජහු විසින් කරවන ලද අභයගිරි විහාරයෙහි චෛත්‍ය රාජයා නමස්කාර කරමි.

## ජේතවනාරාම චෛත්‍යය වැඳීම

පතිට්ඨපෙත්වා ජින කායබන්ධනං
සකෙස ධාතුං සහ දෙහ ධාතුයො
මහා මහාසෙන නරින්ද කාරිතං
සුචෙතියං ජෙතවනං නමාමහං.

## මෙහි භාවය

සර්වඥයන් වහන්සේගේ පටි ධාතුව සහ කෙශ ධාතු ද ශරීර ධාතූන් ද නිධාන කොට මහාසේන මහ රජහු විසින් කරවන ලද ජෙතවන චෛත්‍ය රාජයා නමස්කාර කරමි.

## සෙල චෛත්‍යය වැඳීම

මහාදයො දෙවගණෙච නාගෙ
නුසාසයී යත්ථ ඨිතො මුනින්දො
සඬම්ම හෙමඬප භාසමානං
වන්දෙ සිලා චෙතියමබ්භුතං තං

## මෙහි භාවය

මහත් දයා ඇත්තා වූ සර්වඥයන් වහන්සේ යම් තැනක වැඩ සිට දෙවියන් හට සහ නාගයන් හටත් අනුශාසනා කළ සේක් ද, සද්ධර්ම නමැති ස්වර්ණ ධ්වජයෙන් බබළන්නා වූ අද්භූත වූ ඒ සේලචෛත්‍යය නමස්කාර කරමි.

## කිරිවෙහෙර වැඳීම

මුනින්දෙ නිසින්නො යහිං දෙවතානං
සමෙතාන මග්ගං සුදෙසෙසි ධම්මං
මහාසෙන දෙවෙන සම්මානනීයං
නමෙ කාචරග්ගාම ථූපස්ස ඨානං

## මෙහි භාවය

මුනීන්ද්‍රයන් වහන්සේ යම් තැනක වැඩ හිඳ දෙවියනට ධර්ම දෙශනා කළ සේක් ද; ඒ ස්ථානයෙහි බඳනාලද මහාසේන දිව්‍ය රාජ නම් වූ කතරගම දෙවියන් විසින් පිදිය යුතු වූ කතරගම කිරිවෙහෙර නමස්කාර කරමි.

## දන්ත ධාතු හෙවත් දළද වැඳීම

එකාපි දඨා තිදසෙහි පූජිතා
එකාපි ගන්ධාරපුරෙ මහීයති.
කාලිඞ්ගරඤ්ඤො විජිතෙ පුනෙකා
එකංපි වෙ නාගරාජා මහෙන්ති.

එකා දඨා තිදසපුරෙ එකා නාගපුරෙ අහු
එකා ගන්ධාර විසයෙ එකාසි පුන සිහලෙ
චතස්සොතා මහාදඨා නිබ්බාණ රසදීපිකා
පූජිතා නරදෙවෙහි තාපි වන්දමි ධාතුයො.

### මෙහි භාවය

සර්වඥයන් වහන්සේගේ එක් දළදවක් දෙවියන් විසින් පුදන ලදි. එකක් ගන්ධාරවාසීන් විසින් පුදන ලදි. එකක් කාලිඞ්ග රට රජු විසින් පුදන ලදි. එකක් නාග ලෝකයේ දිව්‍ය නාගරාජයන් විසින් පුදන ලදි. මෙසේ දිව්‍ය මනුෂ්‍යයන් විසින් පුදන ලද්ද වූ මේ දළද වහන්සේ සතර නම මම නමස්කාර කරමි. (කාලිංග රටේ වූ දළදව සිංහල දේශයේ වන බව දෙවැනි ගාථාවෙන් හැඟෙයි.)

## ශ්‍රීපාද ලාඤ්ඡන සතර වැඳීම

ලඞ්කායං සුමනාභිධාන සිඛරී-
කූටෙච යො නම්භයො
දෙසෙ නම්බද වාරිචුම්බිත තටෙ-
උච්චෙච සච්චාචලෙ
යං දස්සෙසි සද පජාපි ච හිතො-
දෙවාති දෙවො ජිනො
වන්දෙ තං පාද ලාඤ්ඡනං සුබ පදං-
දුක්ඛා පහං මුද්ධනා.

### මෙහි භාවය

ලංකාද්වීපයෙහි සමන්තකූට පර්වතයෙහිද, යොන් රට හෙවත් මක්කමෙහිද, නර්මදා නම් ගංගා තීරයෙහි ද, සච්චබඬ පර්වතයෙහි ද, සර්වඥයන් වහන්සේ විසින් පිහිටුවන ලද ශ්‍රීපාද ලාඤ්ඡන චතුෂ්කය මම නමස්කාර කරමි.

## බෝධි වන්දනා ගාථා

1. ඉන්දනීල වණ්ණපත්ත සෙතඛන්ධ
භාසුරං
සත්ථු නෙත්ත පංකජාභිපූජිතග්ග
සාතදං
අග්ගබොධි නාමවාම දෙවරුක්ඛ
වණ්ණිතං
තං විසාල බොධි පාදපං නමාමි සබ්බද

2. සත්ථා සුනීලායත නෙත්තහාරී
කන්තම්බුධාරා නිපතෙන සිඤ්චං
පූජෙසි තං සත්ත දිනානි බොධි
රාජං විරාජං සිරසා නමාමි,

3. මූලෙ දුමින්දස්ස නිසජ්ජ යස්ස
ධීරො සුබොධී චතුසච්ච මග්ගං
මාරං ජිනිත්වා සමරං මුනින්දෙ
තම්පාදපින්දං සිරසා නමාමි.

4. යස්ස මූලෙ නිසින්නොව
සබ්බාරි විජයං අකා
පත්තො සබ්බඤ්ඤුතං සත්ථා
වන්දෙ තං බොධි පාදපං.

5. ඉමෙ එතෙ මහාබොධි
ලොක නාථෙන පූජිතා
අහම්පි තෙ නමස්සාමි
බොධිරාජා නමත්ථු තෙ.

### මෙහි භාවය

1. ඉන්ද්‍රනීල මාණික්‍ය වර්ණ වූ පත්‍ර ඇති ශ්වේතවර්ණවූ කඳකින් බබලන්නා වූ, බුදු-රජාණන් වහන්සේගේ නෙත් නමැති පියුම් වලින් පූජාකරනු ලැබුවා වූ උතුම් නිවන් සැප ගෙන දෙන්නා වූ දිව්‍ය වෘක්ෂයකැයි වර්ණනා කරන ලද අග්‍ර බොධි නම් වූ උත්තම බොධි වෘක්ෂ රාජයා මම වඳිමි.

2. අතිශයි නිල් වූ දික් වූ නේත්‍රයන් ගෙන් සිත්කලු වූ ශාස්තෲන් වහන්සේ නේත්‍ර කාන්ති නමැති ජලධාරාවන් ඉසිමින් සත් දිනක් යම් බෝධියක් පිදූයේ ද; ඒ උතුම් වූ බොධිරාජයා මස්තකයෙන් වඳිමි.

3. යම් වෘක්ෂ රාජයක්හුගේ මූලයෙහි වැඩහිඳ ධෛර්‍ය්‍යවත් වූ මුනීන්ද්‍රයන් වහන්සේ සේනා සහිත වූ මරු පරදවා අග්‍ර වූ චතුස්සත්‍යය අවබෝධ කළසේක් ද, ඒ වෘක්ෂ රාජයා මස්තකය කරණකොට-ගෙන නමස්කාර කෙරෙමි.

4. ශාස්තෘ වූ සර්වඥයන් වහන්සේ යම් බොධිවෘක්ෂ මූලයෙක්හි වැඩහුන්සේක් ද, සියලු ක්ලේශ ශත්‍රූන් ප්‍රහීණ කොට සර්වඥතා ඥානයට පැමිණි සේක් ද, ඒ බොධිවෘක්ෂ රාජයා මස්තකයෙන් නමස්-කාර කරමි.

## අසූ මහා ශ්‍රාවකයන් වහන්සේලාට නමස්කාරය

1. කොණ්ඩඤ්ඤො භද්දියො වප්පො
මහානාමො ච අස්සජි
උපතිස්සො කොලිතො පුණ්ණො
අනුරුද්ධෝ ච කස්සපො.

2. භද්දියො කිම්බිලො චුන්දෙ
නන්දෙ ආනන්ද රාහුලො
උපසෙනො නාලකො දණ්ඩො
සොනො සීවලි සොභිතො,

3. සුනාපරන්තකො පුණ්ණො
රෙවතො පුන රෙවතො
කුමාරකස්සපො රාධො
වංගීසො සොභිතො භගු,

4. සෙලුදයි ච භද්දලි
භද්දියො ච ලකුණ්ටකො
තොදෙය්‍යපුත්තො අභයො
චතුකණ්ණි ච පෙසලො

5. පුණ්ණකො ධොතකො නන්දෙ
උපසීවො ච සොමකො
මෙඝරාජා ජිතො තිස්ස
මෙත්තගු පිංගියො ඉසි,

6. මෙණ්ඩියො කොටයීතො ජන්නො
උපවානො ච හද්දජි
කප්පිනකො මහාකප්පි
රට්ඨපාලො ච වක්කලි,

7. සාගතො ලක්ඛණොවාපි
භාරද්වාජො ගවම්පති
යසො පුණ්ණොති කච්චානො
පථන්කො චුල්ලපන්ථකො,

8. පිලිංදිවච්ඡො කුණ්ඩධානො
භග්ගුලො නන්‍දි කස්සපො
භද්දවුඩො අඞ්ගුලිමාලො
කස්සපො උභය කස්සපො,

9. අවෙලකස්සපො ථෙරො
සක්‍යපුත්තො විසාරදෙ
උරුවෙලකස්සපො වීරො
සුභූති සභියොපි ච,

10. එතෙ අසීති මහා ථෙරා
විමලා අග්ගතං ගතා
නමාමි සිරසා නිච්චං
තෙ මං රක්ඛන්තු සබ්බදා!

## මෙහි භාවය

කොණ්ඩඤ්ඤය, භද්දියය, වප්පය, මහ, නාමය, අස්සජිය, උපතිස්සය, කොලිතය, පුණ්ණය, අනුරුද්ධය, කාශ්‍යපය, භද්දියය, කිම්බිලය, චුන්දය, රාහුලය, උපසේනය, නාලකය, දණ්ඩය, සොණය, සීවලිය, සොභිතය, සුනාපරන්ත පුණ්ණය, රෙව-තය, ඛදිරවනිය රෙවතය, කුමාරකස්සපය, රාධය, වංගීසය, සොභිතය, භගුය, සෙලු-දයිය, භද්දලිය, ලකුණ්ටකය, තොදෙය්‍යා පුත්‍රය, උභයය, චතුකර්ණිය, පෙසලය, පුණ්ණය, ධොතකය, නන්දය, උපසීවය, සොමකය, මෙසරාජය, අජිතය, තිස්සය, මෙත්තගුය, පිංගියය, මෙණ්ඩියය, කොටී-තය, ජන්නය, උපවානය, භද්දජීය,

කප්පිනය, රට්ඨපාලය, වක්කලිය, සාගතය, ලක්ඛණය, භාරද්වාජව, ගවම්පතිය, යසය, පුණ්ණය, කච්චායනය, පන්ථකය, චූල්ලපන්ථකය, පිලින්දිවච්ඡය, කුණ්ඩදානය භග්ගුලය, නන්දිකස්සපය, භද්‍රාවුධය, අංගුලිමාලය, කස්සපය, උභයකාශ්‍යපය, අචෙල කාශ්‍යපය, ශාක්‍යපුත්‍රය, උරුවෙල කාශ්‍යපය, සුභිතිය, සභියය යන මෙකී අග්‍ර ස්ථානන්තර ප්‍රාප්ත වූ අසූමහ සව්වන් වහන්සේලා මම නිත්‍යයෙන් අභිවාදනය කරමි. ඒ උතුමෝ සඳ මා රකිත්වා!

**සර්වඥයන් වහන්සේ සත්සතිය ගත කළ ස්ථානයන් වැඳිම**

පඨමං බොධිපල්ලංකං;
දුතියංච අනිම්මිසං
තතියං චංකමණං සෙට්ඨං;
චතුත්ථං රතනාඝරං.

පඤ්චමං අජපාලඤ්ච;
මුචලින්දෙන ඡට්ඨමං
සත්තමං රාජායතනං;
වන්දෙ තං මුනිසේවිතං.

## මෛත්‍රී භාවය

පළමුවෙන් පර්‍යඞ්ක සතිය, දෙවෙනි අනිමිස ලොචන සතිය, තුන්වැනි ශ්‍රේෂ්ඨ වූ සක්මන් සතිය, සතරවැනි රතනාඝර සතිය, පස්වැනි අජපාල සතිය, සවැනි මුචලින්ද සතිය, සත්වැනි රාජායතන සතිය යන බුදුන් වහන්සේ ඇසුරු කළ ඒ සියලු ස්ථානයන් මම නමස්කාර කෙරෙමි.

## තෙරුවන් නමස්කාරය

බුද්ධං ධම්මඤ්ච සඞ්ඝං සුගත තනුභවා–
ධාතුයො ධාතු ගබ්භෙ
ලඞ්කායං ජම්බුදීපෙ තිදස පුරවරෙ–
නාගලොකෙ ච ථූපෙ.
සබ්බෙ බුද්ධස්ස බිම්බෙ සකල දස දිසෙ–
කෙස ලොමාදි ධාතුං
වන්දෙ සබ්බෙපි බුද්ධං දසබල තනුජං–
බොධි චෛත්‍යං නමාමි.

## මෙහි භාවය

බුදුන් දහම් සඟුන් ද, සර්වඥයන් වහන්සේගේ ශ්‍රී ශරීරයට අයත් ධාතු ගර්භයන්හි පිහිටි ධාතූන් ද ලක්දිවත්, දඹදිවත්, තව්තිසා දෙව්ලොවේත්, නාලොවෙහිත්, සුපිහිටි චෛත්‍යයන් ද, සියලු බුඩප්‍රතිමා වහන්සේලා ද, එම මහොත්තමයාගේ සිරුරෙහි හටගත් දශ දිශාවන්හි පිහිටි කෙශ ලොමාදි ධාතූන් ද, සියලු බොධි චෛත්‍යයන් ද මම මස්තකයෙන් අභිවාදනය කරමි.

## මල් පූජා කිරීම

1. වණ්ණ ගන්ධ ගුණොපෙතං
   එතං කුසුම සන්තතිං
   පූජයාමි මුනින්දස්ස
   සිරිපාද සරොරුහෙ.

2. පූජෙමි බුද්ධං කුසුමෙනනෙන
   පුඤ්ඤෙන මෙතෙන ච හොතු
   මොක්ඛං
   පුප්ඵං මිලායාති යථා ඉදම්මෙ
   කායො තථායාති විනාස භාවං.

## මෙහි භාවය

1. වර්ණයෙන් ද ගන්ධයෙන් ද ගුණයෙන් ද යුක්ත වූ මේ මල් සමූහය මුනීන්ද්‍ර වූ සර්වඥයන් වහන්සේගේ ශ්‍රීපාද පද්මයට පූජා කරමි.

2. මේ පුෂ්පයෙන් බුදු රජාණන් වහන්සේ පුදමි. මෙයින් ජනිත පුණ්‍යය හේතුකොට ගෙන මොක්ෂය හෙවත් නිර්වාණ සම්පත්තිය ලැබේ වා! යම් සේ මේ මල් මැලවී යේ ද එමෙන් ම මාගේ ශරීරය ද විනාශ භාවයට පැමිණේ.

## මල් පූජා කිරීමෙහි වාක්‍යයක්

නිරෝධ සමාපත්තිතො උට්ඨහිත්වා විය නිසින්නස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස, ඉමිනා පුප්ඵෙන පූජෙමි පූජෙමි පූජෙමි. ඉදං පුප්ඵපූජං බුද්ධ පච්චෙක බුද්ධ අග්ගසාවක මහාසාවක අරහන්තානං සභාව සීලං අහම්පි තෙසං අනුවත්තකො හොමි.

ඉදං පුප්ඵං දනි වණ්ණෙනපි සුවණ්ණං ගන්ධෙනපි සුගන්ධං, සණ්ඨානෙනපි සුසණ්ඨානං, ඛිප්පමෙව දුබ්බණ්ණං දුග්ගන්ධං දුස්සණ්ඨානං අනිච්චතං පාපුණිස්සති.

එව මෙව සබ්බෙ සඞ්ඛාරා අනිච්චා සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා සබ්බෙ ධම්මා අනත්තාති.

ඉමිනා වන්දන මානන පූජා පටිපත්‍යානු භාවෙන ආසවක්ඛයා වහං හොතු, සබ්බ දුක්ඛා පමුඤ්චතු!

## මෙහි භාවය

නිරොධ සමාපත්තියෙන් නැඟී සිටියාක් මෙන් වැඩහුන්නා වූ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට මේ මලින් පුදමි, පුදමි, පුදමි. මේ පුෂ්ප පූජාව බුදු පසේබුදු අග්‍ර ශ්‍රාවක මහා ශ්‍රාවක රහතුන් වහන්සේලාගේ සභාව ශීලයෙක. මම ද

උන්වහන්සේලාට අනුව හැසිරෙන්නෙක් වෙමි. දැන් මේ මල් ද වර්ණයෙන් යහපත් වර්ණ ඇත්තේ වේ. ගන්ධයෙන් ද සුගන්ධ ඇත්තේ වේ. සණ්ඨානයෙන් ද මනා සටහන් ඇත්තේ වේ. එතකුදු වුවත් (නොබෝ වේලාවකින්) දුර්වර්ණයට දුර්ගන්ධයට දුස්සණ්ඨානයට පැමිණීමෙන් අනිත්‍යභාවප්‍රාප්ත වන්නේ ය. එමෙන් ම සියලු සංස්කාර ධර්ම අනිත්‍ය ය. දුක්ඛ ය. සියලු ධර්ම අනාත්ම ය. මේ වැඳීම් බුහුමන් කිරීම් යනාදි පූජා ප්‍රතිපත්තීන්ගේ අනුභාවයෙන් කාමාදී ආශ්‍රවයන්ගේ ක්ෂය වීමෙන් සියලු දුකින් මිදෙම්වා හෙවත් අජරාමරවූ නිර්වාණ සම්පත්තිය ලබම්වා!

## ගසේ තිබියදී මල් පූජා කිරීම

කුසුමං ඵුල්ලිතං එතං පග්ගහෙත්වාන
අඤ්ජලිං
බුද්ධ සෙට්ඨං සරිත්වාන ආකාසම්පි
පූජයෙ

### මෙහි භාවය

සර්වඥයන් වහන්සේ සිහි කොට ඇඳිලි බැඳ පිපී ගිය මේ මල උන්වහන්සේට ආකාශයෙහි දී ම පූජා කරමි.

### සුවඳ පූජා කිරීම

සුගන්ධිකාය වදනං අනන්තගුණ ගන්ධිනං
සුගන්ධිනාහං ගන්ධෙන පූජයාමි තථාගතං.

### මෙහි භාවය

අප්‍රමාණ වූ ගුණ සුවඳක් ඇත්තා වූ සුගන්ධවත් ශ්‍රී ශරීරය හා ශ්‍රී මුඛය ඇත්තාවූ තථාගතයන් වහන්සේ මේ මනා සුවඳින් පූජා කරමි.

### සුවඳ දුම් පූජා කිරීම

ගන්ධ සම්භාර යුත්තෙන ධූපෙනාහං
සුගන්ධිනා
පූජයෙ පූජනෙය්‍යන්තං පූජාභාජන
මුත්තමං.

### මෙහි භාවය

සුවඳ සම්භාරයෙන් යුක්ත සුගන්ධ ධූමයෙන් ඒ උතුම් පූජාභාජන වූ පූජාර්හ වූ සර්වඥයන් වහන්සේ මම පුදමි.

### පහන් පූජා කිරීම

සනසාරප්පදිත්තෙන දීපෙන තම ධංසිනා
තිලොක දීපං සම්බුද්ධං පූජයාමි තමොනුදා

### මෙහි භාවය

තුන්ලොවට පහනක් වැනිවූ, මොහාන්ධකාරය නැති කරන්නා වූ සර්වඥ රාජොත්තමයාණන් වහන්සේ සනවූ කපුරු මෙන් දීප්තිමත් ප්‍රදීපාලෝකයෙන් මම පුදමි.

### පහන් පූජා කිරීමෙහි ආනිසංස

සම්මජ්ජකි සතං පුඤ්ඤං සහස්සම්මපි
ලිම්පනෙ
කප්පානි සත සහස්සානි දීපපූජා අසංඛියා.

## මෙහි භාවය

දගබ් බෝමලු ආදී පූජනීය ස්ථාන ඇමදීමෙහි හෙවත් පිරිසුදු කිරීමෙහි ආනිශංස සියයක් ද එම ස්ථානවල බිම පිරිබඩ ගැන්මෙහි ආනිශංස දහසක් ද, කිය හැකි වෙයි. කල්ප ශත සහශ්‍රයකිනි දු පහන් පූජාවෙහි ආනිශංසයෝ සඞ්ඛ්‍යා නැත්තාහුයි.

## ආහාර පූජා කිරීම

1. අධිවාසෙතු නො භන්තෙ, භොජනං
පරිකප්පිතං
අනුකම්පං උපාදය, පතිගණ්හාතු
මුත්තමං.

## මෙහි භාවය

1. ස්වාමීන් වහන්ස, අප විසින් කැප කරන ලද මේ උතුම් භෝජනය ඉවසන සේක්වා, අපට අනුකම්පා පිණිස පිළිගන්නා සේක්වා.

## පැන් පූජා කරන ගාථා

1. බුද්ධස්සනෙන පූජෙමි
මොචනත්ථාය වට්ටතො
උදකග්ගමග්ග සිඤ්චන්තා
ලභාමි පරමං සුඛං,

2. අධිවාසෙතු නො භන්තෙ
පානීය පරිකප්පිතං
අනුකම්පං උපාදය
පතිගණ්හාතු උත්තම.

3. සුගන්ධං සීතලං කප්පං
පසන්නං මධුරං සුභිං
පානීයමෙතං භගවා
පතිගණ්හාතු උත්තම.

## මෙහි භාවය

1. සංසාර වෘත දුක කෙරෙන් මිදී යාම පිණිස දුක්ඛ, සමුදය, නිරොධ, මාර්ග යන චතුරාර්ය සත්‍ය ධර්මයන් අවබොධ කරගත්තා වූ ලොවුතුරා බුදුරජාණන්

වහන්සේට මේ පානීය පරිභොජනීය පැනින් පූජා කරමි. මෙසේ කරන ලද පැන් පූජාමය පුණ්‍යකර්ම හේතුවෙන් අර්හත් මාර්ග ඥාන නමැති සලිලයෙන් කෙලෙස් නමැති ග්‍රීෂ්ම සන්තාපය නිවා උතුම් වූ නිවන් සැපතට පැමිණෙම්වා.

2. ස්වාමීන්වහන්ස? අප විසින් කැප කරන ලද මේ උතුම් වූ පැන් ඉවසන සේක්වා? අපට අනුකම්පා පිණිස පිළිගන්නා සේක්වා!

3. භාග්‍යවතුන් වහන්ස, සුවඳින් ද ශීතලයෙන් ද, යහපත් ප්‍රසන්නතාවයෙන් ද, යහපත් රසයෙන් ද, යුක්ත වූ කැප කරන ලද මේ උතුම් වූ පැන් අපට අනුකම්පා පිණිස පිළිගන්නා සේක්වා.

## ගිලන්පස පූජා කිරීම

අධිවාසෙතු නො භන්තෙ,
ගිලානපච්චයං ඉමං
අනුකම්පං උපාදය
පතිගණ්හාතු උත්තම,

### මෙහි භාවය

ස්වාමීන්වහන්ස, අප විසින් කැපකරන ලද මේ උතුම් වූ ගිලන්පස ඉවසන සේක්වා. අපට අනුකම්පා පිණිස පිළිගන්නා සේක්වා.

### දැහැත් පූජා කිරීම

නාගවල්ලි දලූපෙතං
චුණ්ණ පූග සමායුතං
තාම්බූලං පතිගණ්හාතු
සතං පූජෙමිදං ජිනො

### මෙහි භාවය

බුලතින් සහ සුණු පුවකින් ද යුක්ත වූ මේ බුලත් මම පූජා කරමි. මෙය සර්වඥයන් වහන්සේ ඉවසන සේක්වා.

### කැවිලි වර්ග පූජා කිරීම

අධිවාසෙතු නො භන්තෙ
ඛජ්ජකං පරිකප්පිතං
අනුකම්පං උපාදය
පතිගණ්හාතු උත්තම.

### මෙහි භාවය

ස්වාමීන්වහන්ස, අප විසින් කැප කරන ලද මේ උතුම් වූ කැවිලි වර්ග ඉවසන සේක්වා. අපට අනුකම්පා පිණිස පිළිගන්නා සේක්වා.

### ව්‍යඤ්ජන වර්ග පූජා කිරීම

අධිවාසෙතු නො භන්තෙ
ව්‍යඤ්ජනං පරිකප්පිතං
අනුකම්පං උපාදය
පතිගණ්හාතු උත්තම.

### මෙහි භාවය

ස්වාමීන්වහන්ස, අප විසින් කැප කරන ලද මේ උතුම් වූ ව්‍යඤ්ජන වර්ග ඉවසන සේක්වා. අපට අනුකම්පා පිණිස පිළි-ගන්නා සේක්වා.

### යාගු (කැඳ) පූජා කිරීම

අධිවාසෙතු නො භන්තෙ
තරලං පරිකප්පිතං
අනුකම්පං උපාදය
පතිගණ්හාතු උත්තම.

## මෙහි භාවය

සවාමීන්වහන්ස, අප විසින් කැප කරන ලද මේ උතුම් වූ යාගු (කැඳ) ඉවසන සේක්වා. අපට අනුකම්පා පිණිස පිළි-ගන්නා සේක්වා.

## ප්‍රතිපත්ති පූජාවෙන් පූජා කරන ක්‍රමය

ඉමාය ධම්මානුධම්ම
පටිපත්තියා බුද්ධං පූජෙමි;

ඉමාය ධම්මානුධම්ම
පටිපත්තියා ධම්මං පූජෙමි.

ඉමාය ධම්මානුධම්ම
පටිපත්තියා සඞ්ඝං පූජෙමි;

අද්ධා ඉමාය පටිපත්තියා
ජරාමරණම්හා පරිමුඤ්චිස්සාමි.

## 14. ධර්ම විභාගය
### ආර්ය අෂ්ටාංගික මාර්ගය

1. සම්මා දිට්ඨි, 2. සම්මා සංකප්පො, 3. සම්මා වාචා, 4. සම්මා කම්මන්තො, 5. සම්මා ආජීවො, 6. සම්මා වායාමො, 7. සම්මා සති, 8. සම්මා සමාධි යන මෙය ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය නම් වන්නේ ය.

1. සම්මාදිට්ඨි – සම්‍යක් දෘෂ්ටිය නම්:— දුක්ඛ සත්‍යය, සමුදය සත්‍යය, නිරොධ සත්‍යය, මාර්ග සත්‍යය යන යම් චතුස්සත්‍යය දක්නා නුවණ හෙවත් මිථ්‍යාදෘෂ්ටියෙන් පහ වූ සම්‍යක්දෘෂ්ටි යයි.

2. සම්මා සංකප්පො – සම්‍යක් කල්පනාව නම්:— වස්තුකාම, ක්ලෙශකාම යන මෙය බොහෝ දුකට කරුණු වන බැවින් එ බඳු උපද්‍රව ඇති වූ ගිහි ගෙයින් නික්ම ඉන් මිදෙන්නේ කවර ප්‍රකාරයෙකින් දැ යි සිතන නෛෂ්ක්‍රම්‍ය කල්පනාව ද, සත්ත්වයන් කෙරෙහි ආක්‍රොශයෙන් නසීවායි

නොසිතන අව්‍යාපාද කල්පනාව ද, සත්ත්ව-යන්ට හිංසා පීඩා නො කරමියි සිතන්නා වූ අවිහිංසා කල්පනාව ද, යන මේ කල්පනා තුන සම්‍යක් කල්පනාවයි.

3. සම්මාවාචා – සම්‍යක් වචනය නම්:— මුසාවාද, පිසුණාවාචා, සම්පප්‍රලාප, ඵරුසා-වාචා, යන මේ දුච්චනයන් ගෙන් පහ වූ සම්‍යක්වචනයයි.

4. සම්මා කම්මන්තො – සම්‍යක් කර්මා-න්ත නම්:— ප්‍රාණඝාතය, අදත්තාදනය, කාම මිත්‍ථ්‍යාචාරය, සුරාපානය, යන මේ සතර දුශ්චරිතයන් ගෙන් දුරු වූ සම්‍යක් කර්මාන්ත යයි.

5. සම්මා ආජීවො – සම්‍යක් ජීවිකාව නම්:— සර්වඥයන් වහන්සේ විසින් එපා කර වදරන ලද අධර්ම වෙළෙඳාම් පස, එනම් ආයුධ වෙළෙඳාම ය, සත්ත්ව වෙළෙඳාම ය, මාංස වෙළෙඳාම ය, මද්‍ය වෙළෙඳාම ය, විෂ වෙළෙඳාම ය, යන මේ අධර්මයෙන් කරන වෙළෙඳාම් ආදිය හැර ධාර්මික ක්‍රියාවෙන් දිවි පැවැත්වීම සම්‍යක් ජීවිකාවයි.

6. සම්මා වායාමො – සම්‍යක් ව්‍යායාම නම්:— උපන් අකුසල් සිත් නැති කිරීම පිණිස ද, නූපන් අකුසල් සිත් නොඉපැදීම පිණිසද, නූපන් කුසල් සිත් ඉපදවීම පිණිසද, උපන් සිත් කුසල් දියුණුකර ගැනීම පිණිසද, යන මේ සතර කාරණය ගැන ත්‍රිවිධ ද්වාරයෙන් ම උත්සාහ කිරීම සම්‍යක් ව්‍යායාම නම් වෙයි.

7. සම්මාසති – සම්‍යක් සතිය නම්:— ශරීරය දෙතිස් කුණපයන් ගෙන් යුක්තවන බැවින් අනිත්‍ය ය, දුක්ඛ ය, අනාත්ම ය යි මෙනෙහි කරන කායානුපස්සනාව ද, සුඛ, දුක්ඛ, උපෙක්ෂා වශයෙන් ත්‍රිවිධ වේදනාව අනිත්‍යාදි වශයෙන් මෙනෙහි කරන වෙදනානුපස්සනාව ද රාගද්වෙෂාදි චිත්තයන් අනිත්‍යාදි වශයෙන් මෙනෙහි කරන චිත්තානුපස්සනාව ද, පඤ්ච නීවරණ ධර්මයන් එනම්:— කාමච්ඡන්ද නීවරණ හෙවත් රූප ශබ්දදි පඤ්චකාමයන්හි ඇලීම, ව්‍යාපාද නීවරණය හෙවත් අනුන් නසම්යි යන ද්වෙෂය, ථිනමිද්ධ නීවරණය හෙවත් සිතේ හැකිලීම හා මැලිගතිය හෙවත් ක්‍රියා කිරීමට

නොයොදන සවභාව වූ අකර්මණ්‍යතාව සිතේ උත්සාහයක් ශක්තියක් නැති බවද, උඩච්චකුක්කුච්ච නීවරණය හෙවත් අළු ගොඩකට කැටක් හෙළු කලක් මෙන් සිත නොසන්සුන් වීම හා කළ නොකළ දෙයට පසුතැවිලි වීමද, විචිකිච්ඡා නීවරණය හෙවත් බුඩ ධර්ම සඞ්ඝ ආදීන් සැබෑ දෝ නැද්දෙ යන සංශයද යන මෙය හා රූප වෙදනා සංඥ සංස්කාර විඥන යන පඤ්චස්-කන්ධාදී ධර්මයන් අනිත්‍යාදි වශයෙන් මෙනෙහි කිරීම වූ ධර්මානුපස්සනාව ද යන මේ සතර සති පට්ඨානයෙහි පිහිටි සිත සම්‍යක් සතිය හෙවත් සම්‍යක් සිහියයි.

8. සම්මා සමාධි – සම්‍යක් සමාධිය නම්:— වස්තු කාම ක්ලෙශ කාමයන් කෙරෙන්ද, පඤ්චනීවරණයන් කෙරෙන් ද, සිත වෙන් කොට බඹලෝ වැස්සන් වශ-යෙන් ප්‍රථමධ්‍යානය, ද්වීතීයධ්‍යානය, තෘතීයධ්‍යානය, චතුර්ථධ්‍යානය, යන

මෙයින් සිත එකඟ ව පැවැත්වීම නෛ-
ර්‍යාණික බැවින් සම්‍යක් සමාධිය නම්
වන්නේ ය.

(සියලු කුශල් ඉපදවීමට සම්‍යක් දෘෂ්ටිය ද
සියලු අකුසල් ඉපදීමට මිථ්‍යාදෘෂ්ටිය ද
හේතු වන බව මින් දත යුතුයි.)

## සප්තාර්ය ධනය

සද්ධාධනං සීල ධනං හිරිඔත්තප්පියං ධනං
සුත ධනඤ්ච චාගො ච පඤ්ඤා
මෙ සත්තමං ධනං

## මෙහි භාවය

රාජ චෞර ශත්‍රැ ආදීන් විසින් පැහැරගත
නොහෙන ආර්ය ධනයෝ සත් දෙනෙක්
වෙති. හේ කවරහු ද යත්:—ශ්‍රද්ධා ධනය,
ශීල ධනය, හිරි ධනය, ඔත්තප්ප ධනය,
ශ්‍රැති ධනය, ත්‍යාග ධනය, ප්‍රඥ ධනය, යන
මොහුයි.

1. ශ්‍රද්ධා ධනයː-යම් පුද්ගලයෙක් තෙම ශීල සම්පන්න ආර්ය ශ්‍රාවකයන් දකිනු කැමැති වේ ද, ධර්ම ශ්‍රවණයෙහි ඇලුම් ඇති වේ ද, දාන පරිත්‍යාගයෙහි ප්‍රිය වේ ද, සර්වඥ ගුණානුස්මරණය කොට අදහයි ද, හේ වනාහි ශ්‍රද්ධා ධනය ඇත්තා වෙයි.

2. ශීල ධනයː-යමෙක් තෙම සත්ත්ව ඝාතනයෙන් වැළකේ ද, අදත්තාදානයෙන් මද්‍යපානයෙන් වැළකේ ද, හේ වනාහි ශීල ධනය ඇත්තා වෙයි.

3. හිරි ධනයː-යමෙක් තෙම ප්‍රාණඝාත අදත්තාදාන කාම මිත්‍ථ්‍යාචාරයයි කියනු ලබන ත්‍රිවිධාකාරවූ කාය දුශ්චරිතයට ද, මුසාවාද පිසුණාවාච පරුෂාවාච සම්ඵප්‍රලාප යයි කියනු ලබන චතුර්විධ වාග් දුශ්චරිත යට ද අභිද්‍යා ව්‍යාපාද මිථ්‍යාදෘෂ්ටි යයි කියනු ලබන ත්‍රිවිධ මනොදුශ්චරිතයට සහ අවශෙෂ අකුශල කර්ම කරනයෙහි ලජ්ජා පිළිකුල් ඇතිවන්නේද හේ වනාහි හිරිධනය ඇත්තේ වෙයි.

4. ඔත්තප්ප ධනය:— යමෙක් තෙම සතර වැදැරුම් වූ වාග් දුශ්චරිතය ද, අන්සතු දෙය තමාහට වී නම් යෙහෙකැයි සිතන විසම ලොභය ද, අනුන් නසිත්වා වධයට පැමිණෙත්වා යයි සිතන ව්‍යාපාදයද, ඇති සැටි වරදවා සිතීම වූ මිථ්‍යාදෘෂ්ටියද, යන මේ ගැන භයට තැතිගැන්මට පැමිණේ නම් හේ වනාහි ඔත්තප්ප ධනය ඇත්තේ වෙයි.

5. ශ්‍රැති ධනය:—යමෙක් තෙම නවාඞ්ග ශාස්තෘ ශාසන පර්‍ය්‍යාප්ති ධර්‍මය බෙහෙවින් අසා ජානනය කළේ වේ ද එය ශිලාලෙඛන-යක් මෙන් සිතෙහි දරන්නේ වේ ද හේ වනාහි ශ්‍රැති ධනය ඇත්තේ වෙයි.

6. ත්‍යාග ධනය:—යමෙක් තෙම හරන ලද රාග ද්වෙෂාදිය හා දුරු කරන ලද ලොභ චේතනාවෙන් යුක්ත වේ ද අවඞ්ක ශ්‍රද්ධාධ්‍යාශයෙන් දන ධර්‍ම කරන්නේ ද හේ වනාහි ත්‍යාග ධනය ඇත්තේ වෙයි.

7. ප්‍රඥ ධනය:—යමෙක් තෙම රූප වේදනා සඥ්ඤා සඞ්ඛාර විඥ්ඤාණ යැ යි කියනු ලබන පඤ්චස්කන්ධයන්ගේ විභාග මනා ලෙස දැනගැනීමට පොහොසත් වූ ප්‍රඥවෙන් යුක්ත වේද හේ වනාහි ප්‍රඥ ධන ඇත්තේ වෙයි.

තවද මේ ශ්‍රද්ධා ශීල, හිරි, ඔත්තප්ප, ශ්‍රැති, ත්‍යාග, ප්‍රඥ යන සප්ත විධ ධනයෝ තුමූ යම් බඳු වූ ස්ත්‍රියකට හෝ පුරුෂයකුට හෝ ඇතිවෙද්ද ඒ සප්තාර්ය ධනයෙන් යුක්ත වූවා හට සහල් නැලියක් කහවණුවක් පමණකුදු නැත්තේ වී නමුත් ශ්‍රද්ධාදී සප්ත ධනයෙන් ආඪ්‍ය බැවින් දිළිඳු නො වේ යයි බුද්ධාදී මහොත්තමයෝ කීහු.

### දශ පුණ්‍ය ක්‍රියා

දනං සීලඤ්ච භාවනා
පත්ති පත්තානුමෝදනා
වෙය්‍යාවච්චාපචායඤ්ච
දෙසනා සුති දිට්ඨිජු.

## මෙහි භාවය

1. දනය, 2. ශීලය, 3. භාවනාය, 4. අනාය-යන්ට පින් දීම ය, 5. පින් ගැනීම ය, 6. ගිලන් අයට හෝ සිල්වත් අයට වතාවත් කිරීම ය, 7. පිදීම ය, 8. බණ කීම ය, 9. ධර්ම ශ්‍රවණය කිරීම ය, 10. දෘෂ්ටිය ඍජු කිරීම ය හෙවත් සම්‍යක් දෘෂ්ටිකව විසීම ය යන මොහු දශ පුණ්‍ය ක්‍රියාවෝ වෙත්.

## සසර කතර හෙවත් සංසාර කාන්තාරය

සංසාර කාන්තාරය යන්නෙහි කාන්තා-රය නම් කවරහ යත්:—චොර කාන්තාරය වයාල කාන්තාරය, අමනුෂ්‍ය කාන්තාරය, නිරුදක කාන්තාරය, අල්ප භක්ෂ්‍ය කාන්තාර ය යි පස් ආකාර වේ.

තවද යම් තැනෙක්හි සොර භය ඇද්ද හේ චොර කාන්තාරය වන්නේ ය. යම් තැනෙක්හි සිංහ, දිවි, වලස් ආදීන්ගෙන්

උවදුරු ඇද්ද, හේ ව්‍යාලකාන්තාරය වන්නේ ය. යම් තැනෙක්හි යක්ෂ රාක්ෂස භය ඇද්ද හේ අමනුෂ්‍ය කාන්තාරය වන්නේ ය. යම් තැනක්හි ස්නාන පානයට නිසි වතුර නැද්ද හේ නිරුදක කාන්තාරය වන්නේ ය. යම් තැනෙක්හි කෑමට නිසි අල මුල් ඵල පත්‍රාදිය පමණකුදු නැති වේ ද හේ අල්ප භක්ෂ්‍ය කාන්තාරය වන්නේ ය. යම් සේ මේ පස් ආකාරවූ කාන්තාර ඝොර භයාදියෙන් උවදුරු සහිත වේ ද, එමෙන් ම මේ සංසාරය ද ජාති භයාදියෙන් උපද්‍රව සහිත බැවින් ''කාන්තාරය'' නම් වන්නේ මැයි.

### සර්වඥයන් වහන්සේ සසර සයුරෙහි පරතෙරට ගිය අන්දම

''භව සාගර පාරගතො'' යන තන්හි බුදුහු සසර සයුරෙහි පරතෙරට ගිය පරිදි කෙසේ ද යත්:— එක් සමයෙක්හි බුදුහු කොසොල් දනවුවෙහි සැරිසරන්නා වූ ද්‍රොණ නම් බ්‍රාහ්මණයාට වන වැඩ දැක

මාගීයෙහි පාද ලාඤ්ඡන දක්වා ගොස් එක් රුක් මුලෙක්හි වැඩ උන්හ. එ දවස් ද්‍රොණ බමුණු තෙම සියක් වටනා වස්ත්‍රයක් හැඳ, පන්සියයක් වටනා වස්ත්‍රයක් ඒකාංශ විසින් පිරිවරන ලදු ව ඒ මාගීයට එළඹියේ පාද ලකුණු දක ඒ පා සටහනින් ගොස් රුක් මුල්හි වැඩහුන් බුදුන් දක රූප දශීන-යෙන් පුදුමයට පැමිණ, මේ තෙමේ අනාගතයෙහි මහෙශාක්‍ය එක් දේවතා-වෙක් වනැයි සිතා අනාගත වශයෙන් ප්‍රශ්න කරනුයේ, භවත් තෙම දෙවියෙක් දැයිඇසුයේය. බුදුහු දෙවියන් නොවෙමියි වදළහ. ගාන්ධවීයෙක් දැයි පිළිවිත. ගාන්ධවී නො වෙමියි වදළහ. යක්ෂ වෙයි හෝයිපිළිවිත. යක්ෂ නො වෙමියි වදළහ. මනුෂ්‍යයෙක් දැ යි පිළිවිත. එසේද නොවෙ-මියි වදළහ.

එසඳ බමුණා සිතන්නේ මේ තෙම දේව ගන්ධවී යක්ෂ මනුෂ්‍ය යන සතර කොටසින් එකෙකුදු නො වෙයි කියයි. එබැවින් මොහු

ගෙන් ම ඔහුගේ තතු විචාරම්යි සිතා එසේ නම් භවත් තෙම කවරෙක් වෙයි හෝයි පිළිවිත. එබසට සර්වඥයන් වහන්සේ යම් කෙලෙස් කෙනෙකුන් ප්‍රහීණ නො-කිරීමෙන් දෙවි වෙම් නම් ඒ ආශ්‍රවයෝ මට නැත්තාහ. ගන්ධර්ව වෙම් නම්, යක්ෂ වෙම් නම්, මනුෂ්‍ය වෙම් නම් ඒ ආශ්‍රවයෝ මට පිරිහුණාහු ය. යම් සේ මහනෙල් මල් වනාහි දියෙහි ඉපිද දියෙහි වැඩි දියෙන් රියන් පමණ තැන් නැඟී විල් හොබවමින් බමර සමූහයා සතුටු කරමින් උදකය හා නො ඇලී සිටී ද, එමෙන් ම මම ද ලොක-යෙහි ඉපිද ලොකයෙහිම වැඩි ලෝකයෙන් නැඟී ලොකධර්ම හා ඇලුම් නො කොට වෙසෙමි. එබැවින් මා බුදුහයි දනුව බමුණැයි වදළහ.

එසඳ බමුණු අනාගාමිව දෙළොස් දහසක් පද්‍යයෙන් සර්වඥ ගුණ වනා ''ද්‍රොණ ගර්ජනා'' නම් ගර්ජනාවක් කළේය. ඉන් ඉක්බිති බුදුහු පිරිනිවී කල දඹදිව් තෙලෙහි

උපන් මහත් කලහයක් සන්හිඳුවා දෙව් මිනිස් හට ධාතු බෙදා දින. මෙසේ බුදුනට පුනර්භවෝත්පත්තියක් හෙවත් නැවත භවයෙහි ඉපදුමක් නොමැති බැවින් සසර සයුරෙහි පරතෙරට ම ගියාහු නම් වෙත්.

### දශ දාන වස්තු

අන්නං පානං සරං වත්ථං
යානං මාලා විලෙපනං
ගන්ධො සෙය්‍යා පදීපෙය්‍යං
දාන වත්ථු සියුං දස

### මෙහි භාවය

ආහාර දානය, අම්බ පාන ජම්බු පානාදී පානවර්ග දානය, ආවාස දානය, වස්ත්‍ර දානය, යාන වාහන දානය, පුෂ්පදානය, ශරීරාලෙපය පිණිස සාදන ලද විලේපන දානය, කස්තූරි කපුරු සඳුන් ආදි සුගන්ධ දානය, ඇඳ පුටු

කොට්ට මෙට්ට ඇඳ ඇතිරිලි ආදි සයන දනය, තෙල් පහන් ආදි දනය, යන මේ දශය දශ දන වස්තූහු වෙත්.

## අටපිරිකර පිළිගන්වන අන්දම

1. පාත්‍රය, 2. දෙපට සිවුර, 3. තනිපට සිවුර, 4. අඳනය, 5. පටිය, 6. කරකැත්ත, 7. ඉදිකටුව, 8. පෙරහනය යන මේ අට අෂ්ටපරිෂ්කාර නම් වේ. මෙම අටපිරිකර සඞ්ඝයා හට පූජා කරන විට ''ඉමං අට්ඨ පරික්ඛාර සඞ්ඝස්ස දෙම'' යන වාක්‍යයය තෙවිටක් කියා දනය කරන්නේ ය.

පැලවෙන්නාවූ ඇට ආදී යම් කිසි ද්‍රව්‍ය යක් උපසම්පද සඞ්ඝයාට පිළිගන්වන කල ආයුධයකින් හෝ දුව පත්තෙකින් හෝ ගටා ''කප්පියං භන්තෙ'' යන වාක්‍යය තුන්වරක් කියා කැප කර දිය යුතුයි.

## සාංඝික දනය

සතර නම පටන් වැඩිවූ ගණනකට චීවරාදි සිව් පසින් යමක් පිදීම සාංඝික දන නමි. ආහාර දෙන විට ''ඉමං භික්ඛං

භික්ඛු සඞ්ඝස්ස දෙම'' යන වාක්‍යය තෙවිටක් කියා දිය යුතුයි. ආහාර පානාදිය සමග සිවුරු පිළි පරිෂ්කාර සමග නම් ''ඉමං භික්ඛං සපරික්ඛාරං භික්ඛු සඞ්ඝස්ස දෙම'' යන වාක්‍යය තෙවරක් කියා දිය යුතුයි.

## කඨින දානය

මෙය වනාහි වස්සාන සෘතුවේ චීවර මාසයේ දී භික්ෂූන් විසින් පිළිගන්නා වස්ත්‍රයකි. ආමිස දානයන් අතුරින් කඨින දානය මහත් ආනිශංස දයක වේ. මෙම දානය දෙන දායකයා විසින් තුන් සිවුරු අතුරින් තමා හට දිය හැකි වූ එකකට පොහොනා වස්ත්‍රයක් පෙර වස් විසූ තැනක දී ම සඞ්ඝයාට පැමිණවිය යුතුයි. වස් පවාරණය කළ වස්සාන සෘතුවේ අන්තිම මාසයේ දී ම දිය හැකි වේ. අන් කලෙක නො දිය හැකියි. භික්ෂූන් විසින් එ දවස්හි ම කපා මසා පඬු පොවා ඇතිරිය යුතුයි.

## දන් දෙන්නවුන්ගේ ප්‍රභේද

දන දස ය, දන සහාය ය, දනපතිය යි දන් දෙන්නෝ ත්‍රිභෙදයකි. යමෙක් තෙමේ මිහිරි දෙය අනුභව කොට අනාය-යනට අමිහිරි දෙය දෙන්නේ නම් ඒ තැනැත්තේ දනයට දස ව දෙන බැවින් ''දන දස'' නම් වන්නේ ය. යමෙක් තෙමේ තමා අනුභව කරන ආහාරය අනායයනටත් දේ නම් හේ දනයට යහළු-වකුව දෙන බැවින් ''දන සහාය'' නම් වේ. යමෙක් තෙමේ යම් කිසිවෙකින් තමා යැපිම කොට අනුන්හට මිහිරි දෙය දේ නම් ඒ තැනැත්තේ දනයට සවාමි ව දෙන බැවින් ''දනපති'' නමැයි දත යුතුයි.

## ශීලය පරිස්සම් කළයුතු විධිය

කිකීව් අණ්ඩං චමරීව වාලධිං
පියංව පුත්තං නයනං ච එකකං
කථෙව සීලං අනුරක්ඛමානකා
සුපෙසලා හොථ සද සගාරවා

## මෙහි භාවය

බිජු රක්නා කිරළ පක්ෂියකු මෙන් ද; වාලධිය රක්නා සෙමර මුවකු මෙන් ද, ප්‍රිය පුත්‍රයෙකු රක්නා, ස්නෙහවන්ත මෑණි කෙනෙකු මෙන් ද එක ම ඇසක් ඇතිව එය රක්ෂා කරන පුරුෂයකු මෙන් ද, සිදුරු නො කොට, දුබල නො කොට, කිලුටු නො කොට කඩ නො කොට ශීලය රක්ෂා කට යුතු ය යනු මෙහි භාවය යි.

## ධර්‍ම දනය කිරීමේ යහපත

සබ්බදනං ධම්මදනං ජිනාති
සබ්බරසං ධම්මරසො ජිනාති
සබ්බරතිං ධම්මරති ජිනාති
තණ්හක්ඛයො සබ්බ දුක්ඛං ජිනාති.

## මෙහි භාවය

සියලු සත්ත්‍වයන්ගෙන්ද, සියලු රසයන්-ගෙන් ද, සියලු ඇලීම් අතුරින් ද, ධර්‍ම දනය, ධර්‍ම රසය, ධර්‍ම රතිය, උතුම්

වන්නේ ය. තණ්හාව ක්ෂය කිරීමෙන් සියලු සංසාර දුකින් මිදෙන්නේ ය යනු මෙහි භාවය යි.

## පඤ්ච ශීලය

1. ප්‍රාණාතිපාතය හෙවත් ප්‍රාණඝාත කිරීම, 2. අදත්තාදානය හෙවත් සොරකම් කිරීම. 3. කාමමිත්ථ්‍යාචාරය හෙවත් කාමයෙහි වරදවා හැසිරීම. 4. මුසාවාදය හෙවත් බොරුකීම. 5. සුරාපානය හෙවත් මත්පැන් පානය කිරීම යන මේ පස පංච දුශ්චරිතය නම් වන්නේ ය. ඉන් වැළැක්ම පංචශීලය නම් වන්නේ ය. ඉන් පළමු කොට ප්‍රාණඝාතයෙහි අඞ්ග සහ ආදීනව කියනු ලැබේ.

## ප්‍රාණඝාතයෙහි අඞ්ග සහ ආදීනව

සත්තෙ සත්තොති සඤ්ඤා ච
වධක චිත්ත මුපක්කමො;
තෙන ජීවිත නාසො ච;
සහත්ථා චතුරඞ්ගිකො.

සත්ත්වයකු කෙරෙහි ප්‍රාණවත් සතෙකැයි දැනගැනීම ද, ඔහු මරමි යන චෙතනාව ද, ආයුධාදීන් කැපුම් ඇනුම් වශයෙන් කරන ලද උපක්‍රමය ද, එම උපක්‍රමයෙන් දිවි තොර කිරීම දැයි තමා අතින් සිද්ධ වන ප්‍රාණ හිංසා තොමෝ අඞ්ග සතරක් ඇති වන්නී ය.

යථාධිප්පාය ආණත්ති
තථා තං සම්පටිච්ඡනං
පටික්ඛෙපං අවිනාසෙත්වා
තථෙව කරණම්පි ච

පයොගෙ හෙට්ඨාවුත්තෙසු
ඡඩ්ඩෙත්වා සහතෙපි ච
ඡලඞ්ගාණත්තියා හොන්ති
පාණ හිංසාති දීපයෙ

අදහස් පරිද්දෙන් සත්ත්වඝාතනය පිණිස නියොග කිරීමය, එමෙන්ම එය ගිවිසීමය හෙවත් මරන්නාහු විසින් ඔහුගේ ඉල්ලීම පිළිගැනීමය, ඔහු විසින් එමෙන් ම නැසීමය

යන මේ අඞ්ග තුන හා ඉහත දක්වූ සවහස්ත මරණයෙහි තමා අතින් කරන ප්‍රයොග හැර සෙසු සත්ත්ව සංඥවය, නසමියි යන චේතනාවය, ඊට නියමිත උපක්‍රමය යන අඞ්ගත්‍රය හා එක්ව ඇති වීමෙන් සිදු වන ප්‍රාණහිංසා තොමෝ ෂට්විධාඞ්ගයයි ප්‍රකාශ කරණ ලදි.

සබ්බොපභොග ධනධඤ්ඤ විසෙසලාභි
රූපෙනභො සමකරද්ධජ සන්තිභොපි
යො යොබ්බනො පි මරණං ලභතෙ අකාම
කාමං සදතු පරපාණ හරො නරොහි.

ප්‍රාණවධ කළ සත්ත්වතෙම මෙම ජන්මයෙහිම ශස්ත්‍ර හුල් ආදීන් ඇනුම් කෑමෙන්ද, මරණයෙන් මතු නරකයෙහි ඉපිද අනෙක කෝටි සහශ්‍ර වර්‍ෂයෙහි පැසී එයින් මිදී යම් කිසි කුශල ක්‍රියාවක් හේතුකොටගෙන උප භොග පරිභොගාදී වස්තූන්ගෙන් ආඪ්‍ය වූ කුලයෙක්හි රූචින් අනඞ්ගයා සමව උපන් නේවී නමුත් ඒ සම්පත් නොවළඳාම නව යොවුන් කල ම මිය යෙයි.

න අන්තලික්ඛෙ න සමුද්දමජ්ඣෙ
න පබ්බතානං විවරං පවිස්ස
න විජ්ජ ති සො ජගතිප්පදෙසො
යත්ථට්ඨිතො මුඤ්චෙය්‍ය පාපකම්මං

යම් පුද්ගලයෙක් තෙම ප්‍රාණඝාතාදි අකුසල් කළේ ද හෙතෙම ආකාශගත වුව ද, මහා සමුද්‍ර මධ්‍යගත වුව ද, පර්‍වත විවරයකට ප්‍රවිෂ්ට වුව ද, පෙරදිග ආදී යම් පෘථිවි ප්‍රදෙ-ශයෙහි සිටියේ ද තමා විසින් කරන ලද ඒ පාප කර්මයෙන් මිදෙනු නොහැක්කේ ය. කෙසේ ද යත් :–

ඉකුත් කල බරණැස සිසාන එක් ගොවියෙක් තම ගොනකු හීයට අකීකරු වී මඳක් තැන් ගොස් නිතර ම වැද හොවීමෙන් කර්මාන්තයෙහි නොපවත්නා බැවින් උහු කෙරෙහි උරණව මෙවක් පටන් සුවසේ වැද නිදවයි කියා පිදුරු ගින්නෙන් දවා මැරී ය. හෙතෙම ඒ පාප කර්මය හේතු කොටගෙන බොහෝ කාලයක් අවීචියෙහි ඉපිද

ගින්නෙන් පැසී ඉන් මුක්ත වූ කල සියක් අත් බැව්හි කවුඩු යෝනියෙහි ඉපිද ගෙවල වැදගත් ගින්නෙන් ම අහස දී ද මළේ ය.

බල්ලකු කර වැලි කළයක් බැඳ දියෙහි ගලා මැරූ ස්ත්‍රියක් අවීචියෙහි ඉපිද බොහෝ කාලයක් අපායෙහි පැසී කර්මාවශෙෂයෙන් සියක් අත්බැවෙහි සමුද්‍ර මධ්‍ය ගත කල කර වැලි කළ බැඳ දියෙහි ගල්වා මරන ලදු.

ගොයකු තුඹසෙක හිර කොට හොවා නිරාහාරකොට, සත් දිනෙකින් හළ ගොපලු දරුවෝ සත්දෙනෙක් උහු නොමැරුයෙන් නිරා නො ගොස් තුදුස් අත්බැවක ම පර්වත විවරයට වන්නාහු ගලින් වැසුණු ලෙන් දෙර ඇතිව සත් සත් දවස් නිරාහාර වූහු.

තවද මල්ලිකා දේවිය එක් ජන්මයෙක්හි කුලදුවක් ව (ස්වාමිහුගේ ගෙයි) පතිකුලයෙහි වසන්නී අමුත්තකු වන් කළ ඔහුට

බත් දෙනු කැමතිව මස් සොයා නොලදින් පැසුළු දෙර හොත් එළුවකු හිස සිඳින, ඒ පාපයෙන් බොහෝ කලක් නරකයෙහි පැසී ඉන් මිදී ගිය කල උපනුපන් තන්හි ඒ එළුවාගේ ලොම් ගණනින් හිස් සිඳුම ලදුවාය. එයින් තමා ''දින්නා'' දේවි කල්හි ඒ සියයක් රජුන් හිස් සිඳුවන්නට සිටි බරණැස් රජු හට මේ බව ප්‍රකාශ කරන ලදී. එහෙයින් කියන ලදී.

පාණං නහානෙ නවසාතයෙය්‍ය
නවානුජක්ඛා හනතං පරෙසං;
සබ්බෙසු භූතෙසු නිධාය දණ්ඩං
යෙ ථාවරා යෙ ච තසන්ති ලොකෙ.

ලොකයෙහි කිසි සත්ත්වයකුට හිංසා පිණිස දණ්ඩ දනාදිය නොකිරීම ද, ප්‍රාණඝාත නොකිරීම ද, අන්‍යයන් ලවා නොකරවීම ද, ඒ පිණිස අනුනොදන්ම ද, තරයේ පැවැත්විය යුතු.

## අදත්තාදානයෙහි අඞ්ග සහ ආදීනව

පරපරිග්ගහභණ්ඩො ච –
පරිපරිග්ගහසඤ්ඤිතා
ථෙය්‍යාදිස්වෙක චිත්තංච –
ඨානා චවනමෙවච
පයොගෙවෙති පඤ්චඞ්ගං –
අදින්නං සාහත්ථිකං මතං.

අන්‍යයන් සතු බඩුවක් බව ය, අනුන් අයිතියයි දැනුම් ඇති බව ය, සොරකමින් ගනිමි යන චෙතනාව ය, තුබූ තැනින් පහ කිරීම ය, තම අතින් ඊට කරන ප්‍රයෝගය යන මේ පස සඞහස්තයෙන් සිදු වන අදත්තාදානයෙහි අඞ්ගයි.

යථාධිප්පාය ආණත්ති,
තථා තංසම්පටිච්ඡනං
පටිඤ්ඤං අවිනාසෙත්වා,
තථෙව කරණම්පි ච
ඨානා චාවම්පයොගං ච,
අපනෙත්වාන පඤ්චසු
ජළඞ්ගාණත්තියා හොති
අදින්නං පරිදීපිකං

සොරකම් කිරීමට නියම කිරීම ය. එපරිද්දෙන් ඒ නියෝගය පිළිගැන්ම ය, ඒ පිළිගැන්ම, කඩ නො කොට කිරීම ය, යන මේ තුන් අඞ්ගය සහ ඉහත දක් වූ අඞ්ගපස අතුරින් තුබූතැනින් පහකිරීම ද, සියතින් ඒ ගැන කරන ප්‍රයෝගය ද, යන මේ අඞ්ග දෙක හැර අන් සතු දෙයක් බව ද අන්සතු යයි දැනීම ද සොරකම් කරමි යන සිත ද යන මෙකී තුන් අඞ්ගය එක්ව ඇණවීමෙන් වන අදත්තාදනය ෂට්විධ අඞ්ගයෙක් ඇත්තේ යයි ප්‍රකාශ කරන ලදී.

යො යාවකො භවති භින්න කපාලහත්ථො
මුණ්ඩො ධිගක්ඛර සතෙහිච තජ්ජයන්තො,
භික්ඛං සදරි භවනෙ ස කුචෙල වාසො
දෙහි පරත්ථ පරවිත්ත හරො නරොහි.

මේ ජන්මයෙහිම මහත් අනය ව්‍යසන-යට පමුණුවන අදත්තාදනය කළාහු නරකාදි සිව් අපායෙහි අනෙක වර්ෂකොටි සහස්‍ර-යෙහි දුක් විඳ එයින් මිදී ගිය කල ප්‍රෙතාත්ම

භාවයට පැමිණ බලවත් සා පිපාසයෙන් පීඩිත ව නොයෙක් අනන්තකල්පයෙහි වෙහෙසී ඉදින් මිනිස් කයක් ලදහු නම් දිළිඳු යාචකයකු ව හිස මුඩු කොට කබල් ගත් අත් ඇතිව කඩ මාලු ගොතා කළ අඳනා පිළි ඇතිව හිස් පිරුණු උකුණන් ඇතිව වෙර පිරුණු දූලි කුණු ඇතිව ළය පිරුණු ශොක ඇතිව කැඳ බත් ද හිඳින ගෙයක් දෙරක් ද නො ලදින් බොහෝ ජනයා විසින් කියන නින්ද වචනයෙන් තර්ජනය කරනු ලබමින් හැම කල්හි සිහමින් මනුෂ්‍ය ප්‍රෙතව වෙවුලමින් ඇවිදිති.

තතො අදින්නං පරිවජ්ජයෙය්‍ය
කිංචි ක්වචිසාවකො බුජ්ක්ධිමානො;
න හාරයෙ හරතං නානුජඤ්ඤා;
සබ්බං අදින්නං පරිවජ්ජයෙය්‍ය.

මෙසේ මෙහි ආදීනව සහිත අඞ්ග ලක්ෂණ සැදූහැති අය දූන ජන්මාන්තරයට නොයන තුරු මහානර්ථ කරවන බැවින් අන්සතු දෙය ගිනි සෙයින් විෂ සෙයින් ඝොර විෂ සර්පයන් සෙයින් ද කල්පනා

කොට යම් තැනක තුබූ පර ද්‍රව්‍ය තමා ද නොගන්නේ ය. අනුන් ලවා ද නොගන්-වන්නේ ය. අනුන් හට ගන්න අනුඥ ද නොකරන්නේ ය. මේ ආදි වශයෙන් චෞර කර්මයෙන් හාත් පසින් ම වෙන් ව දානමානාදි පුණ්‍ය කර්මයෙහි නියුක්ත ව සග මොක් සිරි සැප අත්පත් කළ යුතු ය.

''පරද්‍රව්‍ය හරණමාත්මද්‍රව්‍යස්‍ය විනාශ හෙතුං'' යනු කියූ බැවින් අන්සතු දෙය (සොරකමින්) ගැන්ම ස්වකීය ද්‍රව්‍යයාගේ විනාශයට හේතු වන බවත් දත යුතුයි.

### කාමමිත්ථ්‍යාචාරයෙහි අඞ්ග සහ ආදීනව

පරිපග්ගහිතිත්ථී චපරිපග්ගහ සඤ්ඤිතා,
අතික්කමණ චිත්තං ච
තථෙවාතික්කමොපි ච;
එවං පරස්සදරෙසු
චතුරඞ්ගො අතික්කමො.

අන් සතු ස්ත්‍රියක බව ද, අන් සතුය යන දැනිම ද, සෙවනය කරමි යන සිත ද, එසේ කිරීම දැයි මෙසේ ස්ත්‍රීසෙවනය සතර අඞ්ගයක් ඇත්තේ යි. තව ද පරස්ත්‍රී සෙවනය කළාහු මෙම ජන්මයෙහි ම රජුන් විසින් කරන ලද ධන දණ්ඩයෙන් ද, පීඩා විඳ මරණින් මතු නරකයෙහි ඉපිද අනේවා සුවහස් මුළුල්ලෙහි දුකින් පැසී එයින් මිදී මනුෂ්‍යාත්මයක් ලදහු නම් නොයෙක් ආත්මභාවයන්හි ස්ත්‍රී නපුංසකාදි බවට පැමිණෙත්.

තව ද කප් ලක්ෂයක් පිරූ පැරුම් ඇති අප ආනන්ද මහ තෙරහු එක් ජන්මයෙක්හි සිද්ධ කළ පරදර පාප කර්ම විපාකයකින් නරකයෙහි ඉපිද බොහෝ කාලයක් දුකින් පැසී එයින් මිදීගිය කල තුදුස් අත්බැවෙක ස්ත්‍රී වූ හ. සත් අත්බැවෙක අණ්ඩච්ඡේද බවට පැමිණියාහු ය.

තව ද මේ අනඳ මහ තෙරණුවෝ සසර වසන කල ''මගධ රට රජගහ නුවර'' රන් කරුවකුව පාපමිත්‍ර සංසර්ගයෙන් පරදර පාප

කර්‍ම කොට ජීවිතාවසානයෙහි අවකාශ ලත් අන්‍ය පුණ්‍ය කර්‍මයකින් ''වග්‍ර රට කොසඹෑ නුවර'' අසූ කෙළක් ධන ඇති සිටුදරුවකු ව ඉපිද යහපත් මිත්‍ර සේවනයෙන් බොහෝ පින්කම් කොට මියගොස් රජගහ නුවරදී කළ පව් හේතු කොටගෙන රෞරව මහා නරකයෙහි ඉපිද අනෙක වර්‍ෂ කෝටි සහස්‍රයෙහි පැසී බොහෝ දුක් විඳ පව් අවසන් කොට ''කණ්ඨ'' ජනපදයෙහි කොටළුවකු ව උපන්නාහු ඇමති දරුවන් විසින් මොහු ජවසම්පන්න බලසම්පන්න කරමැයි අණ්ඩච්ඡෙද කොට තමන්හට වාහන කරන ලද්දහ. මෙසේ අනඳ මහ තෙරුන් වැනි පින්වතුන් පවා පරදර සංගමයෙන් අපාය දුක්විඳ එයින් මිදීගිය කල්හි අණ්ඩච්ඡෙදත්වය නපුංසකත්වයට ස්ත්‍රීත්වයට ද පැමිණිකල අප වැන්නවුන් ගැන කියනු ම කවරේ ද?

තවද කාශ්‍යප බුදුරජුන් දවස බරණැස් නුවර කුල දරුවෝ සතර දෙනෙක් පරස්ත්‍රී සෙවනය කොට අවීචියෙහි ඉපිද එක්

අන්තඃ කල්පයෙහි පැසී එයින් සැව ලොහොකුඹු නිරයෙහි ඉපිද කකියන උදුනෙහි සාල් සෙයින් උඩු යටි ව පැසෙන්-නාහු තිස්වා දහසෙකින් පතුලට බැස තිස්වා දහසෙකින් මුව විටට නැංගාහු ඔවුනොවුන් දක කථා කරන්නට කල් නැත්තෙන් ''දු'' යන ''ස'' යන ''න'' යන ''සො'' යන සතර අකුරක් සතර දෙන කියා ලොහොකුඹුහි නිමග්න වූහු. කොසොල් මහරජ මධ්‍යම යාමෙහි මෙය අසා බියපත්ව මල්ලිකා දේවියගේ නියමයෙන් බුදුන් කරා ගොස් සැල කෙළේය. බුදුහු මේ සතරදෙන පරදර පරිහරණයෙන් නිරය දුක් විඳිනා පරිදි දක්වා ඔවුන් කී සතර අකුරු ගෙන එහි අදහස් ගාථායෙන් මෙසේ වදළෝ.

1. දුජ්ජීවිතං අජීවිම්හ
   යෙ සන්තෙ න දදම්හසෙ;
   විජ්ජමානෙසු භොගෙසු
   දීපංනාකම්හ අත්තනො.

අපි නපුරුවූ ජීවිතයෙන් ජීවත් වීමු. භොග සම්පත් ඇති කල්හිත් දිය යුත්තන්ට නුදුන්නෙමු. තමා හට ප්‍රතිෂ්ඨාධාර වූ කිසිවක් කර නොගත්තෙමු. යනු මෙහි අභිප්‍රායයි.

2. සට්ඨිංවස්ස සහස්සානි
පරිපුණ්ණානි සබ්බසො;
නිරයෙ පච්චමානානං
කද අන්තො භවිස්සති.

නිරයේ පැසෙන්නාවූ අපට සර්වප්‍රකාර යෙන් වර්ෂ සැට දහසක් පිරී ගියේය. කවර කලෙක්හි මෙහි කෙළවරක් වන්නේ ද?

3. නත්ථි අන්තො කුතො අන්තො
න අන්තො පතිදිස්සති;
තදාහි පකතං පාපං
මම තුය්හං ච මාරිස.

එම්බා පින්වත, මා විසින් ද තා විසින් ද එ කල්හි කරන ලද පාප කර්මය කෙළවරක් නැත්තේය. කොයින් කෙළවරක් ලැබේ ද කෙළවරක් නම් නොපෙනෙන්නේ ම ය.

4. සොහි නූන ඉතො ගන්ත්වා
යොනිං ලද්ධාන මානුසිං;
වදඤ්ඤු සීල සම්පන්නො
කාහාමි කුසලං බහුං.

ඒකාන්තයෙන් ඒ මම මෙයින් මිදී ගොස් මිනිස් පියක් ලද කල්හි දන් දෙන සුලු ව ශීලයෙන් යුක්ත ව බොහෝ වූ පින්කම් කරන්නෙමි.

මේ සතර ශබ්දයන් කොසොල් රජු ඇසූ තැන් පටන් ගෙන ඔවුහු නිරය පත්ලට බසිති, ඔවුන් බස්නා තිස්වාදහසින් තව එක්වා දහසකුදු නොගියෙන් මේ දක්වාත් ඔවුහු සතර දෙන අපා දුක් විඳිත්. මෙසේ කුරිරු දරුණු දුක් විඳ පව් ගෙවී ගිය කල මිනිස් පියක් ලද කල ගැහැනු වෙති. මව්පියනට ද පවා අප්‍රිය වෙති. සියලු ජනයන් විසින් ද ද්වේෂ කරනු ලබතියි වදළසේක.

තව ද මෙම කාමමිත්‍ථ්‍යාචාරයේ විපාකය උපනුපන් ජාතියෙහි බොහෝ සතුරන් ඇති වන බව ද, මව් පියනට අප්‍රිය වන බව ද,

ආහාර පාන සෙනසුන් ආදිය නොලැබෙන බව ද, නපුරු සවප්න දැකීමෙන් දුක සේ සයනය කරන බව ද, එසේ ම දුකසේ පුබුදින බව ද, අපාය භයින් නොමිදෙන බව ද, ස්ත්‍රීව නපුංසක ව උපදින බව ද, ක්‍රොධ බහුල බව ද අසම්පූර්ණ අඞ්ග ප්‍රත්‍යඞ්ගයන් ඇති බව ද යන මේ ආදී අනිෂ්ට ඵල විපාක දෙන ඉන් සම්පූර්ණයෙන් වෙන් ව වාසය කට-යුත්තේ ය.

### මෘෂාවාදයෙහි අඞ්ග සහ ආදීනව

ලද්ධි ගුහන චිත්තංච
— වාචා තදනු ලොමිකා
වචනත්ථ පටිවෙධො ච
මුසාවාදෙ තිවඞ්ගිකො.

දැකීම ඇසීම වශයෙන් තමන් දැනගත් දෙය සඟවන සිත ද, ඊට ඇතුළත් වචනයද ඒ වචනාර්ථය අසන්නාහු දැනගැනීම ද, මෙසේ මුසාවාදයට අඞ්ගත්‍රයක් ඇත්තේ ය යි දත යුතුයි.

එකං ධම්මං අතීතස්ස මුසාවාදිස්ස
ජන්තුනො
විතිණ්ණ පරලොකස්ස
නත්ථි පාපං අකාරියං.

සැබෑ කීමෙන් දුරු වූ පරලොව වින්ද යුතු සැප අත්හැරීමෙන් මුසාවාදී පුද්ගලයා හට මෙලොව දී නොකට හැකි පවක් නම් නැත්තේ ය.

මෙසේ මහ දෙස් වූ මුසාවාද බණන තැනැත්තේ ''අභූතවාදී නිරයං උපෙති''යි වදළ බැවින් නරකයෙහි ඉපිද අනෙක වර්ෂ කොටි සහස්‍රයෙහි පැසී එයින් මිදී මිනිස් පියට පැමිණි කල්හි තමන් නොකී නොකළ දෙය කී කළ දේ යයි අභූතයෙන් ලොකයා විසින් කියනු ලැබෙයි. දුගී වෙයි. ජඩ-වෙයි. අඥාන වෙයි. ගොළු වෙයි. විරූප දෙහ ඇතිවෙයි. නොහොත් අප්‍රිය දර්ශනය වෙයි. සපුන් හට මෙන් දෙ දිව් ඇති වෙයි. කපිල මත්ස්‍යයාට මෙන් දුර්ගන්ධ මුඛ

ඇති වෙයි. දරුවන් නො ලබයි. උපදිත් නම් දුහු වෙති. උපන ද නොකීකරු ව ධූර්ත වෙති.

තව ද පෙර චේතිය නම් රජෙක් විය. ඔහු මුඛයෙන් මහනෙල් මල් සුවඳ හමයි. ශරීරයෙන් සඳුන් සුවඳ වැහෙයි. ආකාශයෙහි බඩ පයඹිකව සිටිනු පෝසත් වෙයි. කඩු ගත් විද්‍යාධරයෝ සතර දෙනෙක් සතර දිග රක්ෂා කෙරෙත්. ඒ රජු බොරු කී තැන් පටන් විද්‍යාධරයෝ ආරක්ෂා නොකොට ගියාහ. මුවෙන් වැහෙන මහනෙල් මල් සුවඳ ද ශරීරයෙන් වැහෙන චන්දන ගන්ධයද අන්තර්ධාන විය. ආකාශයෙහි නොහින්ද හී භූමියෙහි පතිත ව පෘථිවි විවර ව ස්වකීය ශරීරයෙන් ම නිරයෙහි වැටිණ. (මේ තෙමේ පළමුවෙන් බොරුව ලොව පහළ කළ බව දත යුතුයි.)

එබැවින් මෙකී මුසාවාදයෙන් වෙන් ව සුභාෂිත වචනයක් ම බිණිය යුතු වේ. ධර්මයක් ම කිය යුතු ය. අප්‍රිය වදන් නොකිව මනා වේ. සත්‍යයක්ම කිය යුතුය. අසත්

තෙපුල් නොබිණිය යුතු ය. මේ චතුර්විධ අඞ්ගයෙන් යුක්ත වචනය සුභාෂිතය වෙයි. දුර්භාෂිතය නො වෙයි. මෙසේ වූ සුභාෂිත වචනයක් ම මිස දුර්භාෂිත වචනයක් නොම බිණුව මනා බැවින් බොහෝ කොට නොබිණිය යුතු වේ. බොහෝ බිණුම කවර දෙෂය යත්:– බොහෝ කොට බණන තැනැත්තේ මුසාවාද කියන්නේය. පෛශුණ්‍යය ද කියන්නේය. පරුෂ තෙපුල් ද කියන්නේය. සම්ඵප්‍රලාපය ද කියන්නේය. කාය භෙදයෙන් හෙවත් මරණින් පසු අපා දුකට ද පැමිණෙන්නේය. එසේ හෙයින් සුභාෂිත තෙපුලක්ම මිසමහානර්ථකර වූ දුර්භාෂිත වචනයක් නො බිණිය යුතුම වේ.

## මද්‍යපානයෙහි අඞ්ග සහ ආදීනව

සුරාපානය වනාහි ශීලය කිලිටි කෙරෙයි. ප්‍රඥා හීන කෙරෙයි. ඒ ඒ ගුණ අන්තර්ධාන කෙරෙයි. එහි අඞ්ග මෙසේ යි.

සුරා භාවො පාතු කාමො
අජ්ක්ධොහරණප්පයොගතා;
තෙනෙව අජ්ක්ධොහරණං
සුරාපානස්ස චාතුරො.

සුරාවක් බව දැනීම ද පිමට කැමති බව ද එයට උපා යෙදීම ද බීම ද යන මෙය මද්‍යපානය කිරීමෙහි සිව් අංගයවන්නේ ය.

යමකු විසින් හලාහල විෂයක් බඳු සුරාපානය කරන ලද්දේ ද; හෙතෙම නරක-යෙහි ඉපිද අනෙක වර්ෂ කොටි සහස්‍රයෙහි පැසී එයින් මුක්තව මිනිස් පියසක් ලද කලද උන්මත්ත වෙයි. ලජ්ජා රහිත වෙයි. ගුණ හීන වෙයි. දුප්පත් වෙයි. සියලු කල ම ඥාති ව්‍යසනාදීන් යුක්ත ව ශොක පරිදෙවාදි දුක්ඛ භාගී වෙයි. අනෙක ජාතිවල විරූප දේහයෙන් යුක්ත වෙයි. එහෙයින් කිහ.

උම්මත්තකා විගත ලජ්ජ ගුණා භවන්ති
දීනා සද ව්‍යසන සොක පරායනා ච
ජාතා භවෙසු විවිධෙසු විරූපදෙහා
පිත්වා හලාහල විසංච සුරා විපක්ඛා.

සුරාපානය කළ සත්ත්ව තෙම දිව්‍ය ලොකයට යන මාර්ගය ආවරණය කරන්නේ ය, හෙවත් දෙව්ලෝ ගමන වළක්වන්නේ ය. රාග, ද්වෙෂ, මොහ යන මලත්‍රය උපදවන්නේ ය. බුදු, පසේ බුදු, මහ රහතුන් යන තුන් මහා පුරුෂයන් විසින් ගර්හා කරන ලද්දේ ය. එය කාය, වාග්, මනස් යන තුන් දෙරින් වන දුශ්චරිතයනට කාරණ වන්නේ ය.

එබැවින් සත්පුරුෂ තෙම මද්‍ය පානයෙහි විපාක මෙසේ යයි දැන ඉන් හාත්පසින් ම වැළක දනාදි දෙලෝ වැඩ දයක පුණ්‍යක්‍රියාවන්හි අනවරතයෙන් යෙදිය යුතුයි.

## දශ අකුශල කර්‍ම

කායකම්මං තිධා වුත්තං
වාචා කම්මං චතුබ්බිධං
මනසා තිවිධඤ්චෙව
දසකම්ම පථා ඉමෙ;
පාණඝාත පරද්දබ්බං
පරදාරඤ්ච කායතො
මුසා පෙසුඤ්ඤ ඵරුසං
සම්ඵප්පලාප වාචතො
අභිජ්ඣා චෙව ව්‍යාපාදෙ
මිච්ඡාදිට්ඨි ච මානසෙ.

කය පිළිබඳ කාය කර්‍ම අකුශල් තුනෙක, වචනය පිළිබඳ වාචාකර්‍ම අකුශල් සතරෙක, සිත පිළිබඳ මනඃකර්‍ම අකුශල් තුනෙකැයි යන මෙය දශ අකුශල කර්‍ම පථය නම් වේ. ශරීරයෙන් වන පව් තුන නම්:– පරපණ වැනසීම යයි කියනු ලබන ප්‍රාණ ඝාතය ද, අනුන් සතු වස්තුව සොර සිතින් ගැනීම වූ අදත්තාදානය ද අන් අඹුවන් සේවනය කිරීම වූ කාම මිථ්‍යාචාරය ද යන මෙයයි.

වචනයෙන් වන පව් සතර නම්:– බොරු කීම නම් වූ මුසාවාදය ද, කේලාම් කීම වූ පෛශුණ්‍යය ද, රළු බස් බිණීම වූ ඵරුෂ වචනය ද, නිෂ්ඵල බස් කීම වූ සම්පප්‍රලාපය ද යන මෙයයි. සිතින් වන පව් තුන නම්:– අන්සතු දෙයෙහි ලොභ කිරීම වූ අභිධ්‍යාව ද, අන්‍යයන්ගේ විනාශයට තුටු වූ ව්‍යාපාදය ද, වැරදි ලෙස කල්පනා කිරීම හෙවත් දැකීම වූ මිථ්‍යාදෘෂ්ටිය ද යන මේ ය.

මෙකී දශ අකුශල කර්ම අතුරින්:– ප්‍රාණඝාතය, අදත්තාදානය, කාමමිථ්‍යාචාරය, මුසාවාදය යන සතර සම්බන්ධ විස්තර පඤ්ච දුස්සීලයෙහි විස්තර කළ බැවින් ඒවා එයින් බලා දතයුතුයි. ඉතිරි කේලාම් කීම, පරුෂ වචන බිණීම, සම්පප්‍රලාප කීම, අභිද්ධ්‍යාව, ව්‍යාපාදය, මිථ්‍යා දෘෂ්ටිය යන සය සම්බන්ධ විස්තර මෙතැන් පටන් දක්වනු ලැබේ. ඒවා මෙසේ අවබොධ කට යුතුයි.

## පෛශුන්‍ය හෙවත් කේලාම් කීම

"යාය වාචාය යස්ස හදයෙ අත්තනො පිය භාවං පරස්ස ච සුඤ්ඤභාවං කරොතීති සා පිසුණා වාචා" යම් වචනයක් කරණකොට ගෙන යමෙකුගේ ළයෙහි තමහට ඇති වූ ප්‍රිය භාවය ද, අන්හට ඇතිවූ ප්‍රිය භාවය ද, ශූන්‍යකොට නැති කරන්නේද, හේ වනාහි පෛශුන්‍ය වචනය හෙවත් කේලාම් කීම නම් වන්නේය. තවද මිත්‍රයකුගෙන් හෝ වෙන යම් කෙනෙකුගෙන් හෝ යමක් අසා ඔවුන් හෙද කරවන අදහසින් එය අනික් අයට කියා ද, ඒ අයගෙන් ඇසූ දෙය නැවත අනික් මිත්‍රයා හට කියා ද, මෙපරිද්දෙන් ඔවුනොවුන් බිඳවා ප්‍රිය භාවය ශූන්‍ය කොට වෛර කරවන අදහසින් වචන පහළ කිරීම කේලාම් කීම යයි කියනු ලැබේ

1. දෙදෙනකු හෙද කරවමියි යන සිතද
2. සතුටින් එසේ කරනු කැමති වීම ද
3. ඒ වචන දැන්වීමට කරන ව්‍යායාම ද

යන මේ අඞ්ග තුන පෛශුන්‍යයට අයිති වේ. කේලාම් කීම හේතු කොටගෙන නූපන් ඩබර උපදින්නේ ය. උපන් ඩබර බොහෝ වන්නේ ය. මේ අකුශල ක්‍රියාව කරන තැනැත්තේ මරණින් මතුයෙහි අනෙක වර්ෂ කොටි සහස්‍රයක් මුළුල්ලෙහි නරකයෙහි නොයෙක් දරුණු දුක් විඳ එයින් මිදී ප්‍රෙතාත්ම භාවයෙහි ද උපදින්නේ ය. මිනිස් කයක් ලද කල මනුෂ්‍ය ප්‍රෙත ව අනෙක දුක්ඛයන්ට භාජනව කබල් ගත් අත් ඇතිව කඳුළු පෙරෙන මුහුණින් යුක්ත ව හිඟමින් ඇවිදින්නේ වේ.

### පරුෂ වචන

''යාය පන අත්ත නම්පි පරම්පි ඵරුසං කරොතීති සා වාචා නෙව කණ්ණසුඛා න හදය සුඛා'' :– යම් වචනයක් කරණ කොට ගෙන තමන් ගේ ද, අනුන් ගේ ද ළය රළු කරන්නේ ද, ඒ වාක්තොමෝ කනට සැප නො වේ; හෘදයට සැප නො වේ. මෙසේ අප්‍රියවූ පරුෂ වචනය නම් සැඩොලා ය

යනාදි වශයෙන් ජාති සටා බිණීමද, ඇසීමට මිහිරි නොවන්නාවූ ඒ ඒ ජනපදයන්හි අවමන් වූ පරිභව වූ හීන නාමයකින් හෝ හීන ගොත්‍රයකින් හෝ සටා බිණීමද යන මේ ආදි වශයෙන් ලොව පැවැති නින්ද බසින් බිණීම වේ.

පරං බො හෙතු කාමස්ස
දුට්ඨ චිත්තස්ස ජන්තුනො
අනිට්ඨ සාවණං වුත්තං
ඵරුසන්ති විජානතා.

අන් හට අපහාස කරනු කැමති වූ ද්වේෂයෙන් දුෂ්ට සිත් ඇති සත්ත්වයාගේ පරහට අප්‍රිය තෙපුල් බිණීම, සියල්ල දත් සර්වඥයන් වහන්සේ විසින් පරුෂ වචනය යි වදරන ලදී.

1. බිණුම් අසන්නකු ඇතිවීමය. 2. කෝප සිත ය. 3. ඒ කෝප සිතින් තද පරුෂ බස් කීමය යන මේ අඞ්ග තුන පරුෂ වචනයට ඇත්තේ ය. කනට අමිහිරි වූ ඇසුවන්ගේ

සිත් දෙදරන්නාවූ ක්‍රොධය පිරිවරකොට ඇත්තා වූ රළුබස් යමෙක් කියා නම්, ඒ තැනැත්තේ එය හේතුකොට ගෙන අනෙක වර්ෂ කොටි සහස්‍රයක් නරකයෙහි මහත් දුක් විඳ එයින් මිදුණු කල තිරිසන් යෝනි-යෙහි සහ මිනිසත් බව්හි ද අපමණ දුක් විඳින්නේ වේ.

තව ද යමකු සමග කථා කරන්නන් විසින් මුසා ආදි දෙෂයෙන් වෙන් වූ මිහිරි වූ මනාප වූ මොළොක් වූ ප්‍රිය වචනම බිණිය යුතුය. කිසිසේත් පරුෂ වූ අමනොඥ වචන බිණිය යුතු නොවේ. කුමක් නිසාද යත්:– තිරිසනකු පවා අමනාප පරුෂ බස් කියන්-නහුගේ බසට රුචි නොවන බැවිනි. එබැවින් පරුෂ වචන බිණීමෙහි ආදීනව මෙයින් දැන බාල මහලු සියල්ලන් විසින්ම පරුෂ බස් කීමෙන් හාත්පසින්ම වැළකිය යුතු ය.

## සම්ඵප්‍රලාපය

''යෙන සම්ඵප්පලාපෙහි නිරත්ථකං සො සම්ඵප්පලාපො''යි යමකින් සම්‍යක් වචන පෙරළා ද ඒ සම්ඵප්‍රලාපය තෙම අර්ථයෙන් විපරීත බැවින් නිරර්ථක නම් වේ.

නිරත්ථක කථා යෙති
රාග දෙසාභිවඩ්ඪති
තං රත්තස්ස අකාලෙන
භාසනා සමථ සඤ්ඤිනා,

රාග ද්වේෂ දෙක වඩවන්නා වූ යම් නිරර්ථක කථාවක් ඇද්ද ඒ කථාවෙහි ඇළුනාහුගේ නොකාලයෙහි කීම සම්ඵප්‍රලාප යයි කියන ලදි. මෙහි නොකාලය නම් අනුන්ගේ යම්කිසි ආකාරයක් හඟවම් යන සිතින් හෝ කාව්‍ය වින්‍යාස ක්‍රම හඟවම් යන සිතින් හෝ මෙවැනි ආනුභාව සම්පන්න ඇති ඇත්තෝ පවා අනිත්‍යබවට ගියාහ. ඒ බව හඟවන සිතින් හෝ යමක් නො කියා අසමින් උන්නවුන් අපායෙහි

උපදවන්නට නිසි වූ අසඩම්යැ යි කියන ලද කාව්‍ය නාටකාදි යමක් පරමාර්ථ කොට හෝ අසථාන නියොජන කථා කීම නො කාලය නම් වේ. 1. දෙලොවට ම වැඩ නැති කථා වීමය. 2. එබඳු නිරර්ථක කථා කිරීමය යන මේ අඞ්ග දෙක සම්ඵප්‍රලා-පයෙහි වේ. අර්ථ ශූන්‍ය වූ හිස් බස් බණන තැනැත්තේ හෙවත් සම්ඵප්‍රලාප කියන තැනැත්තේ මරණින් මතු නරකොත්පන්-නව ඝොර වූ කටුක දුක් විඳින්නේ වේ.

## අභිධ්‍යාව හෙවත් දළ ලෝභය

''අභිජ්ක්ධායතීති අභිජ්ක්ධා පරභණ්ඩාභි මුඛී භුත්වා තන්නින්නතාය පවත්තතීති අත්ථො'':– තමහට ඇතුළත් කොට ලොභ වශයෙන් සිතන්නේ නු යි අභිධ්‍යා නම්. අන්‍යයන්ගේ භාණ්ඩයෙහි අභිමුඛ ව ඊට නැමී පවත්නා සිත ඇති බවය යන අර්ථ යයි.

අඤ්ඤාය පත්ථනායාහි
පරොපකරණාදිසු
ලොභාධිමත්තතො සාහි
අභිජ්ඣාති පකාසිතා

අනුන්ගේ උපකරණාදි පරවස්තුවෙහි යම් අයුතු ප්‍රාර්ථනාවක් ඇද්ද, ඒ පැතීම් තොමෝ තමන් බඩුයෙහි උපදවන ලෝභයට වඩා බලවත් බැවින් අභිධ්‍යායයි වදරන ලදි.

1. අනුන් අයිති දෙයක් වීමය, 2. එය තම හට ඇත්නම් යෙහෙකැයි කියා ගන්නා විෂම ලොභ සිත ය, යන මේ අඞ්ග දෙක අභිජ්ඣාවට ඇත්තේ ය. මෙසේ අන් සතු උපභොග වස්තුවෙහි දැඩි ලෝභ උපදවන්නාවූ අඥාන පුද්ගලතෙම මරණින් මතු අපාය භාගීවෙයි.

## ව්‍යාපාදය

"හිත සුඛං ව්‍යාපාදයතීති ව්‍යාපාදො සො පරවිනාසාය මනොපදෙස ලක්ඛණො:- හිත සැප වූ පෙර යහපත් ප්‍රකෘතිය පෙරළන්නේනුයි ව්‍යාපාද නම්. එය අනුන් නැසීම පිණිස හිතෙහි දූෂිතතා ලක්ෂණය යි හෙවත් ක්‍රොධ චෙතනාවයි.

යා සම්ප දුට්ඨ චිත්තස්ස
අනත්ථා හිතකාමතා
බ්‍යාපාදෙති සවතො
අබ්‍යාපන්නෙහි සබ්බථා.

දූෂිව කිපියාවූ සිත් ඇත්තාහුගේ යම් අනර්ථයකට කැමති බවෙක් හෙවත් අහිත කැමති බවෙක් ඇද්ද එය හැම පරිද්දෙන් නොපෙරළියාවූ සිත් ඇත්තවුන් විසින් බ්‍යාපාදයයි වදරණ ලදී.

මෙහි අනර්ථ නම් නොවැඩය. අහිත නම් නො වැඩට කාරණයි. අන් සත්ත්වයකු වීමය. ඔහු නසමි යන ක්‍රොධ හිතය, යන මේ අඞ්ග දෙක වනාහි ව්‍යාපාදයෙහි වේ. ව්‍යාපාද සඞ්ඛ්‍යාත මෙම ද්වෙෂයෙන් දූෂිත සිත් ඇත්තෝ බොහෝ සෙයින් තිරිසන්ව උපදින්නාහුයි. එබැවින් ක්‍රොධයෙහි ආදීනව මේ ආදීන් දත් නැණවතුන් විසින් කිසි සේත් ක්‍රොධ නො කොට ප්‍රිය අප්‍රිය සැම දෙනා කෙරෙහිම කරුණා මෛත්‍රිය ඉපදවීය යුත්තේ ම ය.

## මිථ්‍යා දෘෂ්ටිය

"මිච්ඡා පාපිකා විඤ්ඤූ ගරහිතා දිට්ඨීති මිච්ඡා දිට්ඨි" – මිථ්‍යා වූ ලාමක වූ පණ්ඩිතයන් විසින් නින්දාකරන ලද්දවූ දෘෂ්ටි නුයි මිථ්‍යා දෘෂ්ටි නම් වේ.

අතච්ඡාභිනිවෙසො යො
නත්ථි දින්නන්ති ආදිනා
මිච්ඡා දිට්ඨීති අක්ඛාතො
සම්මා දිට්ඨි විපක්ඛිකො

දුන් දෙය ඵල නැත යන මේ ආදීන් යම් මේ වරදවා ගැන්මක් ඇද්ද සම්‍යක් දෘෂ්ටියට විරුඬ වූ ඒ දෘෂ්ටි තොමෝ මිථ්‍යායයි කියන ලදී. තව ද මේ මිථ්‍යාදෘෂ්ටිය හා සමාන මහත් වරද වූ අනිකුදු එකම ධර්‍මයෙක් නොම ඇත්තේය. කුමක් හෙයින් යත්:– පඤ්චානන්තරිය කර්‍මය අතිශයින් මහත් වූ වරදය. ඒ ආනන්තරිය කර්‍මයන්ටත් වඩා මිථ්‍යාදෘෂ්ටි කර්‍මය ම අතිශයින් මහත් වරද වන්නේ ය.

ආනන්තරිය කර්මයන්ගේ පිරිසිඳීමෙක් ඇත. මිදීමේ කෙළවරක් ද පෙනෙයි. නියත මිථ්‍යාදෘෂ්ටියෙහි පිරිසිඳීමෙක් නො පෙනේ. ඒ වනාහි සංසාරයෙහි පැවැත්මට මුල් වන්නේ ය. ඒ මිථ්‍යාදෘෂ්ටියෙන් සමන්විතයා හට භවයෙන් මිදීමෙක් නැත. ස්වර්ගය ද නිවන් මාර්ගය ද ඕ හට නොම ඇත්තේය. කල්ප විනාශ කාලයෙහි බොහෝ ජනයා බඹලොව උපදින කල්හි ද නියත මිථ්‍යාදෘෂ්ටික තෙම එහි නොඉපිද පිට සක්වළ උපදී. එය කල්ප විනාශක ගින්නෙන් දැවෙන කල්හිදු ඒ මිසදිටු තෙම අහස එක් අවකාශයෙක්හි පැසෙන්නේමය.

1. වරදවා කල්පනා කරන චෙතනාවය, 2. ඒ ලෙසම වැටහීමය, යන මේ අඞ්ග දෙක මිථ්‍යාදෘෂ්ටියට ඇත්තේය. රාගාදී කෙලෙස් සංසිඳීමට හේතු වූ කුසල මාර්ගයෙන් වෙන් වූ නොමඟ සිහි කරන්නා හට නූපන් මිථ්‍යාදෘෂ්ටි බොහෝ උපදී. උපන්නා වූ මිථ්‍යාදෘෂ්ටි තොමෝ වැඩේ. මෙසේ නොමඟ සිහි කිරීමෙන් හටගන්නා

මිසදිටු කල්පනාව මාතෘ ඝාතකාදි වූ ආනන්තරිය කර්‍මයටත් වඩා අතිශයින් ම බැරෑරුම් කර්‍මයක් බව දන නියත මිථ්‍යා-දෘෂ්ටි සඞ්ඛ්‍යාත දෙසැට දෘෂ්ටියෙන් වැළක සම්‍යයක් දෘෂ්ටියෙහි පිහිටා සගමොක් සිරි සැප අත්පත් කටයුතුයි.

## ආනන්තර්‍ය්‍ය කර්‍ම පඤ්චකය

ආනන්තර්‍ය්‍ය කර්‍ම නම්:– මේ ජාතියට අනතුරු අත්බැව්හි ම අපායේ උපදවා ඵල විපාක දෙන 1. මව මැරීමය, 2. පියා මැරීමය, 3. රහතුන් මැරීමය, 4. ලොහිතුප්පාදකය හෙවත් බුදුන්ගේ ශරීරයෙන් ලේ සෙල්-වීම ය, 5. සඞ්ඝභෙද කිරීම ය යන දරුණු ක්‍රියා පසයි.

## පඤ්ච දුශ්චරිතය

1. පාණාතිපාතය හෙවත් සතුන් මැරීම, 2. අදත්තාදනය හෙවත් අන්සතු දෙය සොර සිතින් ගැනීම, 3. කාමමිච්ඡාචාරය

හෙවත් අන්සතු ස්ත්‍රීන්ගේ පහස ගැනීම, 4. මෘෂාවාදය හෙවත් බොරුකීම, 5. සුරාපානය හෙවත් මත්පැන් බීම යන මේ පස පඤ්ච දුශ්චරිතය වෙයි.

## පඤ්ච කාමය

1. රූපය හෙවත් ඇසට පෙනෙන දේ, 2. ශබ්දය හෙවත් කනට ඇසෙන හඬ, 3. රසය හෙවත් දිවට දැනෙන මධුර තික්තාදි රස, 4. ගන්ධය හෙවත් නාසයට දැනෙන දුගඳ සුගඳ දෙක, 5. ස්පර්ශය හෙවත් හැපීමෙන් ශරීරයට දැනෙන ශීතෝෂ්ණාදි ස්වභාව යන මේ සත්ත්වයා සතුටට පමුණුවන කාරණා පස පඤ්ච කාමය වෙයි.

## වැඩ කැමැත්තන් විසින් පහකට යුතු දෙෂ

1. උස්සූරසෙය්‍යා පරදාරසෙවනා
වෙරප්පසංගො ච අනත්ථතා ච
පාපා ච මිත්තා සුකදරියතා ච
එතෙ ඡඨානා පුරිසං ධංසයන්ති.

2. අක්ඛිත්ථියො වාරුණී නච්චගීතං
දිවාසොප්පං පාරි චරියා අකාලෙ
පාපා ච මිත්තා සුකදරියතා ච
එතෙ ඡඨානා පුරිසං ධංසයන්ති.

1. ඉර උදවන තෙක් සයනය කිරීම ද, පරදර සෙවනය ද, අන්‍යයන් හා වෛර කිරීම ද, පර හට අනර්ථ පැමිණවීම ද, අසත් පුරුෂ සෙවනය ද, දනය පිණිස හිත නැති තද මසුරු බව ද යන මේ කාරණ සය සත්ත්වයා දෙලොව ම පිරිහිමට පමුණුවන බැවින් දුරු කට යුත්තාහුයි.

2. දූ කෙළිම ද, පරදර සෙවනය ද, මත්පැන් බීම ද, නැටීම ගී කීම ආදී ක්‍රීඩාවල යෙදීම සහ එය පවත්වන ස්ථානවලට බලන පිණිස යෑම ද, දහවල් බොහෝ සෙයින් නිදීම ද, රාත්‍රි ගතව නොකාලයෙහි වීථි සඤ්චාරණය ද, අසත් පුරුෂයන් හා මිත්‍ර වීම ද දනයට හිත නැති දැඩි ලොභකම ද යන මේ කාරණා ෂට්කය මනුෂ්‍යයා දෙලොවින් ම විනාශ කරන බැවින් දුරු කට යුත්තේම ය.

## කර්ම විභාගය

ජනක, උපස්තම්භක, උපපීඩක, උපඝාතක, යයි කියා කෘත්‍ය වශයෙන් සතරක් ද; ගරුක, ආසන්න, ආචීර්ණ, කෘතත්ව යයි කියා විපාක දනානුක්‍රමයෙන් සතරක් ද—දෘෂ්ටි ධර්මවේද්‍ය, උපපද්‍යවේද්‍ය, අපරාපර්‍ය්‍යා වේද්‍ය, අහෝසි යයි කියා විපාකදන කාල වශයෙන් සතරක්දැයි කර්ම ප්‍රභෙද දොළසක් වෙයි.

1. ජනක කර්මය නම්, සත්ත්වයා යම් සුගතියක හෝ දුගතියක උපදවා විපාක දෙන කර්මය වේ. 2. උපස්තම්භක කර්මය නම්, උපදවා විපාක දෙන්නාවූ කර්මයට වන අන්තරාය වැළැක්වීමෙන් උපස්ථාන කරන්නා වූ කර්මය වෙයි. 2. උපපීඩක කර්මය නම්, විපාක දෙන්නා වූ කර්මයට පීඩා කරන කර්මය වෙයි. 4. උපඝාතක කර්මය නම්, විපාක දෙන්නා වූ කර්මය ඡෙද්‍යකරන්නා වූ කර්මය වෙයි. මේ කෘත්‍ය කර්ම සතරයි.

5. ගරු කර්‍මය නම්, අකුශල පක්ෂයට මාතෘ ඝාතක, පිතෘ ඝාතක, අරහන්ත ඝාතක, ලෝහිතුප්පාදක, සඞ්ඝ භෙදක යන මෙකී අකුසල් පස සහ කුශල පක්ෂයට අෂ්ටසමාපත්‍යාදියයි. 6. ආසන්න කර්‍මය නම්, මරණාසන්න කාලයෙහි කරන ලද සිතන ලද කුශලාකුශල කර්‍ම නම් වෙයි. 7. ආචීර්ණ කර්‍මය නම්:– නිතර කරන ලද්දවූ නොහොත් එක්වරක් කොට හෝ නිතර සේවනය කරන ලද්දවූ හෝ කර්‍මයෝ වෙත්. 8. කෘතත්ව කර්‍මය නම්, අසෙවනය ඇති කර්‍මයෝ වෙත්. මේ විපාකදන කර්‍ම සතරයි.

මේ ඉහත දක්වූ කර්‍මයන් අතුරින් ගරු අකුශල කර්‍මයක් කළාවූ පුද්ගල තෙම වෙන කොපමණ කුසල් කළේ වී නමුදු මරණින් මතුයෙහි අපායෙහි ම උපදවත්. එ මෙන් ම ගරු කුශලය සත්ත්වයා සුගතියෙහි ම උපදවයි.

9. දෘෂ්ටධර්මවේද්‍ය කර්මය නම්, එම අත් බැව්හි දී ම විපාක දෙන කර්මය වෙයි. 10. උපපද්‍යවේද්‍ය කර්මය නම්, ළඟ ආත්මභාවයෙහි විපාක දෙන කර්මය වෙයි. 11. අපරාපර්‍ය්‍යවේද්‍ය කර්මය නම්, අවකාශ ලත් අත් බැවෙක්හි විපාක දනය කරණ කර්මයයි. 12. අහොසි කර්මය නම්, විපාක දීමේ කාල නියමය ඉක්ම ගියාවූ කර්මය නම් වන්නේය.

(මේ සම්බන්ධ වැඩි දුර විස්තර අභිධර්මාර්ථ සංග්‍රහ ව්‍යාඛ්‍යාවෙන් බලා දත යුතුයි)

### ජාති දුක

මේ ජාති දුක කෙබඳු ද යත්:– මව් කුසෙහි පිළිසිඳගැනීම මුල් කොට ඇති දුක ය, මව විසින් ගබ් පරිහරණය කළ කල්හි මව් කුසෙහි ඉන්නා සත්ත්වයා හට ඒ පරිහරණය මුල්කොට උපදනා දුකය, ගර්භ විපත්තිය හෙවත් ප්‍රශව කාලයෙහි නිසි සේ ප්‍රසූත නොවීමෙන් මූඪගර්භ වීම මුල් කොට ඇති දුකය. එසේ ම උපන් දවස්හි හෙවත්

ලේ කැටි බඳු කල ඇල්ලීම මුල් කොට උපදන දුක ය, වැඩී ගිය කල තමාගේ උපක්‍රම මුල්කොට උපදනා දුක ය. එසේම අනුන්ගේ උපක්‍රම මුල්කොට උපදනා දුකය යන මේ ආදිය අනෙක දුක්ඛයනට මුල් වන බැවින් ජාති දුක නම් වේ.

## ගර්භාවක්‍රාන්ති මූලක දුක්ඛය හෙවත් මවුකුස පිළිසිඳ ගැනීම මුල්කොට උපදනා දුක

සත්ත්වයා මවුකුස උපදනාකල මහනෙල් නෙළුම් මල් ආදී සුගන්ධ වස්තුවක පිළිසිඳ ගන්නේ නො වෙයි. ආමාසයෙන් යට පක්වාසයෙන් මතුයෙහි උදර පටලය හා පිටකටුව යන මේ දෙක අතර ඇති අතිශයින්ම අන්ධකාර වූ නොයෙක් කුණපයන්ගෙන් ගැවසීගත් පරම දුර්ගන්ධ වාතය හැසිරෙන ඉතා පිළිකුල් වූ කුක්ෂි ප්‍රදේශයෙහි කුණුවූ මස් ආදී තැනක හටගන්නා පණුවකු මෙන් උපදී. එසේ පිළිසිඳුණු සත්ත්ව තෙම දසමසක් මුළුල්ලෙහි මුව

වසා ළිප තැබූ බඳුනක පැසෙන පිටි පිඩක් සෙයින්,මව් කුසෙහි ඇත්තාවූ උෂ්ණයෙන් හැදෙන්නේ, අත් පා වක් කිරීම් දිගු කිරීම් ආදිය රහිත වූයේ ඉතා බොහෝ වූ කටුක දුක් අනුභව කෙරෙයි. මේ ගර්භවක්‍රාන්ති මෞලික දුක්ඛය නම් වන්නේය.

## ගර්භ පරිහරණ මෞලික දුක්ඛය හෙවත් ගබ ආරක්ෂා කරන කාලයෙහි එය මුල්කොට උපදනා දුක

ගබ් ඇති තැනැත්තිය වහා නැගිටින කල ද, හිඳගන්නා කල ද, පෙරළෙන කල ද, ගැබෙහි වූ දරු තෙමේත් සුරා ධූර්තයකු හස්තගත එළුවක්හු සෙයින් ද අහිගුණ්ඨික-යකු අතටගත් සර්ප පෝතකයක්හු සෙයින් ද හැපීම්, ඇදීම්, පෙරළීම්, ආදියෙන් ඉවසිය නොහෙන මහත් දුකට පැමිණෙන්නේ ය. මව සිහිල් ජලය පානය කරණ කල ශීත නරකොත්පන්නයක්හුමෙන්ද, උෂ්ණාහාර-යක් අනුභව කරන කල ගිනි අඟුරු වර්ෂා-වකට අසු වූ එකකු මෙන් ද, ලුණු ඇඹුල්

ආදිය වළඳන කල වණයෙක කාරම් බේත් ගාන කල හටගන්නා වේදනාවක් මෙන් ද, දරුණු දුක් අනුභව කෙරෙයි. මේ ගර්භ පරිහරණ මෞලික දුක්ඛය නම් වේ.

## ගර්භ විපත්ති මෞලික දුක්ඛය හෙවත් ගැබට විපත් පැමිණීමෙන් හටගන්නාවූ දුක

මව නිසි සේ දරු ප්‍රසූතිය කිරීමට අපොහොසත් වූ කල ඥති මිත්‍රාදීන් විසිනුදු දකීමට නුසුදුසු වූ රහස් අවයවයන් වෛද්‍ය-යන් විසින් දර්ශන ස්පර්ශාදිය කිරීම් හා කැපුම් ආදියෙන් ද වන්නාවූ තියුණු දුක් මව හා ගැබ හොත් දරුවා විඳින්නේ ද, හේ ගර්භ විපත්ති මෞලික දුක්ඛය නම් වේ.

## විජායන මෞලික දුක්ඛය හෙවත් වැදීම මුල් කොට ඇති දුක

ප්‍රසූතිකාව ගේ කර්මජ වාතය කෝපා පීමෙන් ගර්භය පෙරළා නරක ප්‍රපාතයක් බඳු අතිභයානක වූ යොනි මාර්ගයට පැමිණි-යා වූ සත්වයා හට බලවත් දුක් වේදනා

ඇති වන්නේ ය. එසේ වැටුන පසු යතුරු සිදුරකින් ඇතෙකු අදිනු ලබන්නාක් මෙන් ද, එක් වූ පර්වත දෙකකින් තැළෙන්නාක් මෙන් ද, යෝනි මාර්ගයෙන් නික්මෙන කල්හි යම් දුක්ඛයක් උපදී ද, හේ විජායන මෞලික දුක්ඛය නම් වේ.

## ගර්භයෙන් බහිර් නිෂ්ක්‍රමණ මෞලික දුක්ඛය හෙවත් ප්‍රසූත වූ කල උපදනා දුක

ජාත සත්ත්වයාගේ හෙවත් උපන්නාවූ දරුවාගේ සුකුමාර ශරීරය වින්නඹු ආදීන් විසින් අතින් අල්ලන කල අලුත් ව්‍රණයක කාරම් බෙහෙත් ප්‍රක්ෂෙප කරන කලක් මෙන් ද, ඉදිකටු හුලින් අනින කලක් මෙන් ද, පිහියකින් කපන කලක් මෙන් ද, ඒ මොළොක් සිරුරට අධික දුක් වේදනා ඇති වන්නේ ය. මෙසේ නාවන කල්හි ද ඇඟ දිය පිසින කල්හි ද යම් දුක්ඛයෙක් උපදී ද, හේ ගර්භයෙන් බහිර්නිෂ්ක්‍රමණ මෞලික දුක්ඛය නම් වේ.

### ආත්මෝපක්‍රම මෞලික දුක්ඛය හෙවත් ස්වකීය උපක්‍රම මුල්කොට උපදනා දුක

තමාට තමාම දුක් දෙන කාලයෙහි නොහොත් යම් කිසි ව්‍යායාම ආදියක් කරන කල ද එසේම නිසණ්ඨ ව්‍රත සමාදන් වීමෙන් කෙලෙස් තවමැයි සිතා ශරීරයට අනෙක ප්‍රකාර වධ දෙන කල්හිද, එසේම ක්‍රොධ වසඟවීමෙන් ශරීරය කපා ගැනීම් තළාගැනීම් ආදිය කරන කල්හිද, හට-ගන්නා යම් දුකෙක් ඇති වේ ද, හේ ආත්මොපක්‍රම මෞලික දුක්ඛය නම් වේ.

### පරොපක්‍රම මෞලික දුක්ඛය හෙවත් අන්‍යයන්ගේ උපක්‍රම මුල් ව හටගන්නා දුක

අන්‍යයන් විසින් වධ බන්ධන කිරීම් ආදි-යෙන් තමන්ට පැමිණෙන්නාවූ දුකද, සොර සතුරන් විසිනුත්, රාජාමාත්‍යාදීන් විසිනුත් අල්ලාගෙන තැළීම්, බැඳීම්, පහරදීම් ආදි-යෙන් පැමිණෙන්නාවූ යම් දුකෙක් වේ නම් හේ ද පරොපක්‍රම මෞලික දුක්ඛය නම් වේ.

## ජරා දුක

ජරා තොමෝ සංස්කාර දුක්ඛ වන බැවින් ද, කායික චෛතසික දුක්ඛ වන බැවින් ද දුක්ඛ මැයි. එහෙයින් කීහ:-

අඞ්ගානං සිථිලී භාවා,
ඉන්ද්‍රියානං විකාරතා
යොබ්බනස්ස විනාසෙන,
බලස්ස උපඝාතතො
විප්පවාසා සතාදීනං,
පුත්තදාරෙහි පත්තනො
අපසාදනියතො චෙව,
භියො බාලන්ත පත්තියා
පප්පොති දුක්ඛං යං මච්චො
කායිකං මනසං තථා
සබ්බමෙතං ජරා හෙතු,
යස්මා තස්මා ජරා දුඛා,

ඒ ඒ සත්ත්ව නිකායෙහි උපන්නවුන්ගේ දත් වැටීමය, හිසකේ පැහීමය, ඇඟ රැළි නැඟීමය, ආයුෂ ක්ෂය වීමය, ඉන්ද්‍රියයන්ගේ විකල වීමය, යන මේ යමක් ඇද්ද හේ වනාහි ජරා නම් වේ. මේ ජරා තොමෝ කෙසේ නම් දුක් වන්නීද; දිරා ගියාවූ ශරීරය ජීර්ණවූ ශකටයක් හෙවත් කරත්තයක් සෙයින් දුර්වල වෙයි. යාම් ඊම් කිරීම සඳහා වෑයම් කරන කල දුර්වලකම කරණකොටගෙන බලවත් ශරීර දුක් උපදනේය. යම් සේ බාලාවස්ථාවෙහි චක්ෂුරාදී ඉන්ද්‍රියයෝ ඉතා සියුම් වුවත් ඒ ඒ ඉන්ද්‍රිය ගොචරයන් ගනිත් ම ය. ඒ ඉන්ද්‍රියයෝ ජරාවට පැමිණි සත්ත්වයාට වූ කලි ඒ ඒ ගොචරයන් ගැනීමට පොහොසත් නො වෙති. මෙසේ වීම හේතු කොටගෙන ස්වකීය අඹුදරුවන් පොෂ්‍ය කිරීමට අසමර්ථ හෙයින් දෞර්මනස් උපදින්නේ ය. මෙසේ හෙයින් ශරීරාවයව ලිහිල් බව ද ඉන්ද්‍රියයන්ගේ විකාරාදිය ද යෞවන බව විනාශ වීමෙන් වීර්‍ය්‍ය හානිය ද සිහිමද බවද

අනුන්ගේ නින්ද ආදිය ලැබීමෙන් බලවත් දුකට කාරණා වන්නේ ය. මේ ජරා දුක නම් වෙයි.

### මරණ දුක

මරණය නම් ඒ ඒ සත්ත්ව නිකායෙන් චුත වීමයි. යම් සේ අහිච්ඡත්‍ර (නයි හතු) මස්තකයෙන් පස් රැගෙන ම පැනනැඟෙන්-නේ ද එසේ ම සත්ත්වයෝ උපදින්නාහු ජරා මරණ නමැති පාංශු මුදුනින් දරාගෙන උපදින්නාහු ය. මේ මරණ කවර හෙය-කින් දුක් වන්නේ ද, මරණාසන්න කාලයෙහි හටගන්නා වූ ශරීර වේදනාවෝ උඩු සුළඟට අල්ලාගන්නා ලද තණ සුලක් සෙයින් ශරීරය චඤ්චල කරන්නාහු ය. නරක නිමිති වැටහෙන කල බලවත් වූ දෙම්නස් උපදින්නේ ය. මෙසේ සිත කය දෙකට දුක් උපදවන හෙයින් මරණය ද දුක බව කියන ලද්දේ ය.

## තෙළෙස් ධූතාඞ්ගයෝ

1. පාංශුකූලිකඞ්ගය, 2. තෙචීවරිකඞ්ගය, 3. පිණ්ඩපාතිකඞ්ගය, 4. සපදනචාරිකඞ්ගය 5. එකාසනිකඞ්ගය, 6. පත්තපිණ්ඩිකඞ්ගය, 7. ඛළුච්ඡා භත්තිකඞ්ගය, 8. ආරඤ්ඤ කඞ්ගය, 9. රුක්ඛමූලිකඞ්ගය, 10. අබ්භොකාසිකඞ්ගය, 11. සොයානිකඞ්ගය, 12. යථාසන්ථතිකඞ්ගය, 13. නෙසජ්ජිකඞ්ගය, යන මොහු වනාහි තෙළෙස් ධූතාඞ්ගයෝ වෙත්. රාග ද්වෙෂ මොහාදී ක්ලෙශධර්මයන් මැඩ පැවැත්වීම කරන අර්ථයෙන් ධූතාඞ්ග නමැයි කියනු ලැබෙයි. මෙකී ධූතාඞ්ග ශ්‍රමණයන් වහන්සේලා විසින් රක්ෂා කළහැකි වන්නේය. මෙහි ගිහින් විසිනුදු රක්ෂා කටයුතු අඞ්ග දෙකක් ඇත්තේ ය. හේ කවරේද යත්:- 1. එකාසනිකඞ්ගය, 2. පත්තපිණ්ඩිකඞ්ගය යන මොහු වෙත්. මින් 1. එකාසනිකඞ්ගය නම්:- අනෙකා'-සනවල හිඳ ආහාර වැළඳීම දුරු කිරීමෙන් එකම අසුනෙක්හි හිඳ වැළඳීම සමාදන් ව

රැකීම කරන චෙතනාව ය, 2. පත්තපිණ්ඩි කඞ්ගය නම්:- දෙවෙනි බඳුනක් නො ගෙන එකම භාජනයක්හි ආහාර ගැනීම සමාදන්ව රැකීම කරන චෙතනාව ය. මෙකී ධූතාඞ්ග දෙකම හෝ එකක් හෝ සමාදන්ව රක්ෂා කරන යමෙක් ඇත්නම් හේ තෙම පළමුකොට අෂ්ටාඞ්ග ශීලයෙහි හෝ දශ ශීලයෙහි හෝ පිහිටා ධූතාඞ්ග රක්ෂා කට යුතු වන්නේය. පඤ්චශීලය නොපොහොනා බැවින් ද එසේම ඉර අවර වූවායින් පසු ආහාර ගැනීම ආර්‍ය්‍ය ධර්‍මයට විරුද්ධ බැවින් ද අෂ්ටාඞ්ග ශීලය හෝ දශ ශීලය හෝ සමාදන්ව ම ධූතාඞ්ග රක්ෂා කරත් නම් මැනවි.

ධූතාඞ්ග සමාදන් වන්නාහු විසින් බුදු, මහාශ්‍රාවක රහත් ආදි උතුමන් මෙකල නැති බැවින් යටත් පිරිසෙයින් ශාරීරික, පාරිභෝගික, උද්දෙශික යන මේ චෛත්‍ය-යන් අතුරින් එක්තරා චෛත්‍යයක් සමීප-යෙහිදී සමාදන් විය යුතු මැයි.

(සර්වඥයන් වහන්සේ ගේ ශාරීරික ධාතු පිහිටුවා බඳවන ලද දගබ් ශාරීරික චෛත්‍යයි. සර්වඥයන් වහන්සේ විසින් පරිභොග කරන ලද හෙවත් සෙවනය කරන ලද බොධි සියල්ල පාරිභොගික චෛත්‍ය නම් වේ. සර්වඥයන් වහන්සේ උදෙසා තනනු ලබන ප්‍රතිමා වහන්සේලා උද්දේශික නම් වෙත්.)

## ඒකාසනිකඞ්ගය රක්‍ෂා කිරීම

ඒකාසනික ධූතාඞ්ගය රකිනුවන් විසින් ඉහත දක්වූ පරිදි දගබක් ළඟට හෝ බෝධි වෘක්ෂයක් ළඟට හෝ ප්‍රතිමා වහන්සේ නමක් සමීපයට හෝ එළඹ එහි කටයුතු ඇමදීම ආදි වත් පිළිවත් කොට උක්කුටුකයෙන් හිඳ බුදුන් ළඟ දී සමාදන් වන කලක් මෙන් සිතා ගෞරව උපදවා – ''නා නා භොජනං පටික්ඛාමි ඒකාසනිකඞ්ගං සමාදියාමි'' යන වාක්‍යය තුන්වරක් කියා සමාදන් විය යුතු ය. මෙහි සියලු ම ධූතාඞ්ගවල උක්කෘෂ්ටය, මධ්‍යමය, මෘදුක

ය යි තුන් ආකාරයක් වෙයි. එබැවින් අඞ්ග සමාදන් වන කල මේ තුන් ආකාරයෙන් තමා හට පුළුවන් ප්‍රකාරයෙන් සලකා සමාදන් විය යුත්තේ ය.

එකාසනිකඞ්ගය සමාදන් වූවහු විසින් ආහාර අනුභව කරන කල්හි ද එනම් බීම හෝ පැදුරක හෝ ඇඳක හෝ පුටුවක හෝ බංකුවක හෝ ආහාර ගැනීම පිණිස උන් කල යම්කිසි කටයුත්තක් පැමිණියේ නම්, උන් ආසනයෙන් නැගිට නැවත එහිම හෝ හිඳ අනුභව කිරීමෙන් දෙස් නො වේ. යම් අසුනෙක්හි හිඳ අනුභවය පිණිස බතෙහි අත තැබූ තැන් පටන් යම් කෘත්‍යයක් පිණිස නැගිටීම නො වටී. එසේ නැඟිට එදින ම පළමු හුන් අසුනෙහි හෝ වෙනයම් අසුනෙක්හි හෝ හිඳ අනුභව කළහොත් ධුතාඞ්ගය බිඳේ. කුමක් හෙයිනැයත්:- සමාදන් වීමෙහිදී නොයෙක් ආසනවල හිඳ අනුභව කිරීම ප්‍රතික්ෂෙප කළ බැවිනි. එක ම අසුනෙහි හිඳ අනුභව කළ යුතුයයි කී බැවින් සෑම දිනවලදී ම එක ම ඇඳක

හෝ පුටුවක හෝ පැදුරු ආදි යමක හෝ හිඳ අනුභව කළයුතුයයි සැක නො ඉපදිය යුතුයි. එක දිනෙක එක ම අසුනෙක ද හිඳ ආහාර කෘත්‍ය කළාට සඳෙස් නො වේ. එසේ හිඳ අනුභව කිරීම නානාසන භොජනය නම් නො වෙයි. යම් දිනෙක යම් අසුනෙක්හි හිඳ අනුභව කිරීමට පටන් ගෙන එයින් නැඟිට නැවත එදිනෙහිම එම ආසනයෙහි හෝ වෙන යම් අසුනෙක්හි හෝ වාඩිගෙන දෙවනු අනුභව කිරීම, නානාසන භොජනය නම් වෙයි. ඉන් ධුතාඞ්ගය ද බිඳෙයි.

'උත්කෘෂ්ට වශයෙන් හෙවත් පළමුවැනි වශයෙන් සමාදන් වෙමි'යි කල්පනා කොට මේ එකාසනිකඞ්ගය සමාදන්වූයේ යම් අසුනෙක හිඳ අනුභව කරනු පිණිස බතෙහි අත තබා ද එවක් පටන් නැවත ගෙන ආ අන් කිසි ආහාරයක් නොපිළිගනියි. කුමක් නිසා ද යතහොත්, අඞ්ගය බිඳෙනවාට නො ව පරම අල්පෙච්ඡතාව හෙවත් ඉතා සවල්පයක් ම කැමති බව කරණකොට

ගෙන නැවත ගෙනා ගෙනා දේ පිළිගැන්ම නම් නානාසන භොජනයක් සමය යි සැලකීම කරන බැවිනි.

ගිතෙල් සර්කරාදියක් ලද්දේ නම් එය බෙහෙත් පිණිසයයි සිතා වළඳන්නට වටී. මී සකුරු ආදිය ගැනීම උත්කෘෂ්ට, මධ්‍යම, මෘදුක යන තිදෙනාට ම මෙයාකාර මැයි. මධ්‍යම හෙවත් දෙවෙනි වශයෙන් මේ ධූතාඞ්ගය රක්ෂා කරන තැනැත්තේ තමා වැළඳීම කරන තලියෙහි බත් කෙළවර වන තුරු ම ගෙනා ගෙනා ආහාර තමා සතුටු තරමක් පිළිගැනීම කරයි. එබැවින් ඕහට "භොජන පරියන්තික" යයි කියනු ලැබේ. මෘදුක හෙවත් තුන්වෙනි වශයෙන් මේ ධූතාඞ්ගධර තෙමේ අනුභවයට උන් අසුනෙන් නැඟී නොසිටින තුරු දෙවනු තෙවනු බෙදවා ගනිමින් අනුභව කරන්නට හෙවත් ගෙනා ගෙනා ආහාර පිළිගැනීම කරන්නට ද වටී. එබැවින් ඕහට "ආසන පරියන්තික" යයි කියනු ලැබේ. මේ වනාහි ඒකාසනික ධූතාඞ්ගයෙහි ප්‍රභෙදයෝයි.

## පත්තපිණ්ඩිකඞ්ග සමාදනය

මේ ධූතාඞ්ගය රක්ෂාකරනු කැමැත්තහු විසින් පෙර කී පරිද්දෙන් ම චෛත්‍යස්ථාන-යක් වෙත එළඹ ගෞරව සිත් පෙරදැරි කොට ඇඳිලි බැඳ උක්කුටුකයෙන් හිඳ උත්කෘෂ්ට, මධ්‍යම, මෘදුක යන තුන් ප්‍රකාර-යෙන් තමන් සතුටු ආකාරයක් කල්පනා කොට ගෙන ''දුතියක භාජනං පටික්ඛිපාමි පත්තපිණ්ඩිකඞ්ග සමාදියාමි'' යන මේ වාක්‍යය තුන් වරක් කියා සමාදන් විය යුතුයි. මොහු විසින් ආහාර අනුභව කරන කල ආහාර භාජන වටේ තබා ඒ ඒ භාජන-වලින් සූප ව්‍යඤ්ජනාදිය ගනිමින් අනුභව නො කොට එක ම බඳුනෙක්හි වැළඳීම කටයුතුයි. පිරිවර ජනයා නොයෙක් භාජනවල ව්‍යඤ්ජන දමා ඔහු වෙත ගෙන තබයිද, ඉන් එක භාජනයක්ම ගෙන අනුභව කටයුත්තේ ය. බතින් මිශ්‍ර නො කොට යමක් අනුභව කරනු කැමති නම් පළමු වැළඳූ අත් පසින් (දෙරියන් හමාරෙක්) ඉවත් කොට අන්‍ය භාජනයක් පිළිගත

යුතු ය. එසේ ඇති කල දුතියක භාජනය නොවන්නේ ය. පළමු ගත්දෑ මඳ වේ නම් නැවත වළඳනු කැමති නම් පළමු භාජන- යෙන් හෝ ගෙන වැළඳිය යුතුයි. නොයෙක් භාජනවල ආහාර ගැනීමේ ලොල් බව නැති කිරීම මේ ධූතාඞ්ගයාගේ සමාදනයයි.

කැඳ අවුළු ලද කල්හි ඉන් එක දෙයක් පළමුව අනුභව කොට නැවත අනික් දෙයද වළඳන්නට වටී. මී සකුරු ආදි යමක් ලද කල එය කැඳෙහි බහා පානයට රුචි වී නම් එසේ ද කටයුතුයි. නැතහොත් කැඳ භාජනය ඉවත් කොට මී සකුරු බඳුනගෙන වැළඳිය යුත්තේ ය. දෙවන භාජනයෙක ගැන්ම ප්‍රතික්ෂෙප කළබැවින් එක විට එක භාජනයට වඩාගෙන අනිකුදු භාජනවලින්ද, ගනිමින් අනුභව කළහොත් මේ ධූතාඞ්ගය බිඳෙන බැවින් එසේ නොකට යුතුයි. මෙය උත්කෘෂ්ට වශයෙන් සමාදන් වූවහු විසින් උක් දඬු අනුභව කරන කල එහි රොඩු අහක ලෑම හැර බත් අනුභව කරන

බඳුනෙහි තුබූ අන් කිසි රොඩුවක් අහකලන්-නට නො වටනේය. ව්‍යඤ්ජනාදියෙහි වූ කටු කරපිංචාකොළ කුරුඳු ආදී රොඩු යමක් ඇති වී නම් අනුභව කිරීමට පටන්ගන්නට හෝ මත්තෙන් තමා විසින් අහක දමා හෝ අනුන් හට කියා අහක දම්මා හෝ ආහාර ගැනීම වටනේය. දෙවෙනි බඳුනක් ප්‍රතික්ෂෙප කළ බැවින් අනික් කොළපත් ආදියකුත් නොගතයුතුයි. ආහාරය පිළි-ගන්නහු විසින් බොහෝ කොට නොගෙන තමාට සෑහෙන පමණින් යුක්තව ම පිළිගත මනා වේ. තවද මස් මාංසාදි යමක් අතින් අල්ලාගෙන දතින් බිඳ අනුභව නො කොට තලියෙහි දමා පොඩි කොට අනුභව කටයුතුයි.

මධ්‍යම වූ දෙවෙනි ධූතාඞ්ගධරයා විසින් අනුභවය පිණිස ගත් භාජනයෙහි වූ මාළු කටු ආදී යම් රොඩු අහක ලමින් එක අතකින් බිඳ වළඳන්නට වටී. මේ තෙමේ "හස්ත යොගී" නම් වේ. මෘදුක වූ තුන්-වෙනියා හට යමක් පාත්‍රයෙහි බහා ලන ලදද

එය අතින් හෝ බිඳ අනුභව කරන්නට වටී. මේ තෙමේ ''පත්තයොගී'' නම් වේ. මේ තුන්දෙනා විසින් දෙවන භාජනයක් ඉවසූ කල ද සමීපයෙහි තිබුණු අන් බඳුන්වලින් ගෙන බෙදගනිමින් අනුභව කළ කල ද අඞ්ගය බිඳේ. මෙකී අඞ්ගය යම් කිසි ප්‍රමාදයකින් බිඳුණේ නම් නැවතත් සමාදන් වීම මැනවි.

## ධූතාඞ්ගධරයාගේ ඉරියවු

යම් ධූතාඞ්ගයක් රක්නහු විසින් තමා ධූතාඞ්ග රක්ෂාකරන්නෙකැයි අනුන් හට හඟවන අදහසින් ක්‍රියා පැවැත්වී නම්, අවැඩ වෙයි. තව ද තමා ධූතාඞ්ගධරයකුව එසේ රක්නා බව අන්‍යයන්ට හඟවන සිතිවිල්ලක් නැතිව කැම පිම ඉඳීම සිටීම ආදි ඉරියවු-වලින් අනුන් දතුයේ නම් එයින් ධූතාඞ්ග-ධරයා හට අවැඩක් නො වේ. ධූතාඞ්ග-ධරයා විසින් මාගේ ධූත ගුණය කිසිවකු හටත් නො හඟවමියි යන පිරිසිදු චේතනා-වෙන් යුක්තව රක්ෂා කට යුතුයි.

## ධූතාඞ්ග ආනිසංස

නිරෝගි බව ය, ශරීර පරිහරණය සැහැල්ලු බවය, රස තෘෂ්ණාව නැතිකරන බව ය, අල්පෙච්ඡතාවය හෙවත් සවල්පයක් ම කැමති බව ය, අනෙක තෘෂ්ණාවන්ගේ දුරලීම ය, වැඩියක් කැමති වීමහුගේ නැති කිරීම ය, පමණ දන ආහාර ගැනීම ය, එකඟ සිතින් ආහාර වැළඳීම ය, සසර දෙව් මිනිස් සැප කෙළවර නිර්වාණ ලාභී වීම ය යන මොහු මෙහි ආනිසංසයෝ වෙත්.

තවද "න මහාරාජ ධූත ගුණෙහි අවිසුඩෙන ධම්මාභිසමයො හොති" යනු වදළ බැවින් ධූත ගුණයෙන් පිරිසිදු නො වූවන්ට ධර්මාභිසමය නො වන්නේය. හෙවත් ධූතාඞ්ගයන් සමාදන්ව රක්ෂා නො කළා හට නිවන් නො ලැබෙන්නේ යයි ශ්‍රී බුඩ දෙශනාවෙහි ස්පිරව ප්‍රකාශිත බැවින් අෂ්ට ක්ෂණ සම්පත්තියෙන් යුක්තවූ මේ

මිනිසත් බව සපල කර ගනු වස් පෝය පැමිණි අට දිනකට වරක් වත් නිවන් සිරි පිණිස මේ ධූතාඞ්ග රක්ෂා කළ මැනවි.

## හෙරණ සිඛ

හෙරණ හට දසසිල්, දසසිඛ, දසපරිජි, දසනාසනා, දස දඬුවම් නම්:– හෙරණ හට දසසිල් නම් කවරේ යත් 1. ප්‍රාණවධයෙන් දුරුවීම. 2. අදින්නාදනයෙන් දුරුවීම. 3. අබ්‍රහ්ම චයර්‍යයෙන් දුරුවීම. 4. මුසාවාදයෙන් දුරුවීම. 5. රහමෙර පානයෙන් දුරුවීම. 6. විකාලයෙහි ආහාර ගැන්මෙන් දුරුවීම. 7. නැටීම, ගී කීම, වැයීම, විසුළු දක්මාදියෙන් දුරුවීම. 8. මල් ගඳ විලවුන් ආදිය දැරීමෙන් දුරුවීම. 9. උස් සුන් මහ අස්නෙන් දුරුවීම. 10. රන් රිදී මසු කහවණු පිළිගැනීමෙන් දුරුවීම යන මෙය හෙරණ හට දසසිල් නම් වේ. හෙරණ හට දසශික්ෂා නම් කවරේද යත්:– මේ දස සිල්ම හික්මවිය යුතු බැවින් දස ශික්ෂා නම් වේ.

හෙරණ හට දසපරිජී කවරේද යත්:- 1. දැන දැන ප්‍රාණඝාත කළේ ද පරිජී වේ. 2. දැන දැන අන්සතු දෙයක් සොර සිතින් ගත පරිජී වේ. 3. දැන දැන තිරිසන් හා ද මෙවුන්දමෙහි හැසුරුණේ පරිජී වේ. 4. දැන දැන සිතාමුසු බසිනුදු මුසවා කිව පරිජී වේ. 5. දැන දැන පිණි බිඳක් පමණ ද මත්පැන් පුව පරිජී වේ. 6. බුදුරුවන් 7. දමුරුවන් 8. සඟුරුවන් යන තෙරුවනෙහි අගුණ කිව පරිජී වේ. 9. පුවතත් මෙහෙණක හා ද මෙවුන්දම් සෙවිය පරිජී වේ. 10. අනියත මිසදිටු ගත පරිජී වේ. යන මෙය හෙරණ හට දසපරිජී නම් වෙයි.

හෙරණ හට දසනාසනා නම් කවරේද යත්:- මේ දසපරිජීම දසනාසනා නම් වේ. මෙහි පසෙක් ලිඞ්ග නාසනා ය, පසෙක් සබ්බනාසනායි. ලිඞ්ග නාසනා පස නම් කවරේද යත්:- 1. දැන දැන අන් අයත් දෙයකුදු සොර සිතින් ගත 3. දැන දැන තිරශ්චීන මාගමක් හා මෙවුන්දම් සෙවිය 4. දැන දැන සිතා මුසු බසිනිදු මුසවා කිව 5. දැන

දූන පිනි බිඳක් සා ද මත් පැනක් පුව මේ පස් ලිඞ්ග නාසනා නම් වේ. පස් සබ්බ නාසනා කවරේද යත්:- 1. බුදුරුවන්, 2. දමුරුවන්, 3. සඟුරුවන් යන තෙරුවන්හි අගුණ කිව, 4. පුවතක් මෙහෙණක හා ද මෙවුන්දම් සෙවිය 5. අනියත මිසදිටු ගත යන මේ පස පස් සබ්බනාසනා නම් වේ.

හෙරණ හට දස දඬුවම් වත් නම් කවරේද යත්:- 1. විකල් බොජුන, 2. නටනු ගයනු වයනු විසුළු දස්න, 3. මල් ගඳ විලවුන් ඇඟ දැරීම, 4. උසසුන් මහ අස්නේ හිඳීම, 5. රන් රිදී මසු කහවණු පිළිගැන්ම, 6. පැවිද්දන් ලබන ලාභයෙන් පිරිහෙළීම, 7. පැවිද්දන්හට උපද්‍රව පමුණනු සඳහා ප්‍රයොග කිරීම,8. පැවිද්දන් ලගිනා ආවාස-යෙන් නෙරනට උපා යෙදීම, 9. පැවිද්දන් හට ආක්‍රොශ පරිභව බිණීම, 10. පැවිද්දන් කෙරෙහි බිඳවීම යන මේ හෙරණ හට දස දඬුවම් වත් නම් වේ. මෙහි පසක් වැලිදඬුවම් වත. පසෙක් සහරමින් නෙරපනවති. වැලි දඬුවම් වත් පස කවරේ යැයත්:- 1. විකල්

බොජුන, 2. නටනු ගයනු වයනු විසුළු දස්න, 3. මල් ගඳ විලවුන් ඇඟ දැරීම, 4. උසසුන් මහ අස්නෙහි හිඳීම, 5. රන් රිදී මසු කහවණු පිළිගැන්ම යන මේ පස වැලි දඬුවම් වත් පස නම් වේ. සඟරමින් නෙරනවත් පස කවරේ යැ යත්:- 1. භික්ඛුනං අලාභාය පරිසක්කති, (පැවිද්දන් ලබන ලාභයෙන් පිරිහෙලීම) 2. භික්ඛුනං අනත්ථාය පරිසක්කති, (පැවිද්දන්ට උපද්‍රව පමුණුනු සඳහා ප්‍රයොග කිරීම) 3. භික්ඛුනං ආවාසාය පරිසක්කති, (පැවිද්දන් ලඟින ආවාසයෙන් නෙරණට උපා යෙදීම) භික්ඛුනං අක්කොසති පරිභාසති, (පැවිද්දන්ට ආක්‍රොෂ පරිභව බිණීම) 5. භික්ඛුහි භෙදෙති, (පැවිද්දන් පැවිද්දන් කෙරෙහි බිඳවීම) යන මේ පස සඞ්ඝාරාමයෙන් නෙරන වත් නම් වේ.

## චතුපාරිශුද්ධි ශීලය

ශීලය නම් සතර සංවර සීලයයි. හේ කෙසේ ද යත්:- ප්‍රාතිමොක්ෂ සංවර ශීලය, ඉන්ද්‍රිය සංවර ශීලය, ආජීව පාරිශුද්ධි ශීලය,

ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලය යන මේ සතර සංවර ශීලය නම් වේ. මෙහි ප්‍රාතිමොක්ෂ සංවර ශීලය නම්:- චාරිත්‍ර වාරිත්‍ර හෙවත් හැසිරිය යුතු වැළකිය යුතු විසින් දෙකෙක් වෙයි. මෙහි චාරිත්‍ර ශීලය නම්:- දකුම්, හැමදුම්, ගෙත්තම්, පන්නම් කිරීම, කැලි කසල දක දක නොහිඳීම, ගිලන් හට මහල්ලන්හට සිල්වත් ගුණවත් හට මෙහෙ කිරීම, ගුරුන් සිල්වතුන් තුන්වේලේ වැඳීම, දගප් මහබෝ තුන් වේලේ වැඳීම, උපන් අහර ආශ්‍රය ඇත්තාවූ තැනැත්තාට බෙද දී වැළඳීම, පුහුණු බණ නොමැලිව පාඩම් කිරීම, හදරන හෙවත් ඉගෙණ-ගන්න බණ දන්නවුන් ලවා කියවා ගෙන කී පරිද්දෙන් පුහුණු කිරීම, හැඳීම් පෙරවීම් සකස්කොට හැඳීම පෙරවීම, පැනිත්තෙහි ද හෙවත් දිය බීමෙහි ද පස වේලායෙහි ද හෙවත් අනුභවකරන වේලායෙහිදීද සන්සිඳී හැසිරීම යන මේ ආදි වත් පිළිවෙත් චාරිත්‍ර ශීලය නම් වේ. මෙසේ නො කොට සිත් සකසා දශ අකුශල කර්මපථාදීන් නො කොට

දශ කුශල කර්ම පථය කිරීමය, සිල් පිරීමය යි මෙසේ චාරිත්‍ර වාරිත්‍ර විසින් දෙකක් වූයේ ප්‍රාතිමොක්ෂ සංවර ශීලය නම් වේ.

ඉන්ද්‍රිය සංවර ශීලය නම්:– රූප–ශබ්ද–ගන්ධ–රස–ස්පර්ශ–ධර්ම යන මේ ෂට් අරමුණෙහි එළඹ උපදනා–ලොභ–ද්වේෂ–මොහ නම් ඇති කෙලෙස් සොරුන් දුරු කොට චක්ෂුර්ද්වාර, ශ්‍රොත්‍රද්වාර, ඝ්‍රාණද්වාර, ජිව්හාද්වාර, කායද්වාර, මනොද්වාර යන මේ සදෙරින් නොවැද්ද දී සිහි නමැති දෙර පියාලා සිහි නුවණ ඇති ව විසීම ඉන්ද්‍රිය සංවර ශීලය නම් වේ.

ආජීවපාරිශුද්ධි ශීලය නම්:–කයින් තෙපු–ලෙන් කරන ලද ප්‍රාණඝාත, අදත්තාදන, කාමමිථ්‍යාචාර, මුසාවාද, පිසුණාවාච, ඵරුසාවාච, සම්ප්‍රලාප යන මේ සත ගා කුහක බැවින් හා අනුන් සිත් ගන්නා කථා–වෙන් ද තමා කෙරෙහි නැතිගුණ පෙන්වීමා–දියෙන් නො ව කපය සාරූප්‍ය හෙවත් සුදුසු පරිද්දෙන් දැහැමින් දිවි පැවැත්වීම ආජීව පාරිශුද්ධි ශීලය නම් වේ.

ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලය නම්:- දැහැමින් ද්වෙෂ මොහ දුරු කොට නොමනා මඳ ද හෙවත් අයහපත් වුව ද මඳ වුව ද බොහෝ කොට නො ඉල්ලා සසර කතර ගෙවන්නට කාරණා ය යි සලකා පස් විකා හෙවත් ප්‍රත්‍යවෙක්ෂා කොට එනම් නුවණින් බලා වැළඳීමූ පරිභොග කිරීම් ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලය නම් වේ. මෙසෙයින් මේ සතර සංවර ශීලය මනා කොට දැන ඉගෙන දවස දවස පඤ්චශීලය හා පොහොය අටසිල් ද වීයයි ඇත හොත් දස සිල් ද රක්ෂා කොට සිල් මල සෝද සිරිසිදු ශීලිව සිල් පිරිය යුතුයි.

## සත්තිස් බොධිපාක්ෂික ධර්ම

සත්තිස් බොධි පාක්ෂික ධර්ම නම්:- බුද්ධ කාරක ධර්ම හෙවත් නිවන් පිණිස භාවනා කරන අයගේ පක්ෂයට අයත් ධර්ම තිස් හත ය. හේ මෙසේයි:-

"චත්තාරො සතිපට්ඨානා, චත්තාරො සම්මාපධානා, චත්තාරො ඉද්ධිපාද; පඤ්චින්ද්‍රියානි, පඤ්චබලානි, සත්තබොජ්ක්ධඞ්ග, අරියො අට්ඨඞ්ගිකො මග්ගොති" යනු හෙයින්

1. සතර සතිපට්ඨානය, 2. සතර සම්‍යක් ප්‍රධානය, 3. සතර සෘද්ධිපාදය, 4. පඤ්චෙන්ද්‍රිය, 5. පඤ්චබලය, 6. සප්තබොධ්‍යඞ්ගය, 7. ආර්‍ය්‍ය අෂ්ඨාඞ්ගික මාර්ගය යන මොවුහු සත්තිස් බොධිපාක්ෂික ධර්ම නම් වෙත්.

1. කාය සම්මතවූ ශරීරය "කෙසා ලොමා නඛා" යනාදි වශයෙන් දෙතිස් කුණප කොට්ඨාශයකට බෙද එය අශුභ වශයෙන් සිහි කිරීම වූ කායානුපස්සනාව ද, සුව දුක් විඳීම ආදි වේදනාව ගැන සිතා බැලීම වූ වේදනානු පස්සනාව ද; චිත්තයාගේ ඉපදීම පැවතීම් නැසීම් යනාදි සවභාව ගැන සිතා බැලීමවූචිත්තානු පස්සනාවද; රූප, වේදනා, සංඥා, සංස්කාර, විඥාන යන පඤ්චස්කන්ධ

ධර්ම සමූහය දක ආත්ම ග්‍රහණය හැර අනාත්මය වශයෙන් දක්නා ධම්මානු-පස්සනා ව ද, යන මේ භාවනා කරන පුද්ගලයාගේ සිත එක අරමුණක පිහිටුවන කාරණ චතුෂ්කය සතර සතිපට්ඨාන නම් වෙයි.

2. නොඋපන් අකුසල් නො ඉපදීම පිණිස ඒ ඒ පව්කම් නූපදනා ප්‍රතිපත්ති පිරීමට කැමැත්ත හා උත්සාහය ද, උපන් ලාමක අකුශල ධර්මයන්ගේ දුරුකිරීම පිණිස ඊට නිසි පිළිවෙත් පිරිමෙහි කැමැත්ත හා උත්සාහය ද, නොඋපන් කුශල ධර්මයන්ගේ ලැබීම පිණිස පිළිවෙත් සාධක කැමැත්ත ඇතිකරවීම හා උත්සාහය ද, උපන් කුශල ධර්මයන් ස්ථිර වශයෙන් පිහිටුවා ගැනීමට කැමැත්ත හා (මුළා ජනයන් මෙන් සිතට යටත් නො ව, වීර්‍ය්‍යය කිරීමෙන් සිත අල්ලා ගැනීම වූ) උත්සාහය ද යන මොවුහු සතර සම්‍යක් ප්‍රධානයෝ නම් වෙත්.

3. ඡන්දය නිසා පැවති සමාධිය, (වරද නැති සැප විපාක ලක්ෂණවූ සිතේ එකඟ බව හෙවත් චිත්තචෛතසිකයන් විසිර යා

තොදී එක අරමුණෙක මනාකොට පිහිටු-
වීම සමාධි නම් වේ. විස්තර, මුද්‍රිත විශුද්ධි
මාර්ග සන්නයෙන් බලා දතයුතුයි.) ප්‍රධාන
කොට ඇති සංස්කාරවලින් (කාමාවචරාදි
කුශල් සිත්) යුක්තවූ ඍද්ධිපාදය හෙවත්
භාවනා කළ මැනවයි යන සිත යයි කියන
ලද ඡන්දිද්ධිපාදය ද; වීර්‍ය්‍ය නිසා පැවති
සමාධිය ප්‍රධාන කොට ඇති සංස්කාරයන්
ගෙන් යුක්තවූ ඍද්ධිපාදය හෙවත්
නිවන් සොයා මුත් නොපසුබස්නා වීර්‍ය්‍යයි
කියන ලද විරියිද්ධිපාදය ද, සිත නිසා පැවති
සමාධිය ප්‍රධාන කොට ඇති සංස්කාරවලින්
යුක්තවූ ඍද්ධිපාදය හෙවත් හිත වසඟ
කරණ බව යයි කියන ලද චිත්තිද්ධිපාදයද;
විමංසාව (අර්ථානර්ථ සලකන ප්‍රඥාව) නිසා
පැවති සමාධිය ප්‍රධානකොට ඇති සංස්කාර-
වලින් යුක්තවූ ඍද්ධිපාදය හෙවත් නිවන්
සොයන ප්‍රඥාවයයි කියන ලද විමංසිද්ධිපාද-
ය ද; යන මේවා චතුෂ්කය සතර ඍද්ධිපාද
නම් වෙයි.

4. සැදැහැ නැති පුද්ගලයන් දුරු කිරීමෙන් ද, සැදැහැති පුහුලන් සේවනයෙන් ද, භජනය කිරීමෙන් ද, පර්යුපාසනය කිරීමෙන් ද, පැහැදුම් ගෙන දෙන සූත්‍රාන්තයන් ප්‍රත්‍යවෙක්ෂා කිරීමෙන් ද; වඩන ශ්‍රද්ධාව සද්ධින්ද්‍රියයි. කුසීත (කම්මැලි) පුද්ගලයන් දුරු කිරීමෙනුත්, පටන්ගත් වීර්‍ය්‍යය ඇත්තවුන් සෙවනය කිරීමෙනුත් සම්‍යක් ප්‍රධානයන් ප්‍රත්‍යවෙක්ෂා කිරීමෙනුත්, වඩන වීර්‍ය්‍යය විරියින්ද්‍රියයි. මුළා (මෝඩ) පුද්ගලයන් දුරු කිරීමෙනුත්, එළඹ සිටි සිහි ඇත්තවුන් සෙවනය භාජනය පර්යුපාසනය කිරීමෙනුත්; සතර සතිපට්ඨානයන් ප්‍රත්‍යවෙක්ෂා කිරීමෙනුත්; වඩනා සිහිය සතින්ද්‍රියයි. එකග සිත් ඇති පුද්ගලයන් සෙවනය භජනය පර්යුපාසනය කිරීමෙනුත් ප්‍රථම ධ්‍යානාදිය හා නිර්වාණය ද ප්‍රත්‍යවෙක්ෂා කිරීමෙනුත්; වඩනා සමාධිය සමාධින්ද්‍රියයි. දුශ්ප්‍රාඥ පුහුලන් දුරු කිරීම ද; එළඹ සිටි සිහි ඇති පුද්ගලයන් සෙවන භජන පර්යුපාසනය ද, ගම්භීර්‍ය්‍ය ඥානචර්‍ය්‍යා ප්‍රත්‍යවෙක්ෂා කිරීම ද; යනු මෙහි

අර්ථ නම්:–සූක්ෂ්ම පඤ්චස්කන්ධයට අනතුරු ව ද අෂ්ටාරසධාතු අනතුරුව ද, ෂඩායතනයන්ට (ඇස-කණ-නාසා-දිව-කාය-සිත) යන මොහු සසර දික් කරන හෙයින් ආයතනයයි. සෝවාන් ආදි ඵලයනට අනතුරුව ප්‍රත්‍යවෙක්ෂා කිරීම ද යන අර්ථයි. (අධිපතිකම් කරන අර්ථයෙන් ඉන්ද්‍රියයයි කියනු ලැබේ.) යන මෙයින් වඩනා නුවණ පඤ්ඤින්ද්‍රියයි. තවද මේ තුන් තුන් කාරණයාගේ වශයෙන් නො කරන ලද අභිනිවෙස (ප්‍රවිෂ්ට වීම හෝ ඇලීම) ඇති ආදි කාර්මික යොගාවචර තෙම (ධ්‍යාන යෙදෙන පුද්ගලයා) ශ්‍රද්ධාධූර ප්‍රඥාධූරයන්හි අභිනිවෙසය තබා වඩන්නේ අවසානයෙහි පෙරළී අර්හත්වය ගනී. රහත් මඟ දක්වා මේ පස් ඉඳුරන් වඩයි.

5. ශ්‍රද්ධා-වීය්‍ය්‍ය-සති-සමාධි-ප්‍රඥා-යන බල පසයි. ශ්‍රද්ධාව අශ්‍රද්ධාව කරණකොට ගෙන කම්පා නො වෙයි. වීය්‍ය්‍යය කුසීත භාවයෙන් කම්පා නො වෙයි. ස්මෘතිය මුළා හිසියෙන් කම්පා නො වෙයි. සිත එකඟ

බව යයි කියන ලද සමාධිය උඩඟු බැවින් කම්පා නො වෙයි. මේ සියල්ල ම කම්පා නොවන අර්ථයෙන් පඤ්චබලයයි කියනු ලැබේ.

6. සති සම්බොද්ධ්‍යඞ්ග සඞ්ඛ්‍යාත වූ සිහියට ද, ධම්ම විචය සම්බොඩ්‍යඞ්ග සඞ්ඛ්‍යාත වූ නුවණට ද; විරිය සම්බොද්ධ්‍යඞ්ග සඞ්ඛ්‍යාත වූ වීය්‍ය්‍යයට ද, ප්‍රීති සම්බොඩ්‍යඞ්ග සඞ්‍යඛ්‍යාත වූ ප්‍රීතියටද; පස්සද්ධි සම්බොඩ්‍යඞ්ග සඞ්ඛ්‍යා වූ කය හා සිත සන් හුන් බවට ද; උපෙක්ඛා සම්බොඩ්‍යඞ්ග සඞ්ඛ්‍යාත වූ මද්ධ්‍යසථ භාවයට ද; සමාධි සම්බොද්ධ්‍යඞ්ග සඞ්ඛ්‍යාත වූ චිතෛකාග්‍රතාවටද යන මේ සතට සප්ත සම්බොද්ධ්‍යඞ්ග යයි කියනු ලැබේ.

(මෙහි වැඩි විස්තර විශුද්ධි මාර්ගය, මනොරථ පූරණී ප්‍රතිසම්භිදමාර්ග යන පොත්වලින් බලා දතයුතුයි.)

## සමතිස් පෙරුම්

සමතිස් පෙරුම් යනු පාරමිතා ධර්ම තිස වේ. එනම්:– 1. දාන පාරමිතාවය, 2. දාන උප පාරමිතාවය, 3. දාන පරමාර්ථ පාරමිතාවය, 4. ශීල පාරමිතාවය, 5. ශීල උප පාරමිතාවය, 6. ශීල පරමාර්ථ පාරමිතාවය, 7. නෛෂ්ක්‍රම්‍ය පාරමිතාවය, 8. නෛෂ්ක්‍රම්‍ය උප පාරමිතාවය, 9. නෛෂ්ක්‍රම්‍ය පරමාර්ථ පාරමිතාවය, 10. ප්‍රඥා පාරමිතාවය, 11. ප්‍රඥා උප පාරමිතාවය, 12. ප්‍රඥා පරමාර්ථ පාරමිතාවය, 13. වීර්‍ය්‍ය පාරමිතාවය, 14. වීර්‍ය්‍ය උප පාරමිතාවය, 15. වීර්‍ය්‍ය පරමාර්ථ පාරමිතාවය, 16. ක්ෂාන්ති පාරමිතාවය, 17. ක්ෂාන්ති උප පාරමිතාවය, 18. ක්ෂාන්ති පරමාර්ථ පරාමිතාවය, 19, සත්‍ය පාරමිතාවය, 20. සත්‍ය උප පාරමිතාවය, 21. සත්‍ය පරමාර්ථ පාරමිතාවය, 22. අධිෂ්ඨාන පාරමිතාවය, 23. අධිෂ්ඨාන උප පාරමිතාවය, 24. අධිෂ්ඨාන පරමාර්ථ පාරමිතාවය, 25. මෛත්‍රී පාරමිතාවය, 26. මෛත්‍රී උප පාරමිතාවය,

27. මෛත්‍රී පරමාර්ථ පාරමිතාවය, 28. උපෙක්ෂා පාරමිතාවය, 29. උපෙක්ෂා උප පාරමිතාවය, 30. උපෙක්ෂා පරමාර්ථ පාරමිතාවය, යන මොහුයි.

1. දිය පිරුණු කළය මුනින් නමන ලද කල සවල්පයකුදු නොරඳා ජලය වගුරුවයි ද වගුළ එම ජලය නැවත නො ගනී ද එමෙන් ම ධනය හෝ යසස් හෝ අඹුදරු ආදීන් හෝ ශරීර අවයව හෝ නො බලා පැමිණි පැමිණි යදීන්ට තුන් සිත පහද දෙනු ලබන පරිත්‍යාගයයි කියන ලද දනය ද, 2. යම් සේ සෙමර මෘග තෙම ජීවිතය නො සලකා සවකීය වාලධිය ම රක්ෂා කරයි ද, එමෙන් ම අත් පා ආදී සවකීය ශරීරාවයව විනාශ වෙද්දී පවා පාපකර්මයන් ගෙන් වෙන්ව රක්නා ශීලය ද, 3. යම් සේ බොහෝ කලක් මුළුල්ලෙහි දඟ ගෙයි වාසය කරන්නා වූ පුරුෂතෙමඑහි ඇල්ම නො කෙරේ ද හුදෙක් සිත කලකිරීමට පැමිණ එහි නොවසනු කැමතිවේ ද, එපරිද්දෙන් ම සියලු කාම, රූප, භවයන් දඟගෙවලට සමානකොට සියලු

භාවය කෙරෙහි උකටලීව ඉන් මිදෙනු කැමතිව මහණදම් පිරීම පිණිස නික්මයාම යයි කියන ලද නෛෂ්ක්‍රම්‍යයද,4. යම් සේ පිඬු සිඟීමෙහි හැසිරෙන භික්ෂුවක් තෙම හීනාදි භෙද ඇති කුලයන්හි කිසි ගෙයක් නො වරදවා ගෙපිළිවෙළින් පිඬු පිණිස හැසිරෙන්නේ ද, එමෙන් ම උත්තම මධ්‍යමාධම සියලු නැණවතුන් කරා එළඹ කුශලාකුශලාදි පිළිවෙත් විචාරා දැන බුද්ධත්වය ලබමැයි සලකා පූරණ ප්‍රඥාව ය, 5. යම්සේ මෘගරාජ වූ සිංහ තෙම ස්ථාන, ගමන, ආසන, ශයන යන සතර ඉරියව්වෙහි දැඩි වීර්‍ය්‍ය ඇත්තේ වේ ද? එමෙන් හැම කල්හි ඒකාකාරයෙන් පවත්නාවූ නූපන් අකුශල් නොඉපදීම ද, උපන් අකුශල් නැති කිරීම ද, නොඋපන් කුසල් උපදවීම ද, උපන් කුසල් ස්ථිර කිරීම ද යන සතර සම්‍යක් ප්‍රධාන ලක්ෂණවීර්‍ය්‍ය ඇතිවබුදුබව ලබමැයි පූරණ වීර්‍ය්‍යය ද, 6. යම්සේ මේ මහාපෘථිවි තොමෝ ශුචි අශුචි දෙක බහාලීමෙහි සමව පවතී ද, එමෙන් ම හිතාහිත සත්වයන් විසින් කරනු ලබන සම්මානාවමානනයෙහි

වෙනසක් නැතිව ඉවසීම වූ ක්ෂාන්තිය ද, 7. යම් සේ ''ඔෂධී'' තාරකාව සියලු හේමන්ත ගිම්හානාදි ඍතු කාලයන්හි තමන් ගමනය කරන වීථිය හැර අන්‍ය මාර්ගයකින් නො යයි ද, ඒ ආකාරයෙන් ම හිස මස්තකයෙහි හෙණ වදින කල්හි දු, ඡන්ද – ද්වෙෂ – භය – මොහ – යන සතර අගතියට වහල් නොව දූන දූන මෘෂවා නොකියන්නේයයි සිතා පුරණ සත්‍යය ද, 8. යම්සේ සියලු දිගාභාගයෙන් හමන්නාවූ වාතයෙනුදු නිශ්චලව යථාස්ථානයෙහි පිහිටි පර්වතයක් පරිද්දෙන් තමාගේ ප්‍රාර්ථනාවෙහි ස්ථිර වශයෙන් පිහිටා බුඬත්වය ලබමැයි සිතා පුරණ අධිෂ්ඨානය ද, 9. යම් සේ පිනැත්තනට ද, පාපින්ට ද යන මේ දෙපක්ෂයට ම එකාකාරව සිහිල් ගුණය පතුරුවන්නාවූ ජලය මෙන් සියලු හිතාහිත සත්ත්වයන් කෙරෙහි සම මෙත් පැවැත්වීමෙන් පුරණ මෛත්‍රිය ද, 10. යම් සේ එක් ශරීරාවයවයක් කිසිවෙක් සුවඳින් ගල්වා ද, එක් ශරීරාවයවයක් කිසිවෙක්

වැයෙන් සසි ද, ඒ දෙදෙනා කෙරෙහි ප්‍රතීත කරනලද ප්‍රතිඝ ගැතිව හෙවත් දයා, ද්වෙෂ දෙකින් වෙනසක් නැතිව සැප දුක් දෙකෙහි මධ්‍යසථව පවතී ද, එමෙන් ම බුධ කාරක ධර්‍මය පිරිමෙහිදී සැප දුක් දෙකෙහි එකාකාර පැවැත්ම වූ උපෙක්ෂාව ද, යන මේ පෙරුම් දහම් දසය වෙයි. දන පාරමිතාවෙහි දී බාහිර වස්තු පරිත්‍යාගය පාරමි ය, අඞ්ග පරිත්‍යාගය – උප පාරමි ය, ජිවිත පරිත්‍යාගය – පරමාර්ථ පාරමි ය යන මේ සැටියෙන් දශපාරමි, දශ උප – පාරමි, දශ පරමාර්ථ පාරමී යයි හැම බලත් පාරමිතා සමතිසකි.

1. යමෙක් තරුණ කාලයෙහි හේවාකමින් හෝ වෙළඳාම් කෘෂිකර්මාදිය කිරීමෙන් හෝ වස්තු උපයාගෙන මහලු බවට පැමිණි කල්හි රැකෙන්නට යයි යමක් ප්‍රවේසම් කොට නොතබා ඒ ඒ කාලයෙහි වියදම් කෙළේ නම්, හෙතෙම සැපසේ වසන වයස් ගත තැනැත්තෙකු දැක '' මම ද

මේ නියාවට සැප විඳීම පිණිස තරුණ කල සැපයුූ වස්තුව ප්‍රවේසම් කොට නොතිබුයෙමි''යි සිතා පසුතැවිලි වෙයි.

2. යමෙක් තෙම බාල්‍යයෙහි උගත යුතු ශාස්ත්‍ර ඉගෙණ ඒ තමන් උගත් ශාස්ත්‍ර හේතුයෙන් සැපතට පැමිණ කීර්ති ප්‍රශංසාදිය ලැබීමෙන් වෙසේ නම්, ශාස්ත්‍ර නොදත්තෙක් ඒ සැප විඳින්නාහු දැක ''අනේ මමද් තරුණ කල ශාස්ත්‍රය උගත්තෙම් නම් මොහු සේම සැපසේ වසන්නෙම් නොවෙම් දැ'යි පසු තැවිලි වෙයි.

3. යමෙක් තෙම පෙර තුලාකූට මානකූට වශයෙන් සොරකම කළේද, මුසා හා කේලාම් කියා අල්ලස් ගැනීමෙන් අන්‍යයනට තද එරුසව වාසය කෙළේද, හෙතෙම මරණාසන්න කාලයෙහි ''අහෝ මම සොරකම් කොට බොහෝ බොරු හා කේලාම් කියා අත්ලස්ද ගෙන තද පරුෂ බිණීමෙන් විසුයෙමි පරලොව කුමක් වේදෙ හෝ''යි සිතා පසු තැවිල්ලට පැමිණෙයි.

4. යමෙක් තෙම පෙර සත්ත්ව ඝාතනය කෙළේද ආයුධාදීන් සතුරන්ට රෞද්‍ර වධ කෙළේද, ක්ෂාන්ති මෛත්‍රී කරුණාදි වශයෙන් මනා පැවතුම් නැත්තේ විද, හෙතෙමේද "මම ප්‍රාණ ඝාතාදි පව්කම් කළෙම් නොවේද්ද"යි මරණාසන්න කල පසුතැවිල්ලට පැමිණෙයි.

5. යමෙක් අනුන් සතු ස්ත්‍රීන් කරා එළඹ ලාමකාඩ්‍යාශයෙන් සේවනය කෙළේ වේද, හේ පුරුෂ තෙමේද මරණාසන්න කල "මම පරදර සඞ්ගමයෙහි යෙදුනෙම් වේද්ද" යි සිතා පසුතැවිල්ලට පැමිණෙයි.

6. යමෙක් තෙම බොහෝ සම්පත් ඇතුව තිබියදීත් දන මානාදි පුණ්‍ය කර්ම කරණයෙහි නොයෙදුනේ වේද, හේ පුරුෂ තෙම මරණාසන්න කාලයෙහි "මට බොහෝ සම්පත් ඇතුව තිබියදීත් පරලෝ වැඩ පිණිස දන් පින් නොකළ හෙයින් කුමක් වේදෙහෝ"යි සිතා පසුතැවිල්ලට පැමිණෙයි.

7. යමෙක් තෙම තමන් යෞවනාවස්ථාවෙහි ස්වකීය මව් පියන්ට අත් පා මෙහෙවරාදීන් වත් පිළිවෙත් නොකළේ වී නම්, හෙතෙමද මරණාසන්න කාලයෙහි "මම යොවුන් කල අප මව් පියන්ට අත් පා මෙහෙවරාදි කිසි සත්කාරයක් නො කෙළෙමි. පරලොව කුමක් වේදෝහෝ" යි සිතා පසුතැවිල්ලට පැමිණෙයි.

8. යමෙක් තෙම මේ දෑ කටයුතුය. මෙය නොකට යුතුයයි කියා උගන්වන හෙයින් ආචාර්‍ය්‍යවරයෙක් සමාන වූ ද, කැමති කැමති ආහාර පානාදියෙන් සංග්‍රහ කරන හෙයින් ඉෂ්ට දේවතාවෙකු බඳු වූ ද, පිය කෙනෙකුන් කීවා නොගිවිස උන්ට ආක්‍රොශ පරිභව බිණි නම් එසේවූ පුරුෂ තෙමේද, මරණාසන්න කාලයෙහි "ඉෂ්ට දේවතාවකු මෙන් මට හිතවූ මපියාණන්ගේ අනුශාසනා වචන නොපිළිගෙන උන්හට ආක්‍රොශ පරිභව බිණීමි. එබැවින් මට පරලොව කුමක් වේදෙහෝ" යි සිතා පසුතැවිල්ලට පැමිණෙයි.

9. යමෙක් තෙම ශීල සම්පන්න බ්‍රාහ්මණාදීන්ට ආක්‍රොශ පරිභව බෙණෙමින් ඔවුන් අ ශ්‍රය නොකෙළේද, හේ පුරුෂ තෙමේද මරණාසන්න කල "මම උතුම්වූ මහණ බමුණන් ආශ්‍රය කොට පරලොව සුඛ භාගීවීම පිණිස දන මානාදි කිසිවක් නොකෙළෙමි. උන්ට ආක්‍රොශ පරිභව බිණීමි. එබැවින් මරණින් මතුයෙහි කුමක් වේදෙහෝ"යි සිතා පශ්චාත්තාපයට පැමිණෙයි.

10. තවද යමෙක් තෙම සිල්වත් ගුණවත් තැනැත්තවුන් වෙත එළඹ, තමන්ට ප්‍රතිෂ්ඨා පිණිස "ස්වාමීනි, මා විසින් කළමනා කිමෙක්ද? පරලොව සුව ලැබීම පිණිස යම්කිසි අවවාදයක් වදළ මැනවි." යනාදීන් නොකියා, මොහයෙන් මුළාව වාසය කෙළේ වී නම් එසේවූ තැනැත්තේද මරණ ළංවූ කල "අහෝ මම ගුණවත් සමණන් කෙරෙන් පරලොව සුව ලැබීම පරමාර්ථ කොට යම අවවාදනුශාසනාදියක් අසා හික්මී ඔවුන් ආශ්‍රය කොට ඉගෙණගත

නුහුණු යෙමි. මරණින් මතු කුමක් වේදෙහෝ''යි සිතා පසුතැවිල්ලට පැමිණෙයි.

මෙසේ පසුතැවිලි විය යුතු මෙකී දශ කාරණයෙන් විශෙෂයෙන් වෙන්ව නුවණින් කාලක්ෂෙපය කළ පුරුෂ තෙම මරණාසන්න කල පසුතැවිලි නොව "මම වනාහි වස්තු සපයා තිබූයෙමි, ශාස්ත්‍ර උගතිමි, සත්ත්ව ඝාතනාදි ලාමකවූ පාපකර්‍ම නොකෙළෙමි. දන මානාදි පුණ්‍යකර්‍ම සිත්සේ කෙළෙමි. මව් පියන්ට කළයුතු උපස්ථානාදියද කෙළෙමි. ඉෂ්ට දෙවතාවකු බඳුවූ පියාණන්ට අනිෂ්ට දෑ නොකියා ප්‍රිය තෙපුල් බිණීමි'' යන මේ ආදි කරුණු නොපිරිහෙලූ බව චින්තනය කොට චිත්ත ප්‍රසාදය උපදවා මරණින් මතු දෙව් මිනිස් සැප විඳ කෙළවර ශාන්තවූ නිර්වාණය නමැති ක්ෂෙම භූමියට සුවසේ පැමිණෙන්නේය.

## දුර්ලභ කාරණා චතුෂ්කය

දුල්ලභඤ්ච මනුස්සත්තං
බුද්ධුප්පාදො ච දුල්ලභො
දුල්ලභා ඛණ සම්පත්ති
සද්ධම්මො පරම දුල්ලභො.

මිනිසත් බවක් ලබා ගැනීම හෙවත් මේ ලොකයෙහි මනුෂ්‍යයෙක්ව ඉපදීමද දුර්ලභය, හෙවත් දුකසේ ලැබිය යුත්තක්ය. බුදු කෙනෙක් ලොව පහළව ඇත්තාවූ හෝ බුද්ධ ශාසනය ඇත්තාවූ කාලයක් ලබා ගැනීමද දුර්ලභය. නරකය, තිරිසන් අපාය, ප්‍රෙත නිකාය, අසුර නිකාය, පඤ්චෙන්ද්‍රිය විකලත්වය, පිට සක්වළ ඉපදීම, මිථ්‍යාදෘෂ්ටි කුලයන්හි ඉපදීමය, අබුද්ධොත්පාද කාලය යන අෂ්ට ප්‍රකාර දුෂ්ට කාලයෙන් වෙන්ව සතර මාර්ග, සතර ඵල, නිර්වාණ යන නව ලොකොත්තර ශ්‍රී සද්ධර්මය අවබොධ කිරීමට ඉඩ ලැබෙන ඉතා සවල්ප කාලයවූ ක්ෂණ සම්පත්තියද දුර්ලභය. නවලොකොත්තර නම්:-

සෝවාන් මාර්ගය, එම ඵලය, සකෘදගාමී මාර්ගය, එම ඵලය, අනාගාමී මාර්ගය, එම ඵලය, අර්හත් මාර්ගය, එම ඵලය, නිර්වාණය යන මෙකී නවයට පමුණුවන්නාවූ ශ්‍රී සඞර්මයද ලබාගැනීම නම් අතිශයින් දුෂ්කර මැයි.

තවද ඉතා දුකසේ ලැබී තිබෙන්නාවූ මේ මිනිසත් බව පස්පව් දස අකුසල් කිරීමෙන් නිෂ්ඵල කර නොගෙන එසේම අතිශයින් දුර්ලභවූ නව ලොකොත්තර ශ්‍රී සඞර්මයද සෙවනය කොට ක්ෂණ සම්පත්තියෙන් ප්‍රයෝජන ගනු සඳහා තුන්තරා බොධියෙන් අභිමතවූ බොධියක් ප්‍රාර්ථනා කරමින් නිර්වාණය ලැබීම පිණිස ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයෙහි අනවරතයෙන් යෙදිය යුතුයි.

## අකුසල් මුල්

රූපාදී අරමුණුවල ඇලීමයයි කියන ලද රාගය හෙවත් ලොභය, සතුරු බව හෙවත් ක්‍රොධ කිරීමයයි කියන ලද ද්වෙෂය,

අරමුණෙහි මුළාවීමයයි කියන ලද මොහය, යන මොහු සියලු අකුසලයන්ට මුල්වූ හෙයින් අකුසල් මුල් යයි කියනු ලැබේ.

## කුසල් මුල්

රූපාදී අරමුණුවල නො ඇලීම යයි කියන ලද අලොභය, සතුරු බව හෙවත් ක්‍රොධ නොකිරීමයයි කියනලද අද්වෙෂය, අරමුණෙහි මුළා නො වීමයයි කියන ලද අමොහය යන මොහු සියලු කුසලයන්ට මුල්වූ හෙයින් කුසල් මුල්යයි කියනු ලැබේ.

## ගති නියත කුසල්

බුඩාදී රත්නත්‍රය සරණ යාමය, පන්සිල් රැකීමය; සලාක බතක් (නම් ඇදීමෙන් බෙදන බතක්, මීට ලහබත් යයිද කියනු ලබේ.) දීමය, වස් විසූ භික්ෂු නමක් හට වස්සාවාසිකයන් දීමය, පොකුණක් කරවී-මය, ආවාසයක් කරවීමය, යන මොහු ''ගති නියත'' කුසල් නම් වෙති. මේ කුසල, ක්‍රියා හේතුකොට ගෙන දයකයන්

නොයෙක් කල්ප ලක්ෂ ගණන් ආත්ම-භාවයන්හිදී දුගතිවල ඉපදීමට අවකාශ නොපා රක්ෂා කරනු ලැබේ.

## උපාසක ලක්ෂණ

සඞ්ඝයා හා සමව සුව දුක් ඉවසනු කැමතිවීමය, ශ්‍රී සද්ධර්මය ශ්‍රේෂ්ඨකොට සිතීමය, ශක්ති පරිද්දෙන් ලද දෙය බෙදා දීමෙහි ලොල් ඇති බවය, සර්වඥ ශාසන-ස්ථිතිය ගැන උත්සාහ දැරීමය, සම්‍යක් දෘෂ්ටාානුගතව මනා පිළිපැදීමෙන් යුක්ත වීමය, සර්වඥ ශාසනයෙන් පිටත් අන්‍ය ශාස්තෘන් පිහිටකොට නොගැනීමය, කාය වාඞ් මනස් යන ත්‍රිවිධද්වාරයෙන් වන පව් වළකාලීමෙන් රැක ගැනීමය, සාමග්‍රී ධර්ම-යෙහි ඇලීම හා අන්‍යයන් කෙරෙහි ඊර්ෂ්‍යා නොකිරීමය, නැති ගුණ ඇඟවීම් වශයෙන් බුඩ ශාසනයෙහි නොහැසිරීමය, බුදු දම් සඟ යන තෙරුවන සරණ යාමය යන මොහු කල්‍යාණ ධර්මෝපාසකයාගේ ගුණ ලක්ෂණයෝ වෙත්.

## නොඉවසීමෙහි ආදීනව

නො ඉවසීමෙහි වනාහි දෙෂ පඤ්චකයෙක් වෙයි. හේ කවරේද යත්:- නොඉවසන තැනැත්තේ බොහෝ දෙනාට අප්‍රිය අමනාප වේ. වෛර බොහෝ කොට ඇත්තේ වේ. එසේම වරද බහුල කොට ඇති වන්නේය. මුළාවූ සිහියෙන් යුක්තව කළුරිය කෙරේ. කාය භෙදයෙන් හෙවත් මරණින් මතු සැපයෙන් වෙන්වූ දුකට හේතුවූ නරකයෙහි උපදනේය. යන මෙ නො ඉවසීමෙහි ආදීනව යයි දතයුතුයි.

## ඉවසීමෙහි ආනිසංස

ඉවසීමෙහි වනාහි ආනිසංස පසෙක් වෙයි. හේ කවරේද යත්:- ඉවසන තැනැත්තේ ලොකයාගෙන් ප්‍රිය මනාප බව ලබයි. පිරිහුණු වෛර ඇත්තේ වේ. වරද බොහෝ කොට ඇති නොවේ. නුමුළාවූ සිහියෙන් යුක්තව කළුරිය කෙරේ.

කාය හෙදයෙන් හෙවත් මරණින් මතු කුශල ක්‍රියා හේතුකොටගෙන එළඹිය යුතු දිව්‍ය ලොකයෙහි උපදනේ යයි යන මොව්හු ඉවසීමෙහි ආනිසංසයෝ වෙති.

## මෛත්‍රෙය බුදුන් දක සසරින් ගැලවෙන්නෝ

බුද්ධෝත්පාද කාලයෙහි පස් පව් දස අකුසලින් වෙන් ව දන මානාදි පුණ්‍ය කර්‍ම කළෝද, සිල් රක්‍ෂා කළෝද, බඹසර වස් රැක්කෝ ද, දගබ් - දකරඬු - පුෂ්පාරාම කරවූවෝද, බෝධි පිහිටවූවෝද, නටබුන්වූ විහාරාරාමාදිය ප්‍රකෘතිමත් කරවූවෝ ද, ධර්‍ම කථිකයන් වහන්සේලාට පා දෙවුන් ආදි වතාවත් කළෝ ද, චීවර-පිණ්ඩපාත-සෙනාසන - ගිලාන ප්‍රත්‍යාදිය දුන්නෝ ද, මව්පියන්ට අත්පා මෙහෙවරාදිය කොට ඔවුන් පෝෂණය කළෝ ද යන මොව්හු මතු මෙතේ බුදුන් දක සසර සයුරින් ගැලවෙන්නාහු වෙත්.

## මෛත්‍රේය බුදුන් නො දක හෙන්නෝ

මව් පියන් මැරුවෝ ද, අරහන්තඝාතකයෝ ද, බුදු සිරුරින් ලේ සෙල්ලුවෝ ද, සඞ්ඝ භෙද කළෝද, දගබ් බිඳ ධර්‍ම පුස්තකාදිය සුන්බුන් කරදැමුවෝ ද, සංඝයා වහන්සේලාට අක්‍රොශ පරිභව බිණුවාහු ද, සිල්වතුන් වහන්සේලාට බොරු චෝදනා ඉපිදවූවාහු ද, ධර්‍මයට අනාදර බිණූ සත්ත්වයෝ ද, මිථ්‍යාදෘෂ්ටි ගෙන සිටියෝද, බුදුන් දහම් සඟුන් යන ත්‍රිවිධ රත්නය සතු දෙය ගෙන ස්වකීය ප්‍රයෝජනය පිණිස ගත්තාහු ද, යන මොව්හු මතු මෛත්‍රී බුදුන් නොදක්ක හෙන්නාහු ය.

## දෙමව්පියන්හට වඳින ගාථා
## මවට වඳින ගාථාව

දසමාසෙ උරෙකත්වා
පොසෙසි වුද්ධිකාරණං
ආයු දීඝං වස්සසතං-
මාතු පාදං නමාමහං

## මෙහි භාවය

මා දස මසක් මුළුල්ලෙහි කුසෙහි වැඩීම පිණිස පොෂ්‍ය කෙළේ ද ආයුෂයාගේ වර්‍ෂ සියය දක්වා වැඩීම සඳහා මම මෑණියන්ගේ පාදයන් නමස්කාර කරමි.

## පියාට වඳින ගාථාව

වුද්ධිකාරෝ අලිඞ්ගිත්වා-
චුම්බිත්වා පියපුත්තකං
රාජමජ්ක්ධං සුපතිට්ඨං
පිතු පාදං නමාමහං

## මෙහි භාවය

මපිය තෙමේ ප්‍රිය පුත්‍රවූ මා වැලඳගෙන සිඹ, ආහාර පානාදිය දීමෙන් මා පොෂ්‍ය කෙළේ වේ ද, රජුන් මධ්‍යයෙහි මනාව පිහිටෙව්වේ ද, ඒ පියාණන්ගේ පාදයන් මම මස්තකයෙන් නමස්කාර කරමි.

## මළගිය ඥතීන් හට පින් දීම

යම් කිසි දන වස්තුවක් සඞ්ඝයාට පූජා කළ කල්හි භාජනයකට පැන් ගෙන මේ ගාථාපද තුන් වරක් කියා පැන් වඩනු.

ඉදං වො ඤාතිනං හොතු
සුඛිතා හොන්තු ඤාතයො.

මේ කරන ලද පුණ්‍ය කර්‍මය අප ඥති සමූහයාට අත් වේවා. නෑයෝ සැපයට පැමිණෙත්වා. අවසානයෙහි මේ ගාථා දෙක ද කියා පැන් වඩනු.

යථාවාරි වහාපූරා
පරිපූරෙන්ති සාගරං
එව මෙව ඉතො දින්නං
පෙතානං උපකප්පතු.

උණ්ණමෙ උදකං වට්ටං
යථානිණ්ණං පවත්තති
එව මෙව ඉතො දින්නං
පෙතානං උපකප්පතු.

යම් සේ වර්‍ෂා නිපාතනයෙන් පිරෙන ලද්ද වූ ජලධාරා නොහොත් වර්‍ෂා ජලයෙන් පුරවන ලද්ද වූ ගඞ්ගාවන්හි උදකය සාගරය කරා පැමිණ හාත්පසින් පිරෙද්ද, එමෙන් ම මෙයින් දෙන ලද පින මළගිය ඥාති ප්‍රෙතයනට පැමිණේ වා. උස්වූ ස්ථානයෙහි වර්‍ෂා කරන ලද ජලය පහත් භූමිය කරා යේ ද, එපරිද්දෙන්ම මෙයින් දෙන ලද පින මළගිය ඥාති ප්‍රෙතයන් කරා පැමිණේ වා.

## මළ කුණක් දුටු විට සිහි කිරීම

අනිච්චාවත සංඛාරා
උප්පාද වය ධම්මිනො
උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති
තෙසං වූපසමො සුඛො.

ඉපදීම නැසීම සවභාව කොට ඇති සියලු සංස්කාර ධර්‍මයෝ ඒකාන්තයෙන් අනිත්‍යයහ. ඔහු තුමූ ඉපිද නැසෙන්නාහු ය. ඒ සංස්කාරයන්ගේ සන්සිඳීම සැපවන්නේයි.

## බෞද්ධයන් විසින් සිහි කටයුතු ප්‍රාර්ථනා

බෞද්ධයන් විසින් කුශල ක්‍රියාවක් කළ කල මෙසේ ප්‍රාර්ථනා කටයුතුයි:– මවිසින් කරන ලද මේ පුණ්‍ය කර්‍මය හේතුකොට ගෙන මා කවර කලෙකවත් නරකය තිරිසන් අපාය, ප්‍රෙත නිකාය, අරූප භවය, පිට-සක්වළ, ප්‍රත්‍යන්ත ජනපදය යන ස්ථාන-යන්හි නොඉපද අඞ්ග ප්‍රත්‍යඞ්ග විකලත්වය නියත මිථ්‍යා දෘෂ්ටිය යන මෙයින් වෙන් ව කල්‍යාණ මිත්‍ර සංසර්‍ගයෙන් ලබන ලද සප්ත විධ ආර්‍ය්‍ය ධන සම්පන්න ව ඉපිද, යම් බුදුවරයෙක් ලොව ඇති වූ කල්හි උන්-වහන්සේ කෙරෙන් ශ්‍රී සද්ධර්‍ම ශ්‍රවණය කොට අර්ථ - ධර්‍ම - නිරුක්ති - ප්‍රතිභාන සඞ්ඛ්‍යාත සිව් පිළිසිඹියා පත් මහ රහත් ව අමාමහ නිවන් සැප මට ලැබේවා' යනුයි. තවද භව සම්පත්තිය ප්‍රාර්ථනා කිරීම වුවමනා නො වේ. මක්නිසාදයත්:- නිවන් පතන්නාහට ඒ සියල්ල ලැබීමට බාධාවක් නොවන බැවිනි.

## දෙවියන්ට පින් දීම

1. එත්තාවතා ච අම්හෙහි, සම්භතං
පුඤ්ඤ සම්පදං
සබ්බෙ දෙවානුමොදන්තු,
සබ්බ සම්පත්ති සිද්ධියා.

අප විසින් මෙපමණකින් රැස් කරන ලද පුණ්‍ය සම්පත්තිය සියලු සැප සිද්ධ කැරගැනීම පිණිස සියලු දෙවියෝ ම අනුමෝදන් වෙත් වා.

2. ආකාසට්ඨා ච භුම්මට්ඨා;
දෙවානාගා මහිද්ධිකා
පුඤ්ඤං තං අනුමොදිත්වා,
චිරං රක්ඛන්තු සාසනං.

අහස්හි වසන්නා වූ ද බිම වසන්නා වූ ද මහත් සෘද්ධි සම්පන්න දෙවියෝත්, නාගයෝත් මේ පින් අනුමෝදන් ව දීර්ඝ කාලයක් සම්බුද්ධ ශාසනය රක්ෂා කෙරෙත් වා!

3\. දෙවො වස්සතු කාලෙන,
සස්ස සම්පත්ති හෙතු ච
පීතො භවතු ලොකො ච,
රාජා භවතු ධම්මිකො

## තවත් පින්දීමක්

මෙත් සිත් සත් සයුරේ මෙරේ අසුරලෝ
නාලෝ සදෙව් ලෝ තලේ
සිව් දේවාල සමන්කුළේ හිමකුළේ
සද්දත් අනෝතත් විලේ
ආකාසේ පොළොවේ සියල් බඹතලේ
මේ සක්වළේ ලක්දිවේ
දෙව් රැස් පින් ගනිමින් මෙතේ මුනි
රජුන් දැක්මෙන් දකිත් වා නිවන්!

## ප්‍රාර්ථනාවක්

ඉමිනා පුඤ්ඤ කම්මෙන,
මා මේ බාල සමාගමො
සතං සමාගමො හොතු
යාව නිබ්බාන පත්තියා!

## 15. ගිහි විනය

### වසල සූත්‍රය

එවං මෙ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථ-පිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්ත-චීවරමාදය සාවත්ථියං පිණ්ඩාය පාවිසි. තෙන ඛො පන සමයෙන අග්ගික-භාරද්වාජස්ස බ්‍රාහ්මණස්ස නිවෙසනෙ අග්ගි පජ්ජලිතො හොති ආහුති පග්ගහිතා. අථ ඛො භගවා සාවත්ථියං සපදානං පිණ්ඩාය චරමානො යෙන අග්ගික-භාරද්වාජස්ස බ්‍රාහ්මණස්ස නිවෙසනං තෙනුපසංකමි. අද්දසා ඛො අග්ගික-භාරද්වාජො බ්‍රාහ්මණො භගවන්තං දූරතො'ව ආගච්ඡන්තං. දිස්වාන භග-වන්තං එතදවොච:

''තත්‍රෙව මුණ්ඩක තත්‍රෙව සමණක තත්‍රෙව වසලක තිට්ඨාහී''ති. එවං වුත්තෙ භගවා අග්ගිකභාරද්වාජං බ්‍රාහ්මණං එතද-වොච: ''ජානාසි පන ත්වං බ්‍රාහ්මණ, වසලං වා වසලකරණෙ වා ධම්මෙ''ති. 'නෙවාහං භො ගොතම ජානාමි වසලං වා වසලකරණෙ වා ධම්මෙ. සාධු මෙ භවං ගොතමො තථා ධම්මං දෙසෙතු, යථා'හං ජානෙය්‍යං වසලං වා වසලකරණෙ වා ධම්මෙ'' ති. ''තෙන හි බ්‍රාහ්මණ සුණොහි සාධුකං මනසි කරොහි භාසිස්සාමී'' ති. ''එවං භො'' ති ඛො අග්ගිකභාරද්වාජො බ්‍රාහ්මණො භගවතො පච්චස්සොසි. භගවා එතදවොච:

කොධනො උපනාහී ච
පාපමක්ඛී ච යො නරො
විපන්නදිට්ඨී මායාවී
තං ජඤ්ඤා වසලො ඉති.

එකජං වා දිජං වාපි
යො'ධ පාණානි හිංසති
යස්ස පාණෙ දයා නත්ථි
තං ජඤ්ඤා වසලො ඉති.

යො හන්ති පරිරුන්ධති
ගාමානි නිගමානි ච
නිග්ගාහකො සමඤ්ඤාතො
තං ජඤ්ඤා වසලො ඉති.

ගාමෙ වා යදි වා' රඤ්ඤෙ
යං පරෙසං මමායිතං
ථෙයයා අදින්නං ආදියති
තං ජඤ්ඤා වසලො ඉති.

සො හවෙ ඉණමාදය
චුජ්ජමානො පලායති
''න හි තෙ ඉණමත්ථීති''
තං ජඤ්ඤා වසලො ඉති.

යො වෙ කිඤ්චික්ඛකමයතා
පන්ථස්මිං වජතං ජනං
හන්ත්වා කිඤ්චික්ඛමාදෙති
තං ජඤ්ඤා වසලො ඉති.

යො අත්තහෙතු පරහෙතු
ධනහෙතු ච යො නරො
සක්ඛි පුට්ඨො මුසා බ්‍රූති
තං ජඤ්ඤා වසලො ඉති.

යො ඤාතීනං සඛීනං වා
දරෙසු පතිදිස්සති
සහාසා සම්පියෙන වා
තං ජඤ්ඤා වසලො ඉති.

යො මාතරං වා පිතරං වා
ජින්නකං ගතයොබ්බනං
පහුසන් තො න හරති
තං ජඤ්ඤා වසලො ඉති.

යො මාතරං වා පිතරං වා
භාතරං භගිනිං සසුං
හන්ති රොසෙති වාචාය
තං ජඤ්ඤා වසලො ඉති.

යො අත්ථං පුච්ඡතො සන්තො
අනත්ථමනුසාසති
පටිච්ඡන්නෙන මන්තෙති
තං ජඤ්ඤා වසලො ඉති.

යො කත්වා පාපකං කම්මං
"මා මං ජඤ්ඤා" ති ඉච්ඡති
යො පටිච්ඡන්නකම්මන්තො
තං ජඤ්ඤා වසලො ඉති.

යො වෙ පරකුලං ගන්ත්වා
භුත්වාන සුචිභොජනං
ආගතං න පටිපූජෙති
තං ජඤ්ඤා වසලො ඉති.

යො බ්‍රාහ්මණං වා සමණං වා
අඤ්ඤං වා'පි වණිබ්බකං
මුසාවාදෙන වඤ්චෙති
තං ජඤ්ඤා වසලො ඉති.

යො බ්‍රාහ්මණං වා සමණං වා
භත්තකාලෙ උපට්ඨිතෙ
රොසෙති වාචා න ච දෙති
තං ජඤ්ඤා වසලො ඉති.

අසතං යො'ධ පබ්‍රෑති
මොහෙන පළිගුණ්ඨිතො
කිඤ්චික්ඛං නිජිගිංසානො
තං ජඤ්ඤා වසලො ඉති.

යො අත්තානං සමුක්කංසෙ
පරං ච මවජානති
නිහීනො සෙන මානෙන
තං ජඤ්ඤා වසලො ඉති.

රොසකො කදරියො ච
පාපිච්චො මච්ඡරී සඨො
අහිරිකො අනොත්තප්පී
තං ජඤ්ඤා වසලො ඉති.

යො බුද්ධං පරිභාසති
අථ වා තස්ස සාවකං
පරිබ්බාජං ගහට්ඨං වා
තං ජඤ්ඤා වසලො ඉති.

යො වෙ අනරහා සන්තො
අරහං පටි ජානති
චොරො සබ්‍රහ්මකෙ ලොකෙ
එස ඛො වසලාධමො–
එතෙ ඛො වසලා වුත්තා
මයා වො යෙ පකාසිතා.

න ජච්චා වසලො හොති
න ජච්චා හොති බ්‍රාහ්මණො
කම්මනා වසලො හොති
කම්මනා හොති බ්‍රාහ්මණො.

තදමිනා'පි ජානාථ
යථා මෙ'දං නිදස්සනං
චණ්ඩාලපුත්තො සොපාකො
මාතඞ්ගො ඉති විස්සුතො.

සො යසං පරමං පත්තො
මාතාඞ්ගො යං සුදුල්ලභං
ආගඤ්ඡුං තස්සුපට්ඨානං
ඛත්තියා බ්‍රාහ්මණා බහු.

සො දෙවයානමාරුය්හ
විරජං සො මහාපථං
කාමරාගං විරාජෙත්වා
බ්‍රහ්මලොකූපගො අහු–
න නං ජාති නිවාරෙසි
බ්‍රහ්මලොකූපපත්තියා.

අජ්ඣායකකුලෙ ජාතා
බ්‍රාහ්මණා මන්තබන්ධුනො
තෙ ච පාපෙසු කම්මෙසු
අභිණ්හමුපදිස්සරෙ.

දිට්ඨෙ'ච ධම්මෙ ගාරය්හා
සම්පරායෙ ච දුග්ගති
න තෙ ජාති නිවාරෙති
දුග්ගච්චා ගරහාය වා.
න ජච්චා වසලො හොති
න ජච්චා හොති බ්‍රාහ්මණො
කම්මනා වසලො හොති
කම්මනා හොති බ්‍රාහ්මණො'ති

එවං වුත්තෙ අග්ගිකභාරද්වාජො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: ''අභික්කන්තං භො ගොතම, අභික්කන්තං භො ගොතම, සෙය්‍යථා 'පි භො ගොතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය පටිච්ඡන්නං වා විවරෙය්‍ය මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය, චක්ඛුමන්තො රූපානි දක්ඛන්තීති. එවමෙවං භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භගවන්තං ගොතමං සරණං ගච්ඡාමි, ධම්මඤ්ච භික්ඛුසංඝඤ්ච. උපාසකං මං භවං ගොතමො ධාරෙතු, අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතං''ති.

## වසල සූත්‍ර භාවය

මා විසින් මෙසේ අසන ලදී.

එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර දෙව්රම්හි අනේපිඩු සිටුහු ගේ අරම්හි වැඩ වසනසේක; ඉක්බිති, භාග්‍යවතුන්වහන්සේ පෙරවරුයෙහි සිවුරු සකසා හැඳ පා සිවුරු ගෙන සැවැත් නුවර පිඬුසිඟා වැඩිසේක. එසමයෙහි වනාහි අග්ගික භාරද්වාජ නම් බමුණාගේ නිවෙස්හි ගිනි දල්වන ලද්දේ යාගය පටන් ගැනුණේ වී. ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ සැවැත් නුවර අනුපිළිවෙළින් පිඬු සිඟා වඩිනසේක් අග්ගික භාරද්වාජ නම් බමුණා ගේ නිවෙස යම් තැනෙක්හි ද එතනට එළඹිසේක. අග්ගික භාරද්වාජ බමුණුතෙමෙ වනාහි දුරින් ම එන්නා වූ භාග්‍යවතුන්වහන්සේ දුටුයේ ය. එසේ දැක බගවතුන් වහන්සේට මෙසේ කීය.

‘‘ඔහිම සිටු මුණ්ඩකය, ඔහිම සිටු මහණ, ඔහිම සිටු වසලය’’ මෙසේ කී කල්හි භාග්‍යවතුන් වහන්සේ මෙසැටියෙන් වදළසේක;

''එම්බා බමුණ, තෝ වනාහි වසලයා හෝ වසලබවට හේතු වූ දහම් හෝ දනිති ද?'' ''පින්වත් ගෞතමය, මම වනාහි වසලයා හෝ වසලබවට හේතු වූ දහම් හෝ නො දනිමි. යහපති, යම් සේ මම වසලයා හෝ වසල බවට හේතු වූ දහම් හෝ දනිම්ද, එසේ වන සැටියට පින්වත් ගෞතම තෙමේ ඒ හැම ධර්මය දෙසා වා.'' ''එසේ නම් බමුණ, අසව; මනා ව සිහියෙහි තබා ගනුව; කියන්නෙමි.'' ''එසේ ය පින්වත''යි අග්ගික භාරද්වාජ බමුණු තෙමේ භාග්‍ය-වතුන්වහන්සේට පිළිවදන් දුන්නේ ය. භාග්‍යවතුන්වහන්සේ මෙසේ වදාළසේක.

යම් මිනිසෙක් තෙමේ කිපෙන සුළු වේද? වෛර ඇත්තේ වේ ද, පාපියෙක් ගුණමකුවෙක් වේ ද, විපරීත දෘෂ්ටිය ඇත්තේ වේ ද, මායාවෙන් යුතු වේ ද, හෙතෙමේ වසලයෙකැයි දන්නේ ය.

යමෙක් තෙමේ මෙලෙව්හි එක් උපතක් ඇති හෝ දෙඋපතක් ඇති හෝ ප්‍රාණීන් හට හිංසා කෙරේ ද, යමකුට ප්‍රාණීන් කෙරෙහි දයාව නැත්තේ ද, හේ වසලයෙකැයි දත්නේ ය.

[එකජං – එක් උපතක් ඇති. මිනිසුන්, ගොනුන්, බල්ලන් මෙන් වැදෑමසින් මවු කුසින් එකැවර ම උපදින සත්තු මෙයින් ගැනෙති.

දීජං – දෙ උපතක් ඇති. මසුන්, විහඟුන් උරගුන් වැනි එක් වරක් මවු කුසින් ද, දෙවැනි වර බිජුවටින් ද උපදින සත්තු මෙයින් ගැනෙති.]

යමෙක් තෙමෙ මිනී මරන්නේ ද, ගම් නියම්ගම් පහරින්නේ ද, නිග්‍රහ කරන්නෙකැ යි දන්නේ වේ ද, හේ වසලයෙකැයි දන්නේය.

ගමෙහි හෝ අරනෙහි (කැලයෙහි) හෝ අනුනට අයත් (තමාට) නුදුන් දෙයක් සොරකමින් ගන්නේ ද, හේ වසලයෙකැයි දන්නේ ය.

යමෙක් වනාහි ණය රැගෙන චෝදනා ලබනුයේ, ''තට වනාහි ණයෙක් නැතැ''යි පලා යන්නේ ද හේ වසලයෙකැයි දන්නේ ය.

යමෙක් වනාහි ඉතා සුළු දෙයකට මඟ යන ජනයා මරා සුළු දෙයක් ඇරගනී ද හේ වසලයෙකැයි දන්නේ ය.

යමෙක් තෙමේ තමා නිසා හෝ අනුන් නිසා හෝ ධනය නිසා හෝ සාක්ෂ්‍ය අසන ලද්දේ බොරු කියා ද හේ වසල-යෙකැයි දන්නේ ය.

යමෙක් තෙමේ නෑයන් ගේ හෝ මිතුරන්ගේ හෝ භාර්යාවන් කෙරෙහි වහා ප්‍රිය භාවයෙන් පෙනෙනුයේ ද (හෙවත් නෑ මිතුරන්ගේ බිරියන් කෙරෙහි ඇලුම් කෙරේ ද) හේ වසලයෙකැයි දන්නේ ය.

යමෙක් තෙමේ බොහෝ ධනය ඇත්තේ මහලු වූ–යොවුන් බව ගියා වූ–මව හෝ පියා හෝ පෝෂණය නො කෙරේ ද, හේ වසලයෙකැයි දන්නේ ය.

යමෙක් තෙමේ මව හෝ පියා හෝ සොහොවුරා හෝ සොහොවුරිය හෝ නැඳිය හෝ තළා මරන්නේ ද, ආක්‍රෝෂ කරන්නේ ද, හේ වසලයෙකැයි දන්නේ ය.

යමෙක් තෙමේ අර්ථයක් අසන ලද්දේ අනර්ථයක් අනුශාසනා කෙරේ ද, පිළිසන් වදනින් (අර්ථය සැඟවුණු වදනින්) මන්ත්‍රණය කෙරේ ද හේ වසලයෙකැයි දන්නේ ය.

යමෙක් තෙමේ පව්කමක් කොට, ''මා නො දනී වා''යි කැමති වේ ද, යමෙක් තෙමේ සැඟවුණු කර්මාන්ත ඇත්තේ ද (හෙවත් තමා කරන පව්කම එළි නොවන සේ ක්‍රියා කෙරේ ද) හේ වසලයෙකැයි දන්නේ ය.

යමෙක් වනාහි අනුන්ගේ ගෙට ගොස් පිරිසිදු බොජුන් අනුභව කොට (තමා ගෙට) ආ තැනැත්තාට ආපසු සත්කාර නොකෙරේ ද හේ වසලයෙකැයි දන්නේ ය.

යමෙක් තෙමේ මහණ බමුණකු හෝ අන් කිසි පුලන්නකු හෝ බොරුවෙන් වංචා කෙරේ ද හේ වසලයෙකැයි දන්නේ ය.

යමෙක් තෙමේ අහර බුදින කල පැමිණි කල්හි මහණ බමුණනට ආක්‍රෝෂ කෙරේ ද නො දෙයි ද, හේ වසලයෙකැයි දන්නේ ය.

යමෙක් තෙමේ මෝඩකමින් වැසුණේ ඉතා සුළු වූ දෙයක් බලවත් සේ කැමැති වූයේ බොරු කියා ද, හේ වසලයෙකැයි දන්නේ ය.

යමෙක් තෙමේ සවකීය මානයෙන් ළාමක වූයේ තමා උසස් කොට වනා ද, අනුන් අවමන් කෙරේ ද, හේ වසලයෙකැයි දන්නේය.

(යමෙක් තෙමේ) කෝප කරවන්නේ වේ ද, මහත් වූ මසුරුබැවින් යුතු වේ ද, පවෙහි කැමති වේ ද, මාත්සර්යයෙන් යුක්ත වේ ද, කපටි වේ ද, හිරි නැත්තේ වේ ද, ඔතප් නැත්තේ වේ ද, හේ වසලයෙකැයි දන්නේ ය.

යමෙක් තෙමේ බුදුනට නින්ද කෙරේ ද, එසේ නැත හොත් සවුවකුට හෝ පිරිවැජියකුට හෝ ගැහැවියකුට හෝ නින්ද කෙරේ ද, හේ වසලයෙකැයි දන්නේය.

යමෙක් තෙමේ වනාහි නොරහත් වූයේ (තමා) රහත් යයි හඟවා ද, හෙතෙම බඹුන් සහිත ලෝකයේ සොරෙකි. හෙතෙමේ වනාහි වසලයන්ගෙන් අන්ත වසලයෙකි. මොහු මා විසින් තොපට පවසන ලද්දහු වසලයෝ යයි කියන ලදහ.

උත්පත්තියෙන් වසලයෙක් නො වේ. උත්පත්තියෙන් බ්‍රාහ්මණයෙක් නො වේ. (කරන ලද) කර්මයෙන් වසලයෙක් වෙයි; බ්‍රාහ්මණයෙක් වෙයි.

යම් සේ මා ගේ මේ නිදසුන වේ ද, ඒ මේ නිදසුනින් දැනගන්නේ ය. සැඬොල් පුත් වූ සෝපාක තෙමේ මාතංග යයි ප්‍රසිද්ධ වී ය.

ඒ මාතංග තෙමේ නම් ඉතා දුර්ලභවූ ඉතා විශිෂ්ට වූ යසසෙක් ඇත්තේ ද එයට පැමිණියේ. ඔහුගේ උපසථානයට බොහෝ වූ ක්ෂත්‍රියයෝ ද බ්‍රාහ්මණයෝ ද පැමිණියාහු ය.

හෙතෙමේ දෙව් ලෝ මහට නැඟ (කෙලෙස්) දූලි නැති වූ මහ මහට (බැස) කාම රාගය දුරු කොට බඹ ලෝ ගියේ යයි කියති. ජාතිය (කුලය) තෙමේ ඔහු බඹ ලොව ඉපදීම නො වැළැක්වී ය.

ගුරු කුලයෙහි උපන්නා වූ මන්ත්‍ර බන්ධු (හෙවත් වේදය දත්තා වූ) ඒ බ්‍රාහ්මණයෝ පව්කම්හි නිතර ප්‍රකට ව පෙනෙති.

(ඔහු) මේ අත්බැව්හි ම ගර්හාවට පැමිණෙන්නාහු ය. පරලෙව්හි (ඔවුනට) දුගතිය වෙයි. ජාතිය ඔහු දුගතියෙන් හෝ ගර්හාවෙන් හෝ නො වළක්වයි.

උත්පත්තියෙන් වසලයෙක් නොවේ. උත්පත්තියෙන් බ්‍රාහ්මණයෙක් නො වේ. (කරන ලද) කර්මයෙන් වසලයෙක් වෙයි; බ්‍රාහ්මණයෙක් වෙයි.

මෙසේ කියන ලද කල්හි අග්ගික භාරද්වාජ බමුණු තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය: ''ආශ්චර්යය, භවත් ගෞතමයාණෙනි, යම් සේ වක් කරන ලද්දක් දික් කරන්නේ ද, වසන ලද්දක් හරින්නේ ද, මුළා වූවකුට මහ දක්වන්නේ ද, අඳුරෙහි තෙල් පහනක් දරන්නේ ද, ඇස් ඇත්තෝ රූපයන් දකින්නාහුය. එසේ ම භවත් ගෞතමයන් විසින් නොයෙක් ආකාරයෙන් ධර්මය ප්‍රකාශ කරන ලදි. ඒ මම භවත් ගෞතමයන් සරණයෙමි; ධර්මය ද භික්ෂු

සංඝයා ද සරණ යෙමි. භවත් ගෞතමයෝ මා උපාසකයකු කොට දරත්වා. (සලකත්වා.) අද පටන් දිවි කෙළවර දක්වා (මා විසින් තෙරුවන්) සරණ යන ලදි.

## පරාභව සූත්‍රය

එවං මෙ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො අඤ්ඤතරා දෙවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා යෙන භගවා තෙනුපසංකමි. උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතා ඛො සා දෙවතා භගවන්තං ගාථාය අජ්ඣභාසි:

1. පරාභවන්තං පුරිසං—
මයං පුච්ඡාම ගොතම,
භගවන්තං පුට්ඨුමාගම්ම—
කිං පරාභවතො මුඛං?

2. සුවිජානො භවං හොති—
සුවිජානො පරාභවො,
ධම්මකාමො භවං හොති—
ධම්මදෙස්සී පරාභවො

3. ඉතිහෙතං විජානාම—
පඨමො සො පරාභවො
දුතියං භගවා බ්‍රෑහි—
කිං පරාභවතො මුඛං ?

4. අසන්තස්ස පියා හොන්ති—
සන්තෙ න කුරුතෙ පියං
අසතං ධම්මං රොචෙති—
තං පරාභවතො මුඛං

5. ඉතිහෙතං විජානාම—
දුතියො සො පරාභවො
තතියං භගවා බ්‍රෑහි—
කිං පරාභවතො මුඛං ?

6. නින්දසීලී සභාසීලී—
අනුට්ඨාතා ච යො නරො
අලසො කොධපඤ්ඤානො—
තං පරාභවතො මුඛං.

7. ඉතිහෙතං විජානාම—
තතියො සො පරාභවො
චතුත්ථං භගවා බෲහි—
කිං පරාභවතො මුඛං?

8. යො මාතරං වා පිතරං වා—
ජිණ්ණකං ගතයොබ්බනං
පහු සන්තො න භරති—
තං පරාභවතො මුඛං.

9. ඉතිහෙතං විජානාම—
චතුත්ථො සො පරාභවො
පඤ්චමං භගවා බෲහි—
කිං පරාභවතො මුඛං?

10. යො බ්‍රාහ්මණංවා සමණං වා—
අඤ්ඤංවා'පි වණිබ්බකං
මුසාවාදෙන වඤ්චෙති—
තං පරාභවතො මුඛං.

11. ඉතිහෙතං විජානාම—
පඤ්චමො සො පරාභවො
ඡට්ඨමං භගවා බ්‍රෑහි—
කිං පරාභවතො මුඛං?

12. පහූතවිත්තො පුරිසො—
සහිරඤ්ඤො සභොජනො
එකොවභුඤ්ජතිසාදූනි—
තං පරාභවතො මුඛං.

13. ඉති හෙතං විජානාම—
ඡට්ඨමො සො පරාභවො
සත්තමං භගවා බ්‍රෑහි—
කිං පරාභවතො මුඛං?

14. ජාතිත්ථද්ධො ධනත්ථධො—
ගොත්තත්ථද්ධො ච යො නරො
සඤ්ඤාතිං අතිමඤ්ඤෙති—
තං පරාභවතො මුඛං.

15. ඉතිහෙතං විජානාම—
සත්තමො සො පරාභවො
අට්ඨමං භගවා බ්‍රෑහි—
කිං පරාභවතො මුඛං ?

16. ඉත්ථිධුත්තො සුරාධුත්තො—
අක්ඛධුත්තො ච යො නරො
ලද්ධං ලද්ධං විනාසෙති—
තං පරාභවතො මුඛං

17. ඉතිහෙතං විජානාම—
අට්ඨමො සො පරාභවො,
නවමං භගවා බ්‍රෑහි—
කිං පරාභවතො මුඛං ?

18. යෙහි දාරෙහි' සන්තුට්ඨො—
වෙසියාසුපදිස්සති
දිස්සති පරදාරෙසු—
තං පරාභවතො මුඛං.

19. ඉතිහෙතං විජානාම—
නවමො සො පරාභවො,
දසමං භගවා බ්‍රෑහි—
කිං පරාභවතො මුඛං ?

20. අතීත යොබ්බනො පොසො—
ආනෙති තිම්බරුත්ථනිං
තස්සා ඉස්සා න සුපති—
තං පරාභවතො මුඛං.

21. ඉතිහෙතං විජානාම—
දසමො සො පරාභවො,
එකාදසමං භගවා බ්‍රෑහි—
කිං පරාභවතො මුඛං ?

22. ඉත්ථිසොණ්ඩිං විකිරණිං—
පුරිසං වා'පි තාදිසං,
ඉස්සරියස්මිං ඨපාපෙති—
තං පරාභවතො මුඛං.

23. ඉතිහෙතං විජානාම—
එකාදසමො පරාභවො
ද්වාදසමං භගවා බ්‍රෑහි—
කිං පරාභවතො මුඛං ?

24. අප්පභොගො මහාතණ්හො—
ඛත්තියෙ ජායතෙ කුලෙ
සො ච රජ්ජං පත්ථයති—
තං පරාභවතො මුඛං.

25. එතෙ පරාභවෙ ලොකෙ—
පණ්ඩිතො සමවෙක්ඛිය
අරියො දස්සනසම්පන්නො—
ස ලොකං භජතෙ සිවංති.

## පරාභව සූත්‍ර භාවය

මා විසින් (මේ පරාභව සූත්‍රය) මෙසේ අසන ලදි: එක් කලෙක බුදුහු සැවැත්නුවර අනේපිඬු සිටුහුගේ ජේතවන නම් වූ අරම්හි විසූ හ. එකල්හි දේවතාවෙක් මැදියම් රැයෙහි තම සිරුරු එළියෙන් සියලු ජේතවනය බබුළුවා, භාග්‍යවතුන් වෙත පැමිණ, වැඳ එකත්පස් ව සිටියේ ය.

එකත්පස් ව සිටි හෙතෙම බුදුනට මේ ගීය ගැයී:

1. භාග්‍යවතුන්වහන්ස, අපි ඔබ ගෙන් පිරිහීමේ කරුණු විමසීමට පැමිණියමු. පිරිහෙන තැනැත්තා කවරෙක්ද? පිරිහීමේ දොරටු කවරේ ද?

[බුදුහු පිළිතුරු දුන්හ:]

2 .දියුණුවන්නා හැඳින ගැනීම පහසු ය;
පිරිහෙන්නාත් හැඳින ගැනීම පහසු ය;
දියුණු වන්නේ දහම කැමති වෙයි;
පිරිහෙන්නේ දහම නොකැමති වෙයි.

3. පිරිහීමේ පළමු කරුණු දතුමු බුදුන්වහන්ස, පිරිහීමේ දෙවැනි කාරණය වදරන්න.

4. යමකුට ශාන්ත අය ප්‍රිය නො වෙද්ද, අශාන්ත අය ප්‍රිය වෙද්ද, ධර්මය රුචි නොවේ ද, එය පිරිහීමට මුලෙකි.

5. පිරිහීමේ දෙවැන්න දතුමු. තෙවැන්න වදරන්න, [3, 5 වැනි ගාථාවනට අරුත් කියූ නියරින් 7, 9, 11, 13, 15, 17, 19, 21, 23 ගාථාවන්ගේ ද අරුත් වටහා ගන්න.]

6. යමෙක් නිතර නිදයි ද, කතා කරමින් බොහෝ වේලා [සමූහයන්හි] කල් ගෙවයි ද, නොනැඟිටී ද, අලස ද, කිපෙනසුලු ද, එය පිරිහීමේ මුලෙකි.

8. යමෙක් පොහොසත් ව හිඳිමින් මාපියන් පෝෂණය නො කෙරේ ද, එය පිරිහීමට මුලෙකි.

10. යමෙක් ශ්‍රමණයකු හෝ බ්‍රාහ්මණයකු හෝ වෙන යම් යාචකයකු හෝ බොරුවෙන් රවටයි ද, එය පිරිහීමට මුලෙකි.

12. යමෙක් වස්තුව හා ආහාර පාන ආදිය හා බහුල ව තිබිය දීත් ඒ සියල්ල තනි ව බුත්ති විඳී ද, එය පිරිහීමට මුලෙකි.

14. යමෙක් දූය, ගොත, දනය පිළිබඳ මානයෙන් සියන් නො සලකයි ද, එය පිරිහීමට මුලෙකි.

16. යමෙක් ගෑනු බාල ව, රා සොඬව, සූදුකාර ව ලැබෙන දේ වනසයි ද, එය පිරිහීමට මුලෙකි.

18. යමෙක් සිය අඹුවන්ගෙන් අසතුටු වෙමින් පර අඹුවන් හා වේශ්‍යාවන් හා කරා යයි ද, එය පිරිහීමට මුලෙකි.

20. යමෙක් වයස ගිය පසු තරුණියක සමඟ විවාවී [ඇය වෙන කෙනෙකු කෙරෙහි ආලය කරති යන සැකයෙන් හෝ ඉරිසියා-වෙන් හෝ] නොනිඳා ඇය රකී ද, එය පිරිහීමට මුලෙකි.

22. යමෙක් කෑදර වූත්, ඒ නිසා වස්තුව නැති කරන්නා වූත් ගැහැනියක හෝ පිරිමියකු හෝ ගේ දෙරෙක ප්‍රධානත්වයට පත්කරයි ද, එය පිරිහීමට මුලෙකි.

24. යමෙක් මහා තණ්හාව ඇති නමුත් දුප්පත් ව රජ කුලයෙක ඉපිද රජය පතයි ද, එය පිරිහීමට මුලෙකි.

25. ඒ පඬුවා පිරිහීමේ මේ කරුණු නුවණැසින් බලා දැක, චතුරාර්ය දර්ශන-යෙන් යුතු වූයේ මෙලොවත් නොපිරිහි දෙව් ලොවත් නිවනත් හජනය කෙරෙයි.

## ව්‍යග්ඝපජ්ජ සූත්‍රය

එවං මෙ සුතං—එකං සමයං භගවා කොලියෙසු විහරති කක්කරපත්තං නාම කොලියානං නිගමෙ. තත්‍ර ඛො දීඝජාණු කොලියපුත්තො යෙන භගවා තෙනුපසංකමි; උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො දීඝජාණු කොලිය පුත්තො භගවංතං එතදවොච:

මයං භන්තෙ ගිහි කාමභොගි පුත්තදරසම්බාධසයනං අජ්ඣාවසාම; කාසිකචන්දනං පච්චනුභොම; මාලාගන්ධ විලෙපනං ධාරයාම; ජාතරූපරජතං සාදියාම. තෙසං නො භන්තෙ භගවා අම්හාකං තථා ධම්මං දෙසෙතුයෙ අම්හකං අස්සු දිට්ඨධම්මහිතාය දිට්ඨධම්මසුඛාය සම්පරායසුඛායා'ති.

චත්තාරො මෙ ව්‍යග්ඝපජ්ජ ධම්මා කුලපුත්තස්ස දිට්ඨධම්මහිතාය සංවත්තන්ති දිට්ඨධම්මසුඛාය. කතමෙ

චත්තාරො? (i) උට්ඨානසම්පද, (ii) ආරක්ඛසම්පද, (iii) කල්‍යාණමිත්තතා (iv) සමජීවිකතා.

කතමා ච ව්‍යග්ඝපජ්ජ උට්ඨානසම්පද? ඉධ ව්‍යග්ඝපජ්ජ කුලපුත්තො යෙන කම්මට්ඨානෙන ජීවිකං කප්පෙති, යදි කසියා යදි වණිජ්ජාය යදි ගොරක්ඛෙන යදි ඉස්සත්ථෙන යදි රාජපොරිසෙන යදි සිප්පඤ්ඤතරෙන. තත්ථ දක්ඛො හොති; අනලසො තත්‍රුපායායවිමංසාය සමන්නාගතො අලංකාතුං අලංසංවිධාතුං, අයං වුච්චති ව්‍යග්ඝපජ්ජ උට්ඨානසම්පද.

කතමා ච ව්‍යග්ඝපජ්ජ ආරක්ඛසම්පද?

ඉධ ව්‍යග්ඝපජ්ජ කුලපුත්තස්ස භොගා හොන්ති උට්ඨානවිරියාධිගතා බාහාබලපරිචිතා සෙදවක්ඛිත්තා ධම්මිකා ධම්මලද්ධා, තෙ ආරක්ඛෙන ගුත්තියා සම්පාදෙති: ''කින්ති මෙ භොගෙ නෙ'ව

රාජානො හරෙය්‍යුං න චොරා හරෙය්‍යුං න අග්ගි ඩහෙය්‍ය න උදකං වා වහෙය්‍ය නු අප්පියා දයාදහරෙය්‍යුං'' ති. අයං වුච්චති ව්‍යග්ඝපජ්ජ ආරක්ඛසම්පද.

කතමා ච ව්‍යග්ඝපජ්ජකල්‍යාණමිත්තතා? ඉධ ව්‍යග්ඝපජ්ජකුලපුත්තො යස්මිං ගාමෙ වා නිගමෙ වා පටිවසති. තත්ථ යෙතෙ හොන්ති ගහපති වා ගහපතිපුත්තො වා දහරා වා වුද්ධසීලිනො වුද්ධා වා වුද්ධසීලා සද්ධාසම්පන්නා සීලසම්පන්නා චාගසම් පන්නා පඤ්ඤාසම්පන්නා. තෙහි සද්ධිං සන්තිට්ඨති සල්ලපති සාකච්ඡංසමාපජ්ජති යථාරූපානං සද්ධාසම්පන්නානං සද්ධා-සම්පදං අනුසික්ඛති. යථාරූපානං චාග-සම්පන්නානං චාගසම්පදං අනුසික්ඛති, යථාරූපානං පඤ්ඤා ස ම් ප න් නා නං පඤ්ඤාසම්පදං අනුසික්ඛති—අයං වුච්චති ව්‍යග්ඝපජ්ජ කල්‍යාණමිත්තතා.

කතමා ච ව්‍යග්ඝපජ්ජ සමජීවිකතා?

ඉධව්‍යග්ඝපජ්ජ කුලපුත්තො අයංච හොගා නං විදිත්වා,වයංච හොගානං විදිත්වා,සමං

ජීවිතං කප්පෙති න අච්චොගාළ්හං න අතිහීනං; ''එවං මෙ වයො අයං පරියාදය යස්සති න ච මෙ අයො වයං පරියාදය යස්සති''ති.

සෙයාාථා'පි ව්‍යග්ඝපජ්ජ තුලාධාරො වා තුලාධාරන්තෙවාසී වා තුලං පග්ගහෙත්වා ජානාති, ''එත්තකෙන වා ඔනතං එත්තකෙන වා උන්නතං''ති. එවමෙව ඛො ව්‍යග්ඝපජ්ජ කුලපුත්තො අයං ච භොගානං විදිත්වා. වයං ච භොගානං විදිත්වා, සමං ජීවිකං කප්පෙති න අච්චොගාළ්හං න අතිහීනං ''එවම්මෙ අයො වයං පරියාදය යස්සති, න ච මෙ වයො අයං පරියාදය යස්සති''ති. සචා'යං ව්‍යග්ඝපජ්ජ කුලපුත්තො අප්පායො සමානො උළාරං ජීවිකං කප්පෙති තස්ස භවන්ති වත්තාරො: ''උදුම්බරඛාදිකං වා'තං කුලපුත්තො භොගෙ ඛාදති''ති. සචෙපනා'යං ව්‍යග්ඝපජ්ජ, කුලපුත්තො මහායො සමානො කසිරං ජීවිකං කප්පෙති, තස්ස භවන්ති වත්තාරො; ''අජද්ධුමාරිකං වා'යං

කුලපුත්තො මරිස්සතී''ති. යතො ච ඛ්වායං ව්‍යග්ඝපජ්ජ කුලපුත්තො අයං ච භොගානං විදිත්වා, වයං ච භොගානං විදිත්වා. සමංජිවිකං කප්පෙති න අච්චොගාළ්හං නාතිහීනං: ''එවම්මෙ අයො වයං පරියාදය යස්සති න ච මෙ අයො වයං පරියාදය යස්සතී''ති. ගයං වුච්චති ව්‍යග්ඝපජ්ජ සමජීවිකතා.

එවං සමුප්පන්නානං ව්‍යග්ඝපජ්ජ භොගානං චත්තාරි අපාසමුඛානි හොන්ති: (i) ඉත්ථිධුත්තො හොති, (ii) සුරාධුත්තො, (iii) අක්ඛධුත්තො, (iv) පාපමිත්තො, පාප සහායො, පාපසම්පවංකො.

සෙය්‍යථා'පි ව්‍යග්ඝපජ්ජ මහතො තළාකස්ස චත්තාරි චෙ' ච අයමුඛානි චත්තාරි ච අපායමුඛානි. තස්ස පුරිසො යානි චෙව අයමුඛානි තානි විවරෙය්‍ය. දෙවො ච න සම්මාධරං අනුප්පවෙච්ඡෙය්‍ය. එවං හි තස්ස ව්‍යග්ඝපජ්ජ මහතො තළාකස්ස හානි

යෙ'ව පාටිකංඛා නො වුද්ධි, එවමෙව ඛො ව්‍යග්ඝපජ්ජ එවං සමුප්පන්නානං භොගානං චත්තාරි අපායමුඛානි හොන්ති: (i) ඉත්ථිධුත්තො හොති (ii) සුරාධුත්තො, (iii) අක්ඛධුත්තො (iv) පාපමිත්තො, පාපසහායො, පාපසම්පවඞ්කො.

එවං සමුප්පන්නානං ව්‍යග්ඝපජ්ජ භොගානං චත්තාරි අයමුඛානි හොන්ති. (i) න ඉත්ථිධුත්තො, (ii) න සුරාධුත්තො. (iii) න අක්ඛධුත්තො, (iv) කල්‍යාණ-මිත්තො, කල්‍යාණසහායො, කල්‍යාණ-සම්පවංකො; සෙය්‍යථාපි ව්‍යග්ඝපජ්ජ මහතො තළාකස්ස චත්තාරි චෙ'ව අය-මුඛානි චත්තාරි චෙ'ව අපායමුඛානි; තස්ස පුරිසො යානි චෙ'ව අයමුඛානි තානි විවරෙය්‍ය, යානි ච අපායමුඛානි තානි පිදහෙය්‍ය, දෙවො ච සම්මාධාරං අනුප්පවෙච්ඡෙය්‍ය, එවං හි තස්ස ව්‍යග්ඝපජ්ජ මහතො තළාකස්ස වුද්ධියෙ'ව පාටිකඞ්ඛා නො පරිහානි.

එවමෙව ඛො ව්‍යග්ඝපජ්ජ එවං සමුප්පන්නානං ...පෙ... කල්‍යාණසම්පවඩ්ඪකො. ඉමෙ ඛො ව්‍යග්ඝපජ්ජ, චත්තාරො ධම්මා කුලපුත්තස්ස දිට්ඨ ධම්මහිතාය සංවත්තන්ති දිට්ඨධම්මසුඛායා'ති.

චත්තාරො'මෙ ව්‍යග්ඝපජ්ජ, ධම්මා කුලපුත්තස්ස සම්පරායහිතාය සංවත්තන්ති සම්පරායසුඛාය. කතමෙ චත්තාරො? (i) සද්ධාසම්පද (ii) සීල සම්පද, (iii) චාගසම්පද, (iv) පඤ්ඤාසම්පද.

කතමා ච ව්‍යග්ඝපජ්ජ සද්ධාසම්පද? ඉධ ව්‍යග්ඝපජ්ජ කුලපුත්තො සද්ධො හොති, සද්දහති තථාගතස්ස බොධිං 'ඉතිපි සො භගවා අරහං සම්මා සම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථී සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා'ති. අයං වුච්චති ව්‍යග්ඝපජ්ජ සද්ධා සම්පද?

කතමා ච ව්‍යග්ඝපජ්ජ සීලසම්පදා? ඉධ ව්‍යග්ඝපජ්ජ කුලපුත්තො පාණාතිපාතා පටිවිරතො හොති, අදින්නාදානා පටිවිරතො හොති, කාමෙසුමිච්ඡාචාරා පටිවිරතො හොති, මුසාවාදා පටිවිරතො හොති, සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතො හොති. අයං වුච්චති ව්‍යග්ඝපජ්ජ සීලසම්පදා.

කතමා ච ව්‍යග්ඝපජ්ජ චාගසම්පදා? ඉධ ව්‍යග්ඝපජ්ජ කුලපුත්තො විගතමලමච්ඡෙරෙන චෙතසාඅගාරං අජ්ඣාවසති, මුත්තචාගොපයතපාණී වොස්සග්ගරතෙධ. අයං වුච්චති ව්‍යග්ඝපජ්ජ චාගසම්පදා.

කතමා ච ව්‍යග්ඝපජ්ජ පඤ්ඤාසම්පදා? ඉධ ව්‍යග්ඝපජ්ජ කුලපුත්තො පඤ්ඤාය හොති, උදයත්ථගාමිනියා පඤ්ඤාව සමන්නාගතො අරියාය නිබ්බෙධිකාය සම්මාදුක්ඛක්ඛයගාමිනියා. අයං වුච්චති ව්‍යග්ඝපජ්ජ පඤ්ඤාසම්පදා. ඉමෙ ඛො ව්‍යග්ඝපජ්ජ චත්තාරො ධම්මා කුලපුත්තස්ස සම්පරායහිතාය සංවත්තන්ති සම්පරායසුඛායාති.

උට්ඨාතා කම්මධෙය්‍යෙසු
අප්පමත්ත්විධානා වා
සම්මා කප්පෙති ජීවිකං
සම්භතං අනුරක්ඛති.
සද්ධො සීලෙන සම්පන්නො
වදඤ්ඤූ වීතමච්ඡරො
නිච්චං මග්ගං විසොධෙති
සොත්ථානං සම්පරායිකං
ඉච්චෙතෙ අට්ඨ ධම්මා
සද්ධස්ස ඝරමෙසිනො
අක්ඛාතා සච්චනාමෙන
උභයත්ථ සුඛාවහා
දිට්ඨධම්මහිත්තත්ථාය
සම්පරායසුඛාය ච;
එවමෙතං ගහට්ඨානං
චාගො පුඤ්ඤං පවඩ්ඪති.

**ව්‍යග්ඝපජ්ජ සූත්‍ර භාවය**

මා විසින් මෙසේ අසන ලදී:
එක් සමයයෙක භාග්‍යවතුන් වහන්සේ කෝලිය ජනපදයෙහි කෝලියයන්ගේ කක්කරපත්ත නම් නියම් ගමෙක වැඩ-

වසන සේක. එකල වනාහි දීඝජාණු නම් කෝලිය පුත් තෙමේ යම් තැනෙක භාග්‍යවතුන්වහන්සේ වූ සේක් ද, එතැනට එළඹ උන්වහන්සේ මනා කොට වැඳ එකත්පසෙක හුන්නේය. එකත් පසෙක හුන් දීඝජාණු කෝලිය පුත් තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැළ කෙළේය.

ස්වාමීනි, අපි ගිහි ව කම් සැප විඳිමින් අඹු දරුවන්ගේ පීඩා සහිත වූ සයනයෙහි වසන්නෙමු; කසී රටෙහි සඳුන් සුවඳ විඳින්නෙමු; මල් ගඳ විලවුන් දරන්නෙමු. රන්, රිදී ඉවසන්නෙමු. ස්වාමීනි, ඒ අපහට භාග්‍යවතුන්වහන්සේ, මෙලොව හිත පිණිස මෙලොව සුව පිණිස, පරලොව සුව පිණිස යම් දහමෙක් වේ ද, එසේ වූ දහමක් දෙසන සේක්වා.

''ව්‍යාඝ්‍රපද්‍යය, මේ සතර දහම්හු කුල පුතුන්ගේ මෙලොව හිත පිණිස, මෙලොව සුව පිණිස, පවත්නාහ. කවර සතරෙක් ද? යත්:

උට්ඨාන සම්පත්තිය නම් නැඟී සිටින වීර්‍ය්‍යය.

ආරක්ෂා සම්පත්තිය නම් උපයගාත් වස්තුව රැකගැනීම.

කල්‍යාණ මිත්‍ර සම්පත්තිය නම් යහපත් මිතුරන් සෙවුම.

සම ජීවිකතාව නම් තම වස්තුවෙහි පමණ දැන සම ව දිවි පැවැත්ම.

ව්‍යාඝ්‍රපද්‍යය, උට්ඨාන සම්පත්තිය කවරේ ද? ව්‍යාඝ්‍රපද්‍යය, මේ (ලෙව්හි) කුල පුත් තෙමේ යම් රැකියාවෙකින් දිවි ගෙවයි නම් — ඉදින් සී සෑමෙන් හෝ ඉදින් වෙළෙඳාමෙන් හෝ ඉදින්, සරක් රැකුමෙන් හෝ ඉදින් දුනුවාකමින් හෝ ඉදින් රජුහුගේ කම් කිරීමෙන් හෝ ඉදින් වෙන යම් ශිල්පයෙකින් හෝ දිවි පවත්වා ද – ඒ ඒ රැකියාවෙහි දක්ෂ වේ ද, නොමැළි වේ ද, ඒ ඒ කටයුත්ත කරන්නට සමත් සේ කරවන්නට සමත් සේ උපාය-

යෙන් යුතු වූයේ වේ ද, විමසුම් නුවණින් යුතු වූයේ වේ ද, – ව්‍යාඝ්‍රපද්‍යය, මේ උට්ඨාන සම්පත්තිය යැ යි කියනු ලැබේ.

ව්‍යාඝ්‍රපද්‍යය ආරක්ෂා සම්පත්තිය කවරේ ද? ව්‍යාඝ්‍රපද්‍යය, මෙ (ලොවෙහි) කුල පුතුහට උට්ඨාන වීර්‍ය්‍යයෙන් ලැබුවා වූ, බාහු බලයෙන් රැස් කැරුණු, ඩහදිය වැගිරීමෙන් සැපයුණු, දැහැමි වූ දැහැමින් ලත් වස්තූහු වෙත් ද, ''ඒ මාගේ වස්තූන් කෙසේ නම් හෝ රජ දරුවෝ පැහැර නොගන්නාහු නම්, සොරහු පැහැර නොගන්නාහු නම්, ගින්න නොදවන්නේ නම්, දිය පහර ඇදගෙන නොයේ නම්, නොපිය වූ නෑයෝ පැහැර නොගන්නාහු නම් යහපතැ''යි සිතා රැකීමෙන් සඟවා තිබීමෙන් සපයන්නේය.

ව්‍යාඝ්‍රපද්‍යා, මෙ ආරක්ෂා සම්පත්තිය යැයි කියනු ලැබේ.

ව්‍යාඝ්‍රපද්‍යය, කල්‍යාණ මිත්‍රතාව කවරේ ද? ව්‍යාඝ්‍රපද්‍යය, මේ (ලෙව්හි) කුල පුතෙක් යම් ගමෙක්හි හෝ නියම් ගමෙක්හි හෝ වෙසේ ද, එහි යම් ගැහැවියෙක් හෝ, ගැහැවි පුතෙක් හෝ වැඩුණු සවභාවයෙන් යුත් බාල වූ හෝ, වැඩුණු සවභාවයෙන් යුත් වැඩිහිටි හෝ අය වෙත් ද, ඔහු සැදැහැයෙන් යුතු වූවාහු ද, සිල්වත් බැවින් යුතු වූවාහු ද, දීමෙන් යුතු වූවාහු ද, නුවණින් යුතු වූවාහු ද ඔවුන් සමග එකට සිටියි ද, කතා කරයි ද, සාකච්ඡා කෙරේ ද, යම් අයුරින් වූ සැදැහැයෙන් යුතු වූවන්ගේ සැදැහැය අනු ව හික්මේ ද, යම් අයුරින් වූ සිල්වතුන්ගේ සීලය අනු ව හික්මේ ද, යම් අයුරින් වූ දෙන්නවුන්ගේ දීම අනු ව හික්මේ ද, යම් අයුරින් වූ නැණවතුන්ගේ නුවණ අනුව හික්මේ ද–ව්‍යාඝ්‍රපද්‍යය, මේ කල්‍යාණ මිත්‍ර සම්පත්තිය යි කියනු ලැබේ.

ව්‍යාඝ්‍රපද්‍යය, සමජීවිකතාව නම් කවරේ ද? ව්‍යාඝ්‍රපද්‍යය මේ (ලෙව්හි) කුල පුත්-තෙමේ වස්තූන් ගේ අය ද දූන වස්තූන් ගේ

වැය ද දැන ඉතා වැඩිත් නො කොට ඉතා අඩුත් නො කොට මෙසේ, ''මාගේ අය වැය ඉක්මවා සිටින්නේය. මාගේ වැය,අය ඉක්මවා නොසිටින්නේ ය''යි සම ව දිවිය ගෙවයි. ව්‍යාඝ්‍රපද්‍යය, යම් සේ තුලා-ධාරයෙක් හෝ තුලාධාරයා ගේ, අතවැසි-යෙක් හෝ තුලාව (තරාදිය) ගෙන, ''මෙපමණ (බරෙකින්) පහතට වැටුණේය. මෙපමණ (බරෙකින්) උස් වූයේය''යි දනී ද, එමෙන් ම කුල පුත් තෙමේ වස්තූන්ගේ අය ද දැන, වස්තූන් ගේ වැය ද දැන, ඉතා වැඩිත් නො කොට, ඉතා අඩුත් නො කොට ''මෙසේ මා ගේ අය, වැය ඉක්මවා සිටින්නේ ය, මා ගේ අය වැය, අය ඉක්මවා නොසිටින්නේය''යි සම ව දිවිය ගෙවයි. ව්‍යාඝ්‍රපද්‍යය, ඉදින් ටිකක් වූ අය ඇති ව බොහෝ වැය කිරීමෙන් දිවිය ගෙවයි ද ඔහුට ''දිඹුල පල කන්නකු මෙන් මේ කුලපුත්තෙමේ වස්තූන් කා නසන්නේ ය''යි කියන්නාහු වෙති. ව්‍යාඝ්‍රපද්‍යය, ඉදින් මේ කුල පුත් තෙමේ මහත් වූ අය ඇති ව දුක සේ දිවිය ගෙවයි ද ඔහුට, ''මේ කුල

පුත් තෙමෙ වස්තූන් අනුභව නො කොට (නොකල්) මරණින් මියෙන්නේ ය''යි කියන්නාහු වෙති. ව්‍යාඝ්‍රපද්‍යය, යම් හෙයකින් කුල පුත් තෙමේ වස්තූන්ගේ අය ද දැන වස්තූන්ගේ වැය ද දැන ඉතා වැඩිත් නො කොට ඉතා අඩුත් නො කොට ''මෙසේ මා ගේ අය, වැය ඉක්මවා සිටින්නේය. මා ගේ වැය, අය ඉක්මවා නොසිටින්නේය''යි සම ව දිවිය ගෙවයි. ව්‍යාඝ්‍රපද්‍යය, මේ සමජීවිකතාවය යි කියනු ලැබේ.

ව්‍යාඝ්‍රපද්‍යය, මෙසේ උපන්නා වූ වස්තූන්ට නැසෙන දොරටු සතරෙක් වෙයි.

(i) ඉතිරින් කෙරෙහි ලොල් වූයේ වේ ද,
(ii) රහ මෙර පිමෙහි ලොල් වූයේ වේ ද,
(iii) දූ කෙළියෙහි ලොල් වූයේ වේ ද,
(iv) පවිටු මිතුරන් ඇත්තේ වේ ද, පවිටු යහළුවන් ඇත්තේ වේ ද, පවිටු දන හට නැමුණේ වේ ද, (යන මේ වෙයි) ව්‍යාඝ්‍රපද්‍යය, යම් සේ මහ විලකට එන

දෙරටු සතරෙක් ම වේ ද, දිය යන දෙරටු සතරෙක් ම වේ ද, යම් පුරුෂයෙක් තෙමේ ඒ විලෙහි අය මුඛ (දිය එන දෙරටු) ද වසා නම්, අපාය මුඛ (දිය යන දෙරටු) ද අරී නම්, වලාකුළුත් මනා ව දිය දහර නො හෙළා නම් එසේ වූ කල්හි ඒ මහ විලට (දියෙන්) වැඩී වීම නොව පිරිහීම ම බලාපොරොත්තු විය යුතුයි. ව්‍යාඝ්‍රපද්‍යය, එමෙන් ම මෙසේ උපන්නා වූ වස්තූනට වැනසෙන දෙරටු සතරෙක් වෙයි.

ඉතිරින් කෙරෙහි ලොල් වූයේ වේ ද,
රහ මෙර පිමෙහි ලොල් වූයේ වේ ද,

දූ කෙළියෙහි ලොල් වූයේ වේ ද,

පව්ටු මිතුරන් ඇත්තේ වේ ද, පව්ටු යහළුවන් ඇත්තේ වේ ද, පව්ටු දනහට නැමුණේ වේ ද (යන මේ වෙයි.)

ව්‍යාඝ්‍රපද්‍යය, මෙසේ උපන්නා වූ වස්තූනට වැඩී වන දෙරටු සතරෙක් වෙයි.

(i) ඉතිරින් කෙරෙහි ලොල් නොවූයේ වේ ද, (ii) රහ මෙර පිමෙහි ලොල් නොවූයේ වේ ද, (iii) දූ කෙළියෙහි ලොල් නොවූයේ වේ ද, (iv) කලණ මිතුරන් ඇත්තේ වේ ද, කලණ යහළුවන් ඇත්තේ වේ ද, කලණ දනහට නැමුණේ වේ ද, (යන මේ වෙයි.) ව්‍යාඝ්‍රපද්‍යය, යම් සේ මහ විකලට දිය එන දෙරටු සතරෙක් ම වේ ද, දිය යන දෙරටු සතරෙක් ම වේ ද, පුරුෂයෙක් තෙමේ ඒ විලෙහි අය මුව (දිය එන දෙරටු) ද අරී නම්, අපාය මුව (දිය යන දෙරටු) ද වසා නම්, වලාකුළුත් මනාව දිය දහර හෙළා නම්, එසේ වූ කල්හි ඒ මහ විලට (දියෙන්) පිරිහීම, නොව වැඩීම ම බලාපොරොත්තු විය යුතුයි. ඒමෙන් ම ව්‍යාඝ්‍රපද්‍යය මෙසේ උපන්නාවූ

...පෙ... කලණ දනහට නැමුණේ වේ ද, (යන මේ වෙයි.) ව්‍යාඝ්‍රපද්‍යය, මේ සිවු දහම්හු කුල පුතුන්ගේ මෙලොව හිත පිණිස මෙලොව සුව පිණිස පවත්නාහ.

ව්‍යාඝ්‍රපද්‍යය, මේ සිවු දහම්හු කුල පුතුන්ගේ පරලොව හිත පිණිස, පරලොව සුව පිණිස පවත්නාහ. කවර සතරෙක් ද යත්;

(i) සැදැහැයෙන් යුතුබව, (ii) සිල්වත් බැවින් යුතුබව, (iii) දීමෙන් යුතුබව, (iv) නුවණින් යුතුබව, (යන මේ වෙයි.)

ව්‍යාඝ්‍රපද්‍යය, සැදැහැයෙන් යුතුබව (ශ්‍රද්ධා සම්පදව) කවරේ ද? ව්‍යාඝ්‍රපද්‍යය, මේ ලෙව්හි කුල පුත්තෙමේ සැදැහැ හැඟුමෙන් යුතු වේද, තථාගතයන්ගේ බුදුබව අදහා ද—(ඒ කෙසේ ද යත්) 'මෙසේ ඒ භාග්‍ය-වතුන් වහන්සේ රහත් ය, සම්මාසම්බුදු ය, දැනීම් (අටින්) හා හැසිරීම්, (පසළොසින්) ද යුතු ය, මනාව, පිළිපන් ය, ලෝ දත් ය, දමනය කළහැකි පුරුෂයන්ගේ ශ්‍රෙෂ්ඨ-රථාචාර්‍ය්‍යා ය, දෙව් මිනිසුන්ගේ ගුරු ය, බුදු ය, භාග්‍යය ඇතිය' යනුයි; ව්‍යාඝ්‍රපද්‍යය මෙය සැදැහැයෙන් යුතුබව යයි කියනු ලැබේ.

ව්‍යාඝ්‍රපද්‍යය, සිල්වත් බැවින් යුතුබව (ශීල සම්පදව) කවරේ ද? ව්‍යාඝ්‍රපද්‍යය, මේ ලෙව්හි කුල පුත්තෙමේ පණිවායෙන් (පණ නැසීමෙන්) වැළකුණේ වේ ද, නුදුන් දේ ගැනීමෙන් වැළකුණේ වේ ද? කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකුණේ වේ ද, මුසා බස් බිණීමෙන් වැළකුණේ වේ ද, මත් වීමට හා පමාවට ද තැනවූ රහ මෙරින් වැළකුණේ වේ ද ව්‍යාඝ්‍රපද්‍යය මෙය සිල්වත්බව යයි කියනු ලැබේ.

ව්‍යාඝ්‍රපද්‍යය, දීමෙන් යුතුබව (ත්‍යාග සම්පදව) කවරේද? ව්‍යාඝ්‍රපද්‍යය, මේ (ලෙව්හි) කුල පුත්තෙමේ පහ වූ මසුරු මලින් යුතු සිතින් ගිහි ගෙයි වෙසේ ද, දෙන දෙයෙහි නොබැඳී දෙන්නේ වේ ද, දීම පිණිස නිරතුරු සේදූ අත් ඇත්තේ වේ ද, දෙන දෙය අත්හැරීමෙහි ඇලුණේ වේ ද, ව්‍යාඝ්‍රපද්‍යය, මෙම දීමෙන් යුතුබව යයි කියනු ලැබේ.

ව්‍යාඝ්‍රපද්‍යය, නුවණින් යුතුබව (ප්‍රඥා සම්පදව) කවරේ ද? ව්‍යාඝ්‍රපද්‍යය, මේ (ලෙව්හි) කුල පුත් තෙමේ නුවණැත්තෝ වේ ද, (මේ පස් කඳෙහි) උදය වැය මනා ව බලන බවට යන්නා වූ නුවණින් යුතු ආර්‍ය්‍ය වූ විනිවිද යන්නා වූ මොනවට දුක නැති කිරීම වෙත යන්නා වූ නුවණින් යුතු වූයේ වේ ද ව්‍යාඝ්‍රපද්‍යය, මේ නුවණින් යුතු බවය යි කියනු ලැබේ.

කර්මාන්තයන් කෙරෙහි නැඟී සිටින සුලු වූ නොපමා වූ, සංවිධාන සම්පන්න වූ තැනැත්තේ මැනැවින් දිවිය ගෙවයි ද, රැස් කළ ධනය රකියි.

සැදැහැ ඇතියේ, සිල්වත් බැවින් යුතු වූයේ (යදියා ගේ) බස් දන්නේ, පහ වූ මසුරුබව ඇත්තේ, පරලොව යහපතෙහි මඟ නිරතුරු ව පිරිසුදු කෙරෙයි.

මෙසේ දෙලොව සුව එළවන මේ අට වැදෑරුම් දහම්, ගිහි සුව සොයන සැදැහැතියාට, සැබෑ නමක් ඇති (බුදුරදුන්)

විසින් දෙසන ලදි. ගෘහස්ථයනට මෙලෝ හිත පිණිස ද පරලොව සුව පිණිස ද, මෙසේ දීම ද, පින ද වැඩෙයි.

## සිඟාලෝවාද සූත්‍රය

එවං මෙ සුතං එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දක-නිවාපෙ. තෙන ඛො පන සමයෙන සිඟාලකො ගහපතිපුත්තො කාලස්සෙව වුට්ඨාය රාජගහා නික්ඛමිත්වා අල්ල-වත්ථො අල්ලකෙසො පඤ්ජලිකො පුථුදිසං නමස්සති, පුරත්ථිමං දිසං දක්ඛිණං දිසං පච්ඡිමං දිසං උත්තරං දිසං හෙට්ඨිමං දිසං උපරිමං දිසං අථ ඛො භගවා පුබ්බණ්හ-සමයං නිවාසෙත්වා පත්තචීවරමාදය රාජගහං පිණ්ඩාය පාවිසි. අද්දසාඛොභගවා සිඟාලකං ගහපති පුත්තං කාලස්සේව වුට්ඨා රාජගහා නික්ඛමිත්වා අල්ලවත්ථං අල්ල-කෙසං පඤ්ජලිකං පුථුදිසා නමස්සමානං පුරත්ථිමං දිසං දක්ඛිණං දිසං පච්ඡිමං දිසං

උත්තරං දිසං හෙට්ඨිමං දිසං උපරිමං දිසං; දිස්වාන සිඟාලකං ගහපතිපුත්තං එතදවොච: ''කින්නු ඛො ත්වං ගහපති පුත්ත, කාලස්සෙව වුට්ඨාය රාජගහා නික්ඛමිත්වා අල්ලවත්ථො අල්ලකෙසො පඤ්ජලිකො පුථුදිසා නමස්සසි, පුරත්ථිමං දිසං දක්ඛිණං දිසං පච්ඡිමං දිසං උත්තරං දිසං හෙට්ඨිමං දිසං උපරිමං දිසං?''ති.

''පිතා මං භන්තෙ කාලං කරොන්තො එවං අවච; ඡද්දිසා තාත, නමස්සෙය්‍යාසී'ති. සො ඛො අහං භන්තෙ පිතු වචනං සක්කරොන්තො ගරුකරොන්තො මානෙන්තො පූජෙන්තො කාලස්සෙව වුට්ඨාය රාජගහා නික්ඛමිත්වා අල්ලවත්ථො අල්ලකෙසො පඤ්ජලිකො පුථුදිසා නමස්සාමි, පුරත්ථිමං දිසං දක්ඛිණං දිසං පච්ඡිමං දිසං උත්තරං දිසං හෙට්ඨිමං දිසං උපරිමං දිසං'' ති. ''න ඛො ගහපතිපුත්ත අරියස්ස විනයෙ එවං ඡද්දිසා නමස්සිතබ්බාව''ති. ''යථා කථං පන භන්තේ අරියස්ස විනයෙ ඡද්දිසා නමස්සි තබ්බා?

සාධු මෙ භන්තෙ භගවා තථා ධම්මං දෙසෙතු යථා අරියස්ස විනයෙ ඡද්දිසා නමස්සිතබ්බා''ති. ''තෙන හි ගහපතිපුත්ත සුණාහි, සාධුකං මනසිකාරොහි, භාසිස්සාමී''ති. ''එවං භන්තෙ''ති ඛො සිඟාලකො ගහපතිපුත්තො භගවතො පච්චස්සොසි භගවා එතදවොච:

යතො ඛො ගහපතිපුත්ත අරියසාවකස්ස චත්තාරො කම්මකිලෙසා පහීණා හොන්ති, චතූහි ඨානෙහි පාපකම්මං න කරොති. ඡ ච භොගානං අපායමුඛානි න සෙවති, සො එවං චද්දසාපාපකාපගතො ඡද්දිසා—පටිච්ඡාදී-උභොලොකෙ විජයාය පටිපන්නො හොති. තස්ස අයං චෙව ලොකො ආරද්ධො හොති, පරො ච ලොකො කායස්ස භෙදා සරම්මරණා සුගතිං සග්ගං ලොකං උප්පජ්ජති. කතමස්ස චත්තාරො කම්මකිලෙසා පහීනා හොන්ති? පාණාතිපාතො ඛො ගහපතිපුත්ත කම්මකිලෙසො, අදින්නාදනං කම්මකිලෙසො,

කාමෙසු මිච්ඡාචාරො කම්මකිලෙසො, මුසාවාදෙ කම්මකිලෙසො. ඉමස්ස චත්තාරො කම්මකිලෙසා පහීණා හොන්තීති.

ඉදමවොච භගවා, ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා:

(1) පාණාතිපාතො අදින්නාදනං–
මුසාවාදෙ පවුච්චති
පරදරගමනඤ්චෙව–
නප්පසංසන්ති පණ්ඩිතා''ති.

කතමෙහි චතුහි ඨානෙහි පාපං කම්මං න කරොති? ඡන්දගතිං ගච්ඡන්තො පාපං කම්මං කරොති, දෙසාගතිං ගච්ඡන්තො පාපං කම්මං කරොති, භයාගතිං ගච්ඡන්තො පාපං කම්මං කරොති, මොහාගතිං ගච්ඡන්තො පාපං කම්මං කරොති. යතො ඛො ගහපතිපුත්ත අරියසාවකො නෙව ඡන්දගතිං ගච්ඡති. න දෙසාගතිං

ගච්ඡති, න භයාගතිං ගච්ඡති, න මොහාගතිං ගච්ඡති, ඉමෙහි චතුහි ඨානෙහි පාපකම්මං න කරොතීති.

ඉදමවොච භගවා, ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා:

(2) ඡන්ද දොසා භයා මොහා–
යො ධම්මං අතිවත්තති
න හියති තස්ස යසො–
කාලපක්ඛෙ'ව චන්දිමා.

(3) ඡන්ද දොසා භයා මොහා–
යො ධම්මං නාතිවත්තති
ආපූරති තස්ස යසො–
සුක්කපක්ඛෙ'ව චන්දිමා' ති

කතමානි ඡ භොගානං අපායමුඛානි න සෙවති? සුරාමෙරයමජ්ජපමාදට්ඨානානුයොගො ඛො ගහපතිපුත්ත භොගානං අපායමුඛං, විකාලවිසිඛාචරියානුයොගො භොගානං අපායමුඛං, සමජ්ජාභිචරණං

භොගානං අපායමුඛං ජුතප්පමාදට්ඨානානු-යොගො භොගානං අපායමුඛං, පාපමිත්-තානුයොගො භොගානං අපායමුඛං ආලස්සානුයොගො භොගානං අපායමුඛං.

ඡ ඛො ගහපතිපුත්ත ආදීනවා සුරාමෙරය-මජ්ජපමාදට්ඨානානුයොගෙ; සන්දිට්ඨිකා ධනඤ්ජානි; කලහප්පවඩ්ඪනී. රෝගානං ආයතනං, අකිත්තිසඤ්ජනනී, කොපීනං නිදංසනී, පඤ්ඤාය දුබ්බලිකරණී–ඡට්ඨං පදං භවති; ඉමෙ ඛො ගහපතිපුත්ත ඡ ආදීනවා සුරාමෙරයමජ්ජපමා දට්ඨානානු-යොගෙ.

ඡ ඛො'මෙ ගහපතිපුත්ත ආදීනවා විකාලවිසිඛාචරියානුයොගෙ: අත්තාපි'ස්ස අගුත්තො අරක්ඛිතො හොති, පුත්තදාරාපි' ස්ස අගුත්තො අරක්ඛිතො හොති, සාපතෙය්‍යම්පි'ස්ස අගුත්තං අරක්ඛිතං හොති, සඞ්කියො ච හොති පාපකෙසු

ඨානෙසු, අභූතං වචනං ච තස්මිං රූහති, බහුන්නං ච දුක්ඛධම්මානං පුරක්ඛතො හොති; ඉමෙ ඛො ගහපතිපුත්ත ඡ ආදීනවා විකාලවිසිඛාචරියානුයොගෙ.

ඡ ඛො' මෙ ගහපතිපුත්ත ආදීනවා සමජ්ජාභිචරණෙ; ක්ව නච්චං: ක්ව ගීතං, ක්ව වාදිතං, ක්ව අක්ඛානං, ක්ව පාණිස්සරං ක්ව කුම්භථූනන්ති; ඉමෙ ඛො ගහපතිපුත්ත ඡ ආදීනවා සමජ්ජාභිචරණෙ.

ඡ ඛො' මෙ ගහපතිපුත්ත ආදීනවා ජූතපමාදට්ඨානුයොගෙ; ජයං වෙරං පසවති, ජිතො චිත්තමනුසොචති. සන්දිට්ඨිකා ධනඤ්ජානි, සභාගතස්ස වචනං න රූහති. මිත්තාමච්චානං පරිභූතො හොති, ආවාහවිවාහකානං අපත්ථිතො හොති, 'අක්ඛධුත්තො අයං පුරිසපුග්ගලො නාලං දරභරණායා'ති ඉමෙ ඛො ගහපතිපුත්ත ඡ ආදීනවා ජූතප්පමාදට්ඨානානුයොගෙ.

ඡ ඛො’ මෙ ගහපතිපුත්ත ආදීනවා පාපමිත්තානුයොගෙ; යෙ ධුත්තා යෙ සොණ්ඩා යෙ පිපාසා යෙ නෙකතිකා යෙ වඤ්චනිකා යෙ සාහසිකා ත්‍යාස්ස මිත්තා හොන්ති තෙ සහායා; ඉමෙ ඛො ගහපතිපුත්ත ඡ ආදීනවා පාපමිත්තානුයොගෙ.

ඡ ඛො’ මෙ ගහපතිපුත්ත ආදීනවා ආලස්සානුයොගෙ: අතිසීතන්ති කම්මං න කරොති, අතිඋණ්හන්ති කම්මං න කරොති, අතිසායන්ති කම්මං න කරොති අතිපාතො’ති කම්මං න කරොති, අතිඡාතොස්මීති කම්මං න කරොති, අතිධාතොස්සීති කම්මං න කරොති; තස්ස එවං කිච්චාපදෙසබහුලස්ස විහරතො අනුප්පන්නා චෙව භොගා නුප්පජ්ජන්ති- උප්පන්නා ච භොගා පරික්ඛයං ගච්ඡන්ති; ඉමෙ ඛො ගහපතිපුත්ත ඡ ආදීනවා ආලස්සානුයොගෙ’ති.

ඉදමවොච භගවා ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා:

(4) හොති පානසඛා නාම-
හොති සම්මියසම්මියො
යො ච අත්ථෙසු ජාතෙසු-
සහායො හොති සොසඛා.

(5) උස්සූරසෙය්‍යා පරදරසෙවනා
වෙරප්පසඞ්ඝො ච අනත්ථතා ච
පාපා ච මිත්තා සුකදරියතා ච
එතෙ ඡ ඨානා පුරිසං ධංසයන්ති.

(6) පාපමිත්තො පාපසඛො
පාපආචාර ගොචරො
අස්මා ලොකා පරම්හා'ච
උභයා ධංසතෙ නරො.

(7) අක්ඛිත්ථියො වාරුණී නච්චගීතං
දිවාසොප්පං පාරිචරියා අකාලෙ
පාපා ච මිත්තා සුකදරියතා ච
එතෙ ඡ ඨානා පුරිසං ධංසයන්ති.

(8) අක්ඛෙහි දිබ්බන්ති සුරං පිබන්ති
සන්තිත්ථියො පාණසමා පරෙසං
නහීනසෙවී න ච වුද්ධසෙවී
නිහීයති කාළපක්ඛෙ'ව චන්දෙ.

(9) යොවාරුණී අධනො අකිඤ්චනො
පිපාසො පිවං පාපගතො
උදකම්ව ඉණං විගාහති
අකුලං කාහති ඛිප්පමත්තනො.

(10) න දිවා සුප්පනසීලෙන
රත්ති'නුට්ඨානදස්සිනා
නිච්චංමත්තෙන සොණ්ඩෙන—
සක්කා ආවසිතුං ඝරං

(11) අතිසීතං අතිඋණ්හං—
අතිසායමිදනහු
ඉතිවිස්සට්ඨකම්මන්තෙ—
අත්ථාඅච්චෙන්තිමානවෙ.

(12) යෙ ච සීතඤ්ච උණ්හඤ්ච—
තිණාහියො න මඤ්ඤති
කරං පුරිසකිච්චානි—
සො සුඛා න විහායති-ති.

චත්තාරො' මෙ ගහපතිපුත්ත අමිත්තා
මිත්තපතිරූපකා වෙදිතබ්බො;

අඤ්ඤදත්ථුහරො අමිත්තො මිත්තපති
රූපකො වෙදිතබ්බො.

වචීපරමො අමිත්තො මිත්තපතිරූපකො
වෙදිතබ්බො,

අනුප්පියභාණී අමිත්තො මිත්තපති—
රූපකො වෙදිතබ්බො,

අපායසහායො අමිත්තො මිත්තපති—
රූපකො වෙදිතබ්බො,

චතුහි ඛො ගහපතිපුත්ත ඨානෙහි අඤ්ඤ-
දත්ථුහරො අමිත්තො මිත්තරූපකො
වෙදිතබ්බො-

(13) අඤ්ඤදත්ථුහරො හොති—
අප්පෙන බහුමිච්ඡති
භයස්ස කිච්චං කරොති—
සෙවෙති අත්තකාරණා'ති.

ඉමෙ ඛො ගහපතිපුත්ත චතූහි ඨානෙහි අඤ්ඤදත්ථුහරො අමිත්තො මිත්තපතිරූපකො වෙදිතබ්බො.

චතූහි ඛො ගහපතිපුත්ත ඨානෙහි වචීපරමො අමිත්තො මිත්තපතිරූපකො වෙදිතබ්බො–අතීතෙන පටිසන්ථරති, අනාගතෙන පටිසන්ථරති, නිරත්ථකෙන සඞ්ගණ්හාති, පච්චුප්පන්නෙසු කිච්චෙසු ව්‍යසනං දස්සෙති; ඉමෙහි ඛො ගහපතිපුත්ත චතූහි ඨානෙහි වචීපරමො අමිත්තො මිත්තපතිරූපකො වෙදිතබ්බො.

චතූහි ඛො ගහපතිපුත්ත ඨානෙහි අනුප්පියභාණී අමිත්තොමිත්තපතිරූපකො වෙදිතබ්බො–පාපකම්පි'ස්ස අනුජානාති, කල්‍යාණම්පි'ස්ස අනුජානාති, සම්මුඛා'ස්ස

වණ්ණං භාසති පරම්මුඛා'ස්ස අවණ්ණං භාසති; ඉමෙහි ඛො ගහපතිපුත්ත චතුහි ඨානෙහි අනුප්පියභාණී අමිත්තො මිත්තපතිරූපකො වෙදිතබ්බො.

චතුහි ඛො ගහපතිපුත්ත ඨානෙහි අපායසහායො අමිත්තො මිත්තපතිරූපකො වෙදිතබ්බො – සුරාමෙරය – මජ්ජ පමාදට්ඨානානුයොගෙ සහ යො හොති. විකාලවිසිඛාචරියානුයොගෙ සහායො හොති, සමජ්ජාභිචරණෙ සහායො හොති ජූතප්පමාදට්ඨානානුයොගෙ සහායො හොති, ඉමෙහි ඛො ගහපතිපුත්ත චතුහි ඨානෙහි අපායසහායො අමිත්තො මිත්තපතිරූපකො වෙදිතබ්බො'ති.

ඉදමවොච භගවා, ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා:

(14) අඤ්ඤදත්ථුහරො මිත්තො–
යොච මිත්තො වචීපරො
අනුප්පියං ච යො අහ–
අපායෙසු ච යො සඛා.

(15) එතෙ අමිත්තෙ චත්තාරො–
ඉති විඤ්ඤාය පණ්ඩිතො
ආරක්ඛා පරිවජ්ජෙය්‍ය–
මග්ගං පටිභයං යථා 'ති.

චත්තාරො'මෙ ගහපතිපුත්ත, මිත්තා සුහද වෙදිතබ්බ, උපකාරකො මිත්තො සුහදෙ වෙදිතබ්බො, සමානදුක්ඛො මිත්තො සුහදෙ වෙදිතබ්බො, අත්ථක්ඛායී මිත්තො සුහදෙ වෙදිතබ්බො, අනුකම්පකො මිත්තො සුහදෙ වෙදිතබ්බො.

චතුහි ඛො ගහපතිපුත්ත ඨානෙහි උපකාරකො මිත්තො සුහදෙ වෙදිතබ්බො-පමත්තං රක්ඛති, පමත්තස්ස සාපතෙය්‍යං රක්ඛති, භීතස්ස සරණං හොති, උප්පන්නෙසු කිච්චකරණීයෙසු තද්දිගුණං භොගං අනුප්පාදෙති. ඉමෙහි ඛො ගහපතිපුත්ත චතුහි ඨානෙහි උපකාරකො මිත්තො සුහදෙ වෙදිතබ්බො.

චතුහි ඛො ගහපතිපුත්ත ඨානෙහි සමානසුඛදුක්ඛො මිත්තො සුහදෙ වෙදිතබ්බො–ගුය්හමස්ස ආචික්ඛති, ගුය්හමස්ස පරිගුය්හති, ආපදසු න විජහති, ජීවිතම්පි'ස්ස අත්ථාය පරිච්චත්තං හොති. ඉමෙහි ඛො ගහපතිපුත්ත චතුහි ඨානෙහි සමානසුඛදුක්ඛො මිත්තො සුහදෙ වෙදිතබ්බො.

චතුහි ඛො ගහපතිපුත්ත ඨානෙහි අත්ථක්ඛායී මිත්තො සුහදෙ වෙදිතබ්බො – පාපා නිවාරෙති, කල්‍යාණෙ නිවෙසෙති' අස්සුතං සාවෙති, සග්ගස්ස මග්ගං ආචික්ඛති: ඉමෙහි ඛො ගහපතිපුත්ත චතුහි ඨානෙහි අත්ථක්ඛායී මිත්තො සුහදෙ වෙදිතබ්බො.

චතුහි ඛො ගහපතිපුත්ත ඨානෙහි අනුකම්පකො මිත්තො සුහදෙ වෙදිතබ්බො–අභවෙනස්'ස න නන්දති' භවෙන'ස්ස නන්දති, අවණ්ණං භණමාන. නිවාරෙති, වණ්ණං භණමානං පසංසති.

ඉමෙහි බො ගහපතිපුත්ත චතූහි ඨානෙහි අනුකම්පකො මිත්තො සුහදො වෙදිතබ්-බො'ති.

ඉදමවොච භගවා, ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා:—

(16) උපකාරො ච යො මිත්තො
යො ච මිත්තො සුඛෙ දුඛෙ
අත්ථක්ඛායී ච යො මිත්තො
යො ච මිත්තානුකම්පකො.

(17) එතෙ බො මිත්තෙ චත්තාරො–
ඉති විඤ්ඤාය පණ්ඩිතො
සක්කච්චං පයිරුපාසෙය්‍ය–
මාතා පුත්තං ච ඔරසං.

(18) පණ්ඩිතො සීලසම්පන්නො–
ජලමග්ගීව භාසති
භොගෙ සංහරමානස්ස–
භමරස්සෙව ඉරීයතො
භොගා සන්නිචයං යන්ති–
වම්මිකොවුපචීයති.

(19) එවං භොගෙ සමාගන්ත්වා–
අලමත්ථො කුලෙ ගිහී
චතුධා විභජෙ භොගෙ-
යවෙ මිත්තො'ති ගන්ථති.

(20) එකෙන භොගෙ භුඤ්ජෙය්‍ය–
ද්වීහිකම්මං පයොජයෙ
චතුත්ථඤ්ච නිධාපෙය්‍ය–
ආපදසු භවිස්සතී'ති.

කථං ච ගහපතිපුත්ත අරියසාවකො ඡද්දියාපටිච්ඡාදී හොති? ඡ ඉමා ගහපති-පුත්ත දිසා වෙදිතබ්බා; පුරත්ථිමා දිසා මාතාපිතරො වෙදිතබ්බා, දක්ඛිණා දිසා ආචරියා වෙදිතබ්බා, පච්ඡිමා දිසා පුත්තදරා වෙදිතබ්බා, උත්තරා දිසා මිත්තාමච්චා වෙදිතබ්බා, හෙට්ඨිමා දිසා දසකම්මකාරා වෙදිතබ්බා උපරිමා දිසා සමණබ්‍රාහ්මණා වෙදිතබ්බා.

පඤ්චහි ඛො ගහපතිපුත්ත ඨානෙහි පුත්තෙන පුරත්ථිමා දිසා; මාතාපිතරො පච්චුපට්ඨාතබ්බා; භතො නෙ භරිස්සාමි, කිච්චං නෙසං කරිස්සාමි, අථ ච පන පෙතානං කාලකතානං දක්ඛිණං අනුපදස්සාමි. ඉමෙහි ඛො ගහපතපුත්ත පඤ්චහි ඨානෙහි පුත්තෙන පුරත්ථිමා දිසා මාතාපිතරො පච්චුපට්ඨිතා, පඤ්චහි ඨානෙහි පුත්තං අනුකම්පන්ති; පාපා නිවාරෙන්ති, කල්‍යාණෙ නිවෙසෙන්ති, සිප්පං සික්ඛාපෙන්ති, පතිරූපෙන දරෙන සංයොජෙන්ති, සමයෙ දයජ්ජං නියා-දෙන්ති. ඉමෙහි ඛො ගහපතිපුත්ත පඤ්චහි ඨානෙහි පුත්තෙන පුරත්ථිමා දිසා මාතාපිතරො පච්චුපට්ඨිතා ඉමෙහි පඤ්චහි ඨානෙහි පුත්තං අනුකම්පන්ති. එවමස්ස එසා පුරත්ථිමා දිසා පටිච්ඡන්නා හොති, ඛෙමා අප්පටිභයා.

පඤ්චහි ඛො ගහපතිපුත්ත ඨානෙහි අන්තෙවාසිනා දක්ඛිණා දිසා ආචරියා පච්චුපට්ඨාතබ්බා: උට්ඨානෙන, පටිග්ගහංණෙන, සුස්සූසාය, පාරිචරියාය, සක්කච්චං සිප්පගහණෙන; ඉමෙහි ඛො ගහපතිපුත්ත පඤ්චහි ඨානෙහි අන්තෙවාසිනා දක්ඛිණා දිසා ආචරියා පච්චුප්පට්ඨිතා පඤ්චහි ඨානෙහි අන්තෙවාසිං අනුකම්පන්ති; සුවිනීතං විනෙන්ති, සුග්ගහිතං ගාහාපෙන්ති, සබ්බසිප්පසුතසමයක්ඛායිනො කරොන්ති; ඉමෙහි ඛො ගහපතිපුත්ත පඤ්චහි ඨානෙහි අන්තෙවාසිනා දක්ඛිණා දිසා ආචරියා පච්චුපට්ඨිතා ඉමෙහි පඤ්චහි ඨානෙහි අන්තෙවාසිං අනුකමපන්ති, එවමස්ස ඒසා දක්ඛිණා දිසා පටිච්ඡන්නා හොති ඛෙමා අප්පටිභයා.

පඤ්චහි ඛො ගහපතිපුත්ත ඨානෙහි සාමිකෙන පච්ඡිමා දිසා භරියා පච්චුපට්ඨාතබ්බා සම්මානනාය, අනවමානනාය අනතිචරියාය, ඉස්සරිය, වොස්සග්ගෙන, අලඞ්කාරානුප්පදානෙන. ඉමෙහි ඛො

ගහපතිපුත්ත පඤ්චහි ඨානෙහි සාමිකෙන පච්ඡිමා දිසා භරියා පච්චුපට්ඨිතා පඤ්චහි ඨානෙහි සාමිකං අනුකම්පන්ති; සුසං-විහිතකම්මන්තා ච හොති සුසඞ්ගහිතපරි-ජනා ච, අනතිචාරිණී ච, සම්භතං ච අනුරක්ඛති, දක්ඛා ච හොති අනලසා සබ්බකිච්චෙසු. ඉමෙහි ඛො ගහපතිපුත්ත පඤ්චහි ඨානෙහි සාමිකෙන පච්ඡිමා දිසා භරියා පච්චුපට්ඨිතා ඉමෙහි පඤ්චහි ඨානෙහි සාමිකං අනුකම්පන්ති. එවමස්ස එසා පච්ඡිමා දිසා පටිච්ඡන්නා හොති ඛෙමා අප්පටිභයා.

පඤ්චහි ඛො ගහපතිපුත්ත ඨානෙහි කුලපුත්තෙන උත්තරා දිසා මිත්තාමච්චා පච්චුපට්ඨාතබ්බා: දනෙන, පෙයයවජ්ජෙන අත්ථචරියාය, සමානත්තතාය, අවිසංවාද-නතාය; ඉමෙහි ඛො ගහපතිපුත්ත පංචහි ඨානෙහි කුල පුත්තෙන උත්තරා දිසා මිත්තා මච්චා පච්චුපට්ඨිතා පඤ්චහි ඨානෙහි කුල-පුත්තං අනුකම්පන්ති: පමත්තං රක්ඛන්ති

පමත්තස්ස සාපතෙයාං රක්ඛන්ති, හීතස්ස සරණා හොන්ති, ආපදාසු න විජහන්ති අපරජ්ජා ච'ස්ස පටිපූජෙන්ති; ඉමෙහි බො ගහපතිපුත්ත පංචහි ඨානෙහි කුලපුත්තෙන උත්තරා දිසා මිත්තාමච්චා පච්චුපට්ඨිතා ඉමෙහි ඨානෙහි කුලපුත්තං අනුකම්පන්ති. එවමස්ස එසා උත්තරා දිසා පටිච්ඡන්නා හොති ඛෙමා අප්පටිභයා.

පඤ්චහි බො ගහපතිපුත්ත ඨානෙහි අයිරකෙන හෙට්ඨිමා දිසා දාසකම්මකරා පච්චුපට්ඨාතබ්බා: යථාබලං කම්මන්තසංවිධානෙන, භත්තවෙතනානුප්පදානෙන, ගිලානුපට්ඨානෙන, අච්ඡරියානං රසානං සංවිධාගෙන, සමයෙ වොස්සග්ගෙන; ඉමෙ බො ගහපතිපුත්ත පංචහි ඨානෙහි අයිරකෙන හෙට්ඨිමා දිසා දාසකම්මකරා පච්චුපට්ඨිතා පංචහි ඨානෙහි අයිරකං අනුකම්පන්ති–පුබ්බුට්ඨායිනො ච හොන්ති, පච්ඡානිපාතිනො ච, දින්නාදායිනො ච, සුකත කම්මකාරකා ච කිත්තිවණ්ණහරා ච, ඉමෙහි බො ගහපතිපුත්ත පංචහි

ඨානෙහි අයිරකෙන හෙට්ඨිමා දිසා දසකම්මකරා පච්චුපට්ඨිතා: ඉමෙහි පංචහි ඨානෙහි අයිරකං අනුකම්පන්ති. එවමස්ස එසා හෙට්ඨිමා දිසා පටිච්ඡන්නා හොති ඛෙමා අප්පටිභයා.

පඤ්චහි ඛො ගහපතිපුත්ත ඨානෙහි කුලපුත්තෙන උපරිමා දිසා සමණබ්‍රාහ්මණා පච්චුපට්ඨාතබ්බා, මෙත්තෙන කායකම්මෙන, මෙත්තෙන වචීකම්මෙන, මෙත්තෙන මනොකම්මෙන, අනාවටද්වාරතාය, ආමිසානුප්පදානෙන; ඉමෙහි ඛො ගහපතිපුත්ත, පංචහි ඨානෙහි කුලපුත්තෙන උපරිමා දිසා සමණබ්‍රාහ්මණා පච්චුපට්ඨිතා ඡහි ඨානෙහි කුලපුත්තා අනුකම්පන්ති: පාපා නිවාරෙන්ති, කල්‍යාණෙ නිවෙසෙන්ති, කල්‍යාණෙන මනසා අනුකම්පන්ති, අස්සුතං සාවෙන්ති, සුතං පරියොදපෙන්ති, සග්ගස්ස මග්ගං අචික්ඛන්ති; ඉමෙහි ඛො ගහපතිපුත්ත පංචහි ඨානෙහි කුලපුත්තෙන උපරිමා දිසා සමණබ්‍රාහ්මණා පච්චුපට්ඨිතා ඉමෙහි ඡහි ඨානෙහි කුලපුත්තං අනුකම්පන්ති.

එවමස්ස එසා උපරිමා දිසා පටිච්ඡන්න හොති ඛෙමා අප්පටිභයාති.

ඉදමවොච භගවා, ඉදං වත්වා සුගතො අථාපරං එතදවොච සත්ථා:

(21) මාතා පිතා දිසා පුබ්බා–
ආචරියා දක්ඛිණා දිසා
පුත්තදාරා දිසා පච්ඡා–
මිත්තාමච්චා ච උත්තරා.

(22) දාසකම්මකරා හෙට්ඨා–
උද්ධං සමණබ්‍රාහ්මණා
එතාදිසා නමස්සෙය්‍ය–
අලමත්ථො කුලෙ ගිහී.

(23) පණ්ඩිතො සීලසම්පන්නො–
සණ්හො ච පටිභාණවා
නිවාතවුත්ති අත්ථද්ධො–
තාදිසො ලභතෙ යසං.

(24) උට්ඨානකො අනලසො–
ආපදසු න වෙධති
අච්ඡිද්දවුත්ති මෙධාවී–
තාදිසො ලභතෙ යසං
(25) සඞ්ගාහකො මිත්තකරො–
වදඤ්ඤූ වීතමච්ඡරො
නෙතා විනෙතා අනුනෙතා–
තාදිසො ලභතෙ යසං.
(26) දානංච පෙය්‍යවජ්ජං ච–
අත්ථචරියා ච යා ඉධ,
සමානත්තතා ච ධම්මෙසු–
තත්ථ තත්ථ යථාරහං.
(27) එතෙ ඛො සඞ්ගහා ලොකෙ–
රථස්සාණීව යායතො,
එතෙ ඛො සඞ්ගහා නාස්සු–
ලභෙථ මානං පූජං වා–
න මාතා පුත්තකාරණා
පිතාවා පුත්තකාරණා.

(28) යස්මා ච සඞ්ගහා එතෙ-
සමවෙක්ඛන්ති පණ්ඩිතා
තස්මා මහත්තංපප්පොන්ති-
පාසංසාච භවන්තිතෙ'ති

එවං වුත්තෙ සිගාලකො ගහපතිපුත්තො භගවන්තං එතදවොච; "අභික්කන්තං භන්තෙ, අභික්කන්තං භන්තෙ, සෙය්‍යථාපි භන්තෙ නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය 'පටිච්ඡන්නං වා විවරෙය්‍ය මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්ති'ති. එවමෙවං භගවතා අනෙකපරියායෙන ධම්මො පකාසිතො: එසාහං භන්තෙ භගවන්තං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච උපාසකං මං භගවං ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණාගතංති."

## සිඟාලොවාද සූත්‍ර භාවය

මා විසින් මෙසේ අසන ලදි; එක් කලෙක බුදුහු රජගහ නුවරට නුදුරු කලන්දක-නිවාප නම් වෙළුවනාරාමයෙහි වසති. එසමයෙහි සිගාලක නම් ගැහැවි පුත්තෙමේ අලුයමින් නැඟී රජගහ නුවරින් නික්මුණේ තෙත් වත් ඇත්තේ, තෙත් කෙස් ඇත්තේ, බැඳැදිලි ඇත්තේ, දෙඅත් ඔසවා හිස මත තබාගෙන, පෙර දිග, දකුණු දිග, පැළ දිග, උතුරු දිග, යට දිග, උඩ දිග යන සියලු දිගුන් වඳින්නේ ය. එකල්හි බුදුහු පෙරවරුයෙහි හැඳ පෙරව පාත්‍රය ගෙන රජගහ නුවර පිඬු පිණිස පිවිසියාහ. බුදුහු අලුයමින් නැඟී පෙ-සදිසාවන් වඳින සිගාලක ගැහැවි පුතු දුටහ.

‘‘ගැහැවි පුත, ඔබ කුමක් නිසා මෙසේ දිසා වඳිත් ද’’යි බුදුහු ඔහු ගෙන් විචාළහ.

''හිමියෙනි, මරණ මොහොතෙහි දී මං-පියා සදිගුන් නමඳින ලෙස මට කීයේ ය. හිමියෙනි, මම පියාගේ වචනයට සත්කාර කරන්නෙමි, ගරු කරන්නෙමි, බුහුමන් කරන්නෙමි, පුදන්නෙමි, අලුයම නැඟිට-පෙ-සියලු දිගුන් වඳිමි.''

''ගැහැවි පුත, ආර්‍ය්‍ය විනයෙහි සදිගුන් නැමඳීම මෙබඳු නො වේ; මෙසේ නමස්-කාර නොකටයුතු''යි බුදුහු වදළහ. (එබස් ඇසූ ගැහැවියා:)

''හිමියෙනි, ආර්‍ය්‍ය විනයෙහි කෙසේ නම් සදිසාවෝ වැඳියයුත්තාහු ද? හිමියෙනි, ආර්‍ය්‍ය විනයයෙහි සදිසාවෝ යම් සේ වැඳියයුත්තාහු ද, එසේ දෙසන සේක්වායි භාග්‍යවතුන් වහන්සේ අයදිමි.''

''ගැහැවිය, එසේ නම් අසව. දෙසමි''! (බුදුහු කීහ.)

''හිමියෙනි, එසේ ය'' සිගාලක ගැහැවි පුත් තෙමේ බුදුනට පිළිවදන් දුන්නේ ය. බුදුහු මෙය වදළහ.

"ගැහැවිය යම් හෙයකින් ආර්ය ශ්‍රාවකයා ගේ කර්ම ක්ලේශයෝ සිවු දෙනෙක් නැසුණාහු වෙත් ද (හෙතෙම) සිව් කරුණෙකින් පව්කම් නොකරන්නේ වෙයි. (ඒ තෙම) වස්තු විනාශයට හේතු සකරුණ ද සේවනය නොකරන්නේ වෙයි. ඒතෙමේ මෙසේ ලාමක කරුණු තුදුසෙකින් (සතර කර්ම ක්ලේශ, සතර අගති, වස්තු වනසට මුල් වන සකරුණ) වෙන් වූයේ, සදිසාවන් වසාගත්තේ දෙව් ලොව ජයගැනීම පිණිස ද පිළිපන්නේ වෙයි. හෙතෙම මේ ලෝකයෙහි ආරබ්ධ භාවයට පැමිණ කයෙහි බිඳීමෙන් මරණින් මතු සුගතිය නම් වූ ස්වර්ග ලෝකයට ද පැමි-ණෙයි.

"ඔහුගේ පහ වූ කර්ම ක්ලේශයෝ සිවු දෙන කවරහු ද? ගෘහපතිය ප්‍රාණ ඝාතය කර්ම ක්ලේශයෙකි; අදත්තාදනය කර්ම ක්ලේශයෙකි; කාම මිථ්‍යාචාරය කර්ම ක්ලේශයෙකි; මුසාවාදය කර්ම ක්ලේශ-යෙකි. මොහු ගේ මේ කර්ම ක්ලේශයෝ

සිවු දෙන නැසුණාහු වෙති.'' භාග්‍යවතුන්-වහන්සේ මෙය වදළසේක, බුදුහු මෙසේ වදරා නැවත ද වදරති:

සතුන් මැරීම නම් වූ පාණාතිපාතය,

අන් සතු දෙය සොර සිතින් ගැනීම නම් වූ අදත්තාදනය.

කාමයෙහි වරදවා හැසිරීම නම් වූ කාම මිථ්‍යාචාරය.

ඇත්ත වසා නැත්ත මතු කොට කීම නම් වූ මුසාවාදය.

යන මේ සතරකම් ක්ලේශයෝ ය. පඬුවෝ ඒ නො පසසත් (මේ කරුණු සතර, මිනිසා කිලිටි කරයි).

''(ආර්ය ශ්‍රාවකයා) කවර කරුණු සතරෙකින් පව්කම් නො කෙරේ ද? (මේ ලෝකයෙහි ඇතැම් කෙනෙක්) ඡන්ද ගති වශයෙන් – කැමැත්ත – නිසා – අගතියට යාමෙන් ද, ද්වේශ ගතියෙන් අගතියට යාමෙන්ද භයගතියෙන් අගතියට යාමෙන්ද

තතු නොදන මුළා ව – මෝහයෙන් – අගතියට යාමෙන් ද පව්කම් කරති. ගැහැවි පුත, ආර්ය ශ්‍රාවක තෙමේ ඡන්දයෙන්, ද්වේශයෙන්, භයෙන්, මෝහයෙන් අගතියට නො යයි; මේ සිවු කරුණින් පව් කම් නොකරයි'' බුදුහු වදළහ. බුදුහු මෙය වදරා නැවතත් මෙසේ වදළහ;

ලාභ–සත්කාර ආදිය ගැන සලකා නොකටයුතු කිරීම, ඡන්දයෙන් අගතියට, පැමිණීම ය, (සිය කැමැත්තෙන්)

තරහ පළි ගැනීම් ආදිය මතක් කිරීම, ද්වේශයෙන් අගතියට පැමිණීම ය.

යමකුගේ උසස්කම් බලවත්කම් ආදිය සලකා නොකටයුතු කිරීම, භයාගතියට පැමිණීම ය.

යුතු-අයුතු ආදිය නො දන පව්-කිරීම, මුළාවෙන් අගතියට පැමිණීම ය.

යමෙක් මේ සතර අගතියෙන් පව්කම කරයි නම් ඔහුගේ යසස, පිරිවර, අවපසෙහි සඳ මෙන් පිරිහී යයි.

යමෙක් මේ සතර අගතියෙන් තොර ව වසයි නම් ඔහු ගේ යසස පිරිවර පෙර පස සඳ මෙන් වැඩෙයි.

වස්තු විනාශයට හේතු වූ කවර නම් කරුණු සයක් ඇසුරු නො කෙරේ ද?

මත් වීමෙන් පමාවට හේතු වූ රහමෙරෙහි යෙදීම,

අවේලාවන්හි වීථි, මාර්ග ආදියෙහි හැසිරීම.

ගී නැටුම් දකීමෙහි ඇලීම,

පමාවට කරුණු වූ දූ කෙළියෙහි යෙදීම,

පාප මිත්‍ර සේවනය කිරීම,

අලසකමින් සිටීම,

(මේ කරුණු එකක් – එකක් ම වස්තු විනාශයට හේතු වෙති වදරා, නැවත ඒ එකිනෙක වස්තු විනාශයට හේතු වූයේ මේ මේ නිසා යයි දක්වූ හ, බුදුහු).

ගෘහපතිය, මත් වීමට හා පමාවටද හේතු වූ රහ මෙර පානයෙහි යෙදීමේ දෙස් සයෙකි. ඒ දෙස් සය:

මේ ලොව තමන් සතු (කෙත්-වත්-ආදි) ධනය වැනසීම

කෝලාහල ඇති වීම,

රෝග ඇති වීම,

(ගරු බුහුමන් පිරිහී) අපකීර්තිය ඇති වීම,

ලජ්ජාව පහ වීම (පහ වූ වත් ඇති ව කාණු ආදියෙහි වැටී සිටීමට පුරුදු වීම).

ප්‍රඥව හීන වීම (මොළය දුර්වල වීම.)

ගෘහපතිය, අවෙලාවන්හි වීථි මාර්ගාදියෙහි හැසිරීමේ දෙස් සයෙකි. ඒ දෙස් සය නම්;

ආත්මාරක්ෂාවට බාධා පැමිණීම,

අඹු – දරු ආරක්ෂාව නොසිදු වීම,
වස්තුව ආරක්ෂා නොවීම,

තමා වැරදි කටයුතුවලට මුල්-වන්නකු වශයෙන් ලෝකයාගේ සැකයට ගොදුරු වීම,

තමා නොකළ දෙයට තමා අසු වීම,
දුක් කරදරයනට මුණ පාන්නට සිදු වීම යනුයි.

ගෘහපතිය, ගී නැටුම්හි ඇලීමෙහි දෙස් සයෙකි. ඒ දෙස් සය නම්:

නැටුම් සොයා යාමට පුරුදු වීම.
ගැයුම් සොයා යාමට පුරුදු වීම.
වැයුම් සොයා යාමට පුරුදු වීම.
[රාමායණාදි] කතා පැවැත්වෙන තැන් සොයා යාමට පුරුදු වීම.
අත්පොළසන් දීම ආදි ක්‍රීඩා පැවැත්-වෙන තැන් සොයා යාමට පුරුදු වීම,
නළා ආදි පිඹීම පැවැත්වෙන තැන් සොයා යාමට පුරුදු වීම යනුයි.

ගෘහපතිය, පමාවට හේතුවූ දූ කෙළියෙහි යෙදීමේ දෙස් සයෙකි. ඒ සය නම්;

දිනූ කල තරහ කරුවන් වැඩි වීම.

පැරදුණු කල තමාට පසුතැවිලි-වන්නට සිදු වීම.

තමාගේ වස්තුව වැනසීම.

සබයෙක දී හෝ සාක්කියෙක දී හෝ තමාගේ වචනය නොපිළිගැනීම.

මිතුරන් ගේ අපවාදයට භාජන වීම.

නෑ මිතුරන්ගේ ආවාහ විවාහ සඳහා තමා ගණන් නොගැනීම.

ගෘහපතිය, පාප මිත්‍ර සේවනය කිරීමෙහි දෙස් සයෙකි. ඒ සය නම්;

සූදුව පුරුදු වීම.

බේබදුකම පුරුදු වීම.

සොරකම පුරුදු වීම.

ගැනු බාලකම් පුරුදු වීම.

වංචාව පුරුදු වීම.

බලහත්කාරකම් පුරුදු වීම.

ගෘහපතිය අලසකමෙහි දෙස් සයෙකි. ඒ සය නම්;

දැන් සීතයයි සිතා කටයුතු පමා කිරීම.

දැන් උෂ්ණයැ යි සිතා කටයුතු පමා කිරීම.

දැන් ඉතා සවසයැ යි සිතා කටයුතු පමා කිරීම.

දැන් ඉතා උදේ යැ යි සිතා කටයුතු පමා කිරීම.

දැන් බඩ ගිනි යැ යි සිතා කටයුතු පමා කිරීම.

දැන් වෙහෙස යැ යි සිතා කටයුතු පමා කිරීම.

මෙසේ අලස ව කටයුතුවල නො යෙදී වසන්නා හට අමුතුවෙන් භෝග නූපදී: උපන් භෝග වැනසෙයි.

(වස්තු විනාශයට හේතුවන කරුණු සයක් දක්වා ඒ එකිනෙක කරුණු විග්‍රහ කොට කරුණු සතිසක් දැක්වූ බුදුහු වෙසෙසින් දතයුතු අවැඩ පැවැතුම් රැසක් ද දක්වති).

අවන් හලෙහි දී පමණක් මිතුරු වූ 'පානසඛ' නම් මිතුරෙක් වෙයි. ඉදිරියෙහි දී පමණක් මිතුරු වූ 'සම්මිය -සම්මිය' නම් මිතුරෙක් වෙයි. (මොහු මිතුරෝ නො වෙති.) වැඩක් පැමිණි කල්හි යමෙක් සහාය වේ ද හේ තෙමේ නියම මිතුරාය.

ඉර උද වන තෙක් නිදීම, පර'ඹුවන් සෙවීම, වෛර කිරීම, අනුනට අනර්ථ කිරීම, පාප මිත්‍ර සේවනය, තද මසුරු-බව යන කරුණු සය පුද්ගලයා විනාශයට පමුණුවයි.

පවිටු මිතුරන් ඇති, පවිටු යහළුවන් ඇති ලාමක හැසිරීම් ද හැසිරෙන තැන් ද ඇති මිනිසා මෙලෝ පරලෝ යන දෙ ලොවින් ම පිරිහේ.

සූදුයෙහි හා ස්ත්‍රීන් සේවනයෙහි හා ලොල් වීම, සුරා පානයෙහි හා නැටුම් ගැයුම්හි හා රිසි ඉපදවීම, දහවල්හි

නිදීම, නොකල්හි වීථීන්හි හැසිරීම, පවිටු මිතුරන් ඇසුරු කිරීම, තද මසුරු බව.

දූ කෙළීම, සුරා පානය, පර ඹුන් සෙවීම, නිහීනයන් සෙවීම, බුද්ධි- මතුන් නොසෙවීම යන කරුණුවල පිහිටි තැනැත්තා අවපස සඳ මෙන් පිරිහීම කරා පැමිණේ.

කිසි ම වස්තුවක් නැති නිර්ධන වූ පුද්ගලයා මත් පැනට ලොල් ව අවන්හලට ගොස්, සුරා පානය කොට බොහෝ ණය වෙයි. ඒ තෙමේ නොබෝ කලෙකින් ම තම කුලය ද වනසයි.

දහවල් නිදන, රෑ නින්දෙන් අවදි නොවන තරම් නිදි බර ගතියෙන් යුත්, නිතර මත් වූ ස්ත්‍රී ධූර්තයාට ගිහි ගෙයි විසිය නොහැකි ය.

දන් ඉතා සීත ය, ඉතා උෂ්ණය, ඉතා සවස් යැයි සිතා වැඩ කටයුතු අත් හැර දමන මිනිසුන් ගේ ධනය පිරිහේ.

සීත-උෂ්ණ තණ පතක් තරමට වත් නො තකා කටයුතු කරන තැනැත්තා (එලෝ-මෙලෝ) සැපයෙන් නො පිරිහේ.

ඇසුරු කිරීමට නුසුදුසු අඤ්ඤදත්ථුහරය, වචීපරම ය, අනුප්පියභාණී ය, අපාය-සහායයයි මිත්‍ර ප්‍රතිරූපකයෝ – මිතුරන් මෙන් අභවාගෙන සිටින්නෝ – සිවු දෙනෙකි. ඔවුන්ගෙන් මතු කියනු ලබන කරුණු සතරින් යුක්ත තැනැත්තා 'අඤ්ඤදත්ථුහර' නම් මිත්‍ර ප්‍රතිරූපකයායි දත යුත්තේයි.

මිතුරාගේ ගෙදෙරට හිස් අතින් ගොස් ඔහු ළඟ ඇති දේ ගෙන යාමත්, නොවටිනා-සුලු දෙයක් ගෙන ගොස් දී ඒ වෙනුවට වටිනා ලොකු දෙයක් ඔහුගෙන් ගෙන යාමත්, තමනට බියක් පැමිණි කල්හි

දසයකු මෙන් (මිතුරාගේ) වැඩපල කිරීමත් නිතර ම යමක් ලබාගන්නා අටියෙන් සේවය කිරීමත් යන සිවු කරුණින් අඤ්ඤදත්ථුහර නම් මිත්‍රයා දත යුත්තේය.

මිතුරකු යම් හදිසි වුවමනාවක් ගැන කී කල, ''තව ටික කලකට කලින් කීවා නම් කරන්නට තිබුණා''යි කියා මග හැරීමත්, එසේ මග හැරීමට බැරි වූ විට ''පසු ව යමක් දෙමි'' කීමත්, එසේ මග හැරීමට බැරි වුවහොත් වැඩ රහිත දෙයක් දීමත්, යම්තම් පිරිමැසෙන දෙයක් පවා නොදීමත් යන කරුණු සතරින් වචීපරම නම් මිත්‍රයා දත යුත්තේ ය.

යහපත් වැඩක් කිරීමට විමසූ විට එයටත් අනුබල දෙයි; අයහපත් වැඩක් කිරීමට විමසූ විට එයටත් අනුබල දෙයි; ඇති තන්හි ගුණ කියයි; නැති තන්හි නුගුණ කියයි. මේ කරුණු සතරින් අනුප්පියභාණී නම් මිත්‍රයා හැඳිනගත-යුත්තේය.

මත් පැන් පානය, අකාලයෙහි වීථි සංචාරණය, නාඩගම් ඈ රඟුම් බැලීම, සූදුව යන මේ සතර කරුණෙහි දී පමණක් සහාය වන්නා අපායසහාය නම් මිත්‍රයායි දතයුත්තේය.

අඤ්ඤදත්ථුහර, වචීපරම, අනුප්පියභාණී, අපායසහාය යන මිතුරන් සිවු දෙනා පණ්ඩිතයෝ වග වලසුන් සහිත මහක් මෙන් දුරු කරති.

[ඇසුරු කිරීමට සුදුසු කලණ මිතුරන් සිවු දෙනකු බුදුහු සොයා දෙති.]

ඇසුරු කිරීමට සුදුසු වූ යහපත් මිතුරෝ සිවු දෙනෙකි. උපකාරක, සමාන සුඛදුක්ඛී, අත්ථක්කායී, අනුකම්පක යනු ය, එමිතුරෝ සිවු දෙන.

කරුණු සතරෙකින් යහපත් සිත් ඇති උපකාරක මිත්‍රයා දතයුතුයි. තම මිතුරා මුළා වූ කල්හි – වරදට ලක් වූ කල්හි – රැකීම, ඔහුගේ වස්තුව රැකීම, බියෙහි දී ඔහුට පිහිට වීම, වුවමනාවක් පැමිණි කල්හි

ඔහුට දෙගුණයෙකින් සංග්‍රහ කිරීම යන කරුණු සතරින් යහපත් සිත් ඇති උපකාරක මිත්‍රයා දතයුතුයි.

සමාන සුඛදුක්ඛී මිත්‍රයාගේ ලක්ෂණ නම්, තමාගේ රහස් මිතුරාට කීම, මිතුරාගේ රහස් සැඟැවීම, විපතෙහි දී මිතුරා රැකීම හා මිතුරා වෙනුවෙන් දිවි වුවත් පිදීමත් ය.

අත්ථක්ඛායී මිත්‍රයාගේ ලක්ෂණ:— මිතුරා වරදින් වැළැක්වීම, ඔහු යහපතෙහි පිහිටුවීම, ඔහු නොඇසූ යහපත් දේ ඔහුට කියාදීම, ස්වර්ග මාර්ගය කියා දීමත් ය.

අනුකම්පක මිත්‍රයාගේ ලක්ෂණ:— මිතුරා අනාථ වූ කල තමා අනාථ වූවාක් මෙන් සැලකීම, මිතුරා සැපවත් වූ කල තමා සැපවත් වූවාක් මෙන් සිතීම, මිතුරාගේ නුගුණ කීම වළකාලීම, මිතුරාගේ ගුණ කීමට පැසසීම.

යමෙක් උපකාරී මිත්‍රවේ ද, යමෙක් සැප දුක සමාන ව පවත්නා මිත්‍රයෙක් වේ ද, යමෙක් වැඩ සහිත වූවක් ම කියා දෙන මිත්‍රයෙක් වේ ද, යමෙක් අනුකම්පායෙන් යුත් මිත්‍රයෙක් වේ ද පඬුවා ඒ මිතුරන් සිවු දෙනා මවක තම පුතකු රකින්නාක් මෙන් මනා ව සේවනය කරයි.

සිල්වත් පඬුවා දිලිසෙන ගින්නක් මෙන් බබළයි. ඒ තෙමේ මී මැස්සකු රොන් රැස් කරන්නාක් මෙන් ද, වේයකු තුඹසක් බඳින්නාක් මෙන් ද වස්තු රැස් කරයි.

එසේ වස්තු රැස් කරගත් ගිහියා ඒ වස්තුව සිවු කොටසකට බෙද ගෙන වියදම් කරයි. හෙතෙම මිතුරන් ද ඇසුරු කරයි.

(එසේ බෙදගත් සිවු කොටසින්) එක් කොටසක් කෑම් පීම් ආදි ගෙදර කටයුතු වෙනුයෙන් යොදයි.

දෙකොටසක් තමාට ආදයම් දෙන කටයුතු වෙනුයෙන් යොදයි. සතර වැනි කොටස තමාට විපත් පත් කල්හි ගැනීම පිණිස සුරකිව තබයි.

ගෘහපතිය, ආර්‍ය්‍ය ශ්‍රාවකයා කෙසේ නම් සදිසාවන් අවුරාගනී ද? ගෘහපතිය, මේ සදිසාවෝ දතයුත්තාහ. මාපිය දෙදෙන පෙර දිගය, ගුරුවරු දකුණු දිගය, අඹු-දරුවෝ පැළ දිගය, මිතුරෝ උතුරු දිගය, දාසි-දස් ආදීහු යට දිගය. මහණ බමුණෝ උඩ දිගය.

ගෘහපතිය, පුතු විසින් කරුණු පසෙකින් පෙර දිග නම් වූ මාපියෝ උපස්ථාන කරනු ලැබියයුත්තාහුය.

මාපියන්ගෙන් පෝෂණය වූ පුතා මාපියන් පෝෂණය කිරීම.

මාපියන්ගේ කටයුතු කිරීම.

කුල වංශය දියුණු කිරීම.

මා පියනට සුබ පැතීම. ඔවුන් මළ කල්හිත් ඔවුනට පින් පැවරීම.

මාපියන්ගෙන් දයාද ලැබෙන ලෙසට පිළිපැදීම.

ගෘහපතිය, පුතු විසින් කරුණු පසෙකින් උවටැන් කරනු ලබන පෙර දිග නම් මාපියෝ කරුණු පසෙකින් පුතුට අනු-කම්පා කරති.

පාපයෙන් වළකා ලීම.

යහපතෙහි පිහිටුවීම.

ශිල්ප ඉගැන්වීම.

සුදුසු බිරියක පාවා දීම.

සුදුසු දයාද පවරා දීම.

ඉහත කී කරුණු පසින් මාපියෝ පුතුට සලකති. එසේ කල්හි පුතා ද මාපියනට මනාව සලකයි. එසේ සැලකූ පුතුට කිසි බියෙක් නො පැමිණේ.

ගෘහපතිය, අතවැසියා පස් අයුරෙකින් ගුරුනට සැලකිය යුතුයි.

ගුරුහු දුක හුනස්නෙන් නැඟිටීම.

උපස්ථාන කිරීම.

අවවාද ආදියට ඇහුම්කන් දීම.

වතාවත් කිරීම.

සකසා සිප්–සතර ඉගැනීම.

ගෘහපති පුත්‍රය, කරුණු පසෙකින්, සිසුන්ගෙන් සැලකුම් ලැබූ ගුරුහු ද කරුණු පසෙකින් සිසුනට සලකති.

මනා සේ හික්මවීම.

කරුණාවෙන් ඉගැන්වීම.

තමා උගත් සිප්–සතර සිසුනට නොසඟවා කියා දීම.

සිසුන්ගේ සමත්කමට පැසසුම.

සිසුන් වසන පෙදෙස්හි ගරු බුහුමන් ආදිය ඔවුනට ලබා දීම.

ගෘහපතිය, කරුණු පසෙකින් ස්වාමියා භාර්යාවට උපස්ථාන කළ යුතුය.

බුහුමන් කිරීම.

අවමන් නොකිරීම.

පර’ඹුවන් සෙවීම ආදි අනාචාරයන්හි නොයෙදීම.

ගෘහ සංවිධානය පැවරීම.

භාර්‍යාවට ඇඳුම් පැළඳුම් සපයා දීම.

ස්වාමියාගෙන් මේ පස් අයුරින් සැලකුම් ලැබූ භාර්‍යාව ද ස්වාමියාට පස් අයුරෙකින් සැලකිය යුතුය.

ස්වාමියාගේ කර්මාන්ත මනාව කිරීම.

නෑ-මිතුරු දැසි-දස් ආදීනට සංග්‍රහ කිරීම.

අනාචාරයෙහි නොහැසිරීම.

උපයන දේ රැකීම.

කටයුතුවල අනලස් වීම.

ගෘහපතිය කරුණු පසෙකින් උතුරු දිග නම් වූ මිතුරාට සැලකිය යුතුය.

දීම.

ප්‍රිය වචනය.

ලාභ ප්‍රයෝජන ලැබෙන්නට සැලැස් වීම.

සමානාත්මතාව.

බොරු නොකීම.

ඒ මිතුරා ගෙන් පස් අයුරෙකින් සැලැකුම ලැබූ මිත්‍රයා ද පස් අයුරෙකින් තම මිතුරාට සැලකිය යුතුය.

සුරාපානාදියෙන් මත් වූවහු රැකීම.

මත් වූවහුගේ ධනය රැකීම.

බයට පැමිණියහුට පිහිටවීම.

විපතෙහි දී අත් නොහැරීම.

මිත්‍රයාගේ දූ දරු ආදීන්ගේ කටයුතුවල දී සහභාගි වීම.

ගෘහපතිය, යට දිග නම් වූ සේවකයාට ද පස් අයුරෙකින් සැලකිය යුතුය.

ඒ ඒ කම්කරුවනට සුදුසු පරිදි වැඩ නියම කිරීම.

ඒ ඒ කම්කරුවාගේ සමත්කම් අනු ව වැටුප් නියම කිරීම.

ලෙඩ දුකෙහි දී පිහිටවීම.

තමාට ලැබෙන – වෙසෙසින් රසවත් – අහර ආදිය දීම.

නිසි පරිදි විවේකය දීම.

තම ස්වාමියා ගෙන් පස් අයුරෙකින් සැලකුම් ලැබූ සේවකයා ද ස්වාමියාට පස් අයුරෙකින් සැලකිය යුතුය.

අලුයමින් අවදි ව නියමිත වැඩෙහි යෙදීම.

ස්වාමියා නිඳාගත් පසු නින්දට යාම. ස්වාමියාගෙන් ලැබෙන වැටුප් ආදියෙන් සෑහීමට පත් වීම.

වැඩ කටයුතු හැකි පමණ හොඳින් කිරීම.

හිමියා ගුණ වැනුම.

ගෘහපතිය, උඩ දිග නම් වූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් හට ද පස් අයුරෙකින් සැලැකිය යුතුය.

වැඳුම් පිදුම් කිරීම, (මෛත්‍රී කාය කර්මය).

මනා වචනයෙන් ඇමැතීම, මනා වචනයෙන් කථා කිරීම ආදිය (මෛත්‍රී වචී කර්මය.)

''නිදුක් නිරෝගී වෙත්වා''යි පැතීම. (මෛත්‍රී මනෝ කර්මය.)

ලොබ නොකොට දන් දීම.

සුදුසු වේලාවට සුදුසු ආමිසයෙන් පිදීම.

එසේ දයකයා ගෙන් සැලකුම් ලබන ශ්‍රමණ බ්‍රාහ්මණයන් ද තම දයකයන් හට පස් අයුරෙකින් සැලකිය යුතුය.

පාපයෙන් වළකාලීම. කුසල්හි යෙදවීම.

දයකයාට ''වැඩක් වේවා''යි පැතීම. නොඅසන ලද දහම් අසන්නට සැලැස්වීම.

දනගෙන තිබෙන දහම්හි සැක පසිඳලීම.

සවර්ග මාර්ගය පෙන්නා දීම යනුයි.

මාපියෝ පෙර දිගය; ගුරුහු දකුණු දිගය; අඹුදරුවෝ අවර දිග ය; මිත්‍රාමාත්‍යයෝ උතුරු දිගය;

දාසි-දස් කම්කරුවෝ යට දිගය; මහණ බමුණෝ උඩ දිග ය. කුලවත් ගිහි තෙමේ මේ දිගුන් වඳී.

පණ්ඩිත වූ ද, සිල්වත් වූ ද, මෘදු වූ ද, වැටහෙන නුවණින් යුක්ත වූ ද, කීකරු පැවතුම් ඇත්තා වූ ද, නොතද වූ ද සත්පුරුෂයා කීර්තිය ලබයි.

උට්ඨාන වීර්‍ය්‍ය ඇති අනලස් වූ තැනැත්තේ විපතෙහි දී කම්පා නො වේ. නොසුන් වූ බලාපොරොත්තු ඇති ඒ නැණවතා කීර්තිය ලබයි. සංග්‍රහ කරන ලද මිතුරන් ඇසුරු කරන්නා වූ පරිත්‍යාගශීලි වූ, මසුරු මල රහිත, ජනයා හික්මවන්නා වූ වෙසෙසින් හික්මවන්නාවූ තැනැත්තේ කිත් පැසසුම් ලබයි.

දීම, පිය තෙපුල් කීම, පරවැඩ පිණිස හැසිරීම — පරාර්ථචර්‍ය්‍යාව — අනුන් තමා හා සමානයයි සිතීම — සමානාත්මතාව — යන සතරින් ඒ ඒ අයට සුදුසු සේ සංග්‍රහ කරන්න.

මේ සතර සංග්‍රහ වස්තූහු රියෙහි ගමනට කඩ ඇණය මෙන් මේ ලෝකයේ පැවැත්මට උපකාර වෙති. මේ සතර සංග්‍රහ වස්තූහු නොවෙත් නම් මව පුතා නිසා හෝ පියා පුතා නිසා හෝ බුහුමන් නොලබයි.

පණ්ඩිතයෝ මේ චතුර් සංග්‍රහ වස්තූන් මනා කොට සලකත් ද එයින් ම ඒ පඬුවෝ උසස් බවට පැමිණෙති; පැසසිය යුතු බවට ද පැමිණෙති.

බුදුන් මෙසේ වදළ කල්හි සිඟාල ගෘහපතිතෙමේ බුදුනට මෙසේ සැළ කෙළේය: ''ස්වාමීනි, ඉතා යහපති, ඉතා ම යහපති, ස්වාමීනි, ස්වාමීනි, යටිකුරු කොට තබන ලද බඳුන යම්සේ උඩුකුරු කොට තබන්නේ ද, වසන ලද දෙයක් යම්සේ විවර කරන්නේ ද, මංමුළා වූවකුට යම් සේ නිසි මඟ දක්වන්නේ ද, ඝන අඳුරෙහි වූ ඇස් ඇත්තා රූප බලනු පිණිස යම්සේ

පහනක් දල්වන්නේ ද, එපරිද්දෙන් බුදුහු නොයෙක් ලෙසින් සදහම් දෙසූහ. ස්වාමීනි, මම බුදුන්-දහම්-සඟුන් සරණ කොට යෙමි. මා අද පටන් තෙරුවන් සරණ ගිය උවසු-වකු බව ඔබවහන්සේ දැන ගන්නා සේක්වා.''

## 16. පරිත්‍රාණදේශනා

### මහා මඞ්ගල සූත්‍රය

එවං මෙ සුතං එකං සමයං භගවා, සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථ-පිණ්ඩිකස්ස ආරාමෙ. අථඛො අඤ්ඤතරා දෙවතා, අභික්කන්තාය රත්තියා අභික්-කන්තවණ්ණා, කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා, යෙන භගවා තෙනුපසංකමි. උපසංකමිත්වා, භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතා-ඛො සා දෙවතා, භගවන්තං ගාථාය අජ්ඣභාසි.

බහු දෙවො මනුස්සා ච
මඞ්ගලානි අචින්තයුං
ආකඞ්ඛමානා සොත්ථානං
බ්‍රෑහි මඞ්ගලමුත්තමං.

අසෙවනා ච බාලානං
පණ්ඩිතානඤ්ච සෙවනා,
පූජා ච පූජනීයානං
එතං මඞ්ගලමුත්තමං.

පතිරූපදෙස වාසො ච
පුබ්බෙ ච කත පුඤ්ඤතා,
අත්ත සම්මාපණිධි ච
එතං මඞ්ගලමුත්තමං.

බහු සච්චඤ්ච සිප්පඤ්ච
විනයොච සුසික්ඛිතො,
සුභාසිතා ච යා වාචා
එතං මඞ්ගලමුත්තමං.

මාතා පිතු උපට්ඨානං
පුත්තදරස්ස සඞ්ගහො,
අනාකුලා ච කම්මන්තා
එතං මඞ්ගල මුත්තමං.

දනඤ්ච ධම්ම චරියා ච
ඤාතකානඤ්ච සඞ්ගහො,
අනවජ්ජානි කම්මානි
එතං මඞ්ගලමුත්තමං.

ආරති විරති පාපා
මජ්ජපානා ච සඤ්ඤමො,
අප්පමාදෙ ච ධම්මෙසු
එතං මඞ්ගලමුත්තමං.

ගාරවො ච නිවාතො ච
සන්තුට්ඨී ච කතඤ්ඤුතා,
කාලෙන ධම්ම සවනං
එතං මඞ්ගලමුත්තමං.

ඛන්තී ච සොවචස්සතා
සමණානඤ්ච දස්සනං,
කාලෙන ධම්ම සාකච්ඡා
එතං මඞ්ගලමුත්තමං.

තපො ච බ්‍රහ්ම චරියං ච
අරිය සච්චාන දස්සනං,
නිබ්බාණ සච්චකිරියා ච
එතං මඞ්ගලමුත්තමං.

ඵුට්ඨස්ස ලොකධම්මෙහි
චිත්තං යස්ස න කම්පති,
අසොකං විරජං ඛෙමං
එතං මඞ්ගලමුත්තමං.

එතා දිසානි කත්වාන
සබ්බත්ථමපරාජිතා,
සබ්බත්ථ සොත්ථිං ගච්ඡන්ති
තං තෙසං මඞ්ගලමුත්තමන්ති.

## රතන සූත්‍රය

යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානිව අන්තලික්ඛෙ,
සබ්බෙව භූතා සුමනා භවන්තු
අථොපි සක්කච්ච සුණන්තු භාසිතං.

තස්මාහි භූතා නිසාමෙථ සබ්බෙ
මෙත්තං කරොථ මානුසියා පජාය,
දිවා ච රත්තො ච හරන්ති යෙ බලිං
තස්මාහි නෙ රක්ඛථ අප්පමත්තා.

යංකිඤ්චි විත්තං ඉධ වා හුරං වා
සග්ගෙසුවායං රතනං පණීතං,
නනො සමං අත්ථි තථාගතෙන;
ඉදම්පි බුද්ධෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

ඛයං විරාගං අමතං පණීතං
යදජ්ක්ධගා සක්‍යමුනී සමාහිතො,
නතෙන ධම්මෙන සමත්ථි කිඤ්චි;
ඉදම්පි ධම්මෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

යංබුද්ධ සෙට්ඨො පරිවණ්ණයී සුචිං
සමාධිමානංතරිකඤ්ඤමාහු,
සමාධිනා තෙන සමො න විජ්ජති;
ඉදම්පි ධම්මෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

යෙ පුග්ගලා අට්ඨ සතම්පසත්තා
චත්තාරි එතානි යුගානි හොන්ති,
තෙ දක්ඛිණෙය්‍යා සුගතස්ස සාවකා
එතෙසු දින්නානි මහප්ඵලානි;
ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

යෙ සුප්පයුත්තා මනසා දළ්හේන
නික්කාමිනො ගොතම සාසනම්හි,
තෙ පත්ති පත්තා අමතං විගය්හ
ලද්ධා මුධා නිබ්බුතිං භුඤ්ජමානා;
ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

යථින්ද ඛීලො පඨවිං සිතොසියා
චතුබ්භි වාතෙහි අසම්ප කම්පියො,
තථූපමං සප්පුරිසං වදමි
යො අරියසච්චානි අවෙච්ච පස්සති;
ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

යෙ අරියසච්චානි විභාවයන්ති
ගම්භීර පඤ්ඤෙන සුදෙසිතානි,
කිඤ්චාපි තෙ හොන්ති භුසප්පමත්තා
න තෙ භවං අට්ඨමං ආදියන්ති;
ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

සහාවස්ස දස්සන සම්පදාය
තයස්සු ධම්මා ජහිතා භවන්ති,
සක්කායදිට්ඨී විචිකිච්ඡිතඤ්ච
සීලබ්බතං වාපි යදත්ථි කිඤ්චි,
චතූහපායෙහි ච විප්පමුත්තො
ඡචාභි ඨානානි අභබ්බො කාතුං;
ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

කිංචාපි සො කම්මං කරොති පාපකං
කායෙන වාචා උදචෙතසා වා,
අභිබ්බො සොතස්ස පටිච්ඡාදාය
අභබ්බතා දිට්ඨපදස්ස වුත්තා;
ඉදම්පිසඞ්ඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

වනප්පගුම්බෙ යථා ඵුස්සිතග්ගෙ
ගිම්හාන මාසෙ පඨමස්මිං ගිම්හෙ,
තථූපමං ධම්මවරං අදෙසයි
නිබ්බාණගාමිං පරමං හිතාය;
ඉදම්පි බුද්ධෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

වරො වරඤ්ඤු වරදො වරාහරො
අනුත්තරො ධම්මවරං අදෙසයි
ඉදම්පි බුද්ධෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

ඛීණං පුරාණං නවං නත්ථි සම්භවං
විරත්ත චිත්තා ආයතිකෙ භවස්මිං,
තෙඛීණබීජාඅවිරුළ්හිච්ඡන්දා
නිබ්බන්ති ධීරා යථායම්පදීපො;
ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානිව අන්තලික්ඛෙ,
තථාගතං දෙවමනුස්සපූජිතං
බුද්ධං නමස්සාම සුවත්ථි හොතු.

යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානිව අන්තලික්ඛෙ,
තථාගතං දෙව මනුස්ස පූජිතං
ධම්මං නමස්සාම සුවත්ථි හොතු.

යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානිව අන්තලික්ඛෙ,
තථාගතං දෙව මනුස්ස පූජිතං
සඞ්ඝං නමස්සාම සුවත්ථි හොතු.

### කරණීය මෙත්ත සූත්‍රය

කරණීයමත්ථ කුසලෙන
යංතං සන්තං පදං අභිසමෙච්ච,
සක්කො උජූ ච සූජු ච
සුවචොචස්ස මුදු අනතිමානි,

සන්තුස්සකො ච සුභරො ච
අප්පකිච්චො ච සල්ලහුකවුත්ති,
සන්තින්ද්‍රියො ච නිපකො ච
අප්පගබ්භො කුලෙසු අනනුගිද්ධො,

න ච බුද්දං සමාචරෙ
කිඤ්චියෙන විඤ්ඤූපරෙ උපවදෙයුං
සුඛිනො වා ඛෙමිනො හොන්තු
සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා!

යෙ කෙචි පාණභූතත්ථි
තසා වා ථාවරා වා අනවසෙසා,
දීඝා වා යෙ මහන්තා වා
මජ්ඣිමා රස්සකාණුක ථූලා,

දිට්ඨා වා යෙව අද්දිට්ඨා
යෙ ච දූරෙ වසන්ති අවිදූරෙ,
භූතා වා සම්භවෙසී වා
සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා!

නපරොපරං නිකුබ්බෙථ
නාතිමඤ්ඤෙථ කත්ථචි නං කඤ්චි
බ්‍යාරොසනා පටිඝසඤ්ඤා
නාඤ්ඤමඤ්ඤස්ස දුක්ඛමිච්ඡෙය්‍ය.

මාතා යථා නියං පුත්තං
ආයුසා එක පුත්තමනුරක්ඛෙ.

එවම්පි සබ්බ භූතෙසු
මානසං භාවයෙ අපරිමාණං;
මෙත්තඤ්ච සබ්බ ලොකස්මිං
මානසං භාවයෙ අපරිමාණං;
උද්ධං අධො ච තිරියං ච
අසම්බාධං අවෙරං අසපත්තං.

තිට්ඨං චරං නිසින්නො වා
සයානො වා යාවතස්ස විගත මිද්ධො,
එතං සතිං අධිට්ඨෙය්‍ය
බ්‍රහ්මමෙතං විහාරං ඉධමාහු.

දිට්ඨිං ච අනුපගම්ම සීල වා
දස්සනෙන සම්පන්නො
කාමෙසු විනෙය්‍ය ගෙධං
නහි ජාතු ගබ්භ සෙය්‍යං පුනරෙතීති.

## ධජග්ග සූත්‍රය

එවං මෙ සුතං එකං සමයං භගවා, සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි 'භික්ඛවො'ති. 'භදන්තෙති' තෙ

භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච. භූත පුබ්බං භික්ඛවෙ දෙවාසුර සඞ්ගාමො සමුපබ්බුළ්හො අහොසි. අථ ඛො භික්ඛවෙ සක්කා දෙවානමින්දො, දෙවෙ තාවතිංසෙ ආමන්තෙසි "සචෙ මාරිසා දෙවානං සඞ්ගාම ගතානං උප්පජ්ජෙයා භයංවා ඡම්භිතත්තංවා ලොමහංසො වා, මමෙව තස්මිං සමයෙ ධජග්ගං උල්ලොකෙයයාථ. මමංහි වො ධජග්ගං උල්ලොකයතං යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා සො පහියිස්සති. නො චෙ මෙ ධජග්ගං උල්ලොකෙයයාථ; අථ පජාපතිස්ස දෙවරාජස්ස ධජග්ගං උල්ලොකෙයයාථ. පජාපතිස්ස හි වො දෙවරාජස්ස ධජග්ගං උල්ලොකයතං යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා සො පහියිස්සති. නො චෙ පජාපතිස්ස දෙව රාජස්ස ධජග්ගං උල්ලොකෙයයාථ, අථ වරුණස්ස දෙවරාජස්ස ධජග්ගං

උල්ලොකෙය්‍යාථ, වරුණස්සහි වො දෙව-
රාජස්ස ධජග්ගං උල්ලොකයතං, යං භවිස්-
සති භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො
වා සො පහීයිස්සති. නො චෙ වරුණස්ස
දෙව රාජස්ස ධජග්ගං උල්ලොකෙය්‍යාථ,
අථ ඊසානස්ස දෙව රාජස්ස ධජග්ගං
උල්ලොකෙය්‍යාථ. ඊසානස්සහි වො දෙව-
රාජස්ස ධජග්ගං උල්ලොකයතං යම්
භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලොමහං-
සො වා සො පහීයිස්සති. ''තං බො පන
භික්ඛවෙ සක්කස්ස වා දෙවානමින්දස්ස
ධජග්ගං, උල්ලොකයතං, පජාපතිස්ස
වා දෙවරාජස්ස ධජග්ගං උල්ලොකයතං,
වරුණස්ස වා දෙවරාජස්ස ධජග්ගං
උල්ලොකයතං ඊසානස්ස වා දෙව-
රාජස්ස ධජග්ගං උල්ලොකයතං, යම්භ-
විස්සති භයං වා ඡම්භිතත්තං වා ලොමහං-
සො වා සො පහීයෙථාපි; නොපි පහීයෙථ,
තං කිස්ස හෙතු? සක්කො හි භික්ඛවෙ
දෙවානමින්දෙ, අවීතරාගො, අවීත-
දෙසො, අවීත මොහො, භීරුච්ඡම්භි උත්‍රාසි
පලායි. අහඤ්ච බො භික්ඛවෙ එවං

වදමි සවෙ තුම්හාකං භික්ඛවෙ, අරඤ්ඤ ගතානං වා රුක්ඛමූල ගතානං වා සුඤ්ඤාගාර ගතානං වා, උප්පජ්ජෙය්‍ය භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා, මමෙව තස්මිං සමයෙ අනුස්සරෙය්‍යාථ : 'ඉතිපි සො භගවා අරහං සම්මා සම්බුද්ධො- විජ්ජාචරණ සම්පන්නො සුගතො ලොක- විදූ අනුත්තරො පුරිසදම්ම සාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති. - මමෙහි වො භික්ඛවෙ අනුස්සරතං, යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලොම හංසො වාසො පහීයිස්සති. නො වෙ මමෙහි, අනුස්සරෙය්‍යාථ, අථ ධම්මං අනුස්ස- රෙය්‍යාථ. 'ස්වාක්ඛාතො භගවතා ධම්මො, සන්දිට්ඨිකො අකාලිකො එහි පස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහීති. - ධම්මං හි වො භික්ඛවෙ අනුස්සරතං, යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා සො පහීයිස්සති. නො ''ච ධම්මං අනුස්ස - රෙය්‍යාථ, අථ සඞ්ඝං අනුස්සරෙය්‍යාථ; 'සුපටිපන්නො භගවතො සාවක සඞ්ඝො,

උජුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, සාමීචිපටිපන්නො භගවතො සාවක සඞ්ඝො, ඤායපටිපන්නො භගවතො සාවක සඞ්ඝො, යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨපුරිස පුග්ගලා එස භගවතො සාවක සඞ්ඝො, ආහුණෙය්‍යො පාහුණෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති. සඞ්ඝං හි වො භික්ඛවෙ අනුස්සරතං යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා සො පහීයිස්සති. තං කිස්ස හෙතු තථාගතො භික්ඛවෙ අරහං සම්මා සම්බුද්ධො වීතරාගො, වීතදොසො, වීතමොහො, අභීරු අච්ඡම්භි අනුත්‍රාසි අපලායීති. ඉදමවොච භගවා, ඉදං වත්වා, සුගතො අථාපරං එතදවොච සත්ථා:

අරඤ්ඤෙ රුක්ඛමූලෙ වා
සුඤ්ඤාගාරෙව භික්ඛවො,
අනුස්සරෙථ සම්බුද්ධං
භයං තුම්හාක නොසියා.
නො චෙ බුද්ධං සරෙය්‍යාථ
ලොකජෙට්ඨං නරාසභං,

අථ ධම්මං සරෙය්‍යාථ
නීයාණිකං සුදෙසිතං,

නො චෙ ධම්මං සරෙය්‍යාථ
නීයාණිකං සුදෙසිතං,

අථ සඞ්ඝං සරෙය්‍යාථ
පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං

එවං බුද්ධං සරන්තානං
ධම්මං සඞ්ඝං ච භික්ඛවො,
භයං වා ඡම්භිතත්තං වා
ලොමහංසො න හෙස්සතීති.

## රන්දෙණේ ගාථා

1. සබ්බෙසංඛත ධම්මෙසු
ඔත්තප්පාකාර සඤ්ඤිතා
ඤාණ මොහිත භාරානං
ධම්ම සංවෙග සඤ්ඤිතා.

2. සස්සරීකතරො නාථ
කෙතුමාලායලඞ්කතො
දක්ඛිණාවත්ත කෙසොසි
නීලාමල සිරොරුහෙ.

3. උණ්හිස සීසො රුචිරො
පරිපුණ්ණ සිරොවරො
අනොලොකිය මුද්ධාසි
සුගන්ධතර මුඩනො.

4. උණ්හිස රුචිරුදර
ලලාටතට සොභිතො
මුදු තූලානිභොදත
උණ්ණ මණ්ඩල මණ්ඩිතො.

5. ඉන්දචාප නිභා නීල
භූතටාක සුසජ්ජිතො
කඤ්චනංකුස සඞ්කාස
තුඞ්ග නාසො විරොචති.

6. ලොචනද්වයමාභාති
පඤ්චවණ්ණ සමුජ්ජලං
දෙහ දෙව විමානම්හි
මණිජාලුපමුත්තමං.

7. රංසිමාල නමො තුය්හං
බුද්ධ සෙතාදි පඤ්ජරං
එවං තං බුද්ධ ජානාථ
බුද්ධ දස විලොචනං.

## ජින පඤ්ජරය

1. ජයාසනගතා වීරා
ජෙත්වා මාරං සවාහිනිං
චතුසච්චාමතරසං
යෙ පිවිංසු නරාසභා.

2. තණ්හඞ්කරාදයො බුද්ධා
අට්ඨවීසති නායකා
සබ්බෙ පතිට්ඨිතා මය්හං[1]
මත්ථකෙ තෙ මුනිස්සරා.

3. සිරෙ පතිට්ඨිතා බුද්ධා
ධම්මො ච මම[1] ලොචනෙ
සඞ්ඝො පතිට්ඨිතො මය්හං
උරෙ සබ්බ ගුණාකරො.

4. හදයෙ අනුරුද්ධො ච
සාරි පුත්තො ච දක්ඛිණෙ
කොණ්ඩඤ්ඤො පිට්ඨිභාගස්මිං
මොග්ගල්ලානොසි වාමකෙ.

5. දක්ඛිණෙ සවණෙ මය්හං[1]
ආහුං ආනන්ද රාහුලා
කස්සපො ච මහානාමො
උභොසුං වාම සොතකෙ.

6. කෙසන්තෙ පිට්ඨිභාගස්මිං
සුරියො විය පභංකරො
නිසින්නො සිරි සම්පන්නො
සොභිතා මුනි පුඞ්ගවො.

7. කුමාර කස්සපො නාම
මහෙසී චිත්‍ර වාදකො
සො මය්හං[1] වදනෙ නිච්චං
පතිට්ඨාසි ගුණාකරො.

8. පුණ්ණො අඞ්ගුලිමාලො ච
උපාලි නන්ද සීවලී
ථෙරා පඤ්ච ඉමෙ ජාතා
ලලාටෙ තිලකා මම[1].

9. සෙසාසීති මහාථෙරා
විජිතා ජිනසාවකා
ජලන්තා සීල තෙජෙන
අඞ්ගමඞ්ගෙසු සණ්ඨිතා.

10. රතනං පුරතො ආසි
දක්ඛිණෙ මෙත්ත සුත්ත මෙ
ධජග්ගං පච්ඡතො ආසි
වාමෙ අඞ්ගුලිමාලකං.

11. ඛන්ධ මොර පරිත්තඤ්ච
ආටානාටිය සුත්තකං
ආකාසච්ඡදනං ආසි
සෙසා පාකාරසඤ්ඤිතා.

12. ජිනානා බල සංයුත්තෙ
ධම්මපාකාරලඞ්කතෙ
වසතො මෙ[1] චතුකිච්චෙන
සද සම්බුද්ධ පඤ්ජරෙ,

13. වාත පිත්තාදි සංජාතා
බාහිරජ්ඣත්තුපද්දවා
අස්සො විලයං යන්තු
අනන්ත ගුණ තෙජසා,

14. ජින පංජර මජ්ඣට්ඨං
විහරන්තං මහීතලෙ
සද පාලෙන්තු මං[1] සබ්බෙ
තෙ මහා පිරිසා සභා.

15. ඉච්චෙව මච්චන්ත කතොසුරක්ඛො
ජිනානුභාවෙන ජිතුපපද්දවො
බුද්ධානුභාවෙන හතාරි සඞ්ඝො
චරාමි[1] සද්ධම්මනුභාව පාලිතො.

16. ඉච්චෙව මච්චන්ත කතො සුරක්ඛො
ජිනානුභාවෙන ජිතුපපද්දවො
ධම්මානු භාවෙන හතාරි සඞ්ඝො
චරාමි[1] සද්ධම්මනුභාව පාලිතො.

17. ඉච්චෙව මච්චන්ත කතො සුරක්ඛො
ජිනානුභාවෙන ජිතුපපද්දවො
සඞ්ඝානුභාවෙන හතාරි සඞ්ඝො
චරාමි සද්ධම්මනුභාව පාලිතො.[1]

18. සද්ධම්මපකාර පරික්ඛිතොස්මි[1]
අට්ඨාරියා අට්ඨ දිසාසු හොන්ති.
එත්ථන්තරෙ අට්ඨ නාථා භවන්ති
උද්ධං විතානං ච ජිනා ඨිතා මෙ[1]

19. භින්දන්තො මාර සෙනං
මම[1] සිරසි ඨිතො
බොධිමාරුය්හ සත්ථා
මොග්ගල්ලානොසි වාමෙ
වසති භුජතටෙ
දක්ඛිණෙ සාරිපුත්තො
ධම්මො මජ්ඣෙ උරස්මිං
විහරති භවතො
මොක්ඛතො මොරයොනිං
සම්පත්තො බොධිසත්තො
චරණ යුග ගතො
භානු ලොකෙක නාථො.

20. සබ්බාවමඞ්ගලමුපද්දව දුන්නිමිත්තං
සබ්බීති රොග ගහදෙස මසෙස නින්ද
සබ්බන්තරාය භය දුස්සුපිනං අකන්තං
බුද්ධානුභාව පවරෙන පයාතු නාසං.

21. සබ්බාවි මඞ්ගලමුපද්දව දුන්නිමිත්තං
සබ්බීති රොග ගහදෙසමසෙස නින්ද
සබ්බන්තරාය භය දුස්සුපිනං අකන්තං
ධම්මානුභාව පවරෙන පයාතු නාසං.

22. සබ්බාවමඞ්ගලමුපද්දව දුන්නිමිත්තං
සබ්බීති රෝග ගහදෙස මසෙස නින්ද
සබ්බන්තරායභයදුස්සුපිනං අකන්තං
සඞ්ඝානුභාව පවරෙන පයාතු නාසං.

ජින පඤ්ජරය තමන් ගැන කියන කල පොතේ යොද තිබෙන ලෙසට ද, අනුන් ගැන කියන කල ඉලක්කම් යොද තිබෙන වචන වෙනුවට මේ වචන යොදගෙන ද භාවිත කළ යුතුයි.

| | | | | |
|---|---|---|---|---|
| 1. | මය්හං | කියූ තැන | තුය්හං | කියාද |
| 2. | මම | ,, | තව | ,, |
| 3. | මෙ | ,, | තෙ | ,, |
| 4. | මං | ,, | ත්වං | ,, |
| 5. | වාරා | ,, | වරාසි | ,, |
| 6. | පරික්ඛිතොස්මි | ,, | පරික්ඛිතොසි | ,, |

## ජය පිරිත

සිරි ධිති මති තෙජො ජය සිද්ධි මහිද්ධි මහා ගුණං අපරිමිතං පඤ්ඤධි කරණස්ස සබ්බන්තරාය නිවාරණ සමත්ථස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස-ද්වත්තිංස මහා පුරිස ලක්ඛණානුභාවෙන

අසීත්‍යනුබ්‍යංජන ලක්ඛණානුභාවෙන අට්ඨුත්තරසත මඞ්ගලානුභාවෙන ඡබ්බණ්ණරංස්‍යානුභාවෙන කෙතුමාලානුභාවෙන දස පාරමිතානුභාවෙන සීල සමාධි පඤ්ඤානුභාවෙන බුද්ධානුභාවෙන ධම්මානුභාවෙන සඞ්ඝානුභාවෙන තෙජානුභාවෙන ඉද්ධ්‍යනුභාවෙන වලානුභාවෙන ඤෙය ධම්මානුභාවෙන චතුරාසීතිසහස්සධම්මක්ඛන්ධානු භාවෙන නවලොකුත්තර ධම්මානුභාවෙන අට්ඨඞ්ගික මග්ගානුභාවෙන අට්ඨසමාපත්‍යානුභාවෙන ඡළභිඤ්ඤානුභාවෙන මෙත්තා කරුණා මුදිතා උපෙක්ඛානුභාවෙන සබ්බ පාරමිතානුභාවෙන රතනත්තය සරණානුභාවෙන මම්හං සබ්බ රොග සොක උපද්දව දුක්ඛ දෙමනස්සුපායාසා විනස්සන්තු! සබ්බ සංකප්පා මය්හං සමිද්ධා හොන්තු! සබ්බද ආකාස පබ්බත වන භූමි තටාක ගඞ්ගා මහා සමුද්ද ආරක්ඛක දෙවතා සදා අම්හෙ අනුරක්ඛන්තු! සබ්බ බුද්ධානුභාවෙන, සබ්බ ධම්මානුභාවෙන සබ්බ සඞ්ඝානු-

භාවෙන බුද්ධරතනං ධම්මරතනං සඞ්ඝ රතනං තින්නං රතනානං ආනුභාවෙන චතුරාසීති සහස්ස ධම්මක්ඛන්ධානුභාවෙන පිටකත්තයානුභාවෙන ජිනසාවකානු-භාවෙන සබ්බේ මෙ රොගා සබ්බෙ මෙ අන්තරායා සබ්බෙ මෙ අවමඞ්ගලා විනස්සන්තු!

ආයු වඩ්ඪකො ධන වඩ්ඪකො යසවඩ්ඪ-කො සිරි වඩ්ඪකො සුඛවඩ්ඪකො හොතු සබ්බදා!

දුක්ඛ රොග භයා වෙරා
සොකා සත්තුපපද්දවා
අනෙකා අන්තරායාපි
විනස්සන්තු ච තෙජසා!

ජයසිද්ධි ධනං ලාභං
සොත්ථි භාග්‍යං සුඛං බලං
සිරියායු ච වණ්ණො ච
භොග මිද්ධි ච තෙ සදා!

සතවස්සානි ආයූ ච
ජීව සිද්ධි භවන්තු මෙ!

(මේ පිරිත සියලු රෝගයට හා යක්ෂ භයට ද ග්‍රහ දෝෂවලට ද යහපති.)

## අටවිසි පිරිත

1. තණ්හංකරො මහා වීරො
මෙධඞ්කරො මහා යසො
සරණංකරො ලොකහිතො
දීපංකරො ජුතින්ධරො,

2. කොණ්ඩඤ්ඤො ජනපාමොක්ඛො
මඞ්ගලො පුරිසා සභො
සුමනො සුමනො ධීරො
රෙවතො රති වද්ධනො,

3. සොභිතො ගුණ සම්පන්නො
අනොමදස්සි ජනුත්තමො
පදුමො ලොක පජ්ජොතො
නාරදෙ වර සාරථී,

4. පදුමුත්තරො සත්ථසාරො
සුමෙධො අග්ග පුග්ගලො
සුජාතො සබ්බ ලොකග්ගො
පියදස්සී නරාසභො,

5. අත්ථදස්සී කාරුණිකො
ධම්මදස්සී තමො නුදෙ
සිද්ධත්ථො අසමො ලොකෙ
තිස්සො වරද සංවරො,

6. ඵුස්සො වරද සම්බුද්ධො
විපස්සී ච අනූපමො
සිඛී සබ්බ හිතො සත්ථා
වෙස්සභූ සුඛ දයකො,

7. කකුසන්ධො සත්ථවාහො
කොණාගමනො රනඤ්ජහො
කස්සපො සිරි සම්පන්නො
ගොතමො සක්‍ය පුඞ්ගවො,

8. තෙසං සච්චෙන සීලෙන
ඛන්ති මෙත්ත බලෙන ච
තෙපි මං අනුරක්ඛන්තු
ආරොගෙ‍‍ය්‍යන සුඛෙන චාති!

9. යං දුන්නිමිත්තං අවමඞ්ගලඤ්ච
යොචාමනාපො සකුණස්ස සද්දෙ
පාපග්ගහො දුස්සුපිනං අකන්තං
බුද්ධානුභාවෙන විනාස මෙන්තු.

10. යං දුන්නිමිත්තං අවමඞ්ගලඤ්ච
යොචාමනාපො සකුණස්ස සද්දෙ
පාපග්ගහො දුස්සුපිනං අකන්තං
ධම්මානුභාවෙන විනාස මෙන්තු.

11. යං දුන්නිමිත්තං අවමඞ්ගලඤ්ච
යොචාමනාපො සකුණස්ස සද්දෙ
පාපග්ගහො දුස්සුපිනං අකන්තං
සඞ්ඝානුභාවෙන විනාස මෙන්තු.

12. දුක්ඛප්පත්තා ච නිද්දුක්ඛා
භයප්පත්තා ච නිබ්භයා
සොකප්පත්තා ච නිස්සොකා
හොන්තුසබ්බෙපි පාණිනො.

13. එත්තාවතාච අම්හෙහි
සම්භතං පුඤ්ඤ සම්පදං
සබ්බෙ දෙවානුමොදන්තු
සබ්බ සම්පත්ති සිද්ධියා.

14. දනං දදන්තු සඩාය
සීලං රක්ඛන්තු සබ්බද
භාවනාභිරතා හොන්තු
ගච්ඡන්තු දෙවතා ගතා.

15. සබ්බෙ බුඩා බලප්පත්තා
පච්චෙකානඤ්චයං බලං
අරහන්තානඤ්ච තෙජෙන
රක්ඛං බන්ධාමි සබ්බසො.

16. නක්ඛත්ථ යක්ඛ භූතානං
පාපග්ගහ නිවාරණා
පරිත්තස්සානුභාවෙන
හන්තු තෙසං උපද්දවෙ.

17. ආකාසට්ඨා ච භුම්මට්ඨා
දෙවානාගා මහිද්ධිකා
පුඤ්ඤන්තං අනුමොදිත්වා
චිරං රක්ඛන්තු සාසනං.

## ජයමංගල ගාථා

1. බාහුං සහස්ස මභිනිම්මිත සායුධං තං
ගිරිමෙඛලං උදිත ඝොර සසෙන මාරං
දනාදි ධම්ම විධිනා ජිතවා මුනින්දො
තං තෙජසා භවතු තෙ ජය මඞ්ගලානි.

2. මාරාතිරෙක මභියුජ්ඣිත සබ්බ රත්තිං
ඝොරම්පනාලවක මක්ඛ මථද්ධ යක්ඛං
ඛන්ති සුදන්ත විධිනා ජිතවා මුනින්දෙ
තං තෙජසා භවතු තෙ ජය මඞ්ගලානි.

3. නාලාගිරිං ගජවරං අතිමත්ත භූතං
දවග්ගිචක්ක මසනීව සුදරුණන්තං
මෙත්තම්බුසෙක විධිනා ජිතවා මුනින්දො
තං තෙජසා භවතු තෙ ජය මඞ්ගලානි.

4. උක්ඛිත්ත ඛග්ග මතිහත්ථ සුදරුණන්තං
ධාවං තියොජනපථඞ්ගුලිමාල වන්තං
ඉද්ධීභිසංඛත මනො ජිතවා මුනින්දෙ
තං තෙජසා භවතු තෙ ජය මඞ්ගලානි.

5. කත්වාන කට්ඨමුදරං ඉව ගබ්භිණියා
චිඤ්චාය දුට්ඨ වචනං ජනකාය මජ්ඣෙ
සන්තෙන සොම විධිනා ජිතවා මුනින්දො
තං තෙජසා භවතු තෙ ජය මඞ්ගලානි.

6. සච්චං විහාය මතිසච්චක වාදකෙතුං
වාදාභි රොපිතමනං අති අන්ධභූතං
පඤ්ඤාපදීප ජලිතො ජිතවා මුනින්දෙ
තං තෙජසා භවතු තෙ ජය මඞ්ගලානි.

7. නන්දොපනන්ද භුජගං විබුධං මහිද්ධිං
පුත්තෙන ථෙර භුජගෙන දමාපයන්තො
ඉද්ධූපදෙස විධිනා ජිතවා මුනින්දෙ
තං තෙජසා භවතු තෙ ජය මඞ්ගලානි.

8. දුග්ගාහදිට්ඨිභුජගෙන සුදට්ඨහත්ථං
බ්‍රහ්මං විසුද්ධි ජුතිමිද්ධි බකාභිධානං
ඤාණාගදෙන විධිනා ජිතවා මුනින්දෙ
තං තෙජසා භවතු තෙ ජය මඞ්ගලානි.

9. එතාපි බුඩ ජයමඞ්ගල අට්ඨ ගාථා
යො වාචකො දින දිනෙ සරතෙ මතන්දී
හිත්වාන නෙක විවිධානි චුපද්දවානි
මොක්ඛං සුඛං අධිගමෙය්‍ය නරො
සපඤ්ඤො

භවතු සබ්බ මඞ්ගලං රක්ඛන්තු සබ්බ
දෙවතා
සබ්බ බුඩානුභාවෙන සද සොත්ථී භවන්තු
තෙ

භවතු සබ්බ මඞ්ගලං රක්ඛන්තු සබ්බ
දෙවතා
සබ්බ ධම්මානුභාවෙන සද සොත්ථී
භවන්තු තෙ

භවතු සබ්බ මඞ්ගලං රක්ඛන්තු සබ්බ
දෙවතා
සබ්බ සඞ්ඝානුභාවෙන සද සොත්ථී
භවන්තු තෙ

(මෙය අනුන් ගැන කියන විට පොතේ සඳහන් පිළිවෙළටද, තමන් කියා ගන්නා කල ''තෙ'' යන්න තිබෙන තැනට ''මෙ'' යන්න යොදා ගෙනද භාවිතා කට යුතුයි.)

## මහා ජය මඞ්ගල ගාථා

1. මහා කාරුණිකො නාථො,
හිතාය සබ්බ පාණිනං
පූරෙත්වා පාරමී සබ්බා,
පත්තො සම්බොධි මුත්තමං,
එතෙන සච්ච වජ්ජෙන
හොතු මෙ ජයමඞ්ගලං!

2. එල නිබ්බාණ ජංසෙරි,
සෙවමානො රසුත්තමො
බොධි මූලෙ අවසී සත්ත,
දිවසානි විනායකො;
එතෙන සච්ච වජ්ජෙන,
හොතු මෙ ජයමඞ්ගලං!

3. සත්තාහං ඨිතකො බුද්ධො,
ඤාපෙතුං ච කතඤ්ඤුතා
බොධිං අනිමිසක්ඛීහි,
සම්මා පූජෙසි පූජියං;
එතෙන සච්ච වජ්ජෙන
හොතු මෙ ජයමඞ්ගලං!

4. විමුත්තිජං සුඛං විඤ්ඤං,
පරිපුණ්ණ මනොරථො
චංකමෙ චංකමී බුද්ධො,
සත්තාහං රතනාමයෙ;
එතෙන සච්ච වජ්ජෙන,
හොතු මෙ ජයමඞ්ගලං!

5. නිසින්නො භගවා රම්මෙ
මන්දිරෙ රතනුජ්ජලෙ
සත්තාහං සම්මසී සම්මා,
ධම්ම ධාතුමනුත්තරං;
එතෙන සච්ච වජ්ජෙන,
හොතු මෙ ජයමඞ්ගලං!

6. සංබොහයිත්වා මාරිත්පී,
මුචම්බුජ වනංභුසං
සත්තාහං අජපාලස්ස
මූලෙ බුඬ්ඉසී වසී;
එතෙන සච්ච වජ්ජෙන
හොතු මෙ ජයමඞ්ගලං!

7. සත්තාහං මුචලින්දස්ස
ඵණිනො භොග මන්දිරෙ
වසී වසී මහාවීරො
තදනුග්ගහ බුද්ධියා;
එතෙන සච්ච වජ්ජෙන
හොතු මෙ ජයමඞ්ගලං!

8. භුංජමානො සුඛං සෙට්ඨං
චිරලද්ධිං විමුත්තිජං
රාජායතන මූලම්හි
සත්තාහං භගවා වසී;
එතෙන සච්ච වජ්ජෙන
හොතු මෙ ජයමඞ්ගලං!

9. සිලාමය චතුපත්තම්හි
මහා රාජෙහි ආභටෙ
මුඛ රෙඛාවසානම්හි
මධු පිණ්ඩං අභුංජි සො;
එතෙන සච්ච වජ්ජෙන
හොතු මෙ ජයමඞ්ගලං!

10. අජ්ක්ධිට්ඨයො බ්‍රහ්මණා බුඩො
රම්මෙබාරාණසී පුරෙ
ධම්මචක්කං පවත්තෙසි
පරිසාසු විනායකො
එතෙන සච්ච වජ්ජෙන
හොතු මෙ ජය මඞ්ගලං.

11. මාපයිත්වා ධම්මනාවං
කත පුඤ්ඤං මහාජනං
භවණ්ණවස්ස පාපෙසි
පාරං කාරුණිකො ජිනො
එතෙන සච්ච වජ්ජෙන
හොතු මෙ ජයමඞ්ගලං.

12. අඤ්ඤා කොණ්ඩඤ්ඤ පමුඛෙ
භික්ඛු බීණාසවෙ ජිනො
විධාතුං ධම්ම දූතෙයාං
විස්සජ්ජෙහි තහිං තහිං
එතෙන සච්ච වජ්ජෙන
හොතු මෙ ජයමඞ්ගලං.

13. උරුවෙලං ජිනො ගන්ත්වා
අච්ඡෙරං පාටිහාරියං
දස්සෙත්වාන තහිං භික්ඛු
දමෙසි කස්සපාදිකෙ
එතෙන සච්ච වජ්ජෙන
හොතු මෙ ජයමඞ්ගලං.

14. සසාවකො ජිනො ගන්ත්වා
රම්මං රාජගහං පුරං
බිම්බිසාරං සානුචරං
මනුජින්දං පබොධයි
එතෙන සච්ච වජ්ජෙන
හොතු මෙ ජයමඞ්ගලං.

15. පටිග්ගහිතෙ බුද්ධෙන
රම්මෙ වෙළුවනුත්තමෙ
මහාමහී පකම්පිත්ථ
නච්චමානාව පීතියා
එතෙන සච්ච වජ්ජෙන
හොතු මෙ ජයමඞ්ගලං.

16. තත්ථ වස්සං වසිත්වාන
නාථො රාජගහෙ පුරෙ
ඤාතීනං සඞ්ගහත්ථාය
අගමා කපිලං පුරං
එතෙන සච්ච වජ්ජෙන
හොතු මෙ ජයමඞ්ගලං.

17. සමාගන්ත්වා තහිං ඤාති
අභිමානං අකංසු තෙ
තං ඤත්වා සො මහාවීරො
රවීව නභමුග්ගතො
එතෙන සච්ච වජ්ජෙන
හොතු මෙ ජයමඞ්ගලං.

18. පාටිහීරං ජිතො කත්වා
නභෙ රතන චංකමෙ
සාකියානං සඤාතීනං
අකරී මාන මද්දනං
එතෙන සච්ච වජ්ජෙන
හොතු මෙ ජයමඞ්ගලං

19. සංසාර සාගරා ලොකං
සන්තාරෙන්තා සදෙවකං
සාවත්ථි නගරෙ රම්මෙ
චිරකාලං වසී ජිනො
එතෙන සච්ච වජ්ජෙන
හොතු මෙ ජයමඞ්ගලං.

20. ගණ්ඩම්බ රුක්ඛ මූලම්හි
යමකං පාටිහාරියං
දස්සෙත්වා තිත්ථියෙ බුද්ධො
පලාපෙසි තහිං තහිං;
එතෙන සච්ච වජ්ජෙන
හොතු මෙ ජයමඞ්ගලං.

21. පදනං වීතිහාරෙහි
තිහි දෙවනගිස්සරං
පාටිහීරාවසානම්හි
අගමාසි නරුත්තමො;
එතෙන සච්ච වජ්ජෙන
හොතු මෙ ජයමඞ්ගලං;

22. ගන්ත්වා සුරින්ද භවනං
මහන්තෙ පණ්ඩුකම්බලෙ
නිසිදි බුද්දපියෙව
ජිනොවර සිලාසනෙ;
එතෙන සච්ච වජ්ජෙන
හොතු මෙ ජයමඞ්ගලං.

23. තිදසින්ද පුරෙ වස්සං
වසං මාසත්තයං තහිං
දෙවානං දෙසෙයි බුද්ධො
අභිධම්මමනුත්තරං;
එතෙන සච්ච වජ්ජෙන
හොතුමෙ ජයමඞ්ගලං.

24. වුත්ථවස්සො පවාරෙත්වා
මණිනිස්සෙනියං මුනි
වත්තමානම්හි සක්කාරෙ
මනුස්ස පඨමාගමි;
එතෙන සච්ච වජ්ජෙන
හොතු මෙ ජය මඞ්ගලං,!

25. බ්‍රහ්මාසුර සුරාදීහි
පරිකිණ්ණො තථාගතො
ඔරොහන්තෙ, මහන්තං සො
අච්ඡෙරං දස්සියී තදා;
එතෙන සච්ච වජ්ජෙන
හොතු මෙ ජය මඞ්ගලං,

26. දෙවාරොහණ කාරම්හි,
අනුභාවං මහෙසිනො
පස්සිංසු යෙ තදා සබ්බෙ
බුද්ධත්තං පත්ථයිංසු තෙ;
එතෙන සච්ච වජ්ජෙන
හොතු මෙ ජයමඞ්ගලං.

27. සංකස්සනගරද්වාරෙ
ධම්මෙ බුද්ධෙන දෙසිතෙ
බහුන්ත ජනකායාන
ධම්මා භිසමයො අහු!
එතෙන සච්ච වජ්ජෙන
හොතු මෙ ජයමඞ්ගලං!

28. අනත්ථකාරිං ලොකස්ස
චොර අංගුලිමාලකං
සදත්ථෙසු නියොජෙසි
මුනින්දෙ නරසාරථී;
එතෙන සච්ච වජ්ජෙන
හොතු මෙ ජයමඞ්ගලං!

29. විබ්භන්තං මද වෙගෙන
නාලාගිරි කරිස්සරං
මෙත්තොසධෙන සම්බුද්ධො
නිම්මදං අකරී භුසං;
එතෙන සච්ච වජ්ජෙන
හොතු මෙ ජයමඞ්ගලං.

30. නන්දෝපනන්ද භුජගං විබුධං මහිද්ධිං  
උග්ගතෙජං මුනිස්සරො  
දමෙත්වා සක තෙජෙන  
සරණෙසු නිවෙසයි;  
එතෙන සච්ච වජ්ජෙන,  
හොතු මෙ ජයමඞ්ගලං.

31. යක්ඛං ආලවකං බුද්ධො  
දුද්දමං අතිකක්ඛලං  
විනයක්ඛුපවෙදෙසි  
සොතාපත්ති ඵලුත්තමෙ,  
එතෙන සච්ච වජ්ජෙන  
හොතු මෙ ජයමඞ්ගලං.

32. වධකෙ දෙවදත්තම්හි  
චොරෙ අඞ්ගුලිමාලකෙ  
ධනපාලෙ රාහුලෙ චාපි,  
සබ්බත්ථ සම මානසො;  
එතෙන සච්ච වජ්ජෙන  
හොතු මෙ ජයමඞ්ගලං.

33. චතුද්දිසොපයාතෙහි
වාතෙහි පබ්බතොවිය
අකම්පනීයො සම්බුද්ධො
ලොකධම්මෙහි අට්ඨහි;
එතෙන සච්චවජ්ජෙන
හොතු මෙ ජයමඞ්ගලං.

34. ධම්මාධිපතිනො පාදෙ
චුල්ලපංකෙරුහොපමෙ
දිස්සතෙ සබ්බ සො සබ්බෙ
අයං ලොකො අසංකාරො;
එතෙන සච්චවජ්ජෙන
හොතු මෙ ජයමඞ්ගලං.

35. අචින්තෙය්‍යප්පභාවස්ස
උත්තමඞ්ගං මහෙසිනො
පස්සිතුං නෙව සක්කොන්ති
බ්‍රහ්මලොකෙ ගතා අපි;
එතෙන සච්චවජ්ජෙන
හොතු මෙ ජයමඞ්ගලං.

36. සද්ධම්ම දෙසනාකාලෙ
පිට්ඨිභාගාදි නිස්සිතා
පුණ්ණචන්දං ච ගගනෙ,
මුඛං පස්සන්ති සත්ථුනො;
එතෙන සච්ච වජ්ජෙන
හොතු මෙ ජයමඞ්ගලං.

37. මුනින්‍දෙ මූලභාසාය
දෙසෙන්තෙ ධම්මමුත්තමං
ජානන්ති සත්තා සබ්බෙපි
සකභාසාය සබ්බසො;
එතෙන සච්ච වජ්ජෙන
හොතු මෙ ජය මඞ්ගලං.

38. ආභවග්ගානිසින්නාසු
පරිසාසුපි නායකො
චිත්තෙ ගහෙත්වා දෙසෙයි
ධම්මං තෙසං විසුං විසුං;
එතෙන සච්ච වජ්ජෙන
හොතු මෙ ජයමඞ්ගලං.

39. උණ්ණභමුක මජ්ඣම්හි
මුනිනො බුබ්බුළූපමා
උග්ගච්ඡතො ගහෙත්වාග්ගං
භවග්ගම්පි ගච්ඡති;
එතෙන සච්ච වජ්ජෙන
හොතු මෙ ජයමඞ්ගලං.

40. අනුපුබ්බූපසන්තස්ස
ජලතො විය අග්ගිනො
පඤ්ඤාපෙතුං ගතිං නත්ථි
පත්තානං අචලං පදං;
එතෙන සච්ච වජ්ජෙන
හොතු මෙ ජයමඞ්ගලං.

41. ඤාතා සබ්බස්ස සම්බුද්ධො
සද්ධම්මො ච තමොනුදෙ
සඞ්ඝො සුපටිපන්නොති
යං තං අවිතථං ධුවං;
එතෙන සච්ච වජ්ජෙන
හොතු මෙ ජයමඞ්ගලං.

42. ජාතිදුක්ඛ පරෙතානං
බුද්ධාදි රතනත්තයං
සබ්බද සබ්බ පාණීනං
තානං ලෙනං පරායනං;
එතෙන සච්ච වජ්ජෙන
හොතු මෙ ජයමඞ්ගලං.

43. නත්ථි මෙ සරණං අඤ්ඤං
බුද්ධො මෙ සරණං වරං;
එතෙන සච්ච වජ්ජෙන
හොතු මෙ ජයමඞ්ගලං.

44. නත්ථි මෙ සරණං අඤ්ඤං
ධම්මො මෙ සරණං වරං;
එතෙන සච්ච වජ්ජෙන
හොතු මෙ ජයමඞ්ගලං.

45. නත්ථි මෙ සරණං අඤ්ඤං
සඞ්ඝො මෙ සරණං වරං;
එතෙන සච්ච වජ්ජෙන
හොතු මෙ ජයමඞ්ගලං.

46. ඉච්චෙව සච්චකිරියං කුරුතෙ
ජනොයො
පාතොව සායම්පි බුද්ධ ගුණෙ
ගහෙත්වා
සබ්බං පරිස්සයමිදංපිච අත්ථමෙතං
පච්ඡා ස නිබ්බිත පදං සමුපෙති
සෙට්ඨං.

(මෙය තමන් සඳහා කියන විට පොතේ තිබෙන අන්දම ට ද අනුන් ගැන කියන විට "මෙ" යන්න වෙනුවට "තෙ" යන්න යොද ද භාවිතා කට යුතුයි.)

යමෙක් මෙකී ජයමඞ්ගල ගාථා පුහුණු කරගෙන උදය සවස භාවිත කරන්නේ වී නම් ඕ හට පැමිණි සියලු ග්‍රහ දෙෂ යක්ෂ දෙෂාදිය දුරු වෙයි. කරන ලද වෙළෙඳාම ගොවිතැන් ආදියද සඵලවෙයි. මරණයෙන් මතු ස්වර්ග මනුෂ්‍ය සම්පත් ද කෙළවර නිර්වාණ සම්පත් ද සිද්ධ වෙයි.

(මෙහි අන්තර්ගත වූ සියලු ම පිරිත්වල හා ජයමඞ්ගල ගාථාවලත් භාවය ''සන්න සහිත පිරුවාණ පොතින්'' බලා දතයුතුයි.)

**සර්වඥ ජන්ම පත්‍රය**




කලියුග වර්ෂ 2478 ක්වූ වෙසහ මස පුණු පොහොය වූ කුජ දින මව ගැබින් බිහිවූ සේක.

## බුඩාගමේ ප්‍රධාන දවස්

1. කලියුග වර්‍ෂයෙන් 2478 වැන්නෙහි වෙසක් මස පුර පසළොස්වක් ලත් කුජ දින විසා නැකතින් බොධිසත්වයන් වහන්සේ මව කුසින් බිහි වූ සේක.

2. උපන් 29 වෙනි අවුරුදුයෙහි ඇසළ මස පුර පසළොස්වක් දින අප මහොත්තම-යාණෝ අභිනිෂ්ක්‍රමණය කොට පැවිදි වූහ.

3. අප මහ බෝසතාණෝ උපන් 35 වැනි අවුරුද්දෙහි වෙසක් මස පුර පස-ළොස්වක් දින මාර පරාජය කොට බුද්ධ රාජ්‍යයට පැමිණියහ.

4. බුදුබව ලැබූ 9 වැනි මස දුරුතු පසළොස්වක් දින බුදුරජාණන් වහන්සේ ලෝ සතුන්ගේ හිත වැඩ පිණිස පළමුවෙන් ලක්දිවට වැඩ වදාළ සේක.

5. බුදුවූ පස්වැනි වර්ෂයෙහි බක් මස පසළොස්වක් දින බුදු රජාණන් වහන්සේ දෙවෙනි වර සිරි ලකට වැඩ වදළ සේක.

6. බුදුවූ අටවැනි අවුරුදුයෙහි වෛශාඛ පෞර්ණමී දිනයෙහි බුදුරජාණන් වහන්සේ තෙවෙනි වරට ලඞ්කාවට වැඩවදරා ශාන්ති කළ සේක.

7. ක්‍රි. වර්ෂයට අවුරුදු 543 කට පළමුව කලියුග වර්ෂ 2558 හි වෙසක් මස පුර පසළොස්වක් දින බුදු රජාණන් වහන්සේ පිරිනිවන් පෑ සේක.

8. බුදුරජාණන් වහන්සේ පිරිනිවී තුන් මස් සතර දිනක් ගතවූ කල පළමුවැනි ධර්ම සංගායනාව රජගහ නුවර සප්තපර්ණී ගුහාවේ දී අජාසත් මහරජහුගේ ආධාරයෙන් මහා කාශ්‍යප මහ රහතුන් වහන්සේ ප්‍රධාන පන්සියයක් රහතුන් වහන්සේලා විසින් කරන ලද්දේ ය. මෙදින ධර්ම භාණ්ඩාගාරික ආනන්ද ස්ථවිරයන් වහන්සේගේ රහත්වීමත් සිද්ධ විය.

9. බුද්ධ වර්ෂයෙන් සියයක් අවුරුද්දක් ගතවූ කල දෙවෙනි ධර්ම සංගායනාව විශාලා මහනුවර වාළුකාරාම නම් විහාරයෙහි කාලාශොක මහරජහුගේ ආධාරත්වයෙන් සබ්බකාමී ස්ථවිරයන් වහන්සේ හා යස නම් මහ තෙරුන් වහන්සේ ඇතුළු සත් සියයක් මහ තෙරුන් වහන්සේලා විසින් සංගායනා කරන ලද්දේය.

10. බුද්ධ වර්ෂයෙන් 236 අවුරුද්දක් ඉක්ම ගිය කල තුන් වැනි ධර්ම සංගායනාව පැළලුප් නුවර අශෝකාරාම නම් විහාරයෙහි දී ධර්මාශොක මහ රජහුගේ ආධාරයෙන් මොග්ගලී පුත්තතිස්ස මහ තෙරුන් වහන්සේ ප්‍රධාන දහසක් මහ රහතුන් වහන්සේලා විසින් සංගායනා කරන ලද්දේය.

11. බුද්ධ වර්ෂයෙන් 458 අවුරුද්දක් ඉකුත් වූ කල සතරවෙනි ධර්ම සංගායනාව ලක්දිව වළගම්බා රජ කාලයෙහි ජනප්‍රධානයකුගේ ආධාරත්වයෙන් පන්සියයක්

රහතුන් වහන්සේ මාතුල (මාතලේ) නම් දනවුවේ වැඩහිඳ සංගායනා කොට පොත්හි ලියවූ සේක.

12. බුඩ වර්‍ෂයෙන් 238 අවුරුද්දක් පැමිණි කල මිහිඳු මහ රහතන් වහන්සේ ලඞ්කාවට වැඩමකැර බුඩ ශාසනය පිහිට වූ සේක.

13. බුඩ වර්‍ෂයෙන් 239 යේ උඳුවප් මස පුර පසළොස්වක් පොහෝ දිනට ප්‍රථම දින-යෙහි සඞ්ඝමිත්තා රහත් මෙහෙණින් වහන්සේ විසින් ජය ශ්‍රී මහා බොධීන් වහන්සේගේ දකුණු ශාඛාවද වැඩමවා ගෙනවුත් ලක්දිව මෙහෙණි සස්නද පිහිටුවන ලද්දේය.

14. බුඩ වර්‍ෂයෙන් 284 රේ වප් මස ශුක්ල පක්ෂයෙහි අටවක් පොහෝ දින මිහිඳු මහ රහතන් වහන්සේ අසූ වර්‍ෂයක් ආයු වළඳා උත්තිය මහ රජ කාලයෙහි ප්‍රථම ධර්‍ම දෙශනාව කළ මිහින්තලේ අම්බසථලයෙහිදී පිරිනිවන් පා වදළසේක.

15. සඞ්සමිත්තා මෙහෙණින් වහන්සේ එම උත්තිය මහරජ කාලයෙහිම ඇතාල නම් මෙහෙණවරදී හැත්තෑ නව වර්ෂයක් ආයු වළඳා පිරිනිවන් පෑ සේක.

16. බුඩ වර්ෂයෙන් 455 අවුරුද්දක් ඉකුත් වූ කල ලක්දිව මහානාම නම් රජහුගේ ආධාරයෙන් දහසක් කුළුගෙයින් හෙබියාවූ ග්‍රන්ථාකාර මහා විහාරයෙහි වැඩ සිටි බුඩඝෝසාචාරීන් වහන්සේ විසින් දෙලක්ෂ පන්සැත්තෑ දහස් දෙසිය පණස් ග්‍රන්ථ සංඛ්‍යාවකින් ප්‍රතිමණ්ඩිත වූ ත්‍රිපිටක පාලි ධර්මයට තුන්ලක්ෂ එක්සැට දහස් සත්සිය පණස් ග්‍රන්ථ සංඛ්‍යාවක් පමණවූ අටුවා පාලිය ලියා පර්‍ය්‍යාප්ති ශාසනය චිරස්ථායි කළ සේක.

17. බුඩ වර්ෂ 854 දී දූනට සෙංකඩ-ගල නුවර පිහිටි දළදා වහන්සේ ලක්දිවට වැඩමවීම.

18. බුඩ වෂී 882 දී බුඩදස රජ කාලයෙහි මහා ධම්කථික නම් සථවිරයන් වහන්සේ විසින් සූත්‍ර දෙශනාව සිංහලට පරිවර්තනය කිරීම.

19. බුඩ වෂී 1846 දී පණ්ඩිත පරාක්‍රම-බාහු නරේන්ද්‍රයාගේ රජ කාලයේ ජාතක පොත සිංහලට නැගීම.

20. ශ්‍රී බුඩ වෂී 2438 දී පළමුවෙන් ලඞ්කාණ්ඩුව විසින් සර්‍වඥයන් වහන්සේ ලොව පහළ වූ දින ප්‍රසිඩ නිවාඩු දවසක් මෙන් නියම කිරීම.

## බුද්ධාගමේ මඞ්ගල්‍ය දවස්

සනරාමර ලොක ශිවංකරවූ ශ්‍රීමත් අප මහ බෝසතාණන් වහන්සේ තුසිත දිව්‍ය ලොකයෙන් චුතව මහා මායා දේවීන්-වහන්සේ ගේ කුස පිළිසිඳ ගැනීමත්

රාහුල කුමාරයාගේ උත්පත්තියෙන් පසු මහබිනික්මන් කොට පැවිදිවීමත්, බුදුවීමෙන් පසු ඉසිපතනාරාමයෙහිදී මඟුල් දම්සක් පැවැත්වීමත් යන කරුණු තුන ඇසළ මස පුර පසළොස්වක් පොහෝදින සිඩ විය.

බෝසතාණන් වහන්සේ මව් කුසින් බිහිවීමත්, මාර පරාජය කොට බුදු වීමත්, කුසිනාරා නුවරදී පිරිනිවන් පෑමත් යන කරුණු තුන වෙසක් මස පුර පසළොස්වක් පොහෝ දින සිඩ විය.

එබැවින් සියලු බුඩාගම් කාරයන් විසින් මෙකී දවස් පුණ්‍යකර්ම කරණයෙහි නියුක්ත වීමෙන් මහෝත්සව පැවැත්විය යුතුයි.

**බුද්ධ ඇදහිල්ල නිමි.**

මිල රු. 35.00 යි.